නිල් අහසක්
පරිසර හිතකාමී ගුවන්සේවයක්

Civil Aviation Authority Sri Lanka

Safe and Efficient Skies for All

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය

වාර්ෂික වාර්තාව 2023



CAASL


CO2



Civil Aviation Authority
Sri Lanka

Safe and Efficient Skies for All

පටුන

වරාය, නාවික හා ගුවන්සේවා ගරු අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරන ලදී, / 4

ගුවන් ප්‍රවාහන සංඛ්‍යාන ඉස්මතු කිරීම් / 5

සභාපතිතුමාගේ සමාලෝචනය / 8

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් සහ ප්‍රධාන විධායක නිලධාරීතුමාගේ සමාලෝචනය / 10

අධ්‍යක්ෂක මණ්ඩලය / 14

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය පිළිබඳ විග්‍රහය / 16

අංශ සහ ඒකක පිළිබඳ දළ විශ්ලේෂණය / 20

මෙහෙයුම් සංවිධාන ව්‍යුහය - කළමනාකරණ කාර්යමණ්ඩලය / 24

CAASL හි පාලනය සහ වගවීම / 26

මෙහෙයුම් කටයුතුවල විශේෂ අවස්ථා / 33

සුරක්ෂිතභාවය ශක්තිමත් කිරීම / 33

ආරක්ෂාව සහ පහසුකම් වැඩි දියුණු කිරීම / 36

කාර්යක්ෂමතාව සහ ඵලදායී කළමනාකරණය / 38

හරිත ගුවන් සේවය / 40

ගුවන්සේවා වර්ධනය / 42

ධාරිතා සංවර්ධනය / 47

තොරතුරු තාක්ෂණ සංවර්ධනයන් / 50

සේවකයන් සවිබල ගැන්වීම / 51

මූල්‍ය කටයුතුවල විශේෂ අවස්ථා / 54

මූල්‍ය ප්‍රකාශන / 58

විගණකාධිපතිගේ වාර්තාව 2023 / 88

විගණකාධිපතිගේ වාර්තාවට පිළිතුරු ලිපිය 2023 / 101

ඇමුණුම් / 112

නියාමන විෂය පථය / 112

CAASL හි තාක්ෂණික කාර්යසාධනය පිළිබඳ සාරාංශය / 114

ප්‍රධාන කාර්යසාධන දර්ශක 2023 / 116

ගුවන් ගමන් පිළිබඳ තොරතුරු / 122

සටහන් / 123

CAASL වාර්ෂික වාර්තාව කියවීම සඳහා මෙම QR කේතය ස්කෑන් කරන්න.
https://www.caa.lk/en/downloads/annual-reports



නිල් අහසක්


පරිසර හිතකාමී ගුවන්සේවයක්

මෙම වර්ෂය අවසානයේ ගුවන්සේවා අංශය තුළ ආරක්ෂාව, සුරක්ෂිතභාවය, තිරසාරභාවය සහ ජාතික සංවර්ධනය වැඩිදියුණු කිරීම සඳහා අපගේ කැපවීම පිළිබඳ සමස්ත විග්‍රහයක් ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය වශයෙන් අපි ඉතා ගෞරවයෙන් යුතු ව ඉදිරිපත් කර සිටිමු.

කාබන් විමෝචනය අවම කිරීම, පරිසර හිතකාමී ගුවන් ඉන්ධන භාවිතය ප්‍රවර්ධනය කිරීම මෙන් ම, අපගේ මෙහෙයුම් පුරාවට බලශක්ති කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම අරමුණු කරගනිමින් පරිසර හිතකාමී මුලපිරීම් කිහිපයක් ම අපි දියත් කර ඇත්තෙමු. එමඟින් පරිසර කළමනාකරණය කෙරෙහි අප දක්වන කැපවීම මැනවින් පිළිබිඹු වේ. තව ද, අපි අපගේ ගුවන්සේවා අවස්ථා පුළුල් කරමින් ද, ජාතික සහ ජාත්‍යන්තර සම්බන්ධතා ක්‍රමානුකූල ව වැඩිදියුණු කරමින් ද ජාතියට සුවිශේෂ වූ දායකත්වයක් සපයන්නෙමු. පරිසර හිතකාමී වූ අපගේ ම ගුවන්සේවා සන්නාමයක් සමඟින් ගුවන් කටයුතු සිදු කිරීමේ දී අප සතු වන නොසැලෙන කැපවීම හේතුවෙන් ගුවන්සේවාවේ සංවර්ධනය, ආරක්ෂක රීති සහ පාරිසරික වශයෙන් තිරසාර භාවිත ක්‍රියාත්මක කිරීම යන අංශවලින් සුවිශේෂ වූ ප්‍රගතියක් ඇති වී තිබේ.

වරාය, නාවික හා ගුවන්සේවා ගරු අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරන ලදී,

2022 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය පනතේ 15 වන වගන්තිය යටතේ ප්‍රකාශිත ව්‍යවස්ථාමය අවශ්‍යතාව සපුරාලීම සඳහා වාර්ෂික වාර්තාව - 2023 සම්පාදනය කරන ලදී. 2023 ජනවාරි මස 01 වන දින සිට 2023 දෙසැම්බර් 31 දක්වා අතර කාල පරිච්ඡේදය තුළ ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය විසින් සිදු කරක ලද ප්‍රධාන කාර්යන්හි සාරංශයක් සහ 2023 වර්ෂය සඳහා අධිකාරියේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය මෙහි අන්තර්ගත වේ.




ජී.එස්. විතානගේ
සභාපති

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය
2024 පෙබරවාරි 27


ගුවන් ප්‍රවාහන සංඛ්‍යාන ඉස්මතු කිරීම්

මඟී ගමනාගමනයන්




ගුවන් ප්‍රවාහන සංඛ්‍යාන ඉස්මතු කිරීම්

භාණ්ඩ ප්‍රවාහන



ගුවන්යානා ගමනාගමනයන්



සභාපතිතුමාගේ සමාලෝචනය



“ශ්‍රී ලංකා ගුවන්සේවා අංශයට තිරසාර සංවර්ධනයක් ළඟා කරගැනීමට මෙන් ම, එහි ඉහළ ආරක්ෂිත සහ සුරක්ෂිත තත්ත්ව පවත්වා ගැනීමට අප දක්වන කැපවීම ජාතික ගුවන්සේවා සුරක්ෂිතතා සැලසුම (NASP), දැනට ක්‍රියාත්මක වෙමින් පවතින සිවිල් ගුවන්සේවා ප්‍රධාන සැලසුම (CAMP) මෙන් ම, ජාතික තිරසාර ගුවන්සේවා පරිසර ප්‍රතිපත්තිය (NSAEP) ආදි උපායමාර්ගික මූලපිරීම් මඟින් මැනවින් පිළිබිඹු කෙරේ.

ගෝලීය තිරසාර ප්‍රයත්නයන් ළඟා කරගැනීමට අපගේ ක්‍රියාකාරී ප්‍රවේශය විදහා දක්වමින් එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා දායකවීමට ශ්‍රී ලංකාව දක්වන කැපවීම ද මෙම මූලපිරීම් මඟින් පිළිබිඹු කරයි.”

ශ්‍රී ලංකා ගුවන්සේවා අංශයට තිරසාර සංවර්ධනයක් ළඟා කරගැනීමට මෙන් ම, එහි ඉහළ ආරක්ෂිත සහ සුරක්ෂිත තත්ත්ව පවත්වා ගැනීමට අප දක්වන කැපවීම ජාතික ගුවන්සේවා සුරක්ෂිතතා සැලසුම (NASP), දැනට ක්‍රියාත්මක වෙමින් පවතින සිවිල් ගුවන්සේවා ප්‍රධාන සැලසුම (CAMP) මෙන් ම, ජාතික තිරසාර ගුවන්සේවා පරිසර ප්‍රතිපත්තිය (NSAEP) ආදි උපායමාර්ගික මූලපිරීම් මඟින් මැනවින් පිළිබිඹු කෙරේ.

ගෝලීය තිරසාර ප්‍රයත්නයන් ළඟා කරගැනීමට අපගේ ක්‍රියාකාරී ප්‍රවේශය විදහා දක්වමින් එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා දායකවීමට ශ්‍රී ලංකාව දක්වන කැපවීම ද මෙම මූලපිරීම් මඟින් පිළිබිඹු කරයි.

පසුගිය වර්ෂයේ දී, ශ්‍රී ලංකාවේ ගුවන්සේවා අංශයෙහි ඇතිවූ කැපී පෙනෙන දියුණුව සහ ලද ජයග්‍රහණ අපි ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියෙහි මෙම වර්ෂයේ වනම්, 2023 වාර්ෂික වාර්තාවෙහි සාඩම්බරයෙන් යුතුව ඉදිරිපත් කර සිටිමු. වසංගත සහ ආර්ථික පසුබෑම්

හමුවේ ඇති වූ දීර්ඝකාලීන බලපෑම් ඇතුළු ගෝලීය අභියෝග මධ්‍යයේ වුව ද අපගේ ගුවන්තොටුපොල අප සතු ඔරොත්තු දීමේ හැකියාව සහ ප්‍රතිසාධනය විදහා දැක්වීය. මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපොල සහ යාපනය ජාත්‍යන්තර ගුවන්තොටුපොල ඇතුළුව බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොල ප්‍රශංසනීය වර්ධනයක් පෙන් වූ අතර, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොල හරහා පූර්ව වසංගත මඟී සංචලනවල සහ ගුවන්යානා සංචලනවල 70% ක ප්‍රශංසනීය ප්‍රතිසාධනයක් ළඟා කරගැනීමට හැකි විය.

ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානය (ICAO) විසින් නියම කරන ලද ජාත්‍යන්තර නියමයන් අනුව සිදු කෙරෙන අපගේ මෙහෙයුම්වල මූලික පරමාර්ථය වන්නේ ආරක්ෂාව අධීක්ෂණය කිරීමෙහි ලා නොසැලී කැප වී සිටීමයි. මෙම නියමයන්ට අනුගත වීම සහතික කිරීම සඳහා අපගේ මෙම ක්‍රියාකාරී ප්‍රවේශය ගුවන් ප්‍රවාහන ඉල්ලුමට අනුව සැකසුම් නිර්මාණය කිරීමේ දී අත්‍යවශ්‍ය වේ. සාර්ථක ව නිම කරන ලද ICAO USAP-CMA වැනි විගණන මඟින් අපගේ කැපවීම පිළිබිඹු කෙරෙන අතර, අපි දකුණු ආසියානු කලාපයේ සුරක්ෂිත ගුවන්සේවාවක් සපයන ප්‍රමුඛයන් බවට පත් වෙමින් 92%ක සුවිශේෂ වූ ඵලදායී ශ්‍රේණිගත කිරීමක් ළඟා කරගත්තෙමු.

ශ්‍රී ලංකාවේ ගුවන්සේවා අංශයේ ඉදිරි ගමන හැඩගැස්වීමෙහි ලා පවත්නා නීති සංශෝධනය කිරීම අත්‍යවශ්‍ය වේ. කර්මාන්ත වර්ධනයට සහ නවෝත්පාදනයට හිතකර පරිසරයක් පෝෂණය කරමින් නියාමන රාමුව නව්‍යකරණය කිරීමට අප සතු ව පැවති කැපවීම සිවිල් ගුවන්සේවා පනත සහ ගුවන් ප්‍රවාහන පනත යාවත්කාලීන කිරීම මඟින් මැනවින් තහවුරු වේ. මෙම සංශෝධන මඟින් පෞද්ගලික අංශයට ද අත්‍යවශ්‍ය ගුවන්සේවා කටයුතු සඳහා සහභාගී වීමට සැලකිය යුතු වශයෙන් අවස්ථාවක් සැපයෙන අතර, මෙහෙයුම් පිරිවැය අවම කර දේශීය ගුවන්යානා සඳහා ඇති තරගකාරිත්වය වැඩි කිරීමට ද අපේක්ෂා කෙරේ.

ශ්‍රී ලංකා ගුවන්සේවා අංශයෙහි තිරසාර සංවර්ධනයක් ළඟා කරගැනීමට මෙන් ම, ඉහළ ආරක්ෂිත සහ සුරක්ෂිත තත්ත්වයන් පවත්වා ගැනීමට අපගේ ඇපකැප වීම ජාතික ගුවන්සේවා සුරක්ෂිතතා සැලසුම (NASP), දැනට ක්‍රියාත්මක වෙමින් පවතින සිවිල් ගුවන්සේවා ප්‍රධාන සැලසුම (CAMP) මෙන් ම, ජාතික තිරසාර ගුවන්සේවා පරිසර ප්‍රතිපත්තිය (NSAEP) ආදි උපායමාර්ගික මූලපිරීම් මඟින් මැනවින් පිළිබිඹු කෙරේ.

ගෝලීය තිරසාර ප්‍රයත්නයන් ළඟා කරගැනීමට අපගේ ක්‍රියාකාරී ප්‍රවේශය විදහා දක්වමින් චික්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා දායක වීමට ශ්‍රී ලංකාව දක්වන කැපවීම ද මෙම මූලපිරීම් මඟින් පිළිබිඹු කෙරේ.

මෙම උපායමාර්ගික ප්‍රයත්නයන්ට සමගාමී ව, දියුණු වන ගුවන් ගමනාගමනයට පහසුකම් සලසා දීමට සහ මඟී අත්දැකීම් වැඩිදියුණු කිරීමට අරමුණු කරමින් බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොලෙහි සිදු කළ පිටත්වීමේ පර්යන්ත පහසුකම් පුළුල් කිරීම වැනි ව්‍යාපෘති හරහා ගුවන්තොටුපොල යටිතල පහසුකම් වර්ධනය කිරීම ආරම්භ වී ඇත.

චික්සත් අරාබි එමීර් රාජ්‍ය සහ ශ්‍රී ලංකාව අතර ඇති කරගත් නව ගුවන්සේවා ගිවිසුම් ජාත්‍යන්තර සබඳතා වර්ධනය කරගැනීමට අප දක්වන කැපවීමට සාක්ෂියකි. ගෝලීය ගුවන්සේවාවන්හි ගතික ස්වභාවයන්ට අනුව පෙළගැස්වීම සඳහා ඉතා සුක්ෂම අයුරින් සකස් කරන ලද මෙම ගිවිසුම ජාතීන් අතර බැඳීම සහ මෙහෙයුම් ප්‍රශස්තකරණයේ නව මාවත් විවෘත කිරීමට පිටිවහලක් වේ.

මෙම මෙහෙයුම් වැඩි දියුණු කිරීමට පරිබාහිරව, අපි ගුවන්සේවාව පිළිබඳ දැනුම්වත්භාවය සහ අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීමෙහිලා වන වැකායන දැක්ම ඇති ව කටයුතු කරන්නෙමු. ගුවන්තොටුපොල පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩමුළු, පාසල් වැඩසටහන සහ ගුවන් සැරිසර රූපවාහිනී වැඩසටහන වැනි මූලපිරීම හරහා විශේෂයෙන් ම පාසල් සිසුන් අතර ගුවන් ගමන් සාක්ෂරතාව පිළිබඳ සංස්කෘතියක් පෝෂණය කිරීමට කටයුතු කෙරේ. තවද, ආර්ථික දියුණුවක් සහ සෞභාග්‍යක් කරා ගමන් කිරීමේදී ගුවන්සේවා අංශයෙන් වැදගත් කාර්යභාරයක් ඉටු කරන අතර, අපගේ මූල්‍ය කාර්ය සාධනය මඟින් එම ස්ව-කාර්යක්ෂමතාව සහ ජාතික සංවර්ධනය කෙරේ අපගේ ධනාත්මක දායකත්වය අවධාරණය කෙරේ.

එසේ ම ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන සියලුම ගුවන් යානා සඳහා ගුවන් ආහාර සැපයුම් සේවා කටයුතු සිදු කිරීමට ශ්‍රී ලංකන් කේටරින් පෞද්ගලික සමාගම අපගේ අධිකාරිය වෙතින් සහතික මෙන් ම බලපත්‍ර ලබා ඇති බව ද සතුටින් දන්වා සිටීමට මම කැමැත්තෙමි. මෙම සහතිකය මඟින් එම සමාගමේ නියාමන අනුකූලතාව, ආයතනික ව්‍යුහය, හැකියා, සුදුසුකම් ලත් සහ පුහුණු කාර්ය මණ්ඩලයක් සිටී ද යන්න පිළිබඳ පුළුල් ඇගයීමක් සිදු කරන ලදි. මීට අමතර ව, අපි අවශ්‍ය මෙවලම් උපකරණ සහ අනෙක් පහසුකම් පිළිබඳව මෙන් ම, සහතික කිරීම සඳහා අවශ්‍ය වෙනත් අත්‍යවශ්‍ය ලේඛන පවත්වා ගැනීම සම්බන්ධයෙන් ද තක්සේරු කිරීමක් සිදු කළෙමු.

වෙනත් උපායමාර්ගික පියවරක් වශයෙන්, CAASL කාර්ය මණ්ඩලය අතරින් ජ්‍යෙෂ්ඨ කළමනාකාර සහ ප්‍රධාන තාක්ෂණික තනතුරු සඳහා සුදුසු සුදුසුකම් සහිත තාක්ෂණික කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීමෙහි ලා අපි මූලිකත්වය ගෙන ඇත්තෙමු. දීර්ඝ කාලයක් පැවති බඳවා ගැනීමේ සීමා කිරීමට විසඳුමක් ලබා දෙමින් රේඛීය අමාත්‍යාංශයේ සහ අදාළ අධිකාරීන්හි අනුමැතිය ද සහිත ව මෙම ප්‍රයත්නය ගනු ලැබ ඇත. ගුවන්සේවාවේ සුරක්ෂාව සහ සේවාව ඉහළ ප්‍රමිතියකින් යුතු ව අඛණ්ඩ ව පවත්වා ගැනීම සහතික කරමින්, අපගේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ සහ තාක්ෂණික කණ්ඩායම්වල ප්‍රවීණතාව සහ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට මෙම උපායමාර්ගික බඳවා ගැනීම් මඟින් අරමුණු කෙරේ.

අවසාන වශයෙන්, සියලු ම CAASL හි සේවකයන්ගේ, කර්මාන්ත පාර්ශ්වකරුවන්ගේ සහ රාජ්‍ය නිලධාරීන්ගේ නොසැලෙන සහය සහ කැපවීම වෙනුවෙන් මම මාගේ අවංක කෘතඥතාව පළ කර සිටිමි. එසේම, සිවිල් ගුවන්සේවාවේ අධ්‍යක්ෂ ජනරාල් සහ ප්‍රධාන විධායක නිලධාරිතුමාහට ද අධ්‍යක්ෂ මණ්ඩලයට ද ඔවුන් සතු වූ දූරදර්ශී නායකත්වය වෙනුවෙන් විශේෂයෙන් ස්තුතිය පුද කර සිටිමි. ශ්‍රී ලංකා ගුවන්සේවා ක්ෂේත්‍රය සඳහා අපගේ හවුල් දැක්ම ඉදිරියට පවත්වාගෙන යාම සඳහා සිය වටිනා මඟපෙන්වීම සහ සහයෝගය ලබා දීම වෙනුවෙන් ගරු වරාය, නාවික හා ගුවන්සේවා අමාත්‍යතුමාටත්, ලේකම්තුමාටත් සියලු ම අමාත්‍යාංශ නිලධාරීන්ටත් අවසාන වශයෙන් මාගේ හෘදයාංගම කෘතඥතාව දක්වා සිටීමට කැමැත්තෙමි.

ජී. එස්. විතානගේ
සභාපති
ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් සහ ප්‍රධාන විධායක නිලධාරිතුමාගේ සමාලෝචනය

"ගුවන් ආරක්ෂණ පද්ධතිවල සහ රාජ්‍ය අධීක්ෂණ හැකියාවන්හි සැලකිය යුතු දියුණුවක් පිළිබිඹු කරමින් 2023 මැයි මාසයේදී ශ්‍රී ලංකාව ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානයේ ගෝලීය ආරක්ෂක විගණන වැඩසටහනේ අඛණ්ඩ අධීක්ෂණ ප්‍රවේශ විගණනය සඳහා 92%ක කැපී පෙනෙන අගයක් වාර්තා කිරීමට සමත් විය. ජා.සි.ගු.සේ.ස. හි ගුවන් ආරක්ෂණ විශේෂඥයින් විසින් සිදු කරන ලද මෙම විගණනය මගින් අපගේ නියාමන රාමුව, ජාතික ප්‍රතිපත්ති, ගුවන් තොටුපල ආරක්ෂණ වැඩසටහන් සහ ක්‍රියා පටිපාටි තරයේ ඇගයීමට ලක් කරන ලදී. මෙම කැපී පෙනෙන ප්‍රතිඵලය අපව ආසියා පැසිෆික් කලාපයේ ප්‍රමුඛතම නියාමන ආයතන සමඟ සම තත්ත්වයට ගෙන ඒමට සමත් විය."

අපි පසුගිය වසරේ ජයග්‍රහණ සහ සන්ධිස්ථාන ගැන මෙනෙහි කර බලන විට, 2023 වසර ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය තුළ (ශ්‍රී.ලං.සි.ගු.සේ.අ.) සැලකිය යුතු ප්‍රගතියක් සහ පරිවර්තනයක් ඇති කල කාල පරිච්ඡේදයක් බව පැහැදිලි කරුණකි. ගෝලීය වසංගත සහ ආර්ථික අවිනිශ්චිතතාවයන් විසින් ඇති කරන ලද අභියෝග මධ්‍යයේ වුවද, ශ්‍රී.ලං.සි.ගු.සේ.අ. ජාතියේ ගුවන්සේවා ක්ෂේත්‍රය ප්‍රගමනය, නවෝත්පාදනයන් මෙහෙයවීම සහ සිවිල් ගුවන් සේවයේ සෑම අංශයක්ම විශිෂ්ටත්වයෙන් පෝෂණය කිරීම වෙනුවෙන් නොසැලී කැපවිය.

ශ්‍රී.ලං.සි.ගු.සේ.අ. මූලෝපායික මූලපිරීම්වල ඉදිරියෙන්ම තිබෙන්නේ ඉදිරි දශකය තුළ ජාතියේ සිවිල් ගුවන්සේවා සංවර්ධනය සඳහා මාවත සකසන දූරදර්ශී සැලැස්ම, එනම් සිවිල් ගුවන්සේවා ප්‍රධාන සැලැස්ම (සි.ගු.ප්‍ර.සැ.) සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීමයි. ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානයේ (ජා.සි.ගු.සේ.ස.) නිර්දේශයන්ට අනුකූලව සංකල්පනය කරන ලද සි.ගු.ප්‍ර.සැ., ශ්‍රී ලංකාවේ ගුවන්සේවා යටිතල පහසුකම් නවීකරණය කිරීම, ආරක්ෂණ ප්‍රමිතීන් ඉහළ නැංවීම සහ තිරසාර වර්ධනයක් ඇති කිරීම සඳහා වූ අංගසම්පූර්ණ ප්‍රවේශයක් සහිතයි.

සි.ගු.ප්‍ර.සැ. සකස් කිරීම ශ්‍රී.ලං.සි.ගු.සේ.අ. හි විශේෂඥයින්, රාජ්‍ය ආයතන, කර්මාන්තයේ පාර්ශවකරුවන් සහ ජාත්‍යන්තර හවුල්කරුවන් සහයෝගීතාවයෙන් සම්බන්ධ වී ගන්නා ලද ප්‍රයත්නයකි. පුළුල් උපදේශන, පර්යේෂණ සහ විශ්ලේෂණ තුළින් සි.ගු.ප්‍ර.සැ. ශ්‍රී ලංකාවේ ගුවන්සේවා ප්‍රජාවගේ විවිධ අවශ්‍යතා සහ ප්‍රමුඛතා ආමන්ත්‍රණය කරන පුළුල් මාර්ග සිතියමක් බවට පරිණාමය වී ඇත. සි.ගු.ප්‍ර.සැ. හි ප්‍රධාන සංරචකයන්ට ගුවන්තොටුපල, ගුවන් නාවික පද්ධති සහ අනුබද්ධ පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති සඳහා ප්‍රමුඛත්වය ලබා දෙන යටිතල පහසුකම් සංවර්ධනය, ක්‍රියාවලි විධිමත් කිරීම, නීති සම්පාදනය යාවත්කාලීන කිරීම සහ ප්‍රමිතීන් ජාත්‍යන්තර හොඳම භාවිතයන් සමඟ පෙළගැස්වීමේ නියාමන ප්‍රතිසංස්කරණ, ගුවන්සේවා ආරක්ෂණය හා ආරක්ෂාව, ජා.සි.ගු.සේ.ස. ප්‍රමිතීන්ට අනුකූල හදිසි ප්‍රතිචාර හැකියාවන් වැඩිදියුණු කිරීමේ ආරක්ෂණ සහ ආරක්ෂා වැඩිදියුණු කිරීම්, පාරිසරික බලපෑම් අවම කිරීම සඳහා හරිත ගුවන්සේවා ප්‍රතිපත්ති සහ තිරසාර භාවිතයන් ප්‍රවර්ධනය කිරීමේ තිරසාර මූල පිරීම් ඇතුළත් වේ. සි.ගු.ප්‍ර.සැ. ක්‍රියාත්මක කිරීමෙන්, ගුවන් ගමන්, භාණ්ඩ ප්‍රවාහනය සහ සංචාරක ව්‍යාපාරයේ වැඩිවන ඉල්ලුම සපුරාලීමට හැකියාව ඇති කලාපයේ ප්‍රමුඛතම ගුවන්සේවා මධ්‍යස්ථානයක් ලෙස ශ්‍රී ලංකාව ස්ථානගත කිරීම ශ්‍රී.ලං.සි.ගු.සේ.අ. හි අරමුණ වේ. සි.ගු.ප්‍ර.සැ. සමෘද්ධියේ සහ සම්බන්ධතාවයේ අනාගතයක් කරා ජාතිය මෙහෙයවන උපායමාර්ගික ආයෝජන, ප්‍රතිපත්තිමය මැදිහත්වීම් සහ සහයෝගීතා හවුල්කාරිත්වයන් සඳහා මාර්ගෝපදේශක රාමුවක් ලෙස ක්‍රියා කරයි.

උපායමාර්ගික සැලසුම් වලට අමතරව, ශ්‍රී.ලං.සි.ගු.සේ.අ. විසින් ගුවන්සේවා අංශය තුළ ආරක්ෂණය සහ ආරක්ෂාව වැඩි දියුණු කිරීම සඳහා ක්‍රියාකාරී පියවර ගෙන ඇත. අර්බුද කළමනාකරණයේ සහ ප්‍රතිචාර දැක්වීමේ වැදගත්කම හඳුනා ගනිමින්, ශ්‍රී.ලං.සි.ගු.සේ.අ. විසින් පැහැර ගැනීම් සහ ප්‍රාණ ඇපකරුවන් මුදවා ගැනීම වැනි තීරණාත්මක සිදුවීම් කළමනාකරණය කිරීම සඳහා පුහුණුව ලද ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන්ගෙන් සමන්විත ප්‍රාණ ඇපකරුවන් මුදවා ගැනීමේ සාකච්ඡා කණ්ඩායමක් පිහිටුවා ඇත. මෙම විශේෂිත ඒකකය මගින් ශ්‍රී.ලං.සි.ගු.සේ.අ. ගුවන් මගීන්ගේ, ගුවන් කාර්ය මණ්ඩලයේ සහ ගුවන් තොටුපල කාර්ය මණ්ඩලයේ ආරක්ෂාව සලසමින් ආරක්ෂිත සහ ප්‍රත්‍යස්ථිතික ගුවන්සේවා පරිසරයක් සහතික කිරීමේ කැපවීම අවධාරණය කරයි.

තවද ශ්‍රී.ලං.සි.ගු.සේ.අ., ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා පිළිබඳ සම්මුතිය (චිකාගෝ සම්මුතිය) යටතේ ජාත්‍යන්තර ප්‍රමිතීන් සහ බැඳීම්වලට අනුකූලව, ස්වාධීන ගුවන්යානා අනතුරු විමර්ශන කාර්යාංශයක් (ස්.ගු.අ.වි.කා.) පිහිටුවීමෙහි සක්‍රීයව නියැලී සිටී. ස්.ගු.අ.වි.කා. සඳහා ව්‍යවස්ථාදායක අනුමැතිය බලාපොරොත්තුවෙන් සිටින අතරතුර, ශ්‍රී.ලං.සි.ගු.සේ.අ. විසින් ගුවන්

අනතුරු සහ සිද්ධීන් පිළිබඳ අපක්ෂපාතී සහ පරිපූර්ණ විමර්ශනයක් සිදු කිරීම සහතික කිරීම සඳහා ගත යුතු අතුරු පියවර යෝජනා කර ඇත. විශේෂඥයන්ගෙන් සමන්විත මණ්ඩල පත් කිරීම, පුහුණු වැඩසටහන් දියත් කිරීම සහ ජාත්‍යන්තර නියෝජිතායතන සමඟ සහයෝගීතා හවුල්කාරිත්වයන් ඇති කිරීම වැනි ශ්‍රී ලංකාව තුළ ශක්තිමත් අනතුරු විමර්ශන රාමුවක් සඳහා අඩිතාලම සැකසීම මෙම ක්‍රියාමාර්ගවලට ඇතුළත් වේ.

ශ්‍රී.ලං.සි.ගු.සේ.අ. විසින් අත්‍යවශ්‍ය ගුවන්සේවා, ගොඩබිම් හැසිරවීම, ගුවනේදී ආහාර සැපයීම සහ ගුවන්සේවා ආරක්ෂාව සහතික කිරීම සඳහා වන දැඩි ප්‍රමිතීන් අඛණ්ඩව පවත්වාගෙන යයි. ශ්‍රී.ලං.සි.ගු.සේ.අ. සවිස්තරාත්මක විගණන සහ ඇගයීම් හරහා, සේවා සපයන්නන් ඉහළ මට්ටමේ ආරක්ෂණය, ගුණාත්මකභාවය සහ විශ්වසනීයත්වය පවත්වා ගනිමින් දැඩි නියාමන අවශ්‍යතාවලට අනුකූලව කටයුතු කරන බව සහතික කරයි. ශ්‍රී.ලං.සි.ගු.සේ.අ. ගුවන්සේවා සහතික කිරීම තුළින් ගුවන්ගමන් සේවා සමාගම්, මගීන් සහ කර්මාන්ත පාර්ශ්වකරුවන් අතර දැඩි විශ්වාසය වර්ධනය කර ගනිමින් ගුවන් ගමන් සහ භාණ්ඩ මෙහෙයුම් සඳහා ශ්‍රී ලංකාව වඩාත් ප්‍රියතම ගමනාන්තයක් ලෙස ස්ථානගත කිරීමට කටයුතු කරයි.

තවද, ශ්‍රී.ලං.සි.ගු.සේ.අ. "පරීක්ෂක සහතික" ප්‍රමිතිකරණය සහ ජාතික සිවිල් ගුවන්සේවා පරීක්ෂක සහතිකය හඳුන්වාදීම හරහා සිය ශ්‍රම බලකායේ වෘත්තීයත්වය සහ නිපුණතාවය ඉහළ නැංවීමට කැපවී සිටියි. ශ්‍රී.ලං.සි.ගු.සේ.අ. විසින් අඛණ්ඩ පුහුණුව, පිළිගැනීම සහ වෘත්තීය සංවර්ධන අවස්ථා ලබා දීම මගින් ආරක්ෂණ අධීක්ෂණය, නියාමන අනුකූලතාව සහ මෙහෙයුම් විශිෂ්ටත්වය පිළිබඳ ඉහළම ප්‍රමිතීන් තහවුරු කිරීමට එහි පරීක්ෂකවරුන් බල ගන්වා ඇත. අඛණ්ඩ වැඩිදියුණු කිරීම් සහ නවෝත්පාදනයන්ගේ මෙහෙයවීමෙන් ශ්‍රී ලංකාවේ ගුවන්සේවා කර්මාන්තය ගෝලීය හොඳම භාවිතයන් අතර ඉදිරියෙන්ම තිබෙන බව මෙම මූලපිරීම් හරහා සහතික කිරීම ශ්‍රී.ලං.සි.ගු.සේ.අ. අරමුණයි.

ගුවන්සේවා සහ ආරක්ෂණය වැඩිදියුණු කිරීම සඳහා අපගේ ප්‍රයත්නයේ කොටසක් ලෙස, අපි ගුවන්සේවා සහ සමුද්‍රීය සෙවුම් සහ ගලවා ගැනීමේ මෙහෙයුම් සම්බන්ධීකරණය වැඩි දියුණු කිරීම අරමුණු කරගත් ජාතික ගගනයාත්‍රික සෙවීම් සහ මුදාගැනීමේ සැලැස්ම (ජා.ග.ස.සෙ.මු.සැ.) සකස් කර ඇත. ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා පිළිබඳ සම්මුතිය, මුහුදේදී ජීවිත ආරක්ෂණ සම්මුතිය (මු.ජී.ආ.ස.) සහ මුහුදු නීතිය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය (මු.නී.පි.ඒ.ජා.ස.) වැනි විවිධ ජාත්‍යන්තර සම්මුතීන් යටතේ ඔවුන්ගේ සෙවීම් සහ ගලවා ගැනීමේ (සේ. ස. ග.) අවශ්‍යතා සපුරාලීමට සහ ප්‍රයත්නයන් ඉටු කිරීමට ජා.ග.ස.සෙ.මු.සැ. පාර්ශවකරුවන්ට සහාය වේ. ජා.ග.ස.සෙ.මු.සැ. හරහා ශ්‍රී ලංකාව ගුවන්සේවා හදිසි අවස්ථා සඳහා හොඳින් සැලසුම් කරන ලද සහ කාර්යක්ෂම ප්‍රතිචාර



ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් සහ ප්‍රධාන විධායක නිලධාරිතුමාගේ සමාලෝචනය

දැක්වීමේ හැකියාවක් ස්ථාපිත කිරීමට අපේක්ෂා කරයි. මෙම සැලැස්ම එනම් ශ්‍රී.ලං.සි.ගු.සේ.අ. ගුවන්සේවා සෙවීම් සහ ගලවා ගැනීමේ ප්‍රතිපත්තියේ මූලික දියත් කිරීම, 2023 ජනවාරි 10 දින ජාතික ගගනයාත්‍රික සෙවීම් සහ මුදාගැනීමේ කමිටුවේ සම සභාපතිවරුන් සහ අනෙකුත් ප්‍රධාන පාර්ශවකරුවන් විසින් නිල වශයෙන් ප්‍රකාශයට පත් කරන ලදී. සැලැස්ම ප්‍රකාශයට පත් කිරීමෙන් පසුව රජයේ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද අතර කැබිනට් අනුමැතිය ලැබීමෙන් පසු පාර්ලිමේන්තු අනුමැතිය ලැබීමට නියමිතය.

ගුවන් ආරක්ෂණ පද්ධතිවල සහ රාජ්‍ය අධීක්ෂණ හැකියාවන්හි සැලකිය යුතු දියුණුවක් පිළිබිඹු කරමින් 2023 මැයි මාසයේදී ශ්‍රී ලංකාව ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානයේ විශ්ව ආරක්ෂක විගණන වැඩසටහනේ අබණ්ඩ අධීක්ෂණ ප්‍රවේශ විගණනය සඳහා 92%ක කැපී පෙනෙන අගයක් වාර්තා කිරීමට සමත් විය. ජා.සි.ගු.සේ.ස. හි ගුවන් ආරක්ෂණ විශේෂඥයින් විසින් සිදු කරන ලද මෙම විගණනය මගින් අපගේ නියාමන රාමුව, ජාතික ප්‍රතිපත්ති, ගුවන් තොටුපල ආරක්ෂණ වැඩසටහන් සහ ක්‍රියා පටිපාටි තරයේ ඇගයීමට ලක් කරන ලදී. මෙම කැපී පෙනෙන ප්‍රතිඵලය අපව ආසියා පැසිෆික් කලාපයේ ප්‍රමුඛතම නියාමන ආයතන සමඟ සම තත්ත්වයට ගෙන ඒමට සමත් විය.

දීර්ඝ ආරක්ෂණ නිෂ්කාශන කාලය හේතුවෙන් පියාසර පාසල්වලට විදේශ සිසුන් බඳවා ගැනීමේදී ඇති වූ අභියෝගවලට මුහුණ දීම සඳහා අපි ආරක්ෂක අමාත්‍යාංශය (ආ.අ.) සහ ජාතික බුද්ධි ප්‍රධානියා (ජා.බු.ප්‍ර.) සමඟ එක්ව නව ආරක්ෂණ නිෂ්කාශන පටිපාටියක් හඳුන්වා දුන්නෙමු. මෙම විධිමත් ක්‍රියාවලිය යටතේ, අයදුම්කරුවන් තම ලේඛන ජාතික බුද්ධි ප්‍රධානියාගේ කාර්යාලයට ඉදිරිපත් කර දින 14ක් ඇතුළත තාවකාලික නිෂ්කාශනය නිකුත් කර සිසුන්ට තම බිම් පුහුණුව කඩිනමින් ආරම්භ කිරීමට ඉඩ සලසන අතර සම්පූර්ණ ආරක්ෂණ නිෂ්කාශනය ඊට සමගාමීව සිදු කරනු ලබයි.

දේශගුණික විපර්යාසවල බලපෑම හඳුනා ගනිමින්, පාරිසරික අවදානම් අවම කිරීම සහ තිරසාරභාවය ප්‍රවර්ධනය කිරීම උදෙසා අපි හරිත ගුවන්සේවා ප්‍රතිපත්තියක් සකස් කර ඇත්තෙමු. පාරිසරික අබණ්ඩතාව සහ තරඟකාරිත්වය පවත්වා ගනිමින් ශ්‍රී ලංකා ගුවන්සේවා කර්මාන්තයේ වර්ධනය සහතික කිරීම සඳහා පැහැදිලි අරමුණු සහ මාර්ගෝපදේශ මෙම ප්‍රතිපත්තිය මගින් සංක්ෂිප්ත කර ඇත. එය ජාතික හා ජාත්‍යන්තර බැඳීම් සමඟ පෙළ ගැසෙන අතරම ඉදිරි වසර 30 තුළ තිරසාර සංවර්ධනය සඳහා වන උපාය මාර්ගයන්ට සහාය දක්වයි.

හිඟුරක්ගොඩ ගුවන් තොටුපල ජාත්‍යන්තර ප්‍රමිතියට සංවර්ධනය කිරීමේ කැබිනට් තීරණය මත, රේඩීය අමාත්‍යාංශය ආරක්ෂක අමාත්‍යාංශය සමඟ එක්ව සිදු කරනු ලබන එම සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය තාක්ෂණික විශේෂඥ දැනුම ලබා දෙන ලෙස මෙම අධිකාරියට නියෝග කර ඇත.

මගේ මගපෙන්වීම යටතේ අපගේ ජ්‍යෙෂ්ඨ තාක්ෂණික කාර්ය මණ්ඩලය, දෙවන ධාවන පථයක් ඉදිකිරීම වෙනුවට බ.ජා.ගු. හි කුලීරථ පිටවීමේ කඩිනම් මාර්ගයක් (කු.පි.ක.මා.) ක්‍රියාත්මක කිරීමට යෝජනා කරන සංකල්ප පත්‍රිකාවක් සකස් කර ඇත. ජාත්‍යන්තර හොඳම භාවිතයන් සමඟ මුසුව ගුවන් ගමන් මෙහෙයුම්, ඉන්ධන කාර්යක්ෂමතාව සහ පාරිසරික තිරසාරභාවය වැඩිදියුණු කිරීම මෙම පිරිවැය ඵලදායී සහ තිරසාර විසඳුමේ අරමුණ වේ.

ගුවන් තොටුපල අධ්‍යාපනික වැඩමුළු වැඩිදියුණු කිරීම සඳහා අප ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව සමඟ සහයෝගීතා ගිවිසුමක් ඇති කර ගෙන ඇත. මෙම මූලපිරීමේ අරමුණ වන්නේ ගුවන්සේවා කර්මාන්තය පිළිබඳ අවබෝධයක් ලබාදීම සහ එහි පවතින රැකියා අවස්ථා පිළිබඳව සිසුන් දැනුවත් කිරීමයි. ජාතික රූපවාහිනිය මගින් ප්‍රචාරණය කරන අයදුම්පත් සහ ස්වයංක්‍රීය තේරීම් ක්‍රියාවලියකින් තෝරා ගත් පාසල් සිසුන් කණ්ඩායම් 10 ක් දක්වා මෙම වැඩමුළු සඳහා සහභාගී වේ. ගුවන්සේවා අධ්‍යාපනයට පුළුල් ප්‍රවේශයක් සහතික කරමින් මෙම වැඩමුළු රට පුරා විකාශනය කෙරේ.

මෙහෙයුම් ආදායම (රු. මිලියන 3,685.22 සිට රුපියල් මිලියන 4,267.57 දක්වා) සහ මෙහෙයුම් නොවන ආදායම (රු. මිලියන 583.08 සිට රු. මිලියන 1,263.07 දක්වා) යන දෙකෙහිම වැඩිවීම හේතුවෙන්, වාර්තාකරණ කාලය තුළ අපගේ මුළු ආදායම රුපියල් මිලියන 4,268.30 සිට රුපියල් මිලියන 5,530.64 දක්වා ඉහළ ගියේය.

වියදම් පිළිබඳව අපි විචක්ෂණශීලී මූල්‍ය කළමනාකරණයක් පවත්වා ගෙන ගිය අතර මුළු වියදම් රුපියල් මිලියන 880.54 සිට රුපියල් මිලියන 973.44 දක්වා මධ්‍යස්ථ වශයෙන් වැඩිවීමක් පමණක් සිදු විය. ශ්‍රම බලකායේ කාර්යක්ෂමතාවය ප්‍රශස්ත කිරීම කෙරෙහි අපගේ අවධානය පිළිඹිබු කරමින් කාර්ය මණ්ඩල වියදම් රුපියල් මිලියන 457.97 සිට රුපියල් මිලියන 432.94 දක්වා සුළු වශයෙන් අඩුවීම කැපී පෙනේ. රැස්වීම්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු සඳහා වූ ආයෝජන රුපියල් මිලියන 7.51 සිට රුපියල් මිලියන 8.06 දක්වා සුළු වශයෙන් වැඩි වූ අතර, සේවක සංවර්ධනය සඳහා අපගේ කැපවීම අවධාරණය කරමින් පුහුණු කිරීම් වියදම් රුපියල් මිලියන 1.47 සිට රුපියල් මිලියන 9.66 දක්වා ඉහළ ගොස් ඇත. ක්ෂයවීම් සහ ක්ෂය කිරීම් සාපේක්ෂව ස්ථාවරව පවතිත්දී පරිපාලන සහ අනෙකුත් වියදම් රුපියල් මිලියන 260.89 සිට රුපියල් මිලියන 365.42 දක්වා සැලකිය යුතු ලෙස වැඩි වීමක් සිදු වී ඇත. අපගේ මෙහෙයුම් ක්‍රියාකාරකම් සහ උපායමාර්ගික මූලපිරීම් වලට සහාය වීම සඳහා මෙම ආයෝජන අත්‍යවශ්‍ය විය.

අපගේ බදු ගෙවීමට පෙර ලාභය රුපියල් මිලියන 3,387.76 සිට රුපියල් මිලියන 4,557.20 දක්වා ඉහළ ගිය අතර, රුපියල් මිලියන 208.92 ක ආදායම් බදු වියදම්වලින් පසු, වර්ෂය සඳහා අපගේ ශුද්ධ ලාභය ආකර්ෂණීය ලෙස රුපියල් මිලියන 2,743.24 සිට රුපියල් මිලියන 4,348.28 ක ඉහළ ගොස් ඇත. මෙම කැපී පෙනෙන කාර්ය සාධනය අපගේ උපායමාර්ගික අවධානය, මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ අපගේ සමස්ත කණ්ඩායමේ කැපවූ උත්සාහයන් පිළිබිඹු කරයි. අපි අපගේ ගමන් මග ගැන විශ්වාසයෙන් සිටින අතරම අපගේ පාර්ශවකරුවන්ට තිරසාර වර්ධනයක් සහ වටිනාකමක් ලබා දීමට කැපවී සිටිමු.

වඩ වඩාත් අන්තර් සම්බන්ධිත සහ තරඟකාරී ගෝලීය ගුවන්සේවා කර්මාන්තය තුළ, සහයෝගීතාවය සහ හවුල්කාරිත්වය, වර්ධනය සහ නව්‍යකරණයන් සඳහා තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. ශ්‍රී.ලං.සි.ගු.සේ.අ. රාජ්‍ය ආයතන, කර්මාන්තයේ හවුල්කරුවන්, ජාත්‍යන්තර සංවිධාන සහ විද්වතුන් සමඟ දැනුම හුවමාරු කර ගැනීමට, හොඳම භාවිතයන් බෙදා හදා ගැනීමට සහ ගුවන්සේවා

පද්ධතිය තුළ සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීමට සක්‍රීයව සහයෝගය දක්වයි. ශ්‍රී.ලං.සි.ගු.සේ.අ. උපායමාර්ගික සන්ධාන සහ නියැලීමේ වේදිකා හරහා, සම්බන්ධතාව වැඩි දියුණු කිරීම, නවෝත්පාදනයන් පෝෂණය කිරීම, අදහස් සහ විශේෂඥ දැනුම හුවමාරු කර ගැනීම මගින් ශ්‍රී ලංකාව ගෝලීය ගුවන්සේවා ප්‍රජාව තුළ ප්‍රධාන සාමාජිකයෙකු ලෙස ස්ථානගත කිරීමට කටයුතු කරයි.

අපි අනාගතය දෙස බලන විට, ශ්‍රී.ලං.සි.ගු.සේ.අ. ශ්‍රී ලංකාවේ ගුවන්සේවා අංශය තුළ ආරක්ෂණය, කාර්යක්ෂමතාව සහ විශිෂ්ටත්වය ප්‍රවර්ධනය කිරීමේ සිය මෙහෙවරට කැපවී සිටියි. ශ්‍රී.ලං.සි.ගු.සේ.අ. උපායමාර්ගික සැලසුම්කරණය, නියාමන අධීක්ෂණය සහ පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය තුළින් නව්‍යකරණයන් ඉදිරියට ගෙනයාම, සහයෝගීතාව වර්ධනය කිරීම සහ වර්ධනය සහ සංවර්ධනය සඳහා නව අවස්ථා විවෘත කිරීම සිදු කරනු ඇත. ශ්‍රී.ලං.සි.ගු.සේ.අ. තිරසාරභාවය, තාක්ෂණය සහ නවෝත්පාදනයන් වැලඳ ගැනීමෙන් ශ්‍රී ලංකාවේ ගුවන්සේවා කර්මාන්තය අනාගතයේදී ඉක්මනින් යථා තත්වයට පත් කල හැකි, තරඟකාරී සහ සාර්ථකත්වය සඳහා සූදානම්ව පවතින බව සහතික කරනු ඇත.

අවසාන වශයෙන්, ශ්‍රී.ලං.සි.ගු.සේ.අ. හි අරමුණු ඉදිරියට ගෙන යාම සඳහා ඔවුන් ලබාදුන් නොසැලෙන සහයෝගය සහ කැපවීම වෙනුවෙන් මම රාජ්‍ය ආයතන, කර්මාන්තයේ හවුල්කරුවන්, ගුවන්සේවා වෘත්තිකයන් සහ සියළුම ප්‍රජාව ඇතුළු සියලුම පාර්ශ්වකරුවන්ට මගේ අවංක ප්‍රශංසාව පුද කරමි. ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා සඳහා වඩා දීප්තිමත් හා සමෘද්ධිමත් අනාගතයක් හැඩගස්වා ගැනීමට අනාගත අභියෝග සහ අවස්ථාවන් සඳහා අපි එක්ව මග හසර සොයා ඉදිරියට සැරිසරමු.

ගරු වරාය, නාවික හා ගුවන්සේවා අමාත්‍යවරයා, අමාත්‍යාංශයේ ලේකම් සහ එහි සියලුම නිලධාරීන්, ඔවුන් ලබා දුන් උපදෙස්, මගපෙන්වීම සහ සහයෝගීතාවය වෙනුවෙන් ගෞරවයෙන් සිහිපත් කරමි.



පී.ඒ. ජයකාන්ත
සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල් සහ ප්‍රධාන විධායක නිලධාරී
ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය



අධ්‍යක්ෂ මණ්ඩලය
සිවිල් ගුවන්සේවා අධිකාරියෙහි සාමාජිකයන්

ශ්‍රී ලංකා ගුවන්සේවා අධිකාරියෙහි (CAASL) 14 වන අධ්‍යක්ෂ මණ්ඩලය

01. ජී.එස්. විතානගේ මහතා
සභාපති
CAASL හි සාමාජික - පත් කළ
(2023/01/14 සිට වර්තමානය දක්වා)

02. ඩී. ඩබ්. එස්. නාරංගොඩ මහතා
උප සභාපති
CAASL හි සාමාජික - පත් කළ
(2023/02/22 සිට වර්තමානය දක්වා)

03. එයාර් වයිස් මාර්ෂල් එච්. එම්. එස්. කේ. බී. කොටකාදෙණිය මහතා (විශ්‍රාමික)
CAASL හි සාමාජික - පත් කළ
(2022/08/12 සිට වර්තමානය දක්වා)

04. කපිතාන් මිලින්ද රත්නායක මහතා
CAASL හි සාමාජික - පත් කළ
(2022/08/12 සිට වර්තමානය දක්වා)

05. මංගල විජේසිංහ මහතා
CAASL හි සාමාජික - පත් කළ
(2023/01/10 සිට වර්තමානය දක්වා)

06. ජනරාල් කමල් ගුණරත්න මහතා (විශ්‍රාමික)
ආරක්ෂක විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශ ලේකම්
CAASL හි සාමාජික - (නිල බලයෙන් සාමාජික)
(2019/11/19 සිට වර්තමානය දක්වා)

07. ඒ. කේ. සෙනෙවිරත්න මහතා
මූදල් විෂයභාර අමාත්‍යවරයා විසින් නම් කරන ලද අමාත්‍යවරයාගේ නියෝජිත
CAASL හි සාමාජික - (නිල බලයෙන් සාමාජික)
(2022/08/18 සිට වර්තමානය දක්වා)

08. ජී. ඒ. ජයකාන්ත මහතා
ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල් සහ ප්‍රධාන විධායක නිලධාරී
CAASL හි සාමාජික - (නිල බලයෙන් සාමාජික)
(01/08/2022 සිට වර්තමානය දක්වා)




04
07
06
01
08

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය පිළිබඳ විග්‍රහය
ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය පිළිබඳ හැඳින්වීම

“අපගේ මූලික පරමාර්ථය වන්නේ, සිවිල් ගුවන්සේවා මෙහෙයුම්වල දී ආරක්ෂාව, සුරක්ෂිතතාව, කාර්යක්ෂමතාව, සහ තිරසාරභාවය සහතික කිරීම සහ කර්මාන්තයෙහි අඛණ්ඩතාවත්, විශ්වාසනීයත්වයත් පවත්වා ගැනීම ය.”

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය වශයෙන් අපි අප රටෙහි ගුවන්සේවා අංශය අධීක්ෂණය කරමින් නියාමනය කරන්නෙමු. අපගේ මූලික පරමාර්ථය වන්නේ, සිවිල් ගුවන්සේවා මෙහෙයුම්වල දී ආරක්ෂාව, සුරක්ෂිතතාව, කාර්යක්ෂමතාව, සහ තිරසාරභාවය සහතික කිරීම සහ කර්මාන්තයෙහි අඛණ්ඩතාවත් විශ්වාසනීයත්වයත් පවත්වා ගැනීම ය. ආරක්ෂණ රෙගුලාසි, සහතික, බලපත්‍ර, ගගන යාත්‍රාංගණ අධීක්ෂණය, ගුවන් සංතරණ සේවා, ගුවන්සේවාවේ සුරක්ෂිතතාව, පාරිසරික ආරක්ෂාව සහ ආර්ථික අධීක්ෂණය ඇතුළු පුළුල් පරාසයක විහිදුණු ක්ෂේත්‍ර ආවරණය කරන්නෙමු.


දැඩි ආරක්ෂණ රෙගුලාසි සහ සම්මත ක්‍රියාවට නංවන අපි අනුකූලතාව සහතික කිරීම උදෙසා නිරන්තර පරීක්ෂණ සහ විගණන පවත්වමින් ගුවන්සේවා අංශය තුළ ආරක්ෂාව වර්ධනය කරන්නෙමු. දැඩි පරීක්ෂණ කාර්ය පටිපාටි, වැඩි දියුණු කළ අධීක්ෂණ පද්ධති සහ නිරන්තර ආරක්ෂක අභ්‍යාස ඇතුළු ශක්තිමත් ආරක්ෂක පියවර ස්ථාපිත කිරීමෙහි ලා අපි අදාළ අධිකාරි සමඟ සමීප ව කටයුතු කරන්නෙමු.

සමස්ත කාර්යක්ෂමතාව වර්ධනය කරගැනීම සඳහා, අපි ක්‍රියාවලි සහ කාර්ය පටිපාටි විධිමත් කිරීම, ගුවන් පාලක කළමනාකරණ පද්ධති ප්‍රශස්තකරණය කිරීම මෙන් ම, උසස් තාක්ෂණ කටයුතු ක්‍රියාත්මක කිරීම ද සිදු කරන්නෙමු. අපි ගුවන්සේවාවේ දී සිදු වන පාරිසරික බලපෑම අවම කිරීමට කැප වී සිටින අතර, පරිසර හිතකාමී පිළිවෙත් අනුගමනය කිරීම, ඉන්ධන කාර්යක්ෂමතා මෙහෙයුම් දියත් කිරීම, ශබ්ද දූෂණය අවම කිරීම සහ අපද්‍රව්‍ය කළමනාකරණ උපායමාර්ග අනුගමනය කිරීම ප්‍රවර්ධනය කරන්නෙමු.

එසේ ම, සාධාරණ සහ තරගකාරී පරිසරයක් සහතික කරමින් මිලකරණය, තරගකාරීත්වය සහ වෙළෙඳපොළ ප්‍රවේශය වැනි ආර්ථික අංග ද අපි නිරීක්ෂණය කරමින් නියාමනය කරන්නෙමු. අපි ආර්ථික තක්සේරු පවත්වමින් ද වෙළෙඳපොළ ප්‍රවණතා විශ්ලේෂණය කරමින් ද, සෞඛ්‍යසම්පන්න තරගකාරීත්වයක් සහ තිරසාර වර්ධනයක් ප්‍රවර්ධනය කෙරෙන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරමින් ද ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනයට සහ පුරවැසියන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීමට දායකත්වය දක්වන්නෙමු.

අපගේ කාර්යභාරය ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානය (ICAO) විසින් අනුමත කරන ලද ජාත්‍යන්තර සම්මත සහ භාවිත අනුගමනය කරමින් සකස් කරන ලද 2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරි පනත සහ 2010 අංක 14 දරන සිවිල් ගුවන්සේවා පනත මඟින් අර්ථ දැක්වේ. අපගේ පාලන ව්‍යුහය සිවිල් ගුවන්සේවා විෂය භාර අමාත්‍යවරයා විසින් පත් කරන ලද සාමාජිකයන් පස් දෙනෙකු, ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්ල මුදල් විෂය භාර අමාත්‍යවයාගේ නියෝජිතයෙකු සහ සිවිල් ගුවන්සේවා අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ඇතුළු නිල බලයෙන් පත් සාමාජිකයන්ගෙන් ද ඇතුළත් අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයන් අට දෙනෙකුගෙන් සමන්විත වේ. අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලබන සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා ප්‍රධාන විධායක නිලධාරි වශයෙන් කටයුතු කරන අතර, සභාපතිවරයා සහ උප සභාපතිවරයා අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබෙති. පත් කරන ලද සාමාජිකයන්ගේ ධූර කාලය වසර තුනකි.

අපගේ විස්තීර්ණ නියාමන කාර්යභාරය හරහා අපි ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනයට සහ ජීවන තත්ත්වය උසස් කිරීමට දායකත්වය සපයමින් ගුවන්සේවා අංශය නඟා සිටුවීමට උත්සාහ දරන්නෙමු.



දැක්ම

සැමට නිරුපද්‍රත අහසක් සහතික කරමින් ප්‍රවීණ සහ විශ්වාසනීය ගුවන්සේවා නිරුපද්‍රතතා නියාමකයකු බවට පත් වීම.



මෙහෙවර

උපායමාර්ගික සැලසුම්කරණය සහ ප්‍රබලකර නියාමනය මගින්, ජාත්‍යන්තර ප්‍රමිති සහ නිර්දේශිත පරිචයන් සමගත් ජාතික ව්‍යවස්ථාමය අවශ්‍යතා සමගත් අනුගත නිරුපද්‍රත, සුරක්ෂිත, කාර්යක්ෂම, ක්‍රමවත් සහ පරිසර හිතකාමී ජාතික සිවිල් ගුවන්සේවා පද්ධතියක් මෙහෙයවීම සුසාධනය කිරීම.

ආදර්ශ පාඨය

"සැමට නිරුපද්‍රත සහ කාර්යක්ෂම අහසක්"

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය පිළිබඳ විග්‍රහය

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය පිළිබඳ හැඳින්වීම

සිවිල් ගුවන්සේවා අධිකාරිය තුළ ක්‍රියාත්මකවන ඉලක්ක

- වාණිජ ගුවන්සේවා අංශයේ ඇතිවන දරුණු අනතුරු වැළැක්වීමට ආරක්ෂක පියවර ශක්තිමත් කිරීම.
- ගුවන්සේවාහි පැහැර ගැනීම් සහ සිවිල් ගුවන් සේවයේ නීති විරෝධී මැදිහත්වීම් වැළැක්වීමට නිසි ආරක්ෂක ක්‍රියාපිළිවෙත් ක්‍රියාත්මක කිරීම.
- ගුවන්සේවාහි සාමාන්‍ය අනතුරු අවම කිරීමට ආරක්ෂක පියවර ක්‍රියාත්මක කිරීම.
- ගුවන් තොටුපල පරිශ්‍රයේදී ඇතිවන ගුවන්සේවා ආශ්‍රිත දරුණු අනතුරු වළක්වා ගැනීමට ආරක්ෂිත පියවර ක්‍රියාත්මක කිරීම.
- ඉංජිනේරු/නඩත්තු වැඩමුළුවලට අදාළ අනතුරු අවම කිරීමට ආරක්ෂක ක්‍රියාපිළිවෙත් ශක්තිමත් කිරීම.
- ප්‍රායෝගික පියවර ඔස්සේ ගුවන් කටයුතුවල හානිකර අවස්ථා අවම කිරීම.
- ගුවන්යානා අදාළ වේලාවට පිටත්වීම සහතික කිරීමට කාර්යක්ෂමතාව ශක්තිමත් කිරීම.
- ගුවන් ගමන් අත්දැකීම වැඩිදියුණු කිරීමට සේවාවේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම.
- ආරක්ෂාව පවත්වා ගනිමින් ගුවන් තොටුපලවල තදබදය අවම කිරීමට සහ මගී පිරිසැකසුම් කටයුතු කඩිනම් කිරීමට ක්‍රියාමාර්ග ගැනීම.
- මෙහෙයුම් වියදම් අවම කිරීමට සහ ගුවන් ගමන්වලදී සිදුවන නාස්තිය අවම කිරීමට සැලසුම් ක්‍රියාත්මක කිරීම.
- ගුවන් ගමනාගමනයේ හානිකර පාරිසරික බලපෑම් අවම කිරීමට පියවර ක්‍රියාත්මක කිරීම.
- සිවිල් ගුවන් සේවයේ ප්‍රතිලාභ පිළිබඳව පාසල් දරුවන් දැනුවත් කිරීමට අධ්‍යාපනික වැඩසටහන් පැවැත්වීම.
- මීළඟ ගුවන් වෘත්තික පරපුර උදෙසා මඟ පෙන්වීමට සහ පුහුණුව ලබා දීමට වැඩසටහන් සූදානම් කිරීම.

ස්ථාවරය

අපට ඉහළින් පවතින ගුවන් අවකාශය, සමාජ ආර්ථික සංවර්ධනය සඳහා විභවයන්ගෙන් පොහොසත් ඉතා සාමාන්‍ය වටිනා පොදු සම්පතක් බැව් අපි තරයේ පිළිගනිමු. අපගේ ජාතියේ ප්‍රගතිය සහ සමෘද්ධිය වෙනුවෙන් පහසුකම් සැලසීම සඳහා පමණක් සීමා නොවෙමින් අනාගත පරම්පරාව උදෙසා ස්ථිර අවස්ථාවන් සහතික කරලීමට එහි සුපරීක්ෂාකාරී සහ වගකිවයුතු කළමනාකාරිත්වය වෙනුවෙන් සිවිල් ගුවන්සේවාවේ භාරකරු වශයෙන්, අපි පෙනී සිටිමු. මෙම සම්පත විචක්ෂණශීලීව යොදා ගැනීම සහතික කිරීම තුළින්, වර්තමාන ප්‍රතිලාභ මෙන්ම, මතු පරපුරේ අවශ්‍යතා සහ අභිලාෂ සුරකිනු ලබන තිරසාර ගුවන්සේවා පද්ධතියක් පිහිටුවාලීම අපගේ අරමුණයි.

අරමුණු

- ආරක්ෂාව සහ ආරක්ෂක ඉලක්ක සපුරා ගැනීම හෝ ඉක්මවා ගැනීම.
- සම්පත් නිසි ලෙස භාවිත කිරීම.
- වෘත්තීයභාවය සහ නිපුණතාවය පවත්වා ගැනීම.
- පුළුල් විශ්වසනීයත්වයක් සහ පිළිගැනීමක් අත්කර ගැනීම.
- ජයග්‍රහණ අඛණ්ඩව වර්ධනය කරලීම.
- සියලුම ක්‍රියාකාරකම්වල ඵලදායීතාව උපරිම කිරීම.
- ජාත්‍යන්තර ප්‍රමිතීන් සමඟ ඉහළ අනුකූලතාවයක් පවත්වා ගැනීම.
- සිවිල් ගුවන්සේවා සැලසුම් සහ සංවර්ධනය වෙනුවෙන් ප්‍රමුඛකත්වය ගෙන කටයුතු කිරීම.

අපේක්ෂිත ප්‍රතිඵල

- සිවිල් ගුවන්සේවා ක්ෂේත්‍රයේ ජාත්‍යන්තර බැඳීම්වලට රජය අනුගතවීම සහතික කිරීම සහ SARPS ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ඉහළ මට්ටමක් සාක්ෂාත් කර ගැනීමට ජාත්‍යන්තර ප්‍රමිති සහ නිර්දේශිත පිළිවෙත් අවධානයෙන් යුතුව ක්‍රියාත්මක කිරීම සහ බලාත්මක කිරීම.
- ශ්‍රී ලංකාවේ සිවිල් ගුවන්සේවා පද්ධතිය සම්බන්ධයෙන් ජාත්‍යන්තර පිළිගැනීම සහතික කරලීම, සම්බාධක හෝ සීමා කිරීම් නොමැති, ICAO මඟින් දක්වන්නාවූ ආරක්ෂිත ගැටළු පිළිබඳ නිසි අවධානය යොමු කිරීම.
- සිවිල් ගුවන්සේවාවන්හි ආරක්ෂාව, කාර්යක්ෂමතාව සහ විධිමත්භාවය සහ ගුවන් ප්‍රවාහන පද්ධතිය කෙරෙහි මහජන විශ්වාසය වැඩි දියුණු කිරීම.
- ගුවන්සේවා අංශය තුළ පාරිභෝගික තෘප්තිමත්භාවය ඉහළ නැංවීම.
- උපායමාර්ගික වැඩිදියුණු කිරීම් හරහා අධිකාරියේ මූල්‍ය කාර්යසාධනය වැඩි දියුණු කිරීම.

උපාය මාර්ග

- අදාළ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට සහ නිර්දේශිත පිළිවෙත්වලට අනුකූලව සමාජ වගකීම් ඉටු කරමින්, ව්‍යවස්ථාපිත කාර්යයන් වැඩිදියුණු කිරීම සහ ස්ථාවර ලෙස ක්‍රියාත්මක වීම සහතික කිරීම.
- අවධානය යොමු කළ යුතු ගුවන් අභියෝග සම්බන්ධයෙන් ඵලදායී විසඳුම් හඳුනාගෙන ක්‍රියාත්මක කිරීම.
- සංවිධානය තුළ ධනාත්මක වෙනස්කම් ප්‍රවර්ධනය කරලීමට විශේෂිත සංස්කෘතිය වෙනස් කිරීමේ මූලපිරීම් හඳුන්වා දීම.
- ගුවන්සේවා කර්මාන්තයේ පාර්ශවකරුවන් සමඟ සහයෝගීතාවය සහ හවුල්කාරිත්වය ශක්තිමත් කරලීම.
- බාහිරව සහ අභ්‍යන්තරව ඵලදායී සන්නිවේදනයකට පහසුකම් සලසමින් විනිවිදභාවයෙන් හා ස්ථාවරව කටයුතු කිරීම.
- සියලුම ලේඛන, ද්‍රව්‍ය සහ අභ්‍යන්තර ක්‍රියා පටිපාටිවල ඵලදායීතාවය සහ අනුකූලතාව පවත්වා ගැනීම.
- මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ ආරක්ෂණ ප්‍රමිතීන් වැඩි දියුණු කිරීම සඳහා නව්‍ය තාක්ෂණික විසඳුම් යොදා ගැනීම.
- වෙනස්වන කර්මාන්ත ප්‍රවණතා සහ අභියෝගවලට අනුවර්තනය වීමට නිරන්තර අධ්‍යයන සහ වෘත්තීය සංවර්ධන පසුබිමක් පවත්වා ගැනීම.

- පාරිසරික බලපෑම අවම කිරීමෙහිලා තිරසාර ගුවන්සේවා භාවිතයන් සඳහා පවතින අවස්ථා ගවේෂණය.
- පරිශීලක-හිතකාමී අතුරුමුහුණත් සහ විධිමත් ක්‍රියාවලි ක්‍රියාත්මක කිරීම තුළින් පාරිභෝගික අත්දැකීම වැඩි දියුණු කිරීම.
- හොඳම භාවිතයන් බෙදා ගැනීමට සහ ගෝලීය ගුවන්සේවා ප්‍රමිතීන් ප්‍රවර්ධනය කිරීමට ජාත්‍යන්තර සගයන් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.
- ගුවන්සේවා අංශයේ අභියෝග පිළිබඳ පුරෝකථන සහ ඊට විසඳුම් සෙවීම උදෙසා වූ පර්යේෂණ සහ සංවර්ධන මූලපිරිමිවලට ආයෝජනය කිරීම.
- මෙහෙයුම්වලට ඇති විය හැකි තර්ජන සහ බාධා අවම කිරීම සඳහා ඵලදායී අවදානම් කළමනාකරණ උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම.
- වඩාත් කැපීපෙනෙන සහ පරිපූර්ණ ගුවන්සේවා ශ්‍රම බලකායක් ඇති කරලීමට විවිධත්වය සහ පුළුල් මූලපිරීම් ක්‍රියාත්මක කිරීම.
- දියුණුව වෙනුවෙන් අදහස් සහ විසඳුම් ඔස්සේ දායක වීමට සේවකයින් දිරිමත් කරනු ලබන නවෝත්පාදන සහ නිර්මාණශීලී සංස්කෘතියක් ඇති කරලීම.

වටිනාකම්

- ගුවන්සේවා කටයුතුවල ආරක්ෂාවට ප්‍රමුඛත්වය ලබාදීම සහ ආරක්ෂිත පරිසරයක් ඇති කිරීම.
- අපගේ ගනුදෙනුකරුවන්ට සපයනු ලබන සියලුම සේවාවන්හි විශිෂ්ටත්වය පවත්වා ගැනීම.
- සිදු කරනු ලබන සෑම කාර්යයකදීම 'කළ හැකිය' යන ආකල්පය පවත්වා ගැනීම.
- අපගේ ක්‍රියාවන්වල විශ්වසනීයත්වය, යථාර්ථවාදය සහ අනුකූලතාව පවත්වා ගැනීම.
- අඛණ්ඩ වර්ධනයක් අත්කරගැනීමට විපර්යාසයන්ට මුහුණදීම.
- සාර්ථකත්වය ළඟා කර ගැනීමට සහ අභියෝග ජය ගැනීමට කණ්ඩායමක් ලෙස සහයෝගයෙන් කටයුතු කිරීම.
- විවෘත, අවංක සහ විනිවිදභාවයෙන් යුතු සන්නිවේදනයක් පවත්වා ගැනීම.
- සියලුම ක්‍රියාකාරකම්වල කාර්යක්ෂමතාව, ඵලදායිතාව සහ විධිමත්භාවය ප්‍රවර්ධනය කිරීම.
- සගයන් අතර විශ්වාසය, ගෞරවය සහ කණ්ඩායම් වැඩ කටයුතු පවත්වා ගැනීම.
- සැමගේ දායකත්වය අගය කිරීම.
- සමාජ වගකීම් සහ බැඳීම් ඉටු කිරීම.
- අපගේ කාර්යයේ සතුට සහ තෘප්තිය පවත්වා ගැනීම.
- ව්‍යාත්මක ප්‍රවේශයක් පවත්වා ගැනීම.
- ගෘහ පරිසරය සහ රාජකාරී පරිසරය සමබරව පවත්වා ගැනීම.

අංශ සහ ඒකක පිළිබඳ දළ විශ්ලේෂණය



ගගන යාත්‍රාංගන අංශය

ගගන යාත්‍රාංගන අංශය ශ්‍රී ලංකාවේ ගගන යාත්‍රාංගන සම්බධයෙන් ප්‍රධාන වශයෙන් වගකීම් දරන අතර ශ්‍රී ලංකාවේ සිවිල් ගගන යාත්‍රාංගනවලට අදාළ නියාමන සහ අධීක්ෂණ කටයුතු සම්බන්ධයෙන් සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල් (DGCA) වෙත සහය ලබා දෙයි. දැනට, ව්‍යවස්ථාපිත සේවා සපයන්නා විසින් මෙහෙයවනු ලබන සිවිල් ගගන යාත්‍රාංගන පහක් මෙම අංශයේ විෂය පථය යටතේ පවතී. ගගන යාත්‍රාංගන මෙහෙයුම්වල ආරක්ෂිතභාවය සහ කාර්යක්ෂමභාවය සහතික කිරීමට අංශය විසින් සිදු කරනු ලබන ප්‍රධාන ක්‍රියාකාරකමක්වන සිවිල් ගුවන්සේවා අධිකාරියේ (CAASL) සහතික කිරීමේ ක්‍රියාවලිය හරහා ගගන යාත්‍රාංගන හතරක් ජාත්‍යන්තර තත්ත්වය ලබා ගෙන ඇත.

ගොඩබිම් ගගන යාත්‍රාංගනවලට අමතරව, ශ්‍රී ලංකාවේ ජල ගගන යාත්‍රාංගනවල ආරක්ෂාව තහවුරු කිරීමද මෙම අංශය මඟින් සිදු කරනු ලබයි. ජල ගගන යාත්‍රාංගන වේකොළහක් ක්‍රියාත්මක වන අතර නිරීක්ෂණ ක්‍රියාකාරකම් මඟින් ඒවායේ ක්‍රියාකාරී තත්ත්වය සහ ක්‍රියාකාරකම් නියාමනය කර ඇත. සිවිල් ගගන යාත්‍රාංගන වටා පවතින බාධාකාරී සීමා කළමනාකරණය කිරීම මෙම අංශයට පැවරී ඇති තවත් වගකීමකි. එතුළින් ආරක්ෂිත ගගන යාත්‍රාංගන මෙහෙයුම්වලට බාධා ඇති නොවන අන්දමින් යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට සහ ශ්‍රී ලංකාවේ සියලුම ගගන යාත්‍රාංගනවල උපයෝගීතාවය උපරිම කිරීමට පහසුකම් සලසා ඇත. ගුවන්සේවා කර්මාන්තය නියාමනය කිරීම සහ වැඩිදියුණු කරලීමේ අරමුණින් ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානයේ (ICAO) ප්‍රකාශන මත පදනම් වූ ප්‍රමිති, මාර්ගෝපදේශ සහ ක්‍රියා පටිපාටි ගගන යාත්‍රාංගන අංශය මඟින් ක්‍රියාත්මක කරයි.

ගුවන් සන්තරණ සේවා අංශය

ගුවන් සන්තරණ සේවා අංශයේ (ANS) මූලික වගකීම වනුයේ ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානය (ICAO) විසින් පවත්වා ගෙන යනු ලබන අදාළ ජාත්‍යන්තර ප්‍රමිතීන් සහ නිර්දේශිත පිළිවෙත් (SARPs) අනුව කොළඹ ගුවන් ගමන් තොරතුරු කලාපය (Colombo FIR) තුළ ගුවන් සන්තරණ සේවා සැපයීම පාලනය කරන නීති රීති සැකසීම සහ එකී ප්‍රමිතීන් ශ්‍රී ලංකාවේ ගුවන් සන්තරණ සේවා සැපයුම්කරු විසින් සම්පාදනය කර ඇති බව සහතික කිරීමයි.



ගුවන්යානා ලියාපදිංචි සහ ගුවන් යෝග්‍යතා අංශය

ගුවන්යානා ලියාපදිංචි සහ ගුවන් යෝග්‍යතා අංශය වෙත අදාළ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට සහ නිර්දේශිත පිළිවෙත්වලට අනුකූලව ශ්‍රී ලංකාවේ සිවිල් ගුවන්යානා ලියාපදිංචි කිරීම සඳහා නීති රීති සහ ක්‍රියා පටිපාටිය සකස් කිරීමේ ප්‍රධාන වගකීම පැවරී ඇත. නඩත්තු පුහුණු සංවිධාන, අඛණ්ඩ ගුවන් යෝග්‍යතා කළමනාකරණ සංවිධාන සහ ගුවන්යානා නඩත්තු සංවිධාන සඳහා අනුමැතිය ප්‍රදානය කිරීම සහ ඒවායේ ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම එකී කාර්යභාරයට ඇතුළත් වේ.

පුහුණු සංවිධාන සහ පුද්ගල බලපත්‍ර අංශය

අදාළ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට සහ නිර්දේශිත පිළිවෙත්වලට අනුකූලව සිවිල් ගුවන්සේවා සම්බන්ධයෙන් ආරක්ෂක සංවේදී ක්‍රියාකාරකම්වල නියැලී සිටින පුහුණු ආයතන සහ පුද්ගලයන් සහතික කිරීම සහ අධීක්ෂණය සඳහා නීති, රීති සහ ක්‍රියා පටිපාටි සංවර්ධනය කිරීමේ වගකීම පුහුණු ආයතන සහ පුද්ගල බලපත්‍ර අංශය විසින් දරයි. අනතුරුදායක කටයුතුවල නිරතවන සේවා මණ්ඩලය වෙනුවෙන් බලපත්‍ර නිකුත් කිරීම, නැවත වලංගු කිරීම සහ අලුත් කිරීම සම්බන්ධයෙන් වූ ජාත්‍යන්තර ප්‍රමිතීන් සහ නිර්දේශිත භාවිතයන්ට අනුකූලවන ICAO ඇමුණුම 1 සහ දේශීය රෙගුලාසි යොදා ගැනීම ඔස්සේ පුහුණු සංවිධානයේ සහතික කිරීම සහ අඛණ්ඩ නිරීක්ෂණය සඳහා එය වගකීම දරයි.

ප්‍රධාන ක්‍රියාකාරී ක්ෂේත්‍ර පහක් පදනම් වූ බොහෝ කාර්යයන් මෙම අංශය වෙත පැවරී ඇත. නියාමන, බලපත්‍ර, පුහුණුව, විභාග සහ පරිපාලනය යනු එකී ක්ෂේත්‍ර වේ. CAASL හි TOPL අංශය මඟින් පියාසර කාර්ය මණ්ඩලය, ගුවන්යානා නඩත්තු පිරිස්, ගුවන් ගමනාගමන පාලකයින්, ගගනගාමී ස්ථාන ක්‍රියාකරුවන්, ගුවන් මෙහෙයුම් නිලධාරීන් සහ කැබින් කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා බලපත්‍ර ලබා දීම සිදු කරයි. මෙම අංශය මඟින් ගුවන් කාර්ය මණ්ඩල බලපත්‍ර, ගුවන්යානා නඩත්තු බලපත්‍ර, ගුවන්යානා පිටත් කිරීමේ බලපත්‍ර නිකුත් කිරීම සඳහා දැනුම විභාග පවත්වයි. තවද මෙම අංශය පියාසර පුහුණු සංවිධාන, ගුවන් ගමනාගමන පාලක පුහුණු සංවිධාන සහ ගුවන් ගමන් පිටත් කිරීමේ පුහුණු සංවිධාන සහතික කිරීම සම්බන්ධයෙන් කටයුතු කරයි. සහතික කළ පුහුණු සංවිධාන නිරීක්ෂණය සහ TOPL අංශය මඟින් නිකුත් කළ බලපත්‍ර නිරීක්ෂණය අංශයේ තවත් වගකීමකි. ඊට අමතරව, හදිසි අනතුරක් හෝ සිදුවීමක් විමර්ශනය කිරීමට සහ අවශ්‍ය විටදී සහයෝගය දැක්වීමට හෝ සහය වීමට TOPL අංශය කැඳවිය හැක.

ගුවන්සේවා ආරක්ෂක අංශය

ශ්‍රී ලංකාවේ සිවිල් ගුවන්සේවා මෙහෙයුම් සඳහා ආරක්ෂිත පරිසරයක් සහතික කිරීමට සියලුම ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා ආරක්ෂක ප්‍රමිතීන් සපුරාලන අයුරින් ජාතික සිවිල් ගුවන්සේවා ආරක්ෂක වැඩසටහන සංවර්ධනය කිරීම, පවත්වාගෙන යාම සහ ක්‍රියාත්මක කිරීම ගුවන්සේවා ආරක්ෂක අංශයේ මූලික අරමුණයි.

ගුවන් ප්‍රවාහන සහ ආර්ථික නියාමන අංශය

ගුවන් ප්‍රවාහන හා ආර්ථික නියාමන අංශය ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ ආයතනික කළමනාකරණ අංශය යටතේ ක්‍රියාත්මක අතර ශ්‍රී ලංකාවේ ගුවන්සේවා කර්මාන්තය නියාමනය කිරීමේ වගකීම් දරයි.

මානව සම්පත් සහ දේපළ කළමනාකරණ අංශය

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියෙහි රාජකාරි ඉටු කිරීම සඳහා සුදුසු පුද්ගලයන් සේවයේ යොදවා ඇති බවට මානව සම්පත් සහ දේපළ කළමනාකරණ අංශය (HRPM) මඟින් සහතික කරයි. තවද, ඒමඟින් CAASL හි ස්වකීය කාර්යසාධනය වැඩි දියුණු කර ගැනීමට සහ ඉදිරියට පවත්වාගෙන යාමට පුද්ගලයන්ට සහ සේවක පිරිසට පහසුකම් සැලසීමට සහ ඔවුන් පෙළඹවීමට අවස්ථා ලබා දෙයි. තවද මෙම අංශය අධිකාරියේ කාර්යාල පරිපාලනය සහ දේපළ කළමනාකරණය සම්බන්ධයෙන් වගකීම දරයි.

අංශ සහ ඒකක පිළිබඳ දළ විශ්ලේෂණය



මූල්‍ය සහ ආදායම් කළමනාකරණ අංශය

CAASL/රාජ්‍ය ප්‍රතිපත්ති, නීති රීති සහ ක්‍රියා පටිපාටිවලට අනුකූලව සීමිත මූල්‍ය සම්පත් කාර්යක්ෂමව, ඵලදායීව සහ ආර්ථිකව කළමනාකරණය කිරීමත්, ICASL විසින් ප්‍රකාශයට පත් කරන ලද පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව පොත් පවත්වාගෙන යාමත්, සත්‍ය සහ සාධාරණ තත්ත්වයේ මූල්‍ය ගිණුම් සැපයීමත් සඳහා මෙම අංශය වගකීම දරයි.

පරිසර, පර්යේෂණ සහ ව්‍යාපෘති අංශය

පරිසර, පර්යේෂණ සහ ව්‍යාපෘති අංශය මඟින් ගුවන්සේවා සම්බන්ධ පර්යේෂණ සිදු කිරීම, CAASL සංඛ්‍යා ලේඛන වැඩසටහන කළමනාකරණය කිරීම, CAASL හි විවිධ වැඩසටහන් පැවැත්වීම, භෞතික යටිතල පහසුකම් සංවර්ධනය, CAASL ලිපිලේඛන/වාර්තා/දැන්වීම් ප්‍රකාශනය කිරීම සහ ජාත්‍යන්තර ගුවන්සේවා (CORSIA) වැඩසටහන සඳහා කාබන් අඩු කිරීමේ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම යනාදිය කටයුතු සිදු කරනු ලැබේ. මෙම අංශය විසින් CAASL සඳහා වූ සියලුම ප්‍රසම්පාදන කටයුතු ද සිදු කරනු ලැබේ.

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ඒකකය

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියෙහි ව්‍යාපාරික සහ සේවා අවශ්‍යතා සපුරාලීම සඳහා කාර්යක්ෂම, සුරක්ෂිත, විශ්වසනීය සහ තිරසාර තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සැපයීම මෙම ඒකකය මඟින් සිදු කෙරේ.



තත්ත්ව සහ අභ්‍යන්තර විගණන අංශය

තත්ත්ව සහ අභ්‍යන්තර විගණන අංශය මඟින් CAASL හි අවදානම් කළමනාකරණය, පාලනය සහ අභ්‍යන්තර පාලන ක්‍රියාවලි ඵලදායී ලෙස ක්‍රියාත්මක වන බවට ස්වාධීන සහතිකයක් ලබා දෙන අතර, ගුණාත්මකභාවය පිළිබඳ වූ අවශ්‍යතා සපුරාලීම ද සහතික කෙරේ.

ගුවන්සේවා ආරක්ෂණ අධීක්ෂණ ඒකකය

ICAO ඇමුණුම 13 සහ ඇමුණුම 19 හි දැක්වෙන ජාත්‍යන්තර ප්‍රමිතීන් සහ නිර්දේශිත පිළිවෙත්වලට අනුකූලව ගුවන්යානා අනතුරු සහ සිද්ධි විමර්ශන සහ රාජ්‍ය ආරක්ෂණ වැඩසටහන (SSP) ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය වගකීම් සහතික කිරීම සහ රට තුළ නියමුවන් රහිත ගුවන් යාත්‍රා නියාමනය කිරීම, ගුවන්සේවා ආරක්ෂණ අධීක්ෂණ ඒකකයේ වගකීම වේ.

ගුවන් වෛද්‍ය සේවා ඒකකය

මෙම ඒකකය මඟින් CAASL බලපත්‍රලාභීන්ගේ වෛද්‍ය ඇගයීම් සඳහා පහසුකම් සැපයීම මෙන්ම, අනෙකුත් ප්‍රධාන විශේෂ ක්ෂේත්‍රවන ගුවන් වෛද්‍ය පුහුණුව, පර්යේෂණ, කාර්ය මණ්ඩලය සහ අනෙකුත් පාර්ශ්වකරුවන් අතර ගුවන් වෛද්‍ය විද්‍යාව පිළිබඳ දැනුවත්භාවය ඇති කිරීම, ප්‍රවේශ වීමේ ස්ථානවල මහජන සෞඛ්‍ය සේවා සිදු කිරීම, CAASL සේවාදායකයන්ගේ සහ කාර්ය මණ්ඩලයේ සුබසාධනය සහතික කරමින් CAASL හි අනෙකුත් අංශ සහ අනෙකුත් අදාළ පාර්ශ්වකරුවන් සමඟ නිරීක්ෂණ කටයුතු සහ පහසුකම් සැලසීමේ කටයුතු ආදිය ඇතුළත් විශාල ක්ෂේත්‍රයක් ආවරණය කෙරේ. තවද, ගුවන් වෛද්‍ය සේවා අංශය මඟින් රාජ්‍යයට සහ ගුවන්සේවා කර්මාන්තයට අභ්‍යවකාශ ආරක්ෂණ විසඳුම් සහ මහජන සෞඛ්‍ය ආරක්ෂණ විසඳුම් අඛණ්ඩව සපයනු ලබයි. ගුවන් වෛද්‍ය සේවා අංශයෙහි ක්‍රියාකාරකම්වල සියලුම පැතිකඩ මඟින් අභ්‍යවකාශ ආරක්ෂාව වැඩි දියුණු කිරීම මූලිකව අරමුණු කොට ඇත.

නෛතික කටයුතු සහ බලාත්මක කිරීමේ ඒකකය

නෛතික කටයුතු සහ බලාත්මක කිරීමේ ඒකකයේ (LA&E) ප්‍රධාන කාර්යභාරය වන්නේ CAASL හි නෛතික සහ බලාත්මක කිරීමේ කාර්යයන්ට අදාළ කටයුතු විධිමත් කිරීමයි. මෙම ඒකකය මූලික වශයෙන් ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සම්මුතීන් අනුමත කිරීම/ප්‍රතිග්‍රහණය, ගුවන්සේවා පිළිබඳ ප්‍රාථමික සහ අනුබද්ධ නීති සමාලෝචනය කිරීම, යාවත්කාලීන කිරීම සහ සංවර්ධනය කිරීම, CAASL හි බලාත්මක කිරීමේ ප්‍රතිපත්තිය ශක්තිමත් කිරීම සහ CAASL හි අයිතිවාසිකම් සහ අවශ්‍යතා හි ධාරිතාව සහ ආරක්ෂණය සම්බන්ධයෙන් කටයුතු කරයි.


සිවිල් ගුවන් සේවය ප්‍රවර්ධන සහ මාධ්‍ය ඒකකය


මහජනතාව අතර විශේෂයෙන් පාසල් සිසුන් ඇතුළු තරුණ පරම්පරාව අතර ගුවන්සේවා දැනුම වැඩි දියුණු කිරීම, ගුවන්සේවා සම්බන්ධ කාලීන මෙන්ම විශ්වාසදායක පුවත් ඉදිරිපත් කරමින් ප්‍රජාවේ දැනුවත්භාවය යාවත්කාලීන කිරීම සහ විද්‍යුත්, මුද්‍රිත සහ නව මාධ්‍ය වේදිකා හරහා ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම තුළින් ශ්‍රී ලංකාව තුළ ගුවන්සේවා පසුබිම පිහිටුවාලීමේ කාර්යභාර්යය සිවිල් ගුවන්සේවා ප්‍රවර්ධන ඒකකය වෙත පැවරී ඇත.

තාක්ෂණික පුස්තකාලය

CAASL හි තාක්ෂණික පුස්තකාලය, CAASL සහ දේශීය ගුවන්සේවා කර්මාන්තය තුළ අභ්‍යන්තර ලේඛන කළමනාකරණය, ICAO ප්‍රකාශන, අදාළ රෙගුලාසි, රජයේ ප්‍රකාශන සහ අනෙකුත් සාමාන්‍ය ලේඛන ප්‍රතිග්‍රහණය සහ බෙදා හැරීම සඳහා වගකීම දරයි. CAASL නිල වෙබ් අඩවියේ පරිපාලනය සහ අන්තර්ගත කළමනාකරණය, 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ දක්වා ඇති පරිදි මහජනතාව වෙත තොරතුරු ලබා දීම, ICAO සහ APAC රාජ්‍ය ලිපි සමඟ ලිපි හුවමාරුව කළමනාකරණය කිරීම සහ CAASL වෙනුවෙන් විශ්ව ආරක්ෂණ අධීක්ෂණ විගණන වැඩසටහන - අඛණ්ඩ අධීක්ෂණ ප්‍රවේශය (USOAP-CMA) හි පරිපාලනය කිරීම යන කටයුතු තාක්ෂණික පුස්තකාලය වෙත භාර දී ඇත.

මෙහෙයුම් සංවිධාන ව්‍යුහය - කළමනාකරණ කාර්ය මණ්ඩලය





Legends
SCAI – Senior Civil Aviation Inspector
Mgr. – Manager
CAI – Civil Aviation Inspector
AM – Assistant Manager

Rev 03 – 09/07/2023

නීල අවකාශයේ, හරිත අරමුණු



CAASL හි පාලනය සහ වගවීම

	පිටු අංක.
අධිකාරියේ කමිටු	27
CAASL හි පාලනය සහ වගවීම	28
අධිකාරියෙහි කාර්යභාරය	28
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්	28
අධ්‍යක්ෂ මණ්ඩලය සහ පාලනය	28
අධිකාරියේ විධායක බලතල	28
පාර්ශවකරුවන් සමඟ සම්බන්ධතාවය	28
අධිකාරියේ සහ ජ්‍යේෂ්ඨ කළමනාකාරිත්වයේ වගකීම	28
වගවීම	29
පිළිබැඳියා ගැටුම	29
ගුණාත්මකභාවය සහ අභ්‍යන්තර විගණනය	29
ව්‍යවස්ථාදායක අනුකූලතාවය	29
නෛතික කටයුතු සහ බලාත්මක කිරීමේ ක්‍රියාකාරකම්	30
ආචාර ධර්ම	31

අධිකාරියේ කමිටු

කාර්ය මණ්ඩල කමිටුව

අරමුණ : කාර්ය මණ්ඩල කමිටුව මඟින් CAASL හි මානව සම්පත්, ආයතනික සංවර්ධනය සහ සේවක සුභසාධනය සම්බන්ධ කරුණු අධීක්ෂණය කිරීමේ වගකීම දරයි.

සංයුතිය : ජී. එස් විතානගේ මහතා කමිටුවේ සභාපති වන අතර පී. ඒ් ජයකාන්ත මහතා සහ ඩී. ඩබ්ලිව්. එස් නාරංගොඩ මහතා එහි සාමාජිකයින් වේ.

වගකීම් : මාණ්ඩලික කමිටුව මඟින් වැටුප් සහ සේවක සංඛ්‍යාව තීරණය කිරීම, සේවක බඳවා ගැනීම් සහ උසස්වීම් සිදුකිරීම, විනය ක්‍රියා පටිපාටි සංවර්ධනය කිරීම, පුහුණු වැඩසටහන් අධීක්ෂණය කිරීම, සේවකයින් සඳහා විදේශීය පුහුණුව සහ ශිෂ්‍යත්ව අනුමත කිරීම සහ CAASL සේවකයින් වෙනුවෙන් සමාජ සහ සුබසාධන යෝජනා ක්‍රම සංවර්ධනය කිරීම ඇතුළත් වේ.

විගණන සහ කළමනාකරණ කමිටුව

අරමුණ : විගණන සහ කළමනාකරණ කමිටුව මඟින් CAASL හි මූල්‍ය කළමනාකරණය, අභ්‍යන්තර පාලන සහ විගණන කටයුතු අධීක්ෂණය කිරීම සිදු කරනු ලබයි.

සංයුතිය : ඒ්. කේ සෙනෙවිරත්න මහතා කමිටුවේ සභාපති වන අතර, (විශ්‍රාමික) AVM HMSKB කොටකදෙණිය මහතා, කපිතාන් මිලින්ද රත්නායක මහතා, එම්. එස් ගුණතිලක මහත්මිය, සහ අචලා පෙරේරා මහත්මිය එහි නිරීක්ෂකයින් ලෙස කටයුතු කරයි.

වගකීම් : අභ්‍යන්තර පාලන පද්ධති සමාලෝචනය කිරීම, පිරිවැය ඵලදායීතාවය සහතික කිරීමට කාර්ය සාධනය ඇගයීම, බාහිර විගණකවරුන් සමඟ සම්බන්ධ වීම, අනුකූලතා සඳහා මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම, විගණන වාර්තාවල නිර්දේශ ක්‍රියාත්මක කිරීම සහ වාර්ෂික වාර්තාවට ඇතුළත් කිරීම සඳහා වාර්තා සකස් කිරීම කමිටුවේ වගකීම් වේ.

සැලසුම් කමිටුව

අරමුණ : සැලසුම් කමිටුව මඟින් ශ්‍රී ලංකාවේ සිවිල් ගුවන්සේවා වැඩසටහන් සහ ක්‍රියාකාරකම්වල උපාය මාර්ගික සැලසුම්කරණය, ප්‍රතිපත්ති සංවර්ධනය සහ අධීක්ෂණය කෙරෙහි අවධානය යොමු කරයි.

සංයුතිය : කමිටුවේ සභාපති (විශ්‍රාමික) AVM HMSKB කොටකදෙණිය මහතා වන අතර කපිතාන් මිලින්ද රත්නායක මහතා සහ මංගල විජේසිංහ මහතා එහි සාමාජිකයින් වේ.

වගකීම් : සැලසුම් කමිටුව විසින් ජාතික සිවිල් ගුවන්සේවා ප්‍රතිපත්ති සහ සංවර්ධන සැලැස්ම සංවර්ධනය කිරීම, සිවිල් ගුවන්සේවා සම්බන්ධ නීති සම්පාදනය සමාලෝචනය කිරීම, ගුවන් ආරක්ෂක සහ ගුවන් ප්‍රවාහන පහසුකම් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ අධීක්ෂණය, සිවිල් හමුදා ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම, ගුවන්සේවා මෙහෙයුම් අධීක්ෂණය සහ ගුවන්සේවා සපයන්නන් අධීක්ෂණය කිරීම සිදු කරනු ලබයි.

CAASL හි පාලනය සහ වගවීම

අධිකාරියෙහි කාර්යභාරය

අධිකාරියේ ප්‍රධාන කාර්යභාරයට පහත සඳහන් දෑ ඇතුළත් වන අතර තවත් බොහෝ කාර්යභාර්යයන් විමඟින් ඉටු කරයි.

- සිවිල් ගුවන්සේවා විෂය භාර ගරු අමාත්‍යවරයා සහ අනෙකුත් රජයේ පාර්ශ්වකරුවන් සමඟ සන්නිවේදන කටයුතු පවත්වා ගනිමින් එකී අදහස් රටේ සිවිල් ගුවන්සේවා ක්ෂේත්‍රය සැලසුම් කිරීමේ දී ක්‍රියාත්මකවන බවට සහතික කිරීම.
- සිවිල් ගුවන්සේවා ක්ෂේත්‍රයේ ප්‍රතිපත්ති සහ ඉලක්ක සැකසීම සහ CAASL හි අරමුණු සාක්ෂාත් කර ගැනීමට ආයතනික කාර්යසාධනය අධීක්ෂණය කිරීම සහ සිවිල් ගුවන්සේවා ක්ෂේත්‍රය සම්බන්ධයෙන් රජයේ අරමුණු පිළිබිඹු කිරීමට CAASL ආයතනික සැලැස්ම අවශ්‍ය පරිදි යාවත්කාලීන කිරීම.
- CAASL හි ප්‍රධාන විධායක නිලධාරියාද වන සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජෙනරාල්වරයාගේ නිශ්චිත අරමුණු සාක්ෂාත් කරලීමට වගකීම පැවරීම.
- CAASL හි කාර්යයන් සහ රාජකාරි ඉටු කිරීමට හැකි වන පරිදි සුදුසුකම් ලත් සහ කුසලතා සපිරි පුද්ගලයන් සේවයේ යෙදවීම සහ ඔවුන්ගේ සේවා නියමයන් සහ කොන්දේසි නිර්ණය කිරීම.
- CAASL ආයතනික සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ සැලසුම් සහ ප්‍රගතිය පිළිබඳ සිවිල් ගුවන්සේවා කටයුතු විෂය භාර ගරු අමාත්‍යවරයාට වගවීම.

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්

වරාය, නාවික හා ගුවන්සේවා කටයුතු භාර ගරු අමාත්‍යතුමා විසින් 2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය පනත යටතේ ඔහුට පැවරී ඇති බලතල ප්‍රකාරව සිවිල් ගුවන්සේවා අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයට සාමාජිකයන් පත් කරන ලදී.

සභාපති සහ උප සභාපති ලෙස පිළිවෙලින් ජී. එස්. විතානගේ මහතා සහ ඩී. ඩබ්ලිව්. එස්. නරංගොඩ මහතා පත් කෙරිණි.

අධ්‍යක්ෂ මණ්ඩලය සහ පාලනය

CAASL හි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් ව්‍යාපාර සහ පරිපාලන, මූල්‍ය, නෛතික සහ ගුවන්සේවා කර්මාන්තය යන ක්ෂේත්‍ර හි මනා විශේෂඥතාවයකින් යුතු පිරිසකි. සිවිල් ගුවන්සේවා සම්බන්ධ ප්‍රතිපත්තිමය ගැටලු වෙනුවෙන් මෙකී කුසලතා සංකලනය මහත් පිටුවහලක් ලබා දේ.

පත් කරනු ලැබීමෙන් පසු, සියලුම සාමාජිකයන් සිවිල් ගුවන්සේවා අධිකාරියේ යහපත වෙනුවෙන් ක්‍රියා කරනු ඇතැයි අපේක්ෂා කරන අතර, අධිකාරිය එහි තීරණ සම්බන්ධයෙන් ඒකමතික විය යුතු බවත්, තනි තනි සාමාජිකයන්ට අධිකාරියෙන් පිටත වෙනම පාලන භූමිකාවක් නොමැති බවත් පිළිගත යුතුය.

අධිකාරිය විසින් යෝග්‍ය ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි ක්‍රියාත්මක කිරීමෙන් CAASL හි අරමුණු සාක්ෂාත් කරලීමට බලතල සහ කාර්යයන් පැවරීමෙන් ප්‍රධාන විධායක නිලධාරියා මෙහෙයවනු ලබයි. අධිකාරියේ ඉදිරි සැලසුම් එහි ත්‍රෛවාර්ෂික ආයතනික සැලැස්මට ඇතුළත් කර ඇති අතර, එය සෑම වර්ෂයකම ආරම්භයේ දී වාර්ෂික වැඩසටහන, පුහුණු වැඩසටහන, ප්‍රසම්පාදන වැඩසටහන, වැඩසටහන් අයවැය සහ විගණන වැඩසටහන හරහා ඵලදායී ලෙස අධීක්ෂණය කරනු ලැබේ. දැනට නිශ්චිත විධිවිධාන නොමැති සියලුම කරුණු සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා හරහා අධිකාරිය විසින් ප්‍රධාන විධායක නිලධාරිතුමා වෙත උපදෙස් ලබා දෙන අතර එවැනි යෝජනා බලාත්මක කිරීම ප්‍රධාන විධායක නිලධාරිතුමාගේ යුතුකම වේ.

අධිකාරියේ විධායක බලතල

2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය පනතට අනුව, අමාත්‍ය මණ්ඩලය විසින් සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජෙනරාල්වරයා පත් කරනු ලබන අතර, ඔහු සිවිල් ගුවන්සේවා අධිකාරියේ ප්‍රධාන විධායක නිලධාරිවරයා ලෙස ද ක්‍රියා කරයි. අධ්‍යක්ෂ ජනරාල්වරයා සඳහා සේවා නියුක්ති නියමයන් සහ කොන්දේසි අමාත්‍ය මණ්ඩලය විසින් ස්ථාපිත කරනු ලබයි. මෙකී භූමිකාව තුළ, ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය පනත හෝ වෙනත් අදාළ ලිඛිත නීති මඟින් නිශ්චිතව දක්වා ඇති සියලුම රාජකාරි සහ කාර්යයන් ඉටු කිරීම අධ්‍යක්ෂ ජනරාල්වරයාට පැවරී ඇත. මේ සඳහා අධිකාරියේ කාර්යයන්හි සමස්ත පරිපාලනය සහ කළමනාකරණය ඇතුළත් වේ.

අධ්‍යක්ෂ ජනරාල්වරයාට නීතියෙන් නියම කර ඇති පරිදි ව්‍යවස්ථාපිත කාර්යයන් ස්වාධීනව සිදුකිරීමේ අවශ්‍යතාවය අධිකාරිය පිළිගනී. එසේ වුවද, මෙකී රාජකාරි සහ වගකීම් ඉටු කරමින්, CAASL හි සම්පත් භාවිත කිරීමට අධ්‍යක්ෂ ජනරාල්වරයාට බලය ඇත, එය අනුමත ක්‍රියා පටිපාටි සහ මාර්ගෝපදේශයන්ට අනුකූල වේ. ව්‍යවස්ථාපිත අවශ්‍යතා සහ ස්ථාපිත ක්‍රියාපිළිවෙළ පිළිපැදීමෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයාට අධිකාරියේ මෙහෙයුම් ඵලදායී ලෙස කළමනාකරණය කළ හැකි බව මෙම විධිවිධානය සහතික කරයි.

පාර්ශවකරුවන් සමඟ සම්බන්ධතාවය

අධිකාරිය තම පාර්ශ්වකරුවන් සමඟ අඛණ්ඩව සහ ක්‍රියාශීලීව කටයුතු කිරීමට මූලිකත්වයක් ලබා දේ. සිවිල් ගුවන්සේවා භාර ගරු අමාත්‍යතුමා විසින් දක්වා ඇති උපායමාර්ගික ඉලක්ක සහ නියාමන අවශ්‍යතා අනුව කටයුතු කිරීමට එය උපකාරී වේ.

අධිකාරියේ සහ ජ්‍යේෂ්ඨ කළමනාකාරීත්වයේ වගකීම

සිවිල් ගුවන්සේවා අධිකාරියේ කාර්යක්ෂම ක්‍රියාකාරකම් සඳහා අධිකාරියේ කාර්ය භාරය සහ ප්‍රධාන විධායක නිලධාරියාගේ ප්‍රධානත්වයෙන් යුත් ජ්‍යේෂ්ඨ කළමනාකාරීත්වය අතර පැහැදිලි සීමා නිර්ණයක් පැවතීම මූලිකව බලපානු ලබයි.

අධිකාරිය මඟින් ඉහළ මට්ටමේ ප්‍රතිපත්ති සහ උපාය මාර්ග සැකසීම කෙරෙහි අවධානය යොමු කරමින්, අරමුණු සාක්ෂාත් කර ගැනීමේ ප්‍රගතිය නිරීක්ෂණය කරයි. එහි වත්මන් ප්‍රතිපත්ති, ක්‍රියා පටිපාටි හෝ පිළිවෙත් සම්බන්ධයෙන් නිශ්චිත ප්‍රතිපාදන නොපවතින කරුණු සඳහා එය තවදුරටත් උපදෙස් සපයයි.

මෙම ඉහළ මට්ටමේ ප්‍රතිපත්ති සහ උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රධාන විධායකයාගේ ප්‍රධානත්වයෙන් යුත් ජ්‍යේෂ්ඨ කළමනාකාරීත්වය වගකීමෙන් බැඳේ.

අධිකාරිය ස්වාධීනව ක්‍රියාත්මක වන අතර, 2010 අංක 14 දරන සිවිල් ගුවන්සේවා පනත, ඒ යටතේ සකස් කළ ගුවන් සන්තරණ රෙගුලාසි හෝ වෙනත් ලිඛිත නීතියක් ප්‍රකාරව සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත විශේෂයෙන් පවරා ඇති නිශ්චිත නියාමන වගකීම් ඉටු කිරීමේ වගකීම සඳහා හවුල්කාරිත්වයක් නොදක්වයි.

කෙසේ වෙතත්, සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාට සහ රාජ්‍යයට පැවරී ඇති නියාමන වගකීම් සහ කාර්යයන් ඉටු කිරීම සඳහා අවශ්‍ය පිරිස්, උපකරණ, පහසුකම් සහ සේවා ඇතුළත් අවශ්‍ය සියලු සම්පත් සහ සහය සහ ඊට සීමා නොවූ සේවාවක් අධිකාරිය විසින් සපයනු ලබයි.

සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල් සහ CAASL හි ප්‍රධාන විධායක නිලධාරී වෙත බලතල සහ කාර්යයන් පැවරීම සංක්ෂිප්ත සහ සම්පූර්ණ බව තහවුරු කරමින් අධිකාරිය විකී භූමිකාවන් මනාව ඉටු කරයි.

වගවීම

අධිකාරිය සහ එහි කමිටු මඟින් එහි උපාය මාර්ගික අරමුණු පිළිබඳ ප්‍රගතිය නිරීක්ෂණය කිරීමට සහ අධිකාරියේ ප්‍රතිපත්ති, උපාය මාර්ගික මඟපෙන්වීම් සහ එහි ආයතනික සැලැස්මේ දක්වා ඇති අරමුණු අනුව සිවිල් ගුවන්සේවා අධිකාරියේ කටයුතු කළමනාකරණය කිරීම, මෙහෙයවීම, ගිණුම්කරණය සහ අධීක්ෂණය කිරීම සහතික කරලීමට නිරන්තරයෙන් රැස්වීම් පවත්වනු ලබයි.

පිළිබැඳියා ගැටුම

අධිකාරිය මඟින් පොලී ලේඛනයක් පවත්වා ගෙන යන අතර, උනන්දුව ප්‍රකාශ කිරීමට ඇති වගකීම් පිළිබඳව අධිකාරියේ සාමාජිකයින් දැනුවත් බවට සහතික කරයි. මෙකී ක්‍රියාවලිය අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින් සහ CAASL හි සියලුම සේවකයින් සඳහා පිළිබැඳියා ගැටුම් ලේඛනයක් පවත්වාගෙනයාම තුළින් ද පිළිබිඹු වේ.


ගුණාත්මකභාවය සහ අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර පාලන සඳහා ප්‍රතිපත්ති පද්ධති සහ ක්‍රියාත්මක කරන ලද ක්‍රියා පටිපාටි ඇතුළත් අතර සිවිල් ගුවන්සේවා අධිකාරිය එහි නිශ්චිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සහතික කරනු ලබයි. මෙම වාර්තාවේ ඇතුළත් වගකීම් ප්‍රකාශය අනුමත කිරීමෙන් අධිකාරිය සහ ජ්‍යේෂ්ඨ කළමනාකාරිත්වය යන දෙපිරිසම ඔවුන්ගේ වගකීම විධිමත් ලෙස පිළිගෙන ඇත.

මෙම කැපවීම ශක්තිමත් කිරීම සඳහා ජ්‍යේෂ්ඨ කළමනාකාරිත්වයෙන් ස්වාධීනව ක්‍රියාත්මක වන විශේෂිත තත්ත්ව සහ අභ්‍යන්තර විගණන අංශයක් අධිකාරිය මඟින් ස්ථාපිත කර ඇත. CAASL හි අභ්‍යන්තර පාලන පද්ධතියේ ප්‍රමාණවත් බව සහ ශක්තිමත් බව නිරීක්ෂණය කිරීම සහ ඇගයීම සඳහා මෙකී අංශය වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය (CAASL) පාලනය, අවදානම් කළමනාකරණය සහ අනුකූලතාව පිළිබඳ ඉහළ ප්‍රමිතීන් පවත්වා ගැනීමේ වැදගත්කම අවධාරණය කරයි. මෙම අංශය අභ්‍යන්තර විගණන පැවැත්වීම සහ සංවිධානයේ මෙහෙයුම් හරහා ගුණාත්මක බව සහතික කිරීම සඳහා වගකීම දරයි. එය සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අධිකාරිය යටතේ ක්‍රියාත්මක වේ.

අභ්‍යන්තර විගණන කාර්ය සාධනයේ සංක්ෂිප්තය - 2023 වර්ෂය



ව්‍යවස්ථාදායක අනුකූලතාවය

සංවිධානය සියලු නීතිරීතිවලට අනුකූල වන බව සහතික කිරීම සඳහා අධිකාරිය වගකීම් දරයි. අධිකාරිය විසින් අනුකූලතා ගැටළු ක්‍රමානුකූලව හඳුනාගැනීම සඳහා වැඩසටහනක් සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා වගකීම ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය වෙත පවරා ඇති අතර සියලුම සේවකයින් ඔවුන්ට විශේෂයෙන් අදාළවන ව්‍යවස්ථාදායක අවශ්‍යතා පිළිබඳව දැනුවත් බව සහතික කරයි.

අධිකාරිය වෙත රජයේ සංවිධාන විසින් නිකුත් කරන ලද සාමාන්‍ය හෝ විශේෂිත චක්‍රලේඛ සහ/හෝ විධානයන් එක් එක් සිද්ධිය අනුව අධිකාරියට අදාළ කර ගැනීම සම්බන්ධයෙන් අධිකාරිය තීරණ ගනී. එබැවින්, අධිකාරියේ නීත්‍යානුකූල බලතල, කර්තව්‍ය සහ යුතුකම් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සම්බන්ධයෙන් අධිකාරිය විසින් එවැනි චක්‍රලේඛවල අන්තර්ගතයේ බලපෑම පිළිබඳව විමර්ශනය කරන්නේ නම් සහ එවැනි යෙදුම්වල ස්වභාවය සහ විෂය පථය තීරණය කරන්නේ නම් මිස, රජයේ දෙපාර්තමේන්තුවක් විසින් නිකුත් කරනු ලබන සෑම චක්‍රලේඛයක්ම CAASL කළමනාකරණය තුළ ස්වයංක්‍රීයව අදාළ නොවේ.

CAASL හි ක්‍රියාකාරිත්වය සඳහා රජයේ චක්‍රලේඛවල යෙදීම් දීර්ඝ කිරීම සම්බන්ධයෙන් යාවත්කාලීන වූ චිකඟතා ලැයිස්තුවක් පවත්වාගැනීමේ වගකීම ආයතනික කටයුතු සහ ආර්ථික නියාමන අංශය මඟින් ඉටු කරයි.

CAASL හි පාලනය සහ වගවීම

නෛතික කටයුතු සහ බලාත්මක කිරීමේ ක්‍රියාකාරකම්

2023 අංක 08 දරන ගුවන් ප්‍රවාහනය (සංශෝධන) පනත බලාත්මක කිරීම

මෙම පනත මඟින් 2018 අංක 29 දරන ගුවන් මඟින් ප්‍රවාහනය කිරීමේ පනතේ ප්‍රධාන පනතේ 5 වැනි වගන්තිය සංශෝධිත කර ඇත. එමඟින් ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද නියෝගයක් අනුව ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහනවලින් වෙනස්වන දේශීය ගුවන් ප්‍රවාහන සඳහා අදාළ වන වගකීම් සීමාවන් නියම කිරීමට සිවිල් ගුවන්සේවා අමාත්‍යවරයාට හැකියාව ලබාදේ.

2023 අංක 24 දරන සිවිල් ගුවන්සේවා (සංශෝධන) පනත බලාත්මක කිරීම

මෙම පනත මඟින් 2010 අංක 14 දරන සිවිල් ගුවන්සේවා පනතේ, ප්‍රධාන පනතේ 6(3)(ඉ) වගන්තිය සංශෝධනය කරන ලදී. මෙකී සංශෝධනය මඟින් 31 වගන්තියේ (ඒ), (ඒ), (ඒ) සහ (ඔ) යටතේ සඳහන් කර ඇති ගුවන්සේවා සඳහා සේවා සපයන්නන් පත් කිරීම සම්බන්ධයෙන් පනවා ඇති ව්‍යවස්ථාපිත සීමා ඉවත් කරන ලදී.

සිවිල් ගුවන්සේවා රෙගුලාසි 2022 (ගගන යාත්‍රාංගන භාවිතය සඳහා ගාස්තු) ප්‍රකාශ කිරීම (2022/10/26 දිනැති අංක 2303/18 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය).

මෙම රෙගුලාසිය මඟින් BIA, MRIA , සහ CIAR ගගන යාත්‍රාංගන භාවිත කිරීම සඳහා ගොඩබෑම සහ වාහන නැවැත්වීමේ ගාස්තු නියම කිරීම සිදු කරනු ලබයි.

සිවිල් ගුවන්සේවා රෙගුලාසි 2022 (ගුවන්යානා භාවිතය සඳහා ගාස්තු) ප්‍රකාශයට පත් කිරීම (2202/11/02 දිනැති අංක 2304/46 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය)

මෙම රෙගුලාසිය මඟින් JIA හි භාවිතය සඳහා ගොඩබෑමේ සහ වාහන නැවැත්වීමේ ගාස්තු නියම කිරීම සහ 31/03/2023 දක්වා BIA සඳහා අදාළ ගොඩබෑමේ සහ වාහන නැවැත්වීමේ ගාස්තුවලට අදාළ බලාත්මතක කිරීම් සිදු කරනු ලබයි.

සිවිල් ගුවන්සේවා රෙගුලාසි 2022 (ගුවන්යානා භාවිතය සඳහා ගාස්තු) ප්‍රකාශයට පත් කිරීම (07/02/2023 දිනැති අංක 2318/14 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය)

මෙම රෙගුලාසිය මඟින් BTIA භාවිතය සඳහා ගොඩබෑමේ සහ නැවැත්වීමේ ගාස්තු නියම කරයි.

2022 අංක 01 දරන ජල ගගන යාත්‍රාංගන රෙගුලාසි ප්‍රකාශයට පත් කිරීම (2022/08/09 දිනැති අංක 2292/34 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය)

මෙම රෙගුලාසි මඟින් ශ්‍රී ලංකාවේ ජල ගගන යාත්‍රාංගන බලපත්‍රය නිකුත් කිරීම සම්බන්ධයෙන් අවශ්‍යතා සහ කොන්දේසි නියම කෙරේ.

2023 අංක 01 දරන අන්තර් මාර්ග නාවික පහසුකම් ගාස්තු පිළිබඳ රෙගුලාසි ප්‍රකාශයට පත් කිරීම (2023/02/16 දිනැති අංක 2319/64 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය)

මෙම රෙගුලාසිය මඟින් ශ්‍රී ලංකාව විසින් සපයනු ලබන ගුවන් සන්තරණ පහසුකම් සහ සේවා භාවිත කිරීමට කොළඹ පියාසැරි තොරතුරු කලාපය (FIR) හරහා පියාසර කරන ගුවන්යානා විසින් ගෙවිය යුතු ගාස්තු නියම කරයි.

2023 අංක 01 දරන සිවිල් ගුවන්සේවා ගගනයාත්‍රික සේවා සපයන්නා (ගුවන් සන්තරණ සහ ගුවන්සේවා ආරක්ෂාව) බලපත්‍ර රෙගුලාසි ප්‍රකාශයට පත් කිරීම (03/04/2023 දිනැති අංක 2326/16 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය)

මෙම රෙගුලාසි මඟින් ශ්‍රී ලංකාව තුළ ගගනයාත්‍රික සේවා සපයන්නාගේ (ගුවන් සන්තරණ) බලපත්‍රය සහ ගුවන්සේවා සපයන්නාගේ (ගුවන් ආරක්ෂක) බලපත්‍රය නිකුත් කිරීම සඳහා අවශ්‍යතා සහ කොන්දේසි නියම කරයි.

2023 අංක 08 දරන ගුවන් ප්‍රවාහනය යටතේ නියෝගය නිකුත් කිරීමේ (සංශෝධන) පනත (2023/07/20 දිනැති අංක 2341/50 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය.)

ජාත්‍යන්තර ගුවන් ගමන්වලින් වෙනස්වීම හේතුවෙන් දේශීය ගුවන් ප්‍රවාහනයට අදාළ වගකීම් සීමා විශේෂකොට දැක්වීමට මෙම නියෝගය නිකුත් කරන ලදී.

ආචාර ධර්ම

අධිකාරිය මඟින් ආචාර ධර්ම සංග්‍රහයක් සකස් කර ඇති අතර, කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයින් සදාචාරාත්මක හැසිරීම් පිළිබඳ උසස් ප්‍රමිතීන් පවත්වා ගෙන යන්නේද සහ 'යහපත් ආයතනික පාලනය' පිළිබඳ ප්‍රගුණ කරන්නේද යන්න නිරන්තරයෙන් අධීක්ෂණය කරයි. පැමිණිලි සහ විනය ක්‍රියාමාර්ගවල ප්‍රවණතා අධීක්ෂණය කිරීම, අභ්‍යන්තර විගණන වාර්තා හෝ ආචාර ධර්ම සංග්‍රහයේ අඩංගු මූලධර්මවලට අනුකූල නොවන බව පෙන්වන වාර්තා හෝ දර්ශක වැනි ක්‍රම හරහා ආචාර ධර්ම ප්‍රමිතීන්ට අනුකූලව අධීක්ෂණය කිරීම ක්‍රියාත්මක කරනු ලබයි.

යහපත් ආයතනික පුරවැසිභාවය සඳහා අධිකාරිය, එහි සේවකයින් ඇතුළුව, එය සහ එය අධීක්ෂණය කරන කර්මාන්තයෙන් පිටත බොහෝ ප්‍රජාවන්ගේ සාමාජිකයෙකු බව පිළිගැනීම සහ සදාචාරය සහ පිළිගත් සදාචාරය සමඟ විනිවිදභාවය, ස්ථාවර, ස්වාධීන සහ වගකීම් සහගත ලෙස ක්‍රියා කිරීමට කැපවීම සහ එම ප්‍රජාවන්ගේ සියලුම පුරවැසියන්ගේ අයිතිවාසිකම් සහ වගකීම් පිළිගැනීම ඇතුළත් වේ.



නීල අවකාශයේ, හරිත දැක්ම



මෙහෙයුම් කටයුතුවල විශේෂ අවස්ථා

	පිටු අංක.
සුරක්ෂිතභාවය ශක්තිමත් කිරීම	33
ආරක්ෂාව සහ පහසුකම් වැඩි දියුණු කිරීම	36
කාර්යක්ෂමතාව සහ ඵලදායී කළමනාකරණය	38
හරිත ගුවන් සේවය	40
ගුවන්සේවා වර්ධනය	42
ධාරිතා සංවර්ධනය	47
තොරතුරු තාක්ෂණ සංවර්ධනයන්	50
සේවකයන් සවිබල ගැන්වීම	51
මූල්‍ය කටයුතුවල විශේෂ අවස්ථා	54

මෙහෙයුම් කටයුතුවල විශේෂ අවස්ථා
සුරක්ෂිතභාවය ශක්තිමත් කිරීම

චිකාගෝ සම්මුති මූලධර්මවලට අනුකූලව ජාත්‍යන්තර ගුවන්සේවා කර්මාන්තය නියාමනය කිරීම සඳහා පිහිටුවා ඇති ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානයේ (ICAO) සාමාජික රාජ්‍යයක් ලෙස, ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ (CAASL) අපි ශ්‍රී ලංකා ගුවන්සේවා පද්ධතියේ මෙහෙයුම් කටයුතු අධීක්ෂණය කරන්නෙමු. 2023 වර්ෂයේදී, රට තුළ ගුවන් ගමන්වල ආරක්ෂාව සහ කාර්යක්ෂමතාව සහතික කරමින් විශිෂ්ට සේවාවක් සැපයීමට අපි කැපවෙන්නෙමු.


ආරක්ෂිත ක්‍රියාමාර්ග වැඩි දියුණු කිරීමේ සැලකිය යුතු ප්‍රගතියක් වෙනුවෙන්, අපි ශ්‍රී ලංකාවේ ගුවන්සේවා ක්ෂේත්‍රයේ තීරණාත්මක අවස්ථාවක් සනිටුහන් කරමින් ගුවන්යානා අනතුරු විමර්ශන කණ්ඩායමක් ස්ථාපිත කළෙමු. ජාතික ගුවන් ඉතිහාසයේ ප්‍රථම වතාවට පත් කරන ලද මෙකී විශේෂිත කණ්ඩායම සඳහා, ගුවන්යානා සිදුවීම් සම්බන්ධයෙන් අපක්ෂපාතී පරීක්ෂණ පැවැත්වීමට, හේතුසාධක අනාවරණය කර ගැනීම සඳහා දත්ත නිසි පරිදි විශ්ලේෂණය කිරීමට බලය ඇත. හේතුසාධක හඳුනා ගැනීම සහ වැළැක්වීමේ පියවරයන් ක්‍රියාත්මක කිරීමෙන්, ගුවන් මගීන් අතර වැඩි විශ්වාසයක් සහ සහතිකවීමක් ඇති කරමින්, ශ්‍රී ලංකාවේ ගුවන් සීමාවේ අබණ්ඩතාව ආරක්ෂා කිරීමට සහ අවදානම් අවම කිරීමට අපි අරමුණු කරන්නෙමු.

එමෙන්ම, අභ්‍යන්තර ගුවන් ප්‍රවාහනය සඳහා නව රක්ෂණ සීමා ඇතිකරමින්, 2018 අංක 29 දරන ගුවන් ප්‍රවාහන පනතට සංශෝධන ක්‍රියාත්මක කිරීමෙන් අපි ප්‍රගතිශීලී නායකත්වයක් පවත්වා ගන්නෙමු. මෙකී ප්‍රායෝගික පියවර, මගීන්ගේ ආරක්ෂාව සඳහා අපගේ කැපවීම පිළිබඳ පිළිබිඹු කරන්නා සේම, සියලුම මගීන් සඳහා ආරක්ෂිත සහ විශ්වාසදායක ගුවන් ගමන් අත්දැකීමක් සහතික කරනු ලබයි. මෙම මූලපිරීම් සහ අඛණ්ඩ උත්සාහයන් ඉටු කරමින්, ශ්‍රී ලංකාවේ ගුවන්සේවා ක්ෂේත්‍රයේ තිරසාර වර්ධනයට සහ සංවර්ධනයට දායක වෙමින් ආරක්ෂාව, කාර්යක්ෂමතාව සහ නියාමන අනුකූලතාවයේ ඉහළම ප්‍රමිතීන් ආරක්ෂා කිරීමට අපි කැපවී සිටිමු.

සුරක්ෂිත ප්‍රතිපත්ති සහ අනුකූලතාවය යාවත්කාලීන කිරීම

ගුවන්සේවා ක්ෂේත්‍රය තුළ සුරක්ෂිතතාව වැඩි දියුණු කිරීම සඳහා අපි නොයෙක් පියවර ගෙන ඇත. පළමුවෙන්, අපි ජාත්‍යන්තර සුරක්ෂිතතා රෙගුලාසිවලට අනුකූල වීම සහතික කරමින්, ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා පිළිබඳ සම්මුතියේ ICAO ඇමුණුම 13 හි දක්වා ඇති නවතම ප්‍රමිතීන්ට අනුකූලව, ගුවන්යානා අනතුරු විමර්ශන කාර්යාංශයේ (AAIB) කෙටුම්පතේ අවසන් කෙටුම්පත සම්පූර්ණ කළෙමු. එමෙන්ම, අපි ආරක්ෂක ප්‍රතිපත්ති සහ බලාත්මක කිරීමේ ක්‍රියා පටිපාටිවල වෙනස්කිරීම් ඇතුළත් රාජ්‍ය ආරක්ෂක වැඩසටහන් ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි අත්පොතෙහි තුන්වන සංස්කරණය ප්‍රකාශයට පත් කළෙමු. තවද, SMS පද්ධතියේ සම්මත - SLCAIS 070 ක්‍රියාත්මක කිරීම සහතික කරලීමට ගුවන් ක්‍රියාකරුවන්ගේ ආරක්ෂිත කළමනාකරණ පද්ධති අත්පොත්, අනුමැතියට පෙර අපගේ මෙහෙයුම් අංශ විසින් ඒවා පිළිපැදීම තහවුරු කර ගැනීම සඳහා පූර්ණ සමාලෝචනයකට ලක් කරන ලදී. ගුවන්සේවා කර්මාන්තය තුළ ආරක්ෂක ප්‍රමිතීන් ප්‍රවර්ධනය කිරීම සහ පවත්වාගැනීම සඳහා වූ අපගේ කැපවීම මෙතුළින් පෙන්නුම් කරයි.

ශ්‍රී ලංකාවේ ලියාපදිංචි ගුවන්යානාවල සහ ශ්‍රී ලංකා භූගෝලීය ප්‍රදේශය තුළ විදේශ ලියාපදිංචි ගුවන්යානා සම්බන්ධයෙන් සිදු වූ සියලුම සිදුවීම් - 2023



කෙටි යෙදුම්

ADRM: ගගන යාත්‍රාංගණය	RAMP :ගොඩබිම් හැසිරවීම
ARC: අක්‍රමවත් ධාවන පථ කොන්ත්‍රාත්තු	RI :ධාවන පථ ආක්‍රමණය - රථ වාහන, ගුවන්යානා හෝ පුද්ගලයින්
ATM: ගුවන් ගමන් කළමනාකරණය /සන්නිවේදන සහ සන්තරණ නිරීක්ෂණ	SCF-NP: පද්ධති/උපාංග අක්‍රිය වීම හෝ අක්‍රමවත් වීම (චන්පිම නොවන)
BIRD: පක්ෂීන් ගැටීම	SEC: ආරක්ෂාව සම්බන්ධ
CABIN: කැබින් ආරක්ෂණ සිදුවීම්	TURB: කැළඹීම්වලට මුහුණ දීම
F-NI: ගිනි/දුම් (බලපෑමක් නොමැති)	WSTRW: සුළං මාරුව සහ අකුණු කුණාටු
MAC: එයාර්ප්‍රොක්ස්/ACAS අනතුරු ඇඟවීම්/වෙන් කිරීමේ අලාභ/(ආසන්න) ගුවන් ඝට්ටනයන්	NAV : සන්තරණ දෝෂ
MED :වෛද්‍ය	SCF-PP: චන්පිම අක්‍රිය වීම හෝ අක්‍රමවත් වීම
OTHR: වෙනත්	

යුරෝපා සංගමය - දකුණු ආසියා ගුවන්සේවා හවුල් ව්‍යාපෘතිය (EU-SA APP)

යුරෝපා සංගමය සහ දකුණු ආසියාව අතර ගුවන්සේවා හවුල්කාරිත්වය ශක්තිමත් කිරීම.

යුරෝපා සංගමය සහ දකුණු ආසියාව අතර ගුවන්සේවා හවුල්කාරිත්වය ශක්තිමත් කරලීමට පහත කරුණු කෙරෙහි ව්‍යාපෘතිය තුළින් අවධානය යොමු කරනු ලබයි:

- සිවිල් ගුවන්සේවා ක්ෂේත්‍රයට අදාළ දකුණු ආසියානු සහ යුරෝපීය ආයතන අතර සබඳතා වැඩි දියුණු කිරීම.
- දකුණු ආසියානු සහ යුරෝපීය ගුවන්සේවා කර්මාන්ත අතර තාක්ෂණික කටයුතු වර්ධනය කිරීම.
- දකුණු ආසියාව තුළ ආරක්ෂක අධීක්ෂණය සඳහා පවතින ශක්‍යතාව වර්ධනය කර ගැනීමට සහය වීම.
- දකුණු ආසියානු ගුවන්සේවා අංශයේ පාරිසරික කාර්ය සාධනය වැඩිදියුණු කිරීම.

මෙහෙයුම් කටයුතුවල විශේෂ අවස්ථා
සුරක්ෂිතභාවය ශක්තිමත් කිරීම

2023 වර්ෂයේදී යුරෝපා සංගමය - දකුණු ආසියා ගුවන්සේවා හවුල් ව්‍යාපෘතිය (EU-SA APP) යටතේ, CAASL සහ කර්මාන්ත පුද්ගලයින් සඳහා පහත පුහුණු වැඩසටහන් පවත්වන ලදී.

ශ්‍රී ලංකාවේ AIR, OPS සහ PEL හි ස්ථානීය දකුණු ආසියානු කලාපීය ප්‍රාරම්භන (SARI) ක්‍රියාකාරකම්

2023 දෙසැම්බර් මාසයේදී යුරෝපා සංගමය - දකුණු ආසියා ගුවන්සේවා හවුල් ව්‍යාපෘතිය II මඟින් සහය දැක්වූ සාර්ථක SARI ක්‍රියාකාරකම් තුනක් ශ්‍රී ලංකාව තුළ පැවැත්විණ.

SARI විශේෂඥ අස්මීර් කෘහෝවික් විසින් M කාණ්ඩයේ ක්‍රියාකාරී කණ්ඩායම් සාමාජිකයින්ගේ රැස්වීම දෙසැම්බර් 13-15 දිනයන්හිදී ශ්‍රී ලංකාවේ දී පවත්වන ලදී. ගුවන් යෝග්‍යතා රෙගුලාසි යාවත්කාලීන කිරීම සහ සංශෝධනය කිරීම සහ SARI සාමාජික රටවල (MS) නවතම ගුවන් රෙගුලාසි නැවත සකස් කිරීම මෙහි අරමුණු විය. EASA විසින් හඳුන්වා දෙන ලද M කාණ්ඩයේ රෙගුලාසිවල සංශෝධන සහ වෙනස්කිරීම් මෙම රැස්වීමට අතිමහත් වැදගත්කමක් එක් කළේය. මෙමඟින් SARI ක්‍රියාකාරී කණ්ඩායම් සාමාජිකයින්ට සාකච්ඡා සඳහා ක්‍රියාකාරීව සහභාගී වීමට, යෝජිත රෙගුලාසි සංශෝධන පිළිබඳ ඉදිරිදර්ශන හුවමාරු කර ගැනීමට සහ විශේෂඥ දැනුම ලබා ගැනීමට මහඟු අවස්ථාවක් ලබා දුන්නේය.

කර්මාන්ත සහභාගිවන්නන් සමඟ SARI EU OPS වෙත RDW හඳුන්වාදීම



CAASL විසින් OPS සඳහා යුරෝපා සංගම් රීති අභිරුචිකරණය කිරීමට එකඟ වූ බැවින් සහ යුරෝපා සංගම් නීති රීති සමඟ FCL සහ AIR අභිරුචිකරණය කොට ඇති බැවින් EU OPS පිළිබඳ හඳුන්වාදීමේ වැඩමුළුවක් කපිතාන් Peter Wilczek විසින් පවත්වන ලදී. ජුනි 11 සහ 13 යන දිනයන්හිදී CAASL සඳහා වැඩමුළුවක් සහ ජුනි 12 වන දින කර්මාන්තයේ සහභාගීවන්නන් සහ අනෙකුත් සියලුම ගුවන්සේවා පාර්ශවකරුවන් සඳහා රැස්වීමක් පවත්වන ලද අතර එය සාර්ථක අන්දමින් පැවැත්විණ. CAASL විසින් යුරෝපා සංගම් රීතිවලට එකඟ වනුයේ, ඒවා ක්‍රියාත්මක කිරීමේ සහ, අනුගමනය කිරීමේ පහසුව, විකල්ප ක්‍රම සමඟ අනුකූල වීම සහ මාර්ගෝපදේශ ද්‍රව්‍ය පහසුවෙන් ලබා ගත හැකි නිසාවෙනි.

සහතිකකරණය සහ මාර්ගෝපදේශ ද්‍රව්‍ය

2010 අංක 14 දරන සිවිල් ගුවන්සේවා පනතේ 31(ඒ) වගන්තිය යටතේ, අපි ආහාරපාන බලපත්‍ර නිකුත් කිරීම සහ මිනිසුන් රහිත ගුවන්යානා පුහුණු සංවිධාන අවශ්‍යතා සඳහා මාර්ගෝපදේශ ද්‍රව්‍ය ප්‍රකාශයට පත් කළෙමු.

- ආහාර සැපයුම් සහතිකය: ශ්‍රී ලංකන් කේටරින් (පෞද්ගලික) සමාගම නියාමන අනුකූලතාවය සහතික කරමින් 2010 අංක 14 දරන සිවිල් ගුවන්සේවා පනතේ 31(ඒ) වගන්තියට අනුකූලව සහතිකයක් සහ ආහාර සැපයුම් බලපත්‍රයක් ලබාගෙන ඇත.
- ස්වයං ආහාරපාන සැපයුම් සඳහා බලය පැවරීම: සීමාසහිත ෆිට් ඒවියේෂන් පෞද්ගලික සමාගම විසින් ස්වයං ආහාරපාන සපයන්නෙකු ලෙස සහතිකයක් ලබා ගෙන ඇති අතර, ඔවුන්ට ආහාර සැපයුම් සේවා ස්වාධීනව පවත්වා ගෙනයා හැකිය.
- විදේශීය ගුවන් ක්‍රියාකරු සහතික: 2023 දී බතික් එයාර්, තායි එයාර් ඒෂියා, සහ එයාර් සීෂෙල්ස් ඇතුළු විවිධ ගුවන්සේවා සඳහා මූලික විදේශ ගුවන් මෙහෙයුම් සහතික ප්‍රදානය කරන ලදී.
- නිපුණතා මත පදනම් වූ පුහුණු වැඩසටහන්: අනිවාර්ය පුහුණු අනුකූලතාව සඳහා අපගේ අනුමැතිය සහිතව, ICAO මාර්ගෝපදේශ අනුගමනය කරමින් නිපුණතා මත පදනම් වූ පුහුණු සහ ඇගයීම (CBTA) සඳහා අනතුරුදායක භාණ්ඩ පිළිබඳ පුහුණු වැඩසටහන
- නිරීක්ෂණ සහ අධීක්ෂණය: ප්‍රධාන පදනම් විගණනවල සිට ආහාර සැපයුම් පරීක්ෂණ දක්වා විවිධ පරීක්ෂණ ක්‍රියාකාරකම් ඇතුළත් නියාමන අවශ්‍යතාවලට අනුකූල වීම සහතික කරලීමට දේශීය සහ විදේශීය ගුවන් ක්‍රියාකරුවන් පිළිබඳව අපි නිරන්තරයෙන් නිරීක්ෂණ කරන්නෙමු.
- විස්තීර්ණ නියාමන විගණන: ICAO SARPs සහ ඔවුන්ගේ ගුවන් ක්‍රියාකරු සහතික (AOCs) අලුත් කිරීම සඳහා වන දේශීය රෙගුලාසිවලට අනුකූල වීම තක්සේරු කිරීම සඳහා 2023 වර්ෂයේදී ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සහ ෆිට් ඒවියේෂන් සමාගම පිළිබඳ සම්පූර්ණ නියාමන විගණනයක් පවත්වන ලදී.

ගුවන්සේවා නියාමන යාවත්කාලීන කිරීම්

අපගේ නියාමන පරිශ්‍රමයන් සඳහා ඉන්ධන සහ ලිහිසි තෙල් සේවා සපයන්නන් සහතික කිරීම සහ ගුවන්යානා කාබන් ඩයොක්සයිඩ් විමෝචනයට අදාළ ඇමුණුම 16 වෙළුම III සඳහා ප්‍රමිති සැකසීම ඇතුළත් වේ. විදේශීය ආයතන සඳහා එක් මූලික නඩත්තු සංවිධාන සහතිකයක් නිකුත් කිරීම සහ දේශීය ආයතන සඳහා තවත් සහතිකයක් නිකුත් කිරීම කැපී පෙනෙන ජයග්‍රහණ අතර වේ. මීට අමතරව, අපි දේශීය නඩත්තු සංවිධාන සහතික දහතුනක් සහ විදේශීය නඩත්තු සංවිධාන සහතික හතළිස් හතක් අලුත් කළෙමු. RMA, BIA, MRIA සහ JIA හි වැඩබිම් සඳහා ලංකා බහිජ තෙල් නීතිගත සංස්ථාව වෙත විශේෂ ගුවන්යානා නඩත්තු සංවිධාන අනුමැතිය ලබා දෙන ලදී. BIA හි SPARK Air Engineering වෙත මූලික අනුමැතිය ලබා දුන් අතර විදේශීය AMO අනුමැතිය චෙන්නායි හි GMR Aero Technic , හාන්, ජර්මනියේ Hahn හි Hangar 901 ගුවන්යානා නඩත්තු GmbH සහ දකුණු කොරියාවේ ඉචියොන් හි Modular Aviation Services මගින් ලබා ගන්නා

ලදී. අපගේ නියාමන ප්‍රමිතීන්ට නොසැලෙන ලෙස අනුකූල වීම සහතික කරලීමට දේශීය හා විදේශීය දෙඅංශයේම ගුවන්යානා නඩත්තු සංවිධාන, අබණ්ඩ ගුවන් යෝග්‍යතා කළමනාකරණ සංවිධාන සහ ගුවන්යානා නඩත්තු පුහුණු සංවිධාන පිළිබඳ මනා නිරීක්ෂණ කටයුතු නිරන්තරයෙන් සිදු කරන ලදී.

COSCAP-SA වැඩසටහන



ශ්‍රී ලංකා රජය විසින් කලින් කලට මූල්‍ය සීමා පැනවූ බැවින්, වසර තුළදී ධාරිතා වර්ධනය කරලීමට කාර්ය මණ්ඩලය සඳහා පුහුණු අවස්ථා ලබාදීම සම්බන්ධයෙන් CAASL විසින් අභියෝගවලට මුහුණ දෙනු ලැබිණ.

පුහුණුව තුළින් ධාරිතා ගොඩනැගීමේ වැදගත්කම සැලකිල්ලට ගනිමින්, CAASL හි කාර්ය මණ්ඩලය සඳහා උපරිම පුහුණු අවස්ථා නොමිලේ ලබා දීමට COSCAP-SA විසින් කටයුතු කොට ඇත. 2023 ජනවාරි 24 සිට 26 දක්වා බංගලාදේශයේ ඩකා නුවර පැවති මෙහෙයුම් කමිටු රැස්වීමේදී පී. ඒ ජයකාන්ත මහතා - DGCA/CEO සහ ජාතික සම්බන්ධීකාරක රේහාන් වන්නියප්පා මහතා විසින් මෙම යෝජනාව ගෙන එන ලදී.

එහි ප්‍රතිඵලයක් වශයෙන්, 2023 වසර තුළදී ද COSCAP-SA විසින් පුහුණුව සහ සංවර්ධනය සඳහා විශාල සහයෝගයක් දක්වන ලදී.

සමාලෝචිත කාල සීමාව තුළ COSCAP -SA විසින් විගණන තාක්ෂණය, මූලික පරීක්ෂක (PEL), ගුවන්යානා අනතුරු විමර්ශනය, DCP/FSTD ඇගයීම වෙනුවෙන් ප්‍රධාන දායකත්වයක් ලබා දෙන ලදී.

ගුවන් නාවික සේවා

අපි 2023 නොවැම්බර් 20 සිට 24 දක්වා ශ්‍රී ලංකාවේ කොළඹ ICAO RO ATM සහ AIS සේවා බෙදා හැරීම වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය සාර්ථකව නිම කළෙමු.



මෙහෙයුම් කටයුතුවල විශේෂ අවස්ථා
ආරක්ෂාව සහ පහසුකම් වැඩි දියුණු කිරීම

ප්‍රාණ ඇපකරුවන් විය හැකි අවස්ථා හැසිරවීමට සහ ගුවන්යානා පැහැරගැනීම් වැනි තර්ජන අවම කිරීමට අපි ශ්‍රී ලංකා පොලිස් සේවයේ ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් නව දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් පත් කළෙමු. රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය (CAASL) අතර මෙකී සහයෝගිතාවයෙන් ගුවන් මෙහෙයුම්වල ආරක්ෂාව සහ සුරක්ෂිතභාවය සහතික කරන අතර, ගුවන්සේවා සම්බන්ධ දත්ත ආරක්ෂා කිරීම අවධාරණය කරයි. ඇතිවන තර්ජනවලට එරෙහිව මෙම අවදානම් දත්ත ආරක්ෂා කිරීම සඳහා විධිමත් ක්‍රියා පටිපාටි ස්ථාපිත කර ඇත.

වැඩිවන සයිබර් ආරක්ෂණ අවදානම් හමුවේ ඊට ප්‍රතිචාර විශයෙන්, ශක්තිමත් ගුවන්සේවා සුරක්ෂිතතා වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට අපි ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය (CERT) සමඟ හවුල් වූවෙමු. සයිබර් සුරක්ෂිතතා ආරක්ෂාව තර කිරීම, ගුවන් මෙහෙයුම් සඳහා අවදානම් අවම කිරීම, සහ සයිබර් තර්ජනවලට එරෙහිව ගුවන්සේවා කර්මාන්තය ශක්තිමත් කිරීම සඳහා මෙම මූලපිරීම උපකාරී වේ. දූර්වලතා සඳහා පිළියම් කිරීමෙන් සහ සිදුවීම්වලට ක්ෂණිකව ප්‍රතිචාර දැක්වීමෙන්, ශ්‍රී ලංකාවේ සිවිල් ගුවන්සේවාවල ආරක්ෂක සහ සුරක්ෂණ ප්‍රමිතීන් පවත්වා ගැනීම අපි අරමුණු කරන්නෙමු.

පතල් උපදේශක කණ්ඩායමෙන් ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව නිෂ්පාදනය කරන ලද ආයුධ ගබඩා කිරීමේ කැබිනට් දෙකක් ලබා ගැනීමෙන් අපි අපගේ භෞතික ආරක්ෂණ යටිතල පහසුකම් ශක්තිමත් කළෙමු. ඇමරිකා එක්සත් ජනපදය විසින් අරමුදල් සපයන ලද සහ එක්සත් රාජධානියේ ලියාපදිංචි කර ඇති, මෙකී පරිත්‍යාගය මඟින් අපගේ ආරක්ෂක ක්‍රියාමාර්ග ශක්තිමත් කරයි. මීට අමතරව, කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලේ ධාවන පථයේ මෙහෙයුම් ධාරිතාව ප්‍රශස්ත කිරීමට සැලසුම් කිරීම තුළින් දිගුකාලීන යටිතල පහසුකම් අවශ්‍යතා සපුරාලීම වෙනුවෙන් අප දක්වන කැපවීම පෙන්නුම් කරයි.

මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපලේ (MRIA) ගුවන්යානා සහතිකය අලුත් කිරීම

ජාතික සහ ICAO ප්‍රමිතීන්ට අනුකූලවීමේ අරමුණින්, ICAO ප්‍රමිතීන්ට අනුගත බව සම්පූර්ණ විගණනයකින් තහවුරු කිරීමෙන් පසුව අපි MRIA හි ගුවන්යානා සහතිකය තවත් වසර දෙකකට අලුත් කළෙමු. රෙඩ් වින්ග් ගුවන් සේවයේ මඟී මෙහෙයුම් වැඩි වීම හේතුවෙන් මෙම අලුත් කිරීම අනිවාර්යය විය.

මඩකලපුව ගුවන් තොටුපල සඳහා ගුවන්යානා බලපත්‍ර අලුත් කිරීම (VCCB)

ජාත්‍යන්තර සහ දේශීය ගුවන් තොටුපලවල් ජාතික රෙගුලාසිවලට අනුකූල වන බව අපි සහතික කළෙමු. ගුවන් තොටුපල බලපත්‍ර අලුත් කිරීමේ විගණනයකින් පසුව ජාතික ප්‍රමිතීන්ට අඛණ්ඩව අනුකූල වීම සහතික කරමින් මඩකලපුව ගුවන් තොටුපලේ බලපත්‍රය වසරක් සඳහා අලුත් කරන ලදී.

AIM ඒකකය ISO 9001:2018 සහතිකය ලබා ගැනීම

අනිවාර්ය ICAO තත්ත්ව සහතික ලබා ගැනීමට AASL හි AIM ඒකකයට අපි නියාමන මගපෙන්වීමක් ලබා දුන්නෙමු. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ICAO ඇමුණුම 15 ප්‍රමිතීන්ට අනුකූලව AIM ඒකකය විසින් ISO 9001:2018 සහතිකය සාර්ථකව ලබා ගත්තේය.

BIA හි නව ATM පද්ධතිය සඳහා අනුමැතිය

BIA හි නව ගුවන් ගමනාගමන කළමනාකරණ (ATM) පද්ධතිය ආරම්භ කිරීමට ඉලෙක්ට්‍රොනික පියාසැරි තීරු (ඊ-තීරු) හඳුන්වාදීම සඳහා අපි නියාමන මාර්ගෝපදේශ සහ අනුමැතිය ලබා දුන්නෙමු. ආරක්ෂාව ඇගයීම් අනුමත කිරීම සහ I අදියරේ සිට II අදියර දක්වා අත්හදා බැලීමේ මෙහෙයුම් ඇගයීම ඒ සඳහා ඇතුළත් විය.

VCSS යොදාගැනීම සඳහා අනුමැතිය

BIA සහ RMA හි වාග් සන්නිවේදන හුවමාරු පද්ධතිය (VCSS) ක්‍රියාත්මක කිරීම අපි සහතික කළෙමු.

ශ්‍රී ලංකාව සිය ගුවන්සේවා සුරක්ෂිතතා පද්ධති තුළ සුරක්ෂිත බැව් ICAO මඟින් යළි තහවුරු කෙරිණ.

ICAO විසින් 2023 මැයි 8 සිට 18 දක්වා කාලය තුළ විශ්ව සුරක්ෂිතතා විගණන වැඩසටහන - අඛණ්ඩ අධීක්ෂණ ප්‍රවේශය (USAP - CMA) යටතේ ශ්‍රී ලංකා ගුවන්සේවා සුරක්ෂිතතා පද්ධති විගණනය කරන ලදී. එය සිවි දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් විසින් වැදගත් මූලිකාංග (CE) 8ක් යටතේ සුපරීක්ෂාකාරී සහ අපක්ෂපාතී ඇගයීමක් හරහා සිදු කළ අතර ICAO හි මහලේකම්වරයා වෙත ඉදිරිපත් කරන ලදී. USAP-CMA හි පරමාර්ථය වන්නේ ගුවන් සුරක්ෂිතතා අධීක්ෂණ පද්ධතියක තීරණාත්මක අංග ක්‍රියාත්මක කිරීමේ මට්ටම සහ ICAO ඇමුණුම 17 - සුරක්ෂිතතාව සහ ICAO ඇමුණුම 9 හි ආරක්ෂාවට අදාළ ප්‍රමිති - පහසුකම් හි ප්‍රමිතීන්ට අනුකූල වීමේ මට්ටම මෙන්ම ආශ්‍රිත ක්‍රියා පටිපාටි, මාර්ගෝපදේශ ද්‍රව්‍ය සහ ආරක්ෂාව සම්බන්ධ භාවිතයන් ඇතුළුව සාමාජික රටවල ගුවන්සේවා ආරක්ෂක කාර්ය සාධනය පිළිබඳ දත්ත ක්‍රමානුකූලව සහ නිරන්තරයෙන් ලබා ගනිමින් සහ විශ්ලේෂණය කරමින් සාමාජික රටවල ගුවන් ආරක්ෂණ අනුකූලතාවය සහ අධීක්ෂණ හැකියාවන් වැඩිදියුණු කිරීමට ගුවන්සේවා ආරක්ෂක කාර්ය සාධනය අඛණ්ඩ විගණනය සහ අධීක්ෂණය හරහා ගෝලීය ගුවන්සේවා ආරක්ෂාව ප්‍රවර්ධනය කිරීමයි.

ICAO විසින් ශ්‍රී ලංකාවේ ගුවන් සුරක්ෂිතතා පද්ධති පැසසුමට ලක්කරයි.



ගෝලීය සුරක්ෂිතතා විගණන වැඩසටහන - අඛණ්ඩ අධීක්ෂණ ප්‍රවේශය (USAP-CMA) යටතේ 2023 මැයි 8 සිට 18 දක්වා පවත්වන ලද විගණනයකදී, සිවි දෙනෙකුගෙන් යුත් ICAO විගණන කණ්ඩායමක් විසින් ශ්‍රී ලංකාවේ ගුවන්සේවා ආරක්ෂක පද්ධති ඇගයීමට ලක් කරන ලදී.

අපි ආසියා පැසිෆික් කලාපයේ ප්‍රමුඛ පෙළේ නියාමන ආයතන හා සම තත්ත්වයට පත් වෙමින් 92% ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත් බව අවසන් වාර්තාවේ සඳහන් විය.

ගුවන් ආරක්ෂක සිදුවීම් වාර්තා පද්ධතිය

අපි ගුවන්සේවා ආරක්ෂක විධානය 08 සඳහා අනුගත වෙමින් ගුවන්සේවා ආරක්ෂක සිද්ධීන් සඳහා පුළුල් රහස්‍ය වාර්තාකරණ පද්ධතියක් ස්ථාපිත කළෙමු. මෙම පද්ධතිය සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල් (DGCA) වෙත සිදුවීම් කඩිනමින් වාර්තා කිරීමට පහසුකම් සපයයි. බලපත්‍ර, සහතික, අවසර පත්‍ර, අවසර, හෝ අනුමැතිය හිමි සියලුම දෙනාට මෙන්ම මගීන්ට සහ සාමාන්‍ය ජනතාව වෙත සිදුවීම් වාර්තා කිරීම 2010 අංක 14 දරන සිවිල් ගුවන්සේවා පනත යටතේ එය අනිවාර්ය කරයි. පුළුල් පරාසයක ගුවන් ආරක්ෂණ සිදුවීම් ආවරණය කරමින් අපගේ වෙබ් අඩවිය හරහා වාර්තා ඉදිරිපත් කළ හැකිය.



හැසිරීම් විශ්ලේෂණය සහ පුරෝකථනය කිරීමේ වැඩමුළුව

ශ්‍රී ලංකාවේ සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ඉල්ලීම පරිදි ඕස්ට්‍රේලියානු ස්වදේශ කටයුතු දෙපාර්තමේන්තුව විසින් "චර්යා විශ්ලේෂණය සහ පුරෝකථනය කිරීමේ උපාය මාර්ග" වැඩමුළුවක් පවත්වන ලදී. මෙම පුහුණුව IATA ප්‍රතිනයය ලත් විශේෂඥයෙකු විසින් මෙහෙයවන ලද අතර, සීමාසහිත ගුවන් තොටුපල සහ ගුවන්සේවා (ශ්‍රී ලංකා) සහ ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි ගුවන් ආරක්ෂක නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් 2023 ජනවාරි 30 සිට පෙබරවාරි 3 දක්වා කොළඹදී පැවැත්විණි.

යාපනය ජාත්‍යන්තර ගුවන්තොටුපලේ ගුවන්සේවා සුරක්ෂිතභාවය විගණනය

ගුවන් ආරක්ෂක නියාමන අවශ්‍යතාවලට අනුකූල වීම සහතික කිරීම සඳහා අපගේ ගුවන්සේවා සුරක්ෂිතතා පරීක්ෂක විසින් ශ්‍රී ලංකාවේ දෙවන කාර්යබහුලතම ජාත්‍යන්තර ගුවන් තොටුපල වන යාපනය ජාත්‍යන්තර ගුවන් තොටුපල (JIA) පිළිබඳ පුළුල් විගණනයක් සිදු කරන ලදී.

වෙන් කරවා ගැනීම් සඳහා අති නවීන ඇමතුම් පද්ධතියක් ස්ථාපිත කිරීම

වෙන් කරවා ගැනීම් සඳහා අති නවීන ඇමතුම් ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම 2023 වර්ෂයේදී සිදු වූ වැදගත්ඩ ජයග්‍රහණයක් විය. කාලය වෙන් කරවාගැනීම විධිමත් කරමින්, ගුවන් නියමුවන් සහ කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ රැඳී සිටීමේ කාලය සැලකිය යුතු ලෙස අඩු කරමින් මෙම පද්ධතිය මඟින් ගුවන්සේවා වෛද්‍ය පරීක්ෂණ සඳහා කාලසටහන් සැකසීමේ ක්‍රියාවලියේ වෙනසක් ඇති කරනු ලැබීය.

සිවිල් ගුවන්සේවා, ආසියා සහ පැසිෆික් කලාපවල අධ්‍යක්ෂ ජනරාල්වරුන්ගේ 58 වැනි සමුළුව



2023 ඔක්තෝම්බර් මස බංග්ලාදේශයේ ඩකා හි පැවති 58 වන DGCA සමුළුවේදී ගුවන්සේවා ආරක්ෂාව සහ පහසුකම් සැපයීම පිළිබඳ සැසිවාර සඳහා උප පරිපාලකවරයෙකු ලෙස ශ්‍රී ලංකාව පත් වූ අතර ඊට සහභාගී වන ලදී. "ඊළඟ පරම්පරාවේ ගුවන්සේවා වෘත්තිකයන්ගේ (NGAP) මුලපිරීම සමඟ එක්ව "ICAO ස්ත්‍රී පුරුෂ සමානාත්මතා වැඩසටහන ප්‍රවර්ධනය කිරීම" යන තේමාවෙන් යුත් මෙම සමුළුව මඟින් තීරණාත්මක ගුවන්සේවා ගැටළු පිළිබඳ සාකච්ඡා කිරීමට සහ අනාගත වර්ධනය සඳහා නව්‍ය අදහස් බෙදා ගැනීමට විශිෂ්ට වේදිකාවක් සපයන ලදී.

ජාතික ගුවන් ප්‍රවාහන පහසුකම් වැඩසටහන (NATFP) හරහා කාර්යක්ෂමතාව සහ ආරක්ෂාව වැඩි දියුණු කිරීම

ආර්ථික වර්ධනයට සහ ජාත්‍යන්තර සම්බන්ධතාවයට ගුවන් ගමන් වැදගත් වන යුගයක, ශ්‍රී ලංකාව සිය ගුවන්සේවා ක්ෂේත්‍රය ප්‍රගමනය කිරීමට දක්වන කැපවීම පිළිබඳ සාක්ෂියක් සපයමින් ජාතික ගුවන් ප්‍රවාහන පහසුකම් වැඩසටහන (NATFP) ක්‍රියාත්මක වේ. මෙම පරිපූර්ණ රාමුව මඟින් ජාතියේ ගුවන් තොටුපල හරහා ගුවන්යානා, කාර්ය මණ්ඩලය, මගීන් සහ භාණ්ඩ ප්‍රවාහනය ප්‍රශස්ත කිරීම, සියලු පාර්ශ්වකරුවන් සඳහා බාධාවකින් තොරව සහ ආරක්ෂිත අත්දැකීමක් සහතික කිරීම අරමුණු කරයි.

NATFP හි සාර්ථකත්වය සඳහා ජාතික ගුවන් ප්‍රවාහන පහසුකම් කමිටුව (NATFC) සහ ගුවන් තොටුපල පහසුකම් කමිටුව පිහිටුවීම මූලිකව බලපාන ලදී. වරාය, නාවික හා ගුවන්සේවා අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ සභාපතිත්වයෙන් යුත් NATFC යනු ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවාවේ විවිධ පැතිකඩ සඳහා වගකිව යුතු විවිධ රාජ්‍ය දෙපාර්තමේන්තු, ආයතන සහ සංවිධාන ඒකාබද්ධ කරන සහයෝගිතා ආයතනයකි.

යොමු නියමයන් අනුව ජාතික FAL කමිටුව පිහිටුවීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා, අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව හරහා අමාත්‍ය මණ්ඩලයෙන් විධිමත් අනුමැතිය ලබා ගන්නා ලදී.

මෙහෙයුම් කටයුතුවල විශේෂ අවස්ථා
කාර්යක්ෂමතාව සහ ඵලදායී කළමනාකරණය

අභ්‍යන්තර ගුවන් ගමන්වල මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ ආරක්ෂිත ප්‍රමිතීන් ඉහළ නැංවීමේ අරමුණින් අපි වැඩසටහන් කිහිපයකට මුලපිරුවෙමු. අත්‍යවශ්‍ය මං සලකුණු, අධි ආරක්ෂිත කලාප සහ සංස්කෘතිකමය වශයෙන් වැදගත් ස්ථාන ඇතුළත් කිරීමට විශේෂයෙන් සම්පාදනය කරන ලද දේශීය VFR සන්තරණ සිතියමේ යාවත්කාලීන අනුවාදයක් හඳුන්වාදීම වැදගත් මුලපිරීමක් විය. මෙම නවතම සංස්කරණය දැඩි ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වෙමින්, ගුවන්යානා අභ්‍යන්තරය, පියාසර පුහුණු සිසුන්, ඩ්‍රෝන ක්‍රියාකරුවන් සහ ගුවන්සේවා වෘත්තිකයන් ඇතුළු විවිධ පරාසයක පරිශීලකයින් සඳහා නිර්මාණය කර ඇත.

2010 අංක 34 දරන සිවිල් ගුවන්සේවා පනතට අනුකූලව, අපි ශ්‍රීලංකන් එයාර්ලයින්ස්, ශ්‍රීලංකන් කේටරින් සමාගම සහ සීමාසහිත ගුවන්තොටුපල සහ ගුවන්සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම නම් වූ ප්‍රධාන සේවා සපයන්නන්ගේ සෘජු සහතිකකරණය අධීක්ෂණය කර ඇත. මෙම සහතිකකරණය තුළින් මගී සහ ගුවන්යානා ගොඩබිම් මෙහෙයුම්, ගුවන්යානා ආහාර සැපයුම් සේවා සහ ගුවන් තොටුපල ආරක්ෂක කළමනාකරණය සඳහා වූ ගුණාත්මකභාවයන්ට අනුකූල වීම සහතික කරයි. මීට අමතරව, අපි සාම්ප්‍රදායික ක්‍රමය වූ කඩදාසි මත පදනම් වූ බලපත්‍ර වෙනුවට, ගුවන්යානා කාර්ය මණ්ඩලය සඳහා ස්මාර්ට් බලපත්‍ර යොදා ගැනීමට කටයුතු කොට ඇති අතර එමඟින් පරිපාලන ක්‍රියාවලීන් විධිමත් කරමින් මෙහෙයුම් කාර්යක්ෂමතාව ඉහළ නංවා ඇත.

ප්‍රධාන වාර්තා ප්‍රකාශනය

කාර්යක්ෂමතාව සහ ඵලදායී කළමනාකරණය ඉහළ නැංවීම සඳහා, අපි ආයතනික සැලැස්ම, CAASL කාර්ය වැඩසටහන, ප්‍රගති සහ කාර්ය සාධන වාර්තාව, සංඛ්‍යාන වාර්තාව, මහ බැංකු වාර්තාව, ප්‍රගති මිනුම් ප්‍රතිඵල වාර්තාව, සහ වාර්ෂික වාර්තා ඇතුළු විවිධ වාර්තා සහ ලේඛන සම්පූර්ණ කර ප්‍රකාශයට පත් කර ඇත. විනිවිදභාවය සහ වගවීම වෙනුවෙන් අපගේ කැපවීම පෙන්නුම් කරමින් මෙම වාර්තා පැහැදිලි ආකාරයෙන් සම්පාදනය කොට ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට, අදාළ රාජ්‍ය ආයතනවලට සහ ගුවන්සේවා ක්ෂේත්‍රයේ අනෙකුත් පාර්ශ්වකරුවන් වෙත ඉදිරිපත් කර ඇත.

තාක්ෂණික පුස්තකාලය

නියාමන ද්‍රව්‍ය සහ අත්පොත් යාවත්කාලීන කිරීම පවත්වා ගනිමින් තාක්ෂණික පුස්තකාලය මඟින් අපගේ ලේඛන රාමුව වැඩි දියුණු කරයි. 2016 අංක 12 දරන RTI පනතට අනුව CAASL සහ දේශීය ගුවන්සේවා කර්මාන්තය තුළ ICAO සහ අනෙකුත් ප්‍රකාශන කාර්යක්ෂමව බෙදා හැරීම, ප්‍රධාන තොරතුරු සැපයීම සහ තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ විමසුම් හැසිරවීම කෙරෙහි එය අවධානය යොමු කරයි.

CAASL වෙබ් අඩවිය


පොදු තොරතුරු මූලාශ්‍රයක් වන අපගේ වෙබ් අඩවිය නිතිපතා යාවත්කාලීන කළ අතර සිවිල් ගුවන්සේවා සඳහා ඉහළ මහජන උනන්දුව පිළිබිඹු කරමින්, 2023 වර්ෂයේදී පරිශීලකයින් 151,607 ක් භාවිත කොට ඇත.

අනුකූලතා අධීක්ෂණය සහ තාක්ෂණික සහය

CAASL මණ්ඩලයේ අනුමැතිය ඇතිව 2023 පෙබරවාරි මස අනුකූලතා අධීක්ෂණය සහ තාක්ෂණික සහය ස්ථාපිත කරන ලදී. මෙම ඒකකය තාක්ෂණික විශේෂඥතාව ලබා දීමෙන් ගුවන්සේවා ආරක්ෂාව සහ ආරක්ෂාව පිළිබඳ අධීක්ෂණය කටයුතු ශක්තිමත් කරයි. එය ප්‍රතිචාර චකිතු කිරීම සහ ඉදිරිපත් කිරීම, නිවැරදි කිරීමේ ක්‍රියාකාරී සැලසුම් සමාලෝචනය කිරීම සහ නියාමන ලේඛන සහ මාර්ගෝපදේශ ද්‍රව්‍ය යාවත්කාලීන කිරීම ඔස්සේ ICAO හි USOAP CMA වැඩසටහනෙහි ශ්‍රී ලංකාවේ ප්‍රගතිය නිරීක්ෂණය කරයි.


ජාතික ගගනයාත්‍රික සෙවුම් සහ මුදාගැනීමේ සැලැස්ම (NASARP) ඉදිරිපත් කිරීම

සෙවීම් සහ ගලවා ගැනීම අවශ්‍ය වන ගුවන්යානා සිදුවීම් සඳහා රාජ්‍ය සූදානම සහතික කිරීම සඳහා අපි පාර්ශවකරුවන් 21 දෙනෙකුගේ සහයෝගීතාවයෙන් ජාතික ගගනගාමී සෙවීම් සහ මුදාගැනීමේ සැලැස්ම (NASARP) සකස් කළෙමු. එය ජාතික නීතියක් ලෙස අංක 2347/02 අතිවිශේෂ ගැසට් පත්‍රයක් මඟින් ස්ථාපිත කරන ලදී.



අන්තර් මාර්ග ප්‍රකාශනය - ICAO

ICAO ඇමුණුම 4 ප්‍රමිතීන්ට අනුකූලව, සියලුම ස්ථාපිත පියාසැරි තොරතුරු කලාප සඳහා අන්තර් මාර්ග සැලසුම් ප්‍රකාශයට පත් කිරීම සඳහා අපි නියාමන මාර්ගෝපදේශය ලබා දුන්නෙමු.



AML අධ්‍යයනය පුළුල් කිරීම

අපි AML අධ්‍යයනය විභාග වාර ගණන වැඩි කළෙමු, අයදුම්කරුවන් බොහෝමයකට ඉඩ සලසමින් සහ විභාග ක්‍රියාවලියට පහසුවෙන් ප්‍රවේශ වීමට පහසුකම් සලසමින්, සහභාගීත්වය වැඩි කිරීම සහ ගුවන්සේවා ක්ෂේත්‍රයේ පුද්ගලයින්ගේ වෘත්තීය සංවර්ධනයට සහය වීමේ අරමුණින් අපි වසරකට තුන් වතාවක් BMICH හි දී විභාග පවත්වමු.

මගී පැමිණිලි

සමස්ත මගී පැමිණිලි සංඛ්‍යාවේ සැලකිය යුතු වෙනසක් සිදු නොවූවද, CAASL හි මැදිහත්වීම හරහා පැමිණිලිවලින් 80% කට වඩා සාර්ථකව විසඳා තිබීම විශේෂ වේ.

වීසා නිර්දේශ

ශ්‍රීලංකන් ගුවන් සමාගමේ විදේශීය සේවකයන්ට සහ රට තුළ ගුවන්සේවා පාසල්වලට බැඳෙන ජාත්‍යන්තර සිසුන් සඳහා වීසා නිර්දේශ කිරීමේදී ගුවන් ප්‍රවාහන හා ආර්ථික නියාමන අංශය මූලික වේ. 2023 වර්ෂයේදී, අපි විදේශීය සිසුන් සඳහා නිර්දේශ 160 ක් සහ විදේශිකයන් සඳහා නිර්දේශ 47 ක් පමණ ඉදිරිපත් කළෙමු.

මෙහෙයුම් කටයුතුවල විශේෂ අවස්ථා
හරිත ගුවන් සේවය

ආරක්ෂක ප්‍රමිතීන් සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට කටයුතු කිරීමට අමතරව, CAASL හි අපි ගුවන්සේවා ක්ෂේත්‍රය තුළ තිරසාර භාවිතයන් ප්‍රවර්ධනය කෙරෙහි අවධානය යොමු කරන්නෙමු. පාරිසරික හානිය අවම කිරීම සහ දේශගුණික විපර්යාසවලට එරෙහිව සටන් කිරීමේ දැඩි අවශ්‍යතාවය හඳුනා ගනිමින්, අපි හරිත ගුවන්සේවා මූලධර්ම පවත්වා ගැනීමට සහ කර්මාන්තයේ පාරිසරික පියසටහන අවම කිරීමට මූලපිරීම්වලට නායකත්වය දෙන්නෙමු.

තිරසාර ගුවන් සේවයක් සඳහා ජාතික ප්‍රතිපත්ති සංවර්ධනය

ගුවන්සේවා කර්මාන්තය සඳහා පුළුල් තිරසාර ජාතික ප්‍රතිපත්තියක් සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා අපි කටයුතු කරන්නෙමු. ගුවන්යානා නඩත්තුව සහ ඉන්ධන පරිභෝජනයේ සිට අපද්‍රව්‍ය කළමනාකරණය සහ කාබන් විමෝචනය දක්වා ගුවන්සේවා මෙහෙයුම්වල සෑම අංශයකටම පාරිසරික වශයෙන් වගකිවයුතු භාවිතයන් ඒකාබද්ධ කිරීම මෙම ප්‍රතිපත්තියෙන් අරමුණු කරයි. තිරසාරභාවයට ප්‍රමුඛත්වය දීමෙන්, අනාගත පරපුර සඳහා පිරිසිදු සහ සෞඛ්‍ය සම්පන්න පරිසරයක් දායක කරමින් වඩාත් පරිසර හිතකාමී භාවිතයන් වෙත යොමු වීමේ ගෝලීය ප්‍රයත්නයන් සමඟ ශ්‍රී ලංකාවේ ගුවන්සේවා ක්ෂේත්‍රයද යොමු කරලීමට අපි උත්සාහ කරන්නෙමු.

තිරසාර ගුවන් සේවයක් වෙනුවෙන් කටයුතු කිරීම

එමෙන්ම, හරිත ගුවන්සේවා මූලපිරීම්වල නව්‍යකරණය සහ ප්‍රගතිය වෙනුවෙන් කර්මාන්තයේ පාර්ශවකරුවන් අතර සහයෝගීතාවය සහ දැනුම හුවමාරු කර ගැනීම අපි වැදගත්කොට සලකන්නෙමු. ගුවන්සේවා, ගුවන් තොටුපල, නියාමන ආයතන සහ පාරිසරික සංවිධාන සමඟ සම්බන්ධ වීමෙන්, ගුවන්සේවා ප්‍රජාව තුළ තිරසාර සංස්කෘතියක් පෝෂණය කිරීම සහ පාරිසරික බලපෑම අවම කරන හොඳම භාවිතයන් සහ තාක්ෂණය අනුගමනය කිරීම දිරිමත් කිරීමට අපි අරමුණු කරන්නෙමු.

ශ්‍රී ලංකාව තුළ CORSIA ක්‍රියාත්මක කිරීම

CAASL විසින් ආරම්භ කරන ලද මූලපිරීමක් ලෙස, ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානයේ (ICAO) ඇමුණුම 16 වෙළුම IV ට අනුව, ජාත්‍යන්තර ගුවන්සේවා සඳහා කාබන් තුලනය කිරීමේ සහ අවම කිරීමේ යෝජනා ක්‍රමය (CORSIA) ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කර ඇත. ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල බව සහතික කරමින් ශ්‍රීලංකන් ගුවන් සමාගම විසින් සුපරීක්ෂාකාරීව දත්ත රැස් කිරීම සහ සත්‍යාපනය කිරීම මෙකී මූලපිරීම සඳහා ඇතුළත් වේ. එමෙන්ම, විමෝචන අධීක්ෂණ සැලැස්ම (EMP) අනුමත කිරීමෙන් පසුව, ෆිට්ස් වියාර් විසින් CORSIA ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියට සම්බන්ධ වී ඇත. ජාතික ප්‍රතීතන ආයතනය විසින් සහතික කරන ලද තිරසාර අනාගත සමූහය, CORSIA මධ්‍යම ලියාපදිංචි ලේඛනයේ CORSIA සත්‍යාපනය කරන්නෙකු ලෙස යාවත්කාලීන වීමෙන් දායක වී ඇත.

CO_2 විමෝචනය අවම කිරීම සහ පාරිසරික තිරසාරත්වය ශක්තිමත් කිරීම

අපගේ හරිත මූලපිරීමේ කොටසක් ලෙස, අපි ජාතික ගුවන්සේවා පාරිසරික ප්‍රතිපත්තිය සහ ICAO විසින් දක්වා ඇති ගෝලීය ප්‍රතිපත්ති රාමුවට අනුකූල වෙමින් ගුවන්සේවාහි CO_2 විමෝචනය අවම කිරීම අරමුණු කරගත් ක්‍රියාකාරී සැලැස්මක් දියත් කර ඇත්තෙමු. මෙම මූලපිරීම සඳහා ප්‍රධාන කාණ්ඩ පහකට සංවිධානය කර ඇති විමෝචන අවම කිරීමේ ක්‍රියාමාර්ග මාලාවක් එනම් තාක්ෂණය සහ ප්‍රමිති, පවත්වාගත හැකි ගුවන්සේවා ඉන්ධන, මෙහෙයුම් වැඩිදියුණු කිරීම, CORSIA හි වෙළඳපල පදනම් කරගත් පියවර සහ අතිරේක ක්‍රියාමාර්ග ඇතුළත් වේ. මෙකී පියවර, ගුවන්සේවා ආශ්‍රිත පාරිසරික ගැටළු විසඳීම සඳහා විවිධ උපාය මාර්ග සහ මනා සැලසුම් යාන්ත්‍රණයන් භාවිත කරමින් රාජ්‍ය ක්‍රියාකාරී සැලැස්මට (SAP) සැලසුමක් අනුව ඒකාබද්ධ කර ඇත. එමෙන්ම, හරිත ගුවන්සේවා මූලපිරීම් සඳහා අපගේ කැපවීම තවදුරටත් අවධාරණය කරමින්, ඇමුණුම 16 වෙළුම IV පාරිසරික ආරක්ෂණය - ජාත්‍යන්තර ගුවන්සේවා සඳහා කාබන් තුලනය සහ අවම කිරීමේ යෝජනා ක්‍රමය (CORSIA) අනුව IS 098 හි දෙවන සංස්කරණය නිකුත් කර ඇත.

ජාත්‍යන්තර ගුවන්සේවා (CORSIA) ප්‍රතීතන ක්‍රියාවලිය සඳහා කාබන් තුලනය සහ අවම කිරීමේ යෝජනා ක්‍රමය සඳහා ශ්‍රී ලංකාවේ සත්‍යාපන ආයතනය

තිරසාර අනාගත සමූහය (SFG) 2023 වර්ෂයේදී CORSIA වැඩසටහනට අදාළ විමෝචනය සත්‍යාපනය කිරීම සඳහා සත්‍යාපන ආයතනයක් ලෙස සහතික කරන ලදී. මෙය 2023 අගෝස්තු මාසයේදී මාලී හි පවත්වන ලද පිළිගත් ශ්‍රී ලාංකික සත්‍යාපන ආයතනයක් බවට පත් වීමට SFG සඳහා CORSIA ප්‍රතීතන ක්‍රියාවලියේ අවසාන පියවර ලෙස ක්‍රියා කරනු ලබන සාක්ෂි විගණනයකින් පසුව සිදු විය.

මෙකී ප්‍රතීතනය හේතුවෙන් කලාපයේ අනෙකුත් ගුවන් සමාගම්වල විමෝචනය සත්‍යාපනය කිරීමට SFG හට හැකියාව ලබා දෙන බැවින් මෙය රට වෙනුවෙන් ලද සැලකිය යුතු ජයග්‍රහණයකි. ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය (SLAB) විසින් නියම කර ඇති ජාත්‍යන්තර ගුවන්සේවා (CORSIA) ප්‍රමිතීන් සහ අවශ්‍යතා සඳහා වූ කාබන් තුලනය සහ අවම කිරීමේ යෝජනා ක්‍රමය SFG සපුරාලන බව ප්‍රතීතනය මඟින් සහතික කරයි. අනුරූප ICAO ලේඛනවල CORSIA-ප්‍රතීතනය ලත් සත්‍යාපන ලද්දක් ලෙස SFG දැක්වේ.

පරිසර කාර්යසාධනය

යුරෝපා සංගමය - දකුණු ආසියා හවුල්කාරිත්ව ව්‍යාපෘතිය (EU-SA APP) යටතේ EU-SA APP II - දකුණු ආසියානු ගුවන්සේවා අංශයේ පාරිසරික කාර්ය සාධනය වැඩිදියුණු කිරීම සඳහා ගුවන්සේවාහි පාරිසරික ගැටලු නම්න් වැඩමුළුවක් පවත්වන ලදී.



යුරෝපා සංගමය - දකුණු ආසියා හවුල්කාරිත්ව ව්‍යාපෘතිය II (EU-SA APP II) විසින් 2023 ඔක්තෝබර් 16 සිට 20 දක්වා EU-SA APP II - ගුවන්සේවාහි පාරිසරික ගැටලු: හරිත හා වඩා තිරසාර ගුවන්සේවාවක් සඳහා යුරෝපා සංගමය - දකුණු ආසියාව එකමුතුව නමින් ශ්‍රී ලංකාව තුළ වැඩමුළුවක් පවත්වන ලදී. සහභාගිවන්නන්ට CORSIA ක්‍රියාවට නැංවීම සම්බන්ධයෙන් ප්‍රගතියක් ලබා ගැනීමට සහ කාබන් විමෝචන තුලනය කිරීම, SAF සහ රාජ්‍ය ක්‍රියාකාරී සැලසුම් (SAP) හි විභව භූමිකාව පිළිබඳ ඔවුන්ගේ දැනුම වැඩි දියුණු කිරීම සඳහා පහසුකම් සැලසීමට මෙම සතියක වැඩමුළුව මඟින් අරමුණු කොට ඇත.තිරසාර ගුවන් ඉන්ධන සංවර්ධනයට සහ යෙදවීමට අදාළ කාර්යභාරය සහ අභියෝග පිළිබඳව සහභාගිවන්නන්ට තවදුරටත් අවබෝධයක් ලබා ගැනීමට උපකාර කිරීම සඳහා මෙම වැඩමුළුවේදී සැසි පැවැත්විණ.



මෙහෙයුම් කටයුතුවල විශේෂ අවස්ථා
ගුවන්සේවා වර්ධනය

ගුවන් මෙහෙයුම්

කොවිඩ්-19 සීමා කිරීම් ලිහිල් වීමත් සමඟ ශ්‍රී ලංකාවේ ගුවන් ප්‍රවාහන අංශය සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කළේය. එමිරේට්ස්, එතිහාඩ්, එයාර් ඇරබියා සහ කටාර් එයාර්වේස් වැනි මැද පෙරදිග ගුවන්සේවා ආර්ථිකය නංවාලමින් සිය මෙහෙයුම් පුළුල් කළේය. ඕමාන් එයාර්, ෆ්ලයිඩුබායි, සලාම් එයාර්, ජසීරා එයාර්වේස් සහ ගල්ෆ් එයාර් ඇතුළු අනෙකුත් ගුවන් සමාගම් ද වර්ධනය වෙනුවෙන් කටයුතු කළහ. තුර්කි ගුවන් සේවය ඉස්තාන්බුල් සිට කොළඹ දක්වා සෘජු ගුවන් ගමන් හඳුන්වා දෙමින්, සම්බන්ධතා වැඩි දියුණු කළේය. රොසියා එයාර්ලයින්ස් විසින් එරෝෆ්ලොට් වෙනුවට රුසියානු ගුවන් ගමන් නැවත ආරම්භ කළේය. සිංගප්පූරු එයාර්ලයින්ස්, මැලේසියා එයාර්ලයින්ස්, එයාර් ඒෂියා, තායි එයාර් ඒෂියා සහ මලින්ඩෝ වැනි ඈත පෙරදිග ගුවන්සේවා ඔවුන්ගේ සේවා පුළුල් කළහ. චීනය සීමාවන් ඉවත් කරමින්, චයිනා ඊස්ටර්න් එයාර්ලයින්ස් ගුවන් ගමන් වැඩි කිරීමට සහ එයාර් චයිනාහි මෙහෙයුම් ආරම්භ කිරීමට ඉඩ සැලැස්වීය. ඉන්දියානු ගුවන් සමාගම් එයාර් ඉන්දියා, විස්තාරා, ස්පයිස් ජෙට් සහ ඉන්ඩිගෝ මඟින් ශක්තිමත් සම්බන්ධතා පවත්වා ගෙන ගිය අතර, එලායන්ස් එයාර් යාපනය දක්වා ව්‍යාප්ත කළේය. එයාර් සීෂෙල්ස් ශ්‍රී ලංකාව හරහා අප්‍රිකාව සහ ආසියාව යා කරමින් ගුවන් ගමන් ආරම්භ කළේය. මීට අමතරව, එයාර් ඇරබියා අබුඩාබි 2023 දී මෙහෙයුම් දියත් කළේය.

භාණ්ඩ මෙහෙයුම්

ශ්‍රී ලංකන් එයාර්ලයින්ස්, කටාර් එයාර්වේස්, එතිහාඩ් සහ කැතේ පැසිෆික් ඔවුන්ගේ භාණ්ඩ ප්‍රවාහනය තුළින් ශ්‍රී ලංකාවේ ආර්ථිකය නංවාලීම සඳහා තීරණාත්මක කාර්යභාරයක් ඉටු කළ අතර අනෙකුත් මහී ගුවන් සමාගම් ද භාණ්ඩ ප්‍රවාහනය සඳහා යොමුවීමෙන් දායක වේ.

වරලත් මෙහෙයුම්

පශ්චාත් කොවිඩ් තත්ත්වය සහ යුරෝපීය සංචාරකයින් ආසියාව වෙත නැඹුරුවීම හේතුවෙන් ශ්‍රී ලංකාව වෙත වරලත් ගුවන් ගමන් වැඩි විය. රුසියානු ගුවන්සේවාවන රෙඩ්වින්ග් සහ අසූර් එයාර්ලයින්ස් විසින් ස්කයි අප්, ෆලයිවින්, උස්බෙකිස්තාන් වරලත් මෙහෙයුම් ආරම්භ කළ බල්ගේරියන් එයාර් විසින් ද මත්තල ගුවන් තොටුපල වෙත ගුවන් ගමන් දියත් කරන අතර සතිපතා මහී ආසන 6,000 ක් පමණ පිරිනැමේ. අසූර් එයාර්ලයින්ස් කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල දක්වා ක්‍රියාත්මක විය. එන්ටර් එයාර්, LOT පෝලිෂ්, සහ ස්මාර්ට් වින්ග්ස් විසින් වරලත් ගුවන් ගමන් එකතු කරන ලද අතර අර්කියා එයාර්ලයින්ස් කලාපීය ගැටුම් හේතුවෙන් ප්‍රමාදීව මෙහෙයුම් ආරම්භ කළේය.

දේශීය ගුවන්සේවා

ෆිට්ස් එයාර් සහ සිනමන් එයාර් ශ්‍රී ලංකාව තුළ දේශීය වරලත් ගුවන් ගමන් සැපයූ අතර, අඩු ඉල්ලුම හේතුවෙන් නියමිත සේවා නිතිපතා සිදුනොකළ අතර, ඇතැම් හෙලිකොප්ටර් ක්‍රියාකරුවන් විසින් පාරිභෝගික ඉල්ලීම් මත මෙහෙයුම් සිදුකරනු ලැබිණ.

සංචාරක නියෝජිත ආයතන බලපත්‍රය

2023 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ නව සංචාරක ආයතන 127 ක් ආරම්භ වූ අතර එය 2022 වර්ෂය අනුව 39ක වර්ධනයක් වේ. ගුවන් ප්‍රවාහන ව්‍යාපාර ක්‍රියාකාරකම්වල සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කරමින් නියෝජිත ආයතන 400 ක් පමණ ඔවුන්ගේ බලපත්‍ර අලුත් කොට ඇත. මෙහෙයුම් සඳහා සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවසරය අවශ්‍ය වේ.

ගුවන්සේවා පිළිබඳ සාකච්ඡා

සිව් වසරක විරාමයකින් පසු, ශ්‍රී ලංකාව එක්සත් අරාබි එමීර් රාජ්‍යය සමඟ ගුවන්සේවා සාකච්ඡා නැවත ආරම්භ කළ අතර, අපගේ කර්මාන්තයට වාසිදායක ප්‍රතිඵල ලබා දෙමින්, ගුවන්සේවා මෙහෙයුම් ඉහළ නැංවීමේ හැකියාව පවතී. තවද, ශ්‍රී ලංකාව සහ මෙම ජාතීන් අතර ගුවන්සේවා වැඩිදියුණු කිරීම සඳහා අපි නෙදර්ලන්තය, මියන්මාරය සහ තායිලන්තය වැනි රටවල් සමඟ බහුවිධ ගුවන්සේවා ගිවිසුම් සංශෝධනය කළෙමු.

සිවිල් ගුවන්සේවා ප්‍රධාන සැලැස්ම (CAMP)

ශ්‍රී ලංකාවේ සිවිල් ගුවන්සේවා ක්ෂේත්‍රයේ අනාගතය සඳහා පාඨමාලා සකස් කිරීම කෙරෙහි උපායමාර්ගික අවධානයක් යොමු කරමින්, අපි පුළුල් ජාතික ගුවන්සේවා ප්‍රධාන සැලැස්මක් (CAMP) සංවර්ධනය කිරීම ආරම්භ කළෙමු. මෙම මුලපිරීම ඉදිරි දශකය තුළ රටේ ගුවන්සේවා කර්මාන්තයේ ගමන් පථය හැඩගැස්වීම සඳහා වන ප්‍රධාන පියවරක් වන අතර, ප්‍රධාන අභියෝගවලට විසඳුම් සෙවීම, අවස්ථා ප්‍රයෝජනයට ගැනීම සහ තිරසාර වර්ධනයක් සහතික කිරීම අරමුණු කර ගෙන ඇත.

වාණිජ මහී මෙහෙයුම් වර්ධනය කිරීම

කොවිඩ්-19 වසංගතයෙන් අහිතකර ලෙස බලපෑ රත්මලාන, මත්තල සහ යාපනය ඇතුළු උපාය මාර්ගික වශයෙන් වැදගත් ගුවන් තොටුපලවල වාණිජ මහී මෙහෙයුම් යළි ශක්තිමත් කරලීමට කටයුතු සිදුකොට ඇත. ගුවන්සේවා ක්‍රමයෙන් නැවත ආරම්භ වන විට, නව විදේශ ගුවන්සේවා කිහිපයකට ලබා දී ඇති අනුමැතිය තුළින් ජාත්‍යන්තර හවුල්කාරිත්වයන් ශක්තිමත් කිරීම සහ අපගේ ගුවන්සේවා ජාලය පුළුල් කිරීම අප දරන ප්‍රයත්නයන් අවධාරණය කරයි. එක්සත් අරාබි එමීර් රාජ්‍යය වැනි ප්‍රධාන ගුවන්සේවා මධ්‍යස්ථාන සමඟ ද්විපාර්ශ්වික සාකච්ඡා මඟින් ගෝලීය ගුවන් සේවය තුළ වැදගත් සාමාජිකයෙකු ලෙස අපගේ ස්ථාවරය තවදුරටත් ශක්තිමත් කරමින්, වැඩි සම්බන්ධතාවයක් සහ ආර්ථික අවස්ථා සඳහා පහසුකම් සපයයි.

ගුවන්සේවා දැනුවත් කිරීමේ වැඩසටහන

ගුවන්සේවා කර්මාන්තය සඳහා අනාගත පරම්පරාවන් සම්බන්ධ කර ගැනීමට සහ දැනුවත් කිරීමට අපි කටයුතු කළෙමු. පාසල් සිසුන් ඉලක්ක කරගත් අධ්‍යාපනික වැඩසටහන් මඟින් තරුණ සිත් තුළ උනන්දුව සහ උද්යෝගය ඇතිකරමින් ගුවන් තොටුපල මෙහෙයුම් පිළිබඳ ප්‍රායෝගික

ඉගෙනුම් අත්දැකීම් සහ තීක්ෂ්ණ බුද්ධිය ලබා දීම සඳහා නවීකරණය කර ඇත. තවද සියලුම ශ්‍රී ලාංකීය සිසුන් අතර ගුවන්සේවා පිළිබඳ දැනුවත්භාවය සහ අවබෝධය පුළුල් කිරීමට ජාතික රූපවාහිනිය ඔස්සේ මාසිකව විකාශය කෙරෙන වැඩමුළු මාලාවක් උපකාරී වන අතර, එය ආර්ථික වර්ධනය සහ සමාජ සංවර්ධනය සඳහා කර්මාන්තයේ කාර්යභාරය අවධාරණය කරයි. නවෝත්පාදන, අධ්‍යාපනය සහ සහයෝගීතාවයේ සංස්කෘතියක් පෝෂණය කිරීමෙන්, ශ්‍රී ලංකාවේ ගුවන්සේවා ක්ෂේත්‍රය සඳහා තිරසාර සහ ජවසම්පන්න අනාගතයක් සහතික කරමින් මීළඟ පරම්පරාවේ ගුවන්සේවා වෘත්තිකයන් සහ උද්යෝගිමත් පිරිස් සවිබල ගැන්වීමට අපි අරමුණ කරන්නෙමු.

"ගුවන් සැරිසර" රූපවාහිනී වැඩසටහන විකාශය



"ගුවන් සැරිසර" රූපවාහිනී විශේෂාංග වැඩසටහන ජනප්‍රියත්වයට පත්ව ඇත්තේ එහි අද්විතීය නිෂ්පාදන විලාසය සහ මින් පෙර කිසිදා දැක නැති හෝ ප්‍රසිද්ධියේ ප්‍රදර්ශනය නොකළ ගුවන්සේවා ක්ෂේත්‍රයේ රසවත් පැතිකඩක් ආවරණය වන දර්ශන නිසාවෙනි. මෙම වැඩසටහන එහි ජනප්‍රියත්වය සහ සමාජයට වෙනුවෙන් දක්වන දායකත්වය හේතුවෙන් සම්මානයට පාත්‍ර විය. එය සෙනසුරාදා 06.30 ට රූපවාහිනියේ විකාශය විය. "සිවිල් ගුවන්සේවාවේ" වැදගත්කම පිළිබඳ දැනුවත් කිරීමේ මට්ටම් ඉහළ නැංවීම සඳහා CAASL පුවත් සහ සිවිල් ගුවන්සේවා ක්ෂේත්‍රයේ පුවත් මුද්‍රිත සහ විද්‍යුත් මාධ්‍ය හරහා ප්‍රකාශයට පත් කිරීම ආරම්භ කරන ලද අතර එමඟින් විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය භාවිතයෙන් තොරතුරු ප්‍රකාශයට පත් කිරීමට පියවර ගෙන ඇත.

ශ්‍රී ලංකා ගුවන්සේවා දිනය 2023

ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන සංගමයේ (IATA) සහයෝගීතාවයෙන් අපි 2023 ජූලි 14 වැනි දින "ශ්‍රී ලංකා ගුවන්සේවා දිනය" පැවැත්වුවෙමු. මෙම අවස්ථාවෙහිදී පශ්චාත් කොවිඩ් ගුවන් ගමන් අභියෝග සහ තිරසාර වර්ධනය සඳහා උපාය මාර්ග සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදී. ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා සහ පිලිප් ගෝ මහතා ඇතුළු ප්‍රධාන කථිකයන් විසින් ස්මාර්ට් ගුවන් තොටුපල සංවර්ධනය සහ ගුවන් ආරක්ෂාව වැනි පිළිබඳ අදහස් දැක්වීය. ශ්‍රී ලංකාවේ ගුවන්සේවා ක්ෂේත්‍රය ශක්තිමත් කරමින් කර්මාන්තයේ ප්‍රධානීන් සහ පාර්ශ්වකරුවන් අතර දැනුම හුවමාරු කර ගැනීමට මෙම සහයෝගීතාවය හේතු විය.





පාසල් ළමුන් සඳහා ගුවන්සේවා පිළබඳ දැනුවත් කිරීමේ වැඩසටහන



ශ්‍රී ලංකාවේ අනාගත පරපුර අතර ගුවන්සේවා සම්බන්ධ දැනුම ගොඩනැගීමේ අරමුණින් පාසල තුළ "සිවිල් ගුවන්සේවා සංගමයක්" පිහිටුවීම පිළිබඳව සිසුන් දැනුවත් කරමින් ගුවන්සේවා දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී. මෙම විෂය පිළිබඳව වැඩි අවබෝධයක් සහ උනන්දුවක් ඇති කිරීමට සිවිල් ගුවන්සේවා සංකල්පය සමඟ තරුණ සිසුන් වෙත ඉදිරිපත් කිරීම වැඩසටහන් වල අරමුණ විය.

මෙහෙයුම් කටයුතුවල විශේෂ අවස්ථා
ගුවන්සේවා වර්ධනය

ගුවන්සේවා ශ්‍රම බලකාය සහ රැකියා අවස්ථා වැඩි දියුණු කිරීම

ගුවන්සේවා වර්ධනය ඉහළ නැංවීම සඳහා, අපි "ශ්‍රී ලංකා ගුවන්සේවා කර්මාන්තයේ රැකියා අවස්ථා සහ ශ්‍රම බලකායේ ගතිකත්වය සිතියම්ගත කිරීම: පුළුල් රැකියා වෙළෙඳපොළ විශ්ලේෂණයක්" යන මැයෙන් පුළුල් පර්යේෂණ ව්‍යාපෘතියක් ආරම්භ කර ඇත. මෙම පර්යේෂණයේ මූලික අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ ගුවන්සේවා ක්ෂේත්‍රය පිළිබඳ ගැඹුරු දළ විශ්ලේෂණයක් සැපයීම, පවතින බඳවා ගැනීමේ අවස්ථා හඳුනා ගැනීම සහ ශ්‍රම බලකායේ ගතිකත්වය විශ්ලේෂණය කිරීමයි. මෙම මූලපිරීම කර්මාන්ත අවශ්‍යතා සහ අධ්‍යාපනික පිරිනැමීම් අතර පරතරය පියවීමෙන්, ශ්‍රම බලකායේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සහ ශ්‍රී ලංකා ගුවන්සේවා කර්මාන්තයේ වර්ධනයට සහ තරඟකාරිත්වයට ශක්තියක් වීම අරමුණු කරයි.

ගුවන්සේවා පිළිබඳ දැනුම වර්ධනය කරලීම



ශ්‍රී ලංකාවේ අනාගත පරපුර වෙත ගුවන්සේවා දැනුම ලබාදීමේ අරමුණින් ගුවන්සේවා දැනුවත් කිරීමේ වැඩසටහන් ආරම්භ කරන ලදී. සිවිල් ගුවන්සේවා පිළිබඳව සිසුන් දැනුවත් කිරීම සහ පාසල් තුළ "සිවිල් ගුවන්සේවා සංගම්" පිහිටුවීම දිරිමත් කිරීම මෙම මුල පිරීම්වලින් අරමුණු කරයි. සිවිල් ගුවන්සේවා ප්‍රවර්ධන ප්‍රයත්නවල අංගයක් වශයෙන් පාසල් දැනුවත් කිරීමේ වැඩසටහන්වල මීළඟ අදියර ලෙස ගුවන් තොටුපල වැඩමුළු හඳුන්වා දෙන ලදී. මීට අමතරව, ගුවන් තොටුපල පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වීම සඳහා අපි ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව සමඟ අත්වැල් බැඳගත් අතර ගුවන්සේවා කර්මාන්තය පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා "ගුවන් සැරිසර" රූපවාහිනී වැඩසටහන විකාශය කළෙමු. මෙම මූලපිරීම් නරඹන්නන් බොහෝ දෙනෙකුගේ සිත් දිනා ගත් අතර, සිවිල් ගුවන්සේවා සමඟ මහජන සහභාගීත්වය වැඩි කිරීමට දායක විය.

BIA හි පිටත්වීමේ පර්යන්තය පුළුල් කිරීම

BIA හි වැඩි වූ තදබදය විසඳීම සඳහා, අපි පිටත්වීමේ පර්යන්තය පුළුල් කිරීම සඳහා අතුරු සැලැස්මක් යෝජනා කළෙමු. මෙම ව්‍යාප්තිය සඳහා බිම් ප්‍රමාණය, පිරික්සුම් කවුන්ටර, ආරක්ෂක පිරික්සුම් යන්ත්‍ර, ගමන් මලු වාහක සහ අනෙකුත් පහසුකම් ඇතුළත් වන අතර, ලබන වසර අවසන් වන විට සම්පූර්ණ කිරීමට අපේක්ෂා කෙරේ. ගුවන් තොටුපලේ ආරක්ෂාව, සුරක්ෂිතභාවය සහ ප්‍රශස්ත මගී පහසුකම් සහතික කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ.

A320 මෙහෙයුම් සඳහා යාපනය ජාත්‍යන්තර ගුවන් තොටුපල (JIA) සංවර්ධනය කිරීම

A320 ගුවන්යානා සඳහා JIA මෙහෙයුම් දීර්ඝ කිරීමට රජය අපේක්ෂා කරයි. වැඩිදුර ඇගයීම සඳහා රේඛීය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලද වාර්තාවක් සමඟ අදාළ බලධාරීන් හා සහයෝගයෙන් පුළුල් කිරීම සඳහා ඉඩම් හඳුනාගැනීමේ කටයුතු අපි ආරම්භ කළෙමු.

ජාත්‍යන්තර මෙහෙයුම් සඳහා හිඟුරක්ගොඩ ගුවන්තොටුපල සංවර්ධනය කිරීම

2024 අයවැයෙන් රජයේ මුදල් වෙන් කිරීමට පෙර, හිඟුරක්ගොඩ ගුවන්තොටුපලේ වත්මන් සැකැස්ම ඇගයීමට අපි එය අධ්‍යනය කොට වියදම් සහ ශක්‍යතා අධ්‍යයන අවශ්‍යතා පිළිබඳ සවිස්තර වාර්තාවක් ලබා දුන්නෙමු.

MRIA හි ගුවන්යානා විසුරුවා හැරීමේ පහසුකම ස්ථාපිත කිරීම


ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර මූලික පරීක්ෂණ පවත්වා, අවශ්‍යතා ගුවන් තොටුපල ක්‍රියාකරු වෙත දැනුම් දීමෙන් MRIA හි ගුවන්යානා විසුරුවා හැරීමේ ස්ථානයක් පිහිටුවීමට අපි යෝජනා කළෙමු.

රාජ්‍ය තාන්ත්‍රික නිෂ්කාශනය සඳහා ස්ථාවර මෙහෙයුම් ක්‍රියාපටිපාටිය (SOP) සංවර්ධනය කිරීම

ශ්‍රී ලංකාව, විදේශ හමුදාව හෝ ශ්‍රී ලංකාව වෙතට පැමිණෙන විදේශ ගුවන්යානා හෝ ශ්‍රී ලංකාව සහ ශ්‍රී ලංකා භූමියට ඉහළින් පියාසර කරන රාජ්‍ය ගුවන්යානා සඳහා රාජ්‍යතාන්ත්‍රික නිෂ්කාශන ලබාදීමට CAASL, ආරක්ෂක අමාත්‍යාංශය (MOD) සහ අනෙකුත් පාර්ශවකරුවන් 18 දෙනෙකු සමඟ එක්ව ස්ථාවර මෙහෙයුම් ක්‍රියා පටිපාටියක් (SOP) සකස් කරන ලදී.


5LNC අඩුපාඩු නිවැරදි කිරීම

අපි කොළඹ පර්යන්ත ගුවන් අවකාශය තුළ "අකුරු දෙකේ මාර්ග ලකුණු නිර්මාණකරුවන්", ICAO පිළිගත් අකුරු පහේ නාම කේත (5LNC) සමඟ ප්‍රතිස්ථාපනය කොට, ICAO ජාත්‍යන්තර කේත සහ මාර්ග සැලසුම්කරුවන්ගේ (ICARD) පද්ධතියේ මෙම වෙනස්කම් ලියාපදිංචි කළෙමු.




ATM හදිසි අවස්ථා සැලැස්ම - ප්‍රකාශයට පත් කළ දෙවන අනුවාදය

හදිසි අවස්ථා වලදී අබණ්ඩ ගුවන්යානා මෙහෙයුම් සහතික කිරීම සඳහා අපි කොළඹ පියාසැරි තොරතුරු කලාපය (FIR) සඳහා II මට්ටමේ ATM හදිසි අවස්ථා සැලැස්මේ දෙවන අනුවාදය සංවර්ධනය කර ප්‍රකාශයට පත් කළෙමු.



CAASL මගින් ATM හදිසි අවස්ථා සැලසුම්කරණ සහය

I මට්ටමේ ATM හදිසි අවස්ථා සැලසුම සංවර්ධනය කිරීම සහ අනුමැතිය කිරීම සඳහා අපි ගුවන සන්තරණ සේවා දායකයින් (ANSPs) වෙත විශේෂඥ මගපෙන්වීමක් ලබා දුන්නෙමු.



ගුවන්සේවා වෛද්‍ය විද්‍යාව පිළිබඳ පුළුල් දැනුවත් කිරීමේ වැඩසටහන්

2023 වර්ෂයේදී ප්‍රජා සහභාගීත්වය සහ දැනුවත් කිරීම ප්‍රධාන තැනක් ගන්නා ලදී. ගුවන්සේවා වෛද්‍ය විද්‍යාව පිළිබඳ ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සඳහා ගුවන්සේවා කර්මාන්තය ක්‍රියාකාරිව සහභාගී විය. ගුවන්සේවා ක්ෂේත්‍රයේ සෞඛ්‍ය සහ යහපැවැත්මේ වැදගත්කම පිළිබඳව ගුවන්සේවා වෘත්තිකයන් පමණක් නොව පුළුල් මහජනතාව ද දැනුවත් කිරීම මෙම මූලපිරීම්වල අරමුණ විය. ව්‍යාප්ති ව්‍යාපාර, සම්මන්ත්‍රණ සහ ඩිජිටල් මාධ්‍ය කිහිපයක් හරහා කර්මාන්තය සෞඛ්‍ය පිළිවෙත්, වැළැක්වීමේ පියවර සහ ගුවන් සේවයේ වෛද්‍ය සූදානමේ වැදගත්කම පිළිබඳ තීරණාත්මක තොරතුරු බෙදා හරින ලදී. මෙම ප්‍රයත්නයන් සියලු පාර්ශ්වකරුවන් අතර සෞඛ්‍ය පිළිබඳ දැනුවත්භාවයක් වූ සංස්කෘතියක් සහ ආරක්ෂාව පිළිබඳ දැනුවත්භාවයක් ඇති කිරීමට උපකාරී විය.

වෙන් කර ගැනීම් සඳහා ඇමතුම් පද්ධතියක් ස්ථාපිත කිරීම

වෙන් කර ගැනීම් සඳහා අති නවීන ඇමතුම් ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම 2023 වර්ෂයේ විශේෂ ජයග්‍රහණයක් විය. ගුවන්සේවා වෛද්‍ය පරීක්ෂණ සඳහා කාලසටහන් සැකසීමේ ක්‍රියාවලිය සඳහා මෙම පද්ධතිය මඟින් විශාල වෙනසක් ඇති කළේය. මෙම නවෝත්පාදනය මඟින් වෙන් කර ගැනීම් විධිමත් කිරීම සහ ගුවන් නියමුවන් සහ කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා රැඳී සිටීමේ කාලය අවම කරමින් කාර්යක්ෂමතාව වැඩි දියුණු කළා සේම සමස්ත ගුවන්සේවා ආරක්ෂාව සඳහා ද සැලකිය යුතු දායකත්වයක් ලබා දුන්නේය.

නව ගුවන්සේවා වෛද්‍ය පරීක්ෂකවරුන් පත් කිරීම

ගුවන්සේවා වෛද්‍ය සේවා සඳහා වැඩිවන ඉල්ලුම සපුරාලීම සඳහා, ශ්‍රම බලකාය පුළුල් කරමින් සහ කර්මාන්තයට ප්‍රමාණවත් සුදුසුකම්ලත් වෘත්තිකයන් සංඛ්‍යාවක් පවතින බව සහතික කරමින් නව වෛද්‍ය පරීක්ෂකවරුන් පත් කරන ලදී. පත් කරන ලද පරීක්ෂකයින් ඉහළම නිපුණත්වයකින් සහ සදාචාරාත්මක හැසිරීමකින් යුතු බවට සහතික කිරීම සඳහා දැඩි තේරීම් නිර්ණායක ක්‍රියාත්මක කරන ලදී.

ගුවන්සේවා වෛද්‍ය විද්‍යාවේ උසස් නියාමන ප්‍රමිතීන්

ගුවන්සේවා සහ වෛද්‍ය විද්‍යාවන්හි ගතික ස්වභාවය හඳුනා ගනිමින් ගුවන්සේවා වෛද්‍ය විද්‍යාවේ නියාමන ප්‍රමිතිවල පුළුල් යාවත්කාලීන කිරීමක් සිදු කරන ලදී. ගුවන්සේවා බලධාරීන්, වෛද්‍ය විශේෂඥයන් සහ නියාමන ආයතන අතර සහයෝගීතාවය මෙයට ඇතුළත් විය. එකී ප්‍රමිතීන් තාක්ෂණික දියුණුව සමඟ මෙන්ම නැගී එන සෞඛ්‍ය අභියෝගවලට ප්‍රතිචාර දක්වන බව සහතික කිරීම එහි අරමුණ විය.


මිනිසුන් රහිත ගුවන්යානා පද්ධති - (ඩ්‍රෝන මෙහෙයුම්)

2010 අංක 14 දරන සිවිල් ගුවන්සේවා පනතේ 80 වැනි වගන්තියේ දක්වා ඇති නියමයන්ට අනුකූලව, ශ්‍රී ලංකාවේ භෞමික මායිම්වල සියලුම මිනිසුන් රහිත ගුවන්යානා අධීක්ෂණය කිරීමට සහ නියාමනය කිරීමට සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂක ජනරාල් (DGCA) වෙත බලය පැවරී ඇත.

වසංගත හා ආර්ථික පසුබෑමෙන් මතු වූ අභියෝගවලින් පසුව 2023 මූල්‍ය වර්ෂය තුළ ශ්‍රී ලංකාවේ UAS අංශයේ කැපී පෙනෙන වර්ධනයන් ඇති විය. පෙර වසර හා සසඳන විට නිකුත් කරන ලද මෙහෙයුම් අනුමත කිරීම් සහ නව ඩ්‍රෝන් ලියාපදිංචි කිරීම් සැලකිය යුතු ලෙස ඉහළ යාම මෙයට සාක්ෂි දරයි.


මෙහෙයුම් කටයුතුවල විශේෂ අවස්ථා
ගුවන්සේවා වර්ධනය

නිකුත් කරන ලද ඩ්‍රෝන මෙහෙයුම් අනුමත කිරීම් ප්‍රමාණය



තවද, මෙම කාලසීමාව තුළ UAS පුහුණු සංවිධානවලට අදාළ වන ප්‍රමිතීන් නිරූපණය කරන SLCAP 4600 ක්‍රමවත් සැකසීම ඇතුළුව ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය (CAASL) විසින් සැලකිය යුතු වර්ධනයක් අත්පත් කර ගන්නා ලදී. මීට අමතරව, CAASL විසින් UAS මෙහෙයුම් පාලනය කරන නීති සහ ප්‍රමිතීන් ඇතුළත් SLCAIS 053 සංස්කරණය 2 සාර්ථකව සංවර්ධනය කර අවසන් කරන ලදී.

කර්මාන්තය පවතින විභවයන් හඳුනා ගනිමින්, ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය (CAASL) ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානයේ (ICAO) අවශ්‍යතා සහ කලාපීය වර්ධනයන් සමඟ කටයුතු කරනු ලබන අනාගත සැලසුම් සකස් කර ඇත. මෙම උපායමාර්ගික මුලපිරීම් ඉදිරි වර්ෂවලදී ක්‍රියාත්මක කිරීමට සූදානම් වේ.



ධාරිතා සංවර්ධනය

2023 වර්ෂයේදී, පසුගිය කාල සීමාවේ රජය පනවා තිබූ සීමාවලට මුහුණදෙමින් සේවක බඳවා ගැනීම් නැවත ආරම්භ කිරීමත් සමඟ අපි සැලකිය යුතු වටිනාකමක් අත්කර ගත්තෙමු. අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය අපගේ බඳවා ගැනීමේ කටයුතු නැවත ආරම්භ කිරීමට යහපත් ලෙස බලපෑ අතර, ධාරිතාව සහ මෙහෙයුම් කාර්යක්ෂමතාවය වැඩි දියුණු කළේය. අපි මූල්‍යමය බාධා මධ්‍යයේ වුවද, පුහුණු වැඩසටහන් සඳහා විදේශීය ශිෂ්‍යත්ව යොදා ගනිමින් වෘත්තීය සංවර්ධනය සඳහා ආයෝජනය කළෙමු. දක්ෂතා පෝෂණය කිරීම සහ අඛණ්ඩ ඉගෙනීම පෝෂණය කිරීම, ගුවන් ක්ෂේත්‍රයේ විශිෂ්ටත්වය සහ වර්ධනය සඳහා අපගේ පදනම ශක්තිමත් කිරීම වෙනුවෙන් අපගේ කැපවීම මෙකී මූලපිරීම් තුළින් අවධාරණය කරයි,

ගුවන් කාර්ය මණ්ඩල බලපත්‍ර වැඩමුළුව

අපි SARI (දකුණු ආසියා කලාපීය මූලපිරීම්), EASA (යුරෝපා සංගමයේ ගුවන්සේවා ආරක්ෂක නියෝජිතායතනය) එක්ව සංවිධානය කරන ලද පුළුල් වැඩමුළුවක සඳහා මෙන්ම ගුවන් කාර්ය මණ්ඩල බලපත්‍ර සඳහා සම්මත 72 ක්‍රියාත්මක කිරීමට මූලිකත්වය ගෙන කටයුතු කළෙමු. EASA හි විශේෂඥයෙකු විසින් මෙහෙයවන ලද මෙම වැඩමුළුව ඔස්සේ ජාත්‍යන්තර ගුවන්සේවා ආරක්ෂණ ක්‍රියාපිළිවෙත්වලට අනුකූලවීම සහතික කරමින්, ගුවන්සේවායේ නියුතු පුද්ගලයින්ගේ ප්‍රවීණතාවය ඉහළ නංවමින් ප්‍රමිතිය ක්‍රියාත්මක කිරීම පිළිබඳ සවිස්තරාත්මක මග පෙන්වීමක් සහ පුහුණුවක් ලබා දීම අරමුණු කරයි.

ගුවන්සේවා සහතිකකරණ ප්‍රයත්න

ගුවන් කාර්ය මණ්ඩල බලපත්‍ර ප්‍රමිතීන් ඉහළ නැංවීමේ ප්‍රයත්නයන්හිදී, අපි සාමාන්‍ය ගුවන්සේවා සහ ජාත්‍යන්තර ගුවන්සේවා හරහා ගුවන් නියමුවන් සඳහා IS 72 සමඟ අනුකූල වූ නව නිපුණතා පරීක්ෂණ ආකෘතිය හඳුන්වා දුන්නෙමු. මීට අමතරව, පියාසර පුහුණු සංවිධාන සඳහා සහතිකකරණ ක්‍රියාවලිය ආරම්භ කිරීමට 'පූර්ව-අයදුම්පත්' සහ 'විධිමත් අයදුම්පත්' රැස්වීම් පවත්වන ලදී. පරීක්ෂක ප්‍රවීණතාවය ඉහළ නැංවීම සඳහා, අපි පෞද්ගලික බලපත්‍ර විභාගය සහ පියාසර පුහුණුව ආවරණයවන විදේශීය පුහුණු වැඩසටහන් සහය සමඟින් PEL පරීක්ෂක මූලික පුහුණු පාඨමාලාව සංවිධානය කළෙමු. එමෙන්ම, තාක්ෂණික ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු කිරීම සහතික කරමින් විදේශීය ජාතික අයදුම්කරුවන්ගේ නිපුණතාවය තක්සේරු කිරීම සඳහා ගුවන් කාර්ය මණ්ඩල තාක්ෂණික පරීක්ෂණ පවත්වන ලදී.

අපගේ පහසුකම් සැලසීම යටතේ SARIM කාණ්ඩයේ වැඩමුළුව

ශ්‍රී ලංකාව තුළ SARI -M කාණ්ඩයේ රෙගුලාසි ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය තක්සේරු කිරීමේ අරමුණින් අපි දින පහක වැඩමුළුවක් පවත්වන ලද්දෙමු. වැඩමුළුව අතරතුර අපගේ ක්‍රියාත්මක කිරීමේ සම්මතයන් IS-M වලට අනුකූල වීම සඳහා ගුවන් සමාගම් විගණනය කරන ලදී. මීට අමතරව, ගුවන් යෝග්‍යතා පරීක්ෂකයෙකු විසින් පාකිස්තානයේ M කාණ්ඩය ක්‍රියාත්මක කිරීමේ වැඩමුළුව නිරීක්ෂණය කරන ලදී.

ගුවන් ආරක්ෂණ සංස්කෘතික වැඩමුළුව

ශ්‍රී ලංකාවේ ගුවන්සේවා පාර්ශ්වකරුවන් අතර ශක්තිමත් ආරක්ෂක සංස්කෘතියක් ස්ථාපිත කිරීමේ අරමුණින් අපගේ ගුවන්සේවා ආරක්ෂක අංශය ICAO ගුවන් ආරක්ෂණ සංස්කෘතික වැඩමුළුව මෙහෙයවන ලදී. එමඟින් ආරක්ෂක සංස්කෘතිය, දෛනික මෙහෙයුම්වලට බලපෑම් කිරීම සහ සංවිධානයක් තුළ සිටින සියලුම ආයතනවල සහ පුද්ගලයන්ගේ ක්‍රියා සහ හැසිරීම්වලට බලපාන ආකාරය පිළිබඳ පුද්ගලයන් දැනුවත් කෙරිණ.


ගුවන්සේවා වෛද්‍ය පුහුණුවක් පැවැත්වීම

ගුවන්සේවා වෛද්‍ය වෘත්තිකයන්ගේ කුසලතා සහ දැනුම අබණ්ඩව වැඩිදියුණු කිරීමේ ප්‍රයත්නයක් ලෙස, ආධුනිකයන්ට මනා පුහුණු වැඩසටහනක් මෙම වසරේදී පවත්වන ලදී. ඇතිවන සෞඛ්‍ය ගැටළු සහ වෛද්‍ය තාක්ෂණයේ දියුණුව අවධාරණය කරමින් මෙම වැඩසටහන් මඟින් ගුවන්සේවා වෛද්‍ය විද්‍යාවේ නවතම ධාරිතා සංවර්ධන වර්ධනයන් ආවරණය කරයි. ගුවන්සේවා වෛද්‍ය වෘත්තිකයන් ඔවුන්ගේ ක්ෂේත්‍රයේ වෙනස්වන පරිසරයට අනුකූලව කටයුතුව කිරීම සහතික කිරීම මෙහි අරමුණ විය.

ගුවන්සේවා මහජන සෞඛ්‍යය පිළිබඳ ජාත්‍යන්තර සංසදවල ක්‍රියාකාරී සහභාගීත්වය

ගුවන්සේවා අංශයේ නියෝජිතයින් ගුවන්සේවා මහජන සෞඛ්‍යය සඳහා කැප වූ ජාත්‍යන්තර සංසදවල ක්‍රියාකාරිව නිරත විය. මෙම සංසද මඟින් සහයෝගිතා සාකච්ඡා, දැනුම හුවමාරු කර ගැනීම සහ ගුවන්සේවා සෞඛ්‍යයේ ගෝලීය අභියෝගවලට මුහුණ දීම සඳහා හවුල්කාරිත්වයන් ස්ථාපිත කිරීමට අවස්ථාවන් ඇති කරන ලදී. මෙකී ක්‍රියාකාරී මැදිහත්වීම ජාත්‍යන්තර සහයෝගීතාව ශක්තිමත් කළ අතර ඉදිරියේදී ඊටත් වඩා විශාල සහයෝගීතාවයක් වෙනුවෙන් ඉඩ සකසයි.

2023 වර්ෂයේදී අත්කරගත් ජයග්‍රහණ මඟින් ගුවන් ගමන් ක්ෂේත්‍රයේ විශිෂ්ටත්වය, සහයෝගීතාවය සහ ගුවන් ගමන්වලට සම්බන්ධ සියලු දෙනාගේ යහපැවැත්ම සඳහා වූ කැපවීම අවධාරණය කරයි. මෙම සන්ධිස්ථාන මඟින් සෞඛ්‍ය සහ ආරක්ෂාවෙහි ප්‍රගතිය මෙන්ම ගුවන් ගමනාගමනයේ අන්තර් සම්බන්ධිත ස්වභාවය සහ සැමට සුරක්ෂිත සහ සෞඛ්‍ය සම්පන්න අනාගතයක් සහතික කිරීම සඳහා එක්ව කටයුතු කිරීමේ වැදගත්කම පිළිබඳ ගෝලීය ඉදිරිදර්ශනයක් ද පිළිබිඹු කරයි.



මෙහෙයුම් කටයුතුවල විශේෂ අවස්ථා
ධාරිතා සංවර්ධනය

පුද්ගල හා ගුවන්සේවා පුහුණු සංවිධාන සහතිකකරණය මඟින් ඔවුන්ගේ ක්‍රියාකාරකම් අඛණ්ඩව නිරීක්ෂණය කිරීම සහ ආරක්ෂක ඌනතා විසඳීම සිදු කරනු ලැබිය.

2,408
ගුවන් නියමු බලපත්‍ර

54
උපදේශක සහ පරීක්ෂක ශ්‍රේණිගත කිරීම්

28
ගොඩබිම් උපදේශක බලය පැවරීම්

43
විදේශ බලපත්‍ර වලංගු කිරීමේ සහතික

186
ගුවන් ගමනාගමන පාලන බලපත්‍ර සහ ශ්‍රේණිගත කිරීම්

342
උපදේශක සහ පරීක්ෂක ශ්‍රේණිගත කිරීම්

501
ගුවන් කාර්ය මණ්ඩල සහතිකය

5,057
සිවිල් ගුවන්සේවා දැනුම විභාග

ගුවන්සේවා පුහුණු සංවිධාන සහතිකකරණය මඟින් ඔවුන්ගේ ක්‍රියාකාරකම් අඛණ්ඩව අධීක්ෂණය කිරීම සහ ආරක්ෂක ඌනතා විසඳීම සිදු කරනු ලැබිය.

15
පුහුණු සංවිධානවල අඛණ්ඩ පරීක්ෂණ

1
ආසියානු ගුවන්සේවා මධ්‍යස්ථානය

2
විවෘත අහස

4
ෆ්ලයිං ඒන්ජල් ෆ්ලයිට් ඇකඩමිය

2
ශ්‍රී ලංකා TRTO

3
ෆ්ලයි සඳර්න් ප්‍රයිවට් ලිමිටඩ්

1
ලක්වින් ඒවියේෂන් ප්‍රයිවට් ලිමිටඩ්

1
සකුරායි ඒවියේෂන් ඇකඩමිය

1
රෙඩ් බර්ඩ් ඒවියේෂන් ප්‍රයිවට් ලිමිටඩ්

1
ශ්‍රී ලංකා තාක්ෂණික පුහුණුව

2
ATC පුහුණු සංවිධානය - ගුවන්තොටුපල සහ ගුවන්සේවා ඇකඩමිය

1
ගුවන්තොටුපල සහ ගුවන්සේවා ඇකඩමියේ සිමියුලේටරය

5
බලපත්‍ර නිරීක්ෂණ



ගුවන් කාර්ය මණ්ඩල බලපත්‍ර (පෞද්ගලික නියමු බලපත්‍රය (PPL)/ගුවන් ප්‍රවාහන නියමු බලපත්‍රය (ATPL) සඳහා දැනුම විභාග පැවැත්වීම

573
ලබාදුන් ප්‍රශ්න පත්‍ර ප්‍රමාණය - PPL

1,653
ලබා දුන් ප්‍රශ්න පත්‍ර ප්‍රමාණය - ATPL

ගුවන්යානා නඩත්තු සේවකයින් සඳහා දැනුම විභාග පැවැත්වීම

2,650

භාර දුන් ප්‍රශ්න පත්‍ර ප්‍රමාණය - AML

ELPC සඳහා ප්‍රායෝගික පරීක්ෂණ පැවැත්වීම

127

ELPC ගණන

රාජ්‍ය ආරක්ෂණ වැඩසටහන

8

අනුමත ආරක්ෂක කළමනාකරුවන් සංඛ්‍යාව

8

පුහුණු පාසල්වල අනුමත ආරක්ෂක කළමනාකරණ පද්ධති අත්පොත් ගණන



මෙහෙයුම් කටයුතුවල විශේෂ අවස්ථා
තොරතුරු තාක්ෂණ සංවර්ධනයන්

CAASL හි, අපි තොරතුරු තාක්ෂණ (IT) පද්ධති ඒකාබද්ධ කිරීම, කාර්යාල මෙහෙයුම්වල කාර්යක්ෂමතාව සහ නිරවද්‍යතාවය වැඩි දියුණු කිරීම වෙනුවෙන් සැලකිය යුතු පරිශ්‍රමයක් දරා ඇත්තෙමු. අන්තර්ජාල පුද්ගල බලපත්‍ර නිකුත් කිරීම, ලිඛිත පරීක්ෂණ සඳහා මාර්ගගත පද්ධතිය යොදා ගැනීම සහ QR කේත සක්‍රීය බලපත්‍ර නිකුත් කිරීම වැනි මූලපිරීම් තුළින් පරිපාලන ක්‍රියාවලි විධිමත් කර ඇති අතර පුද්ගල කළමනාකරණ කාර්යක්ෂමතාව ඉහළ නංවා ඇත.

නව තාක්ෂණය යොදා ගැනීම

නව තාක්ෂණය යොදා ගැනීම මඟින් අපගේ සේවා බෙදා හැරීමේ හැකියාව, කාර්ය ප්‍රවාහ කළමනාකරණය ප්‍රශස්ත කිරීම, සන්නිවේදන නාලිකා සහ කණ්ඩායම් සහයෝගීතාව සැලකිය යුතු ලෙස ශක්තිමත් කර ඇත. මෙම තාක්ෂණික උත්ශ්‍රේණිගත කිරීම මඟින් ආයතනය පුරා මෙහෙයුම්වල පහසුව සහ වැඩිදියුණු කළ කාර්යක්ෂමතාව සහතික කරයි.

අක්තපත්‍ර නිකුත් කිරීමේ ක්‍රමය ක්‍රියාත්මක කිරීම මඟින් හැඳුනුම්පත් නිකුත් කිරීමේ සහ කළමනාකරණය කිරීමේ ක්‍රියාවලිය විධිමත් කර ඇති අතර, ආරක්ෂාව ඉහළ නංවමින් පරිපාලන කටයුතුවල පොදු කාර්ය භාරය අවම කර ඇත. නිරීක්ෂණ සැලසුම් අධීක්ෂණ යෙදුම මඟින් තත්‍ය කාලීන අධීක්ෂණ සහ කාලෝචිත මැදිහත්වීම් සඳහා ඉඩ සලමින් නියාමන අවශ්‍යතා අධීක්ෂණය කිරීමට සහ ඒවාට අනුකූල වීම සහතික කිරීමට අප සතු හැකියාව වැඩිදියුණු කර ඇත. එමෙන්ම, AVSEC මාර්ගගත විභාග පද්ධතිය, ආරක්ෂක නිලධාරීන් සඳහා පුහුණු සහ සහතික කිරීමේ ක්‍රියාවලිය සංවර්ධනය කරමින්, ඇගයීම් පැවැත්වීම සඳහා ආරක්ෂිත සහ කාර්යක්ෂම වාතාවරණයක් සපයයි. මෙම තාක්ෂණික දියුණුව සාමූහිකව වඩාත් ඵලදායී, කාර්යක්ෂම සහ ඒකාබද්ධ ආයතනික ව්‍යුහයකට දායක වේ.

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ඒකකයේ මූලපිරීම් ශක්තිමත් කිරීම

නව තාක්ෂණයන් යොදාගැනීමට අපගේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ඒකකය කටයුතු කර ඇති අතර ඉන් කැපී පෙනෙන ප්‍රගතියක් ලබා ඇත. CAASL කාර්යාල හැඳුනුම්පත් පද්ධතියක් සංවර්ධනය කිරීම සහ පාරිභෝගික ප්‍රතිපෝෂණ සමීක්ෂණ පද්ධතියක් ස්ථාපිත කිරීම එකී ජයග්‍රහණවලට ඇතුළත් වේ. මීට අමතරව, PEL බලපත්‍ර QR පද්ධතිය සහ මාර්ගගත වෛද්‍ය පද්ධතිය වැනි වර්ධනයන් කාර්යක්ෂමතාව වැඩි කරන අතර, ශක්තිමත් කරන ලද සයිබර් ආරක්ෂණ පියවර අපගේ තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් දැඩි කරයි.

පරිගණක පාදක විභාග ක්‍රියාත්මක කිරීම

ගුවන්සේවා ආරක්ෂක නිලධාරීන් සහතික කිරීම සඳහා පරිගණක ආශ්‍රිත විභාග ක්‍රමයක් අපි සාර්ථකව හඳුන්වා දුන්නෙමු. ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි පිරික්සුම්කරුවන් සමඟ ක්‍රියාත්මක කරන ලද මෙම මූලපිරීම, මඟින් කාලය ඉතිරි කරන්නා සේම, සහතිකකරණ ක්‍රියාවලීන් නවීකරණය කිරීම, කඩදාසි පරිභෝජනය අඩු කිරීම සහ විභාග ක්‍රමවේද දියුණු කිරීම ද සිදු කරයි.

පරිගණක පදනම් වූ උපදේශන වැඩසටහන

ප්‍රතිපත්තියක් ලෙස, අලුතින් බඳවා ගන්නා ලද පිරිස් ඔවුන් සම්බන්ධ වූ දින සිට පළමු සති දෙක ඇතුළත CAASL හි කාර්යභාරයන් සහ වගකීම් පිළිබඳව දැනුවත් කළ යුතුය. මීට පෙර මෙම වැඩසටහන CAASL සම්පත් දායකයින්ගේ සහාය ඇතිව HRPM අංශය විසින් පවත්වන ලදී. කාලය වෙන් කිරීමේ අවශ්‍යතාවය සහ සම්පත් හා පිරිස් අවශ්‍යතාවය හේතුවෙන් මෙය සැලකිය යුතු අභියෝගයක් විය.

මෙම ගැටළුව විසඳීමට, ප්‍රේරක වැඩසටහන කාලෝචිත ලෙස නිම කිරීම සඳහා HRPM අංශය විසින් මාර්ගගත ක්‍රමවේදයක් හඳුන්වා දී ඇත.



මෙහෙයුම් කටයුතුවල විශේෂ අවස්ථා
සේවකයන් සවිබල ගැන්වීම



CAASL හි, අපගේ ආයතනික ආචාරධර්මවල මූලික අංගයක් ලෙස සේවක බලගැන්වීම කෙරෙහි අපි දැඩි අවධානයක් යොමු කරන්නෙමු. විවිධ මූලපිරීම් සහ වැඩසටහන් හරහා, සේවකයින්ට ඔවුන්ගේ සම්පූර්ණ හැකියා සාක්ෂාත් කර ගැනීමට වටිනාකමක්, සහයෝගයක් සහ බලයක් දැනෙන පරිසරයක් ගොඩනැඟීමට අපි උත්සාහ කරමු. අපගේ කාර්ය මණ්ඩලයට ඔවුන්ගේ භූමිකාවන්හි විශිෂ්ටත්වය දැක්වීමට අවශ්‍ය කුසලතා සහ දැනුම ඇති බව සහතික කරලීමට පූර්ණ පුහුණු වැඩසටහන් සහ අනුස්ථාපන සැසි සැපයීම, සේවක සංවර්ධනය සඳහා ආයෝජනය කිරීම මෙකී කැපවීමට නිදසුන් සපයයි. අපි කණ්ඩායම් වැඩ සහ සහභාගීත්වය දිරිමත් කිරීම සඳහා නිර්මාණය කර ඇති සිදුවීම් සහ ක්‍රියාකාරකම් හරහා ප්‍රජාව සහ සහයෝගීතාව පිළිබඳ හැඟීමක් වර්ධනය කරන්නෙමු. සේවක සවිබල ගැන්වීමට ප්‍රමුඛත්වය දීමෙන්, අපි පුද්ගල යහපැවැත්ම වැඩි දියුණු කරලමින් අපගේ සමස්ත ආයතනික කාර්යක්ෂමතාව සහ කාර්ය සාධනය ශක්තිමත් කරන්නෙමු.

CAASL හි ශ්‍රම බලකාය ශක්තිමත් කිරීම

ගුවන් ආරක්ෂණ නියාමනය පිළිබඳ ප්‍රවීණ සහ විශ්වාසදායක අධිකාරියක් වීමට අපි කැපවී සිටිමු. නව සේවකයින් අපේක්ෂාවන් සහ ප්‍රශස්තිකරණ ක්‍රම පිළිබඳව දැනුවත්වීම සහතික කරමින් බඳවා ගැනීම් සිදුකිරීම තුළින් මෙය පැහැදිලි වේ. දක්ෂ ශ්‍රම බලකායක වැදගත්කම හඳුනා ගනිමින්, බාධාවකින් තොරව මෙහෙයුම් සහ නියාමන කාර්යක්ෂමතාව සහතික කිරීමට අපගේ HRPM අංශය සැලසුමකින් යුතුව පුරප්පාඩු පුරවයි. දක්ෂතා අත්පත් කර ගැනීම සහ සංවර්ධනය සඳහා ආයෝජනය කිරීමෙන්, ගුවන්සේවා ආරක්ෂාව සහ නියාමන විශිෂ්ටත්වය පිළිබඳ ඉහළම ප්‍රමිතීන් ආරක්ෂා කිරීමට අපි කැපවෙන්නෙමු.

සේවක සහය පිළිබඳ මූලපිරීම්

විනෝදාත්මක පහසුකම් සමඟ සේවක නවාතැන් පහසුකම් වැඩිදියුණු කිරීම අපි වැදගත්කම කොට සලකන්නෙමු. කාර්ය මණ්ඩල සාමාජිකයින්ට පහසු සහ මනාව නඩත්තු කරන ලද ජීවන අවකාශයන් සඳහා ප්‍රවේශය සහතික කරමින් කටුනායක සහ රත්මලාන නිල නිවාස ප්‍රතිසංස්කරණය කර නැවත යෙදවීමට කිරීමට සැලසුම් කරමින් පවතී. එමෙන්ම, මිත්‍රත්වය පෝෂණය කරලීමේ අරමුණින් "ඒවියේෂන් රිදම් නයිට් 2023" ප්‍රසංගය වැනි ආයතනික උත්සව සංවිධානය කරන්නෙමු. මෙම නව්‍ය මූලපිරීම සහභාගිවන්නන්ගේ විනෝදාස්වාදය වෙනුවෙන් මෙන්ම, CAASL සහ එහි පාර්ශවකරුවන්ගේ සංවිධාන අතර සබඳතා ශක්තිමත් කිරීමට හේතු වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස රු. මිලියන 2.5 ක ලාභයක් අත්කර දෙනු ලැබිණ. එමෙන්ම, ස්ථානීය සුභසාධක සංගමයේ ක්‍රියාකාරකම් සඳහා පහසුකම් සලසමින් යාබද ඉඩම ක්‍රීඩාංගනයක් බවට පත්කිරීමද මෙහිදී අපි ආඩම්බරයෙන් ප්‍රකාශ කරන්නෙමු. වැඩ සහ විවේකය වෙනුවෙන් හිතකර පරිසරයක් පෝෂණය කරමින් අපගේ සේවකයින් සඳහා පුළුල් සහයෝගයක් සහ පහසුකම් සැපයීමට අප දක්වන කැපවීම මෙම උත්සාහය මගින් අවධාරණය කරයි.

දේපළ කළමනාකරණය

අපගේ අරමුණුවලට මෙන්ම, අංශ හරහා මෙහෙයුම් අඛණ්ඩව පවත්වාගෙන යාමට සහය වෙමින් අපගේ HRPM මඟින් පහසුකම් කාර්යක්ෂමව අධීක්ෂණය කරයි. නෛතික නියෝගවලට අනුව පරිපාලන ලේඛන සඳහා බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල වැනි දේපළ ඇතුළත් වේ. සංශෝධිත ගැසට් නිවේදනයක් මගින් අනාගත ප්‍රයත්නයන් සඳහා මගපෙන්වන ප්‍රධාන පහසුකම් සඳහා සීමා මායිම් ස්ථාපිත කිරීම සුවිශේෂී වේ. අපගේ අයිතිය තහවුරු කරමින් මාදම්පැල්ල ගුවන් තරංග ආධාරක ඉඩම සඳහා හිමිකම් වාර්තාව ලබා ගැනීම තවත් සන්ධිස්ථානයක් විය.


මෙහෙයුම් කටයුතුවල විශේෂ අවස්ථා
සේවකයින් සවිබල ගැන්වීම

CAASL හි අපගේ සේවකයින් සඳහා නිවාඩු නිකේතන

CAASL විසින් පරිපාලනය කරනු ලබන මධකලපුව සංචාරක බංගලාව අපගේ කාර්ය මණ්ඩලය සහ මහජනතාව යන දෙඅංශයෙන්ම සඳහා සාධාරණ මිලකට පහසුකම් සපයයි. මෙහිදී අමුත්තන්ට මධකලපුව ගුවන් තොටුපලේ මනරම් දර්ශනය සුව විඳිමින් සුවිශේෂී අත්දැකීමක් ලබා ගත හැකිය. මෑතභාගයේ සිදුකළ වෙනස් කිරීම්වලින් පසුව, වැඩි දියුණු කරන ලද පහසුකම් සහ ප්‍රබෝධමත් වටපිටාවකින් සමන්විත වීරවිල සංචාරක බංගලාව දැන් ආගන්තුකයින් සඳහා විවෘතව කොට ඇත. මෙම බංගලා ද්විත්වයම CAASL කාර්ය මණ්ඩලයට සහ මහජනතාවට සුබසාධන පහසුකමක් ලෙස සේවා පිරිනමන අතර, අත්දැකීම්වලින් පිරි නවාතැනක් සඳහා වට්ටම් සහිත ගාස්තු පිරිනමයි.

මානව සම්පත් සංවර්ධන 2023

අපි සේවක කුසලතා සහ දැනුම වැඩිදියුණු කිරීම අරමුණු කරගත් පුළුල් පරාසයක පුහුණු වැඩසටහන් සඳහා රු. 3,332,403.63 ක් වෙන් කළෙමු. මෙම ආයෝජනය මඟින් කාර්ය මණ්ඩල සාමාජිකයින් තිස්හත් දෙනෙකුට මාර්ගගත සැසි සඳහා පහසුකම් සැලසූ අතර, සේවකයින් දෙසිය තිස් හත් දෙනෙකු සඳහා දේශීය, අභ්‍යන්තර, මාර්ගගත සහ විදේශීය සැසි ආවරණය වන පරිදි පුහුණු ඉසව් හතළිස් හයක් ලබා දුන්නේය. එමෙන්ම, කාර්ය මණ්ඩල සාමාජිකයින් විසි දෙනෙක් විවිධ දේශීය හා විදේශීය රැස්වීම්, සම්මන්ත්‍රණ සහ සම්මන්ත්‍රණ සඳහා සහභාගී වූහ. මෙම මූලපිරීම්වලින් දක්ෂතා පෝෂණය කිරීමට සහ කර්මාන්තයේ දියුණුවට අනුගත වීමට අපගේ කැපවීම පෙන්නුම් කරයි. එමෙන්ම, අපගේ මානව සම්පත් සංවර්ධන මූලපිරීම්වලට නව බඳවා ගැනීම් සඳහා අනුස්ථාපනය සහ විධායකයින් සඳහා මාර්ගගත පුහුණුව ඇතුළත් විය. පුහුණු සහ ප්‍රසිද්ධ කථන කුසලතා කෙරෙහි අවධානය යොමු කරමින් සහකාර කළමනාකරුවන්, සිවිල් ගුවන්සේවා පරීක්ෂකවරුන් සහ කනිෂ්ඨ කළමනාකරුවන් 39 දෙනෙකු වෙනුවෙන් විශේෂිත වැඩසටහන් පවත්වන ලදී. මීට අමතරව, රියදුරන් 18 දෙනෙකු CIDA විසින් පහසුකම් සපයන ලද ආරක්ෂිත රිය පැදවීමේ පරිචයන් පිළිබඳ පුහුණුව ලබා ඇත.



ක්‍රීඩා සහ සුබසාධන ක්‍රියාකාරකම්

සිංහල හින්දු අලුත් අවුරුදු උත්සවය



CAASL හි සමස්ත කාර්ය මණ්ඩලයේ සහභාගීත්වයෙන් 2024 අප්‍රේල් 27 වන දින පවත්වන ලද සිංහල හින්දු අලුත් අවුරුදු උත්සවය.

"ගුවන්සේවා ධර්මාභිවන්දනා" පොසොන් ගී වැඩසටහන



"ගුවන්සේවා ධර්මාභිවන්දනා" පොසොන් ගී වැඩසටහන

ඇසළ සීල පාරමිතා වැඩසටහන



2023 ජූලි 01 වන දින ඇසළ පොහොය නිමිත්තෙන් "ඇසළ සීල පාරමිතා වැඩසටහන" පැවැත්විණි.

වාර්ෂික ක්‍රිකට් තරඟාවලිය



2023 වාර්ෂික ක්‍රිකට් තරඟාවලිය 2023 අගෝස්තු 26 සෙනසුරාදා CAASL හිදී පැවැත්විණි.

නත්තල් කැරොල්



නත්තල සැමරීමේ අරමුණින් 2023 දෙසැම්බර් 20 වන දින පවත්වන ලද මහා නත්තල් ප්‍රසංගයේදී අපගේ අධිකාරියේ සේවකයින් විසින් "නත්තල් කැරොල්" ගායනා කිරීම.

ඒවියේෂන් රිදම් නයිට් 2023



"ඒවියේෂන් රිදම් නයිට් 2023" වැඩසටහන 2023 නොවැම්බර් 10 වැනි සිකුරාදා CAASL පරිශ්‍රයේදී අති උත්කර්ෂවත් අන්දමින් පැවැත්විණි.

මෙහෙයුම් කටයුතුවල විශේෂ අවස්ථා
මූල්‍ය කටයුතුවල විශේෂ අවස්ථා

අරමුණු සහ කාර්යයන්

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය (CAASL) හි මූල්‍ය හා ආදායම් කළමනාකරණ අංශය මඟින් සංවිධානයේ මූල්‍ය යහපත්භාවය සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව සහතික කිරීමේ ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. අපගේ මූලික පරමාර්ථය වන්නේ අධිකාරියේ ප්‍රධාන ඉලක්ක සහ අරමුණුවලට සහය වීම සඳහා CAASL හි මූල්‍ය සහ ආදායම් මාර්ග උපාය මාර්ගික කළමනාකරණය කිරීමයි.

ප්‍රධාන කාර්යයන්

ආදායම් එකතු කිරීම සහ වියදම් කළමනාකරණය - ආයතනික ප්‍රමුඛතාවලට අනුකූලව සම්පත් ප්‍රශස්ත ලෙස වෙන් කිරීම සහතික කිරීම සඳහා අපගේ අංශය විසින් බලපත්‍ර ගාස්තු, දඩ සහ බදු ඇතුළු විවිධ මූලාශ්‍රවලින් ලැබෙන ආදායම් එකතුව සුපරීක්ෂාකාරීව අධීක්ෂණය කරයි. එමෙන්ම ඊට සමගාමීව CAASL හි වියදම් සමගාමීව කළමනාකරණය කරයි.

මූල්‍ය ප්‍රෝකථනය සහ වැඩසටහන් අයවැයකරණය - උසස් මූල්‍ය ප්‍රෝකථනය සහ වැඩසටහන් අයවැයකරණ ශිල්පීය ක්‍රම හරහා, අපි CAASL හි උපායමාර්ගික අරමුණු සමඟ අනුකූලවන ශක්තිමත් මූල්‍ය සැලසුම් සකස් කරන්නෙමු. මේ සඳහා ආදායම් ප්‍රවාහයන් ප්‍රෝකථනය කිරීම, වියදම් ඇස්තමේන්තු කිරීම සහ දැනට ක්‍රියාත්මක වැඩසටහන් සහ මූලපිරීම් සඳහා ඵලදායී ලෙස සහය වීම සඳහා සම්පත් වෙන් කිරීම ඇතුළත් වේ.

අරමුදල් කළමනාකරණය - විචක්ෂණශීලීව සහ කාර්යක්ෂමව අරමුදල් වෙන්කිරීම් කළමනාකරණය කරමින් අපි CAASL හි මූල්‍ය වත්කම්වල භාරකරුවන් ලෙස කටයුතු කරන්නෙමු, මේ සඳහා මේ සඳහා මූල්‍ය සම්පත් භාවිතය ප්‍රශස්ත කිරීම, ප්‍රතිලාභ උත්පාදනය කිරීම සඳහා උපාය මාර්ගික ආයෝජන සිදු කිරීම සහ නියාමන මාර්ගෝපදේශවලට අනුකූලව මෙහෙයුම් අවශ්‍යතා සපුරාලීම සඳහා ද්‍රවශීලතාවය පවත්වා ගැනීම ඇතුළත් වේ.

මූල්‍ය වාර්තාකරණය - ආදායම් ප්‍රකාශ, ශේෂ පත්‍ර සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශ ඇතුළුව නිවැරදි හා කාලෝචිත මූල්‍ය වාර්තා සකස් කිරීම අපගේ අංශයේ වගකීම වේ. කළමනාකරණය සහ පාර්ශවකරුවන් විසින් දැනුවත් තීරණ ගැනීමේ හැකියාව ඇති කරමින් මෙම වාර්තා CAASL හි මූල්‍ය කටයුතු කාර්ය සාධනය පිළිබඳ මනා අවබෝධයක් සපයයි.

බඩු ලේඛන කළමනාකරණය - සම්පත් භාවිතය ප්‍රශස්ත කිරීම සහ පිරිවැය අවම කිරීම සඳහා කාර්යක්ෂම බඩුලේඛන කළමනාකරණය ඉතා වැදගත් වේ. CAASL හි මෙහෙයුම් අවශ්‍යතා සඳහා කාර්යක්ෂමව සහය වීම සඳහා වත්කම් ප්‍රසම්පාදනය, ගබඩා කිරීම සහ බෙදා හැරීම ඇතුළු බඩුලේඛන පාලන ක්‍රියාවලීන් අපි අධීක්ෂණය කරන්නෙමු.

ගුවන්යානා ඇණිය කළමනාකරණය - CAASL හි ගුවන්යානා ඇණිය කළමනාකරණය කිරීම අප අංශයේ තවත් මූලික කාර්යයකි. මෙහෙයුම් සූදානම සහ නියාමන ප්‍රමිතීන්ට අනුකූල වීම සහතික කිරීම සඳහා ගුවන්යානා ප්‍රසම්පාදනය, නඩත්තුව සහ භාවිතය අධීක්ෂණය කිරීමෙන්, අධිකාරියේ සංචලතා අවශ්‍යතාවලට ඵලදායී ලෙස සහය වීම මින් අරමුණු කරයි.

අපගමන බද්ද එකතු කිරීම සහ බෙදා හැරීම හැසිරවීම

2003 අංක 25 දරන මුදල් පනතේ විධිවිධාන යටතේ, ගුවන් සමාගම්වලින් මගී අපගමන බද්ද එකතු කර එයින් ලැබෙන මුදල් වෙන්කිරීමේ වගකීම අප වෙත පැවරී ඇත. අධිකාරිය වෙනුවෙන් ක්‍රියා කරමින් අපගේ මූල්‍ය හා ආදායම් කළමනාකරණ අංශය විසින් මෙම වැදගත් කාර්යය ක්‍රියාත්මක කරයි.

2023 වර්ෂයේදී මගින් 2,306,653ක් අපගමන බද්ද ගෙවීමෙන් ඔවුන්ගේ වගකීම ඉටු කළහ. ඉන්පසුව, අපි පහත දක්වා ඇති පරිදි විවිධ ආයතන වෙත එකතු කරන ලද අරමුදල් යොමු කළෙමු.

ආයතනය	ප්‍රමාණය (රු.මිලි)
මහා භාණ්ඩාගාරය	38,828
සීමාසහිත ගුවන්තොටුපල සහ ගුවන්සේවා සමාගම	8,970
ශ්‍රී ලංකා සංචාරක සංවර්ධනය	4,485
සිවිල් ගුවන් සේවා අධිකාරිය	329

මූල්‍ය මෙහෙයුම් දළ විශ්ලේෂණය

අපගේ ආයතනික අරමුණු සාක්ෂාත් කර ගැනීමේදී යහපත් මූල්‍ය පරිචයන් වල වැදගත්කම අවබෝධ කර ගනිමින්, ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය (CAASL) හි අපගේ මූල්‍ය මෙහෙයුම් කාර්යක්ෂම හා ඵලදායී කළමනාකරණයට අපි ප්‍රමුඛත්වය දෙමු. අපගේ මූල්‍ය ක්‍රියාකාරකම්වල විවිධ පැති පිළිබඳ සවිස්තරාත්මක දළ විශ්ලේෂණය පහත පරිදි වේ.

නියමිත වේලාවට සම්පූර්ණ කිරීම සහ වාර්තා ඉදිරිපත් කිරීම - අපි නියමිත කාලසීමාවන් තුළ ඉතා වගකීමෙන් යුතුව 2023 වර්ෂය සඳහා වාර්ෂික අයවැය, 2023 වර්ෂය සඳහා මූල්‍ය අධිකාරියේ නියෝජිත ප්‍රකාශය සහ 2022 වාර්ෂික මූල්‍ය ප්‍රකාශය ඇතුළුව, මූල්‍ය වාර්තා සකස් කර ඉදිරිපත් කරන්නෙමු. නියාමන ප්‍රමිතීන්ට නිරවද්‍යතාවය සහ අනුකූලතාවය සහතික කිරීම සඳහා මෙම වාර්තා ඉදිරිපත් කිරීමට පෙර දැඩි පරීක්ෂාවට සහ අනුමත ක්‍රියාවලීන්ට භාජනය වේ.

විවිධ ආදායම් ප්‍රවාහ - අපගේ මෙහෙයුම් පවත්වාගෙන යාමට සහ ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ (CAASL) අපගේ වගකීම් ඉටු කිරීමට අපි විවිධ මූලාශ්‍රවලින් ආදායම් ලබා ගනිමු. මෙම ආදායම් මාර්ගවලට පහත දැ ඇතුළත් වේ.

- විදේශීය විකුණුම් අධිභාරය - ශ්‍රී ලංකාවෙන් පිටත සිදු කරන ලද විකුණුම් වලින් ලැබෙන ආදායම.
- අපගමන බද්දේ සේවා ගාස්තුව - මගීන් ගුවන් ගමන් ආරම්භ කරන විට ඔවුන්ගෙන් අය කරන ගාස්තු.
- නියාමන සේවා වලින් ලැබෙන ආදායම - නියාමන අවශ්‍යතා අනුව සපයනු ලබන සේවාවන්ගෙන් ලැබෙන ආදායම.
- පොලී ආදායම - කාර්ය මණ්ඩල ණය සහ අරමුදල් කළමනාකරණ ක්‍රියාකාරකම් මත පොලීවලින් උපයාගත් ඉපැයීම්.
- වෙනත් මෙහෙයුම් නොවන ආදායම් - මූලික මෙහෙයුම් ක්‍රියාකාරකම් හැරුණු කොට අමතර ආදායම් මූලාශ්‍ර.

ගෙවීම් ක්‍රම - ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ (CAASL) අපගේ පාර්ශවකරුවන්ගේ විවිධ අවශ්‍යතා සපුරාලීම සඳහා අපි බහුවිධ ගෙවීම් විකල්ප ඉදිරිපත් කරන්නෙමු. මෙම ගෙවීම් ක්‍රමවලට ඇතුළත් වන්නේ:

- මුදල් හෝ චෙක්පත් ගෙවීම් - මුදල් හෝ චෙක්පත් මගින් ප්‍රධාන කාර්යාලයේ පිහිටා ඇති නම් කරන ලද ගෙවීම් කවුන්ටරවල ගෙවීම්.
- මාර්ගගත ගෙවීම් - ක්‍රෙඩිට්/ඩෙබිට් කාඩ්පත් හරහා ගනුදෙනු කිරීමට පහසු මාර්ගගත ගෙවීම් පහසුකම්.
- ලංකා QR ක්‍රමය - බාධාවකින් තොරව විද්‍යුත් ගෙවීම් සඳහා ලංකා QR කේත පද්ධතිය භාවිත කිරීම.
- සෘජු USD ගෙවීම් - ජාත්‍යන්තර ගණුදෙනු සඳහා ඇමරිකානු ඩොලර් වලින් සෘජු ගෙවීම් සිදුකිරීමට පහසුකම් සැලසීම.
- සෘජු තැන්පතු - අපගමන බදු එකතු කිරීම සඳහා වෙන් කර ඇති නිශ්චිත බැංකු ගිණුම් වෙත සෘජු තැන්පතු සඳහා ප්‍රතිපාදන.


ඒකාබද්ධ අරමුදලට දායකත්වය - CAASL හි අපි රු. බිලියන හතරක සැලකිය යුතු ආදායමක්, 2023 වර්ෂයේදී ඒකාබද්ධ අරමුදලට පවරමින් රාජ්‍ය සංවර්ධනය වෙනුවෙන් දායක වීමු. මෙකී දායකත්වය රාජ්‍ය ආදායම ඉහළ නංවමින් ජාතික ආර්ථිකය නංවාලීම ඉලක්ක කරගත් මූලපිරිමිවලට සහය වේ.

බදු පියවීම - ආදායම් බදු, අගය එකතු කළ බද්ද (VAT) සහ මුද්දර ගාස්තු ඇතුළු විවිධ බදු කඩිනමින් පියවීමෙන් අපි අපගේ නෛතික බැඳීම් තහවුරු කරමු. බදු රෙගුලාසිවලට අනුකූලවීමෙන් නෛතික අවශ්‍යතා පිළිපැදීම සහතික කරන අතර නියාමන අධිකාරීන් සමඟ හිතකර සබඳතාවක් ඇති කරයි.


ඵලදායී අරමුදල් කළමනාකරණය - CAASL හි, අපි මහජන බැංකුව සහ ලංකා බැංකුව වැනි කීර්තිමත් බැංකු ආයතන සමඟ ඇති අරමුදල් කළමනාකරණ ගිණුම් යොදා ගනිමින් විචක්ෂණ මූල්‍ය කළමනාකරණ පිළිවෙත් අනුගමනය කරමු. මෙම ගිණුම් භාණ්ඩාගාර බිල්පත්වල කෙටි කාලීන සහ දිගු කාලීන ඉතුරුම් යන දෙඅංශයේම උපාය මාර්ගික ආයෝජන සඳහා පහසුකම් සපයන අතර මූල්‍ය වත්කම් ආරක්ෂා කරමින් ප්‍රතිලාභ ප්‍රශස්ත කරයි.

දැඩි මූල්‍ය ක්‍රියාමාර්ග පිළිපැදීමෙන්, CAASL හි අපි මූල්‍ය අඛණ්ඩතාව, විනිවිදභාවය සහ වගවීම පවත්වාගෙන යාමට ප්‍රමුඛත්වය දෙමු. මෙම මූලධර්මවලට අපගේ කැපවීම තිරසාර මූල්‍ය ස්ථාවරත්වයක් සහතික කරන අතර, ශ්‍රී ලංකාව තුළ සිවිල් ගුවන්සේවා ප්‍රගමනය කිරීමේ අපගේ මෙහෙවර ඉටු කිරීමට උපකාරී වේ. දූරදර්ශී මූල්‍ය කළමනාකරණ භාවිතයන් සහ සූක්ෂම අධීක්ෂණය තුළින් අපි අපගේ මූල්‍ය සම්පත් ආරක්ෂා කරන අතර චිමඟින් අපේ රටේ ගුවන්සේවා අංශයේ වර්ධනයට සහ සංවර්ධනයට දායක වෙමු.


ආදායම -2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂය




නැවත ඇතිවන වියදම් - 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂය



ප්‍රාග්ධන වියදම් - 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂය



සැබෑ සහ මූල්‍ය සැලසුම 2023



මෙහෙයුම් කටයුතුවල විශේෂ අවස්ථා

මූල්‍ය කටයුතුවල විශේෂ අවස්ථා

2023 වර්ෂය පිළිබඳ දළ වශයෙන්



ස්කන්ධ සහ වගකීම්

රුපියල් මිලියන 6,908
ප්‍රාග්ධනය සහ සංචිත

රුපියල් මිලියන 400
ජංගම නොවන වගකීම්

රුපියල් මිලියන 3,579
ජංගම වගකීම්

වත්කම්

රුපියල් මිලියන 2,823
ජංගම නොවන වත්කම්

රුපියල් මිලියන 8,064
ජංගම වත්කම්

ලාභය

රුපියල් මිලියන 4,557
බදු පෙර ලාභය

රුපියල් මිලියන 4,348
බදු පසු ලාභය

නිල් අහසක්, පරිසර හිතකාමී ගමනාන්තයක්



මූල්‍ය ප්‍රකාශන 2023 වර්ෂය

	පිටු අංක.
විස්තීර්ණ ආදායම් පිළිබඳ ප්‍රකාශය	58
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය	59
ස්කන්ධ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය	60
මුදල් ප්‍රවාහ ප්‍රකාශය	61
මූල්‍ය ප්‍රකාශනයන් සඳහා සටහන්	62
විගණකාධිපතිගේ වාර්තාව 2023	88
විගණකාධිපතිගේ වාර්තාවට පිළිතුරු ලිපිය 2023	101
නියාමන විෂය පථය	112
CAASL හි තාක්ෂණික කාර්යසාධනය පිළිබඳ සාරාංශය	114
ප්‍රධාන කාර්යසාධන දර්ශක - 2023	116
ගුවන් ගමන් පිළිබඳ තොරතුරු	122
සටහන්	123

මූල්‍ය ප්‍රකාශන

විස්තීර්ණ ආදායම් පිළිබඳ ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා	සටහන	2023 රු.	2022 රු.
ආදායම		**5,530,639,804**	4,268,302,673
මෙහෙයුම් ආදායම	23	**4,267,567,018**	3,685,224,914
මෙහෙයුම් නොවන ආදායම	23	**1,263,072,786**	583,077,759
වියදම		**973,440,478**	880,544,000
කාර්ය මණ්ඩල වියදම්	24	**432,938,638**	457,965,055
රැස්වීම්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු	25	**8,063,683**	7,507,808
පුහුණු කිරීම් සඳහා වියදම්	26	**9,659,098**	1,474,290
පරිපාලන සහ වෙනත් වියදම්	27	**365,420,451**	260,886,367
ක්ෂය වීම්	29	**149,698,845**	137,374,730
අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය කිරීම	30	**7,638,729**	15,314,716
වත්කම පාවිච්චි කිරීමේ හිමිකම් සඳහා ක්ෂය වියදම්	31	**21,034**	21,034
බදු පෙර ලාභය		**4,557,199,326**	3,387,758,673
ආදායම් බදු වියදම්	28	**208,920,729**	644,515,000
වර්ෂය සඳහා ලාභය		**4,348,278,597**	2,743,243,673
වෙනත් විස්තීර්ණ ආදායම්			
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් නැවත මිණුම් කිරීමෙන් ජනිත ලාභය/(අලාභය)		**(14,345,234)**	53,276,761
නැවත ඇගයීමේ අතිරික්තය		**105,418,708**	113,812,525
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම		**4,439,352,071**	2,910,332,959

පිටු අංක 62 සිට 87 දක්වා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශයන්හි අනිවාර්යය අංගයකි.

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා	සටහන	2023 රු.	2022 රු.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත සහ උපකරණ	29	2,781,375,720	2,233,315,801
අස්පෘශ්‍ය වත්කම්	30	13,503,511	11,929,326
වත්කම පාවිච්චි කිරීමේ හිමිකම	31	294,471	315,505
නොනිමි වැඩ - ප්‍රාග්ධනය	32	12,266,660	460,920,979
ස්ථාවර තැන්පතු - කාර්ය මණ්ඩල සුභසාධනය සහ සමාජ ආරක්ෂණ අරමුදල		158,564	142,337
විලම්භිත බදු - වත්කම්		15,596,177	15,596,177
මුළු ජංගම නොවන වත්කම්		2,823,195,103	2,722,220,125
ජංගම වත්කම්			
තොග		8,774,766	9,789,941
වෙළඳ ලැබිය යුතු දෑ	33	355,783,337	293,915,448
කාර්ය මණ්ඩල ණය	34	60,762,235	55,980,902
මූල්‍ය වත්කම්	35	3,737,658,343	3,352,854,505
අත්තිකාරම්, පෙර ගෙවුම්, වෙනත් ලැබිය යුතු දෑ	36	449,910,755	545,422,389
මුදල් සහ මුදල් සමාන දෑ	37	3,451,520,415	2,592,346,695
මුළු ජංගම වත්කම්		8,064,409,851	6,850,309,880
මුළු වත්කම්		10,887,604,954	9,572,530,005
හිමිකම් සහ වගකීම්			
ප්‍රාග්ධනය සහ සංචිත			
රජයේ ප්‍රදාන	38	551,162,338	554,889,603
රඳවාගත් ඉපැයුම්	39	6,137,845,749	5,826,217,782
නැවත තත්සේරු කිරීමේ අතිරික්තය	40	219,231,233	113,812,525
මුළු ප්‍රාග්ධනය සහ සංචිත		6,908,239,320	6,494,919,909
වගකීම්			
ජංගම නොවන වගකීම්			
විලම්භිත බදු - වත්කම්	41	100,184,510	63,470,341
බදු වගකීම	42	281,554	307,013
ප්‍රතිපාදන සහ අනෙකුත් වගකීම්	43	268,222,208	72,495,410
විශ්‍රාම ප්‍රතිලාභ වගකීම	44	31,578,115	21,196,052
මුළු ජංගම නොවන වගකීම්		400,266,387	157,468,816
ජංගම වගකීම්			
වෙළඳ ගෙවිය යුතු	45	3,656,608,443	2,372,386,756
වෙනත් ගෙවිය යුතු දෑ	46	41,764,655	65,701,955
ආදායම් බදු වගකීම්	47	(119,273,851)	482,052,569
මුළු ජංගම වගකීම්		3,579,099,247	2,920,141,280
මුළු ස්කන්ධ සහ වගකීම්		10,887,604,954	9,572,530,005

පිටු අංක 62 සිට 87 දක්වා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනය සඳහා අනිවාර්ය වේ. මෙම මූල්‍ය ප්‍රකාශය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල ව සකස් කර ඇති බවට මම සහතික වෙමි.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල ව සකස් කර ඇති මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ. මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩල විසින් අනුමතකර අත්සන් කරන ලදි.

සී.ඒ.ජී. රාජන්
වැඩ බලන අධ්‍යක්ෂ- මූල්‍ය හා
ආදායම් කළමනාකරණ

ඒ.වී.එම්. සාගර කොටකාදෙණිය (විශ්‍රාමලත්)
සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ
ජනරාල් සහ ප්‍රධාන විධායක නිලධාරී

ජී.එස්. විතානගේ
සභාපති

2024 ජූනි 24

මූල්‍ය ප්‍රකාශන
ස්කන්ධ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා	රජයේ ආධාර රු.	නැවත ඇගයීමේ අතිරික්තය රු.	රඳවා ගත් ඉපැයුම් රු.	මුළු විකතුව රු.
2022 ජනවාරි 01 වන දිනට ශේෂය	558,598,755	-	4,029,697,348	4,588,296,103
කාලය සඳහා ලාභය	-	-	2,743,243,673	2,743,243,673
වත්කම් නැවත තක්සේරු කිරීම	-	113,812,525	-	113,812,525
ඒකාබද්ධ අරමුදලට මාරුවීම්	-	-	(1,000,000,000)	(1,000,000,000)
වසර සඳහා අස්පෘශ්‍ය කිරීම	(3,709,152)	-	-	(3,709,152)
විශ්‍රාම ප්‍රතිලාභය නැවත තක්සේරු කිරීම	-	-	53,276,761	53,276,761
2022 දෙසැම්බර් 31 වැනි දිනට ශේෂය	554,889,603	113,812,525	5,826,217,782	6,494,919,909
කාලය සඳහා ලාභය	-	-	4,348,278,597	4,348,278,597
වත්කම් නැවත තක්සේරු කිරීම	-	105,418,709	-	105,418,709
වසර සඳහා අස්පෘශ්‍ය කිරීම	(3,709,152)	-	-	(3,709,152)
රජයේ ආධාර වත්කම් බැහැර කිරීම්	(18,113)	-	-	(18,113)
අනුමත නොකළ යෙදවුම් බදු - විකතු නොකළ අඟය මත බදු	-	-	(22,305,396)	(22,305,396)
විශ්‍රාම ප්‍රතිලාභය නැවත තක්සේරු කිරීම	-	-	(14,345,234)	(14,345,234)
ඒකාබද්ධ අරමුදල් මාරු කිරීම	-	-	(4,000,000,000)	(4,000,000,000)
2023 දෙසැම්බර් 31 වැනි දිනට ශේෂය	551,162,338	219,231,233	6,137,845,749	6,908,239,320

පිටු අංක 62 සිට 87 දක්වා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශයන්හි අනිවාර්යය අංගයකි.

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	සටහන්	2023 රු.	2022 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම් වෙතින් මුදල් ප්‍රවාහය			
බදු අය කිරීමට පෙර සාමාන්‍ය ක්‍රියාකාරකම් වෙතින් ලද ලාභය/(අලාභය)		4,557,199,326	3,387,758,674
ගැලපුම්			
ක්ෂය වීම් - වත්මන් වර්ෂය	29	149,698,845	137,374,730
ක්ෂය වීම් - අනුමත නොකළ වකතු කළ අගය මත බදු		2,174,170	-
අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය කිරීම	30	7,638,729	15,314,716
වත්කම් පාවිච්චි කිරීමේ හිමිකම් සඳහා ක්ෂය වියදම්	31	21,034	21,034
රජයේ ප්‍රධාන මත ක්‍රමක්ෂය කිරීම	38	(3,709,152)	(3,709,152)
ආයෝජන වෙතින් ලද පොලී ආදායම	23	(1,235,493,468)	(541,714,111)
දේපළ, පිරියත සහ උපකරණ විකිණීමෙන් ලද අලාභය		862,778	3,550
දේපළ, පිරියත සහ උපකරණ විකිණීමෙන් ලද ලාභය		(106,226)	-
කල්බදු වගකීම්හි මූල්‍ය පිරිවැය	41	6,682	4,296
නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් සඳහා ප්‍රතිපාදන	43	4,426,929	12,250,981
පෙර වර්ෂයේ ගැලපුම්		(22,305,396)	-
කාරක ප්‍රාග්ධනයෙහි වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය/(අලාභය)		3,460,414,251	3,007,304,717
තොගයෙහි (වැඩිවීම)/අඩුවීම		1,015,176	(4,165,735)
වෙළෙඳ ලැබිය යුතු දෑහි (වැඩිවීම)/අඩුවීම	33	(61,867,890)	(167,687,169)
කාර්යමණ්ඩල ණයවල (වැඩිවීම)/	34	11,324,547	(9,687,605)
අත්තිකාරම්/පෙරගෙවීම්/වෙනත් ලැබිය යුතු දෑ හි (වැඩිවීම)/අඩුවීම	36	110,568,853	(2,994,691)
වෙළෙඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ හි වැඩිවීම	45/46	1,260,284,386	708,788,990
මෙහෙයුම්වලින් ජනිත මුදල්		4,781,739,323	3,531,558,507
ගෙවන ලද නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් පිරිවැය (පාරිතෝෂිකය)	44	(8,390,100)	(3,963,765)
වකතු කළ අගය මත බදු ආදායම් බද්දට හිලව් කිරීම		(8,250,934)	
ගෙවන ලද ආදායම් බදු	47	(765,282,046)	(309,550,100)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වෙතින් ලද ශුද්ධ මුදල්		3,999,816,244	3,218,044,642
ආයෝජන ක්‍රියාකාරකම් වෙතින් වූ මුදල් ප්‍රවාහ			
දේපළ පිරියත සහ උපකරණ අත්පත් කරගැනීම	29	(48,449,971)	(25,086,196)
දේපළ පිරියත සහ උපකරණ මත අනුමත නොකළ වකතු කළ අගය මත බදු		(98,947,675)	-
අස්පෘශ්‍ය වත්කම් අත්පත් කරගැනීම	30	(3,046,875)	-
නොනිමි ප්‍රාග්ධනයේ (වැඩිවීම)/අඩුවීම	32	(5,599,264)	8,701,220
වෙනත් ආයෝජන ඉවත් කරගැනීම/(අත්පත් කරගැනීම)	35	(484,262,387)	(2,070,348,167)
ලද පොලිය		1,303,788,920	701,514,519
දේපළ, පිරියත සහ උපකරණ විකිණීමෙන් ලද මුදල්		196,298	90,193
හදිසි අනතුරු විමර්ශන අරමුදලේ වැඩිවීම/(අඩුවීම)		(621,823)	(1,055,481)
බැංකු සහතිකයේ වැඩිවීම/(අඩුවීම)		196,332,395	12,276,000
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා යොදවන ලද ශුද්ධ මුදල		859,389,618	(1,373,907,913)
මූල්‍ය ක්‍රියාකාරකම් වෙතින් වූ මුදල් ප්‍රවාහ			
ඒකාබද්ධ අරමුදල වෙත දායකත්වය		(4,000,000,000)	(1,000,000,000)
කල්බදු පදනම්න් ගත් වීරවිල ඉඩම සඳහා ගෙවීම	42	(32,141)	(26,784)
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා යොදවන ලද ශුද්ධ මුදල		(4,000,032,141)	(1,000,026,784)
මුදල් සහ මුදල් සමාන දෑ හි ශුද්ධ වැඩිවීම/(අඩුවීම)		859,173,720	844,109,945
වර්ෂය ආරම්භයේ මුදල් සහ මුදල් සමාන දෑ	37	2,592,346,694	1,748,236,749
වර්ෂය අවසානයේ මුදල් සහ මුදල් සමාන දෑ	37	3,451,520,415	2,592,346,694

පිටු අංක 62 සිට 87 දක්වා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශයන්හි අනිවාර්යය අංගයකි.

මූල්‍ය ප්‍රකාශන
මූල්‍ය ප්‍රකාශනයන් සඳහා සටහන්

1. වාර්තාකරණ ආයතනය

1.1. පොදු තොරතුරු

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියෙහි ලියාපදිංචි කාර්යාලය අංක 152/1, මිනුවන්ගොඩ පාර, කටුනායක පිහිටා ඇත.

1.2 මෙහෙයුම් සැකැස්ම සහ ස්වභාවය

2002 අංක 34 දරන සිවිල් ගුවන්සේවා අධිකාරිය පනත යටතේ 2002 දෙසැම්බර් 27 වන දින ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය පිහිටු වන ලදි. එය ආරක්ෂාව, කාර්යක්ෂමතාව සහ සිවිල් ගුවන්සේවයේ විධිමත්භාවය පවත්වාගෙන යන අතර ම, 2002 අංක 34 දරන ශ්‍රී ලංකා ගුවන්සේවා අධිකාරි පනතේ සහ 2010 අංක 14 දරන සිවිල් ගුවන්සේවා පනතේ ව්‍යවස්ථාදායක විධිවිධාන යටතේ ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානය විසින් පිළිගන්නා ලද ජාත්‍යන්තර ප්‍රමිතීන්ට සහ නිර්දේශිත ක්‍රියාමාර්ගවලට අනුව ගමන් කරමින් පරිසර බලපෑම අවම කරමින් කටයුතු කරන ව්‍යවස්ථාපිත ආයතනයක් වශයෙන් සැලකේ.

2. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳ සාරාංශයමෙම මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේ දී සම්මත කරන ලද ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති පහතින් දක්වා ඇත. වෙනත් ආකාරයකින් පැවසුව හොත්, මෙම ප්‍රතිපත්ති මෙහි සඳහන් සියලු වර්ෂ සඳහා අඛණ්ඩ ව අදාළ වේ.

2.1 පිළියෙල කිරීමේ පදනම

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් පිළිබඳ ප්‍රකාශය, හිමිකම් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය අන්තර්ගත වන සිවිල් ගුවන්සේවා අධිකාරියෙහි මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය (CA Sri Lanka) මඟින් දක්වා ඇති ශ්‍රී ලංකාවේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLFRS සහ LKAS) අනුකූලව සකස් කොට ඇත.

2.2 අනුකූලතා ප්‍රකාශය

(අ) මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් පිළිබඳ ප්‍රකාශය, හිමිකම් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය අන්තර්ගත වන සිවිල් ගුවන්සේවා අධිකාරියෙහි මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය (CA Sri Lanka) මඟින් දක්වා ඇති ශ්‍රී ලංකාවේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLFRS and LKAS) අනුකූල ව සකස් කොට ඇත.

(ආ) මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ කළමනාකරණය සතු වගකීමකි. 2024 පෙබරවාරි 26 වන දින අධ්‍යක්ෂවරුන්ගේ යෝජනාව මත අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීමට අවසර ලබා දෙන ලදි.

2.3 ගණනය කිරීමේ පදනම

මූල්‍ය ප්‍රකාශ වෙතිහාසික පිරිවැය මත සකස් කර ඇති අතර, මූල්‍ය වත්කම් සාධාරණ වටිනාකමින් ගණනය කරනු ලැබේ.

2.4 ක්‍රියාකාරී හා ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය

මෙම මූල්‍ය ප්‍රකාශ අධිකාරියෙහි ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල්වලින් නිරූපණය කොට ඇත. ගනුදෙනුව සිදු වූ දිනයේ විනිමය අනුපාතය අනුව, විදේශ මුදල් ගනුදෙනු අධිකාරියේ ක්‍රියාකාරී මුදල් ඒකකයට පරිවර්තනය කර ඇත.

2.5 අඛණ්ඩ පැවැත්ම

මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේ දී අඛණ්ඩ පැවැත්ම සඳහා අධිකාරිය සතු හැකියාව කළමනාකරණය විසින් තක්සේරු කරනු ලබයි. අධිකාරියට එහි නීත්‍යනුකූල කටයුතු ඉටු කිරීමට සහ ඉදිරි අනාගතයේ දී මෙහෙයුම් පවත්වා ගෙන යාමට ප්‍රමාණවත් සම්පත් ඇති බවට කළමනාකරණය බොහෝ දුරට අපේක්ෂා කරයි. අනාගතය පිළිබඳ පවත්නා තොරතුරු සලකා බැලීමේ දී ඈවර කිරීමකට හෝ මෙහෙයුම් නැවැත්වීමට අවශ්‍ය යැයි අධිකාරිය විසින් අපේක්ෂා කරනු නොලබයි. ඒ අනුව, මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේ දී අධිකාරිය විසින් අඛණ්ඩ පැවැත්ම කෙරෙහි අවධානය යොමු කෙරේ.

2.6 සැලකිය යුතු ගිණුම්කරණ තීන්දු, ඇස්තමේන්තු සහ උපකල්පන

අධිකාරියේ මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම සඳහා වාර්තාකරණ දිනයට අදාළ ආදායම්, වියදම්, වත්කම්, සහ වගකීම් අනාවරණය කළ හැකි තීන්දු ඇස්තමේන්තු සහ උපකල්පන සකස් කිරීමේ දී අවශ්‍ය කළමනාකරණ කටයුතු සිදු කිරීම අවශ්‍ය වේ. කෙසේ වුව ද, මෙම උපකල්පනවල සහ ඇස්තමේන්තුවල අවිනිශ්චිතතාව ඉදිරි අනාගතයේ දී වත්කම්වල හෝ වගකීම්වල ධාරණ අගයේ ද්‍රව්‍යාත්මක වෙනස්කමක් අවශ්‍ය ප්‍රතිඵල කෙරෙහි එය හේතු වේ. තීන්දු, ඇස්තමේන්තු, උපකල්පන මීට ඇතුළත් වේ.

2.6.1. තීන්දු

ඇස්තමේන්තු සහ උපකල්පන සිදු කිරීම හැරුණු කොට, අධිකාරියෙහි ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදා ගැනීමේ දී කළමනාකරණය මූල්‍ය ප්‍රකාශවල හඳුනා ගනු ලබන අගයන්වලට සැලකිය යුතු වශයෙන් බලපෑමක් ඇති කරන පහත සඳහන් තීන්දු ගන්නා ලදී.

2.6.2 ඇස්තමේන්තු සහ උපකල්පන

ඉදිරි මූල්‍ය වර්ෂය තුළ වත්කම්වල සහ වගකීම්වල ධාරණ අගයේ ද්‍රව්‍යමය ගැලපීමක් ඇති කිරීමේ සැලකිය යුතු අවදානමක් ඇති, අනාගතය පිළිබඳ ප්‍රධාන උපකල්පන සහ වාර්තා කරන දිනයේ ඇස්තමේන්තු අවිනිශ්චිතතාවයෙහි අනෙකුත් ප්‍රධාන මූලාශ්‍ර පහතින් සාකච්ඡා කෙරේ.

(අ) මූල්‍ය උපකරණවල සාධාරණ වටිනාකම

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි දක්වා ඇති මූල්‍ය වත්කම්වල සාධාරණ වටිනාකම සහ වාර්තාගත මූල්‍ය වගකීම් ක්‍රියාකාරී වෙළෙඳපොළෙන් ලබා ගත නොහැක. කෙසේ වුව ද, වට්ටම් කරන ලද මුදල් ප්‍රවාහ ආකෘතිය සහ ගණිතමය ආකෘතිය ඇතුළු විවිධ තක්සේරු ක්‍රම භාවිත කර ඒවා තීරණය කරනු ලැබේ. මෙම ආකෘතීන් සඳහා යෙදවුම් හැකිතාක් නිරීක්ෂණය කළ හැකි වෙළඳපල දත්ත වලින් ව්‍යුත්පන්න කර ගන්නා අතර, නිරීක්ෂණය කළ හැකි වෙළඳපල දත්ත නොමැති විට, සාධාරණ අගයන් ස්ථාපිත කිරීම සඳහා විනිශ්චයක් යොදා ගනු ලැබේ.

මෙම සාධකවල උපකල්පන වෙනස්කම්, වාර්තා කළ මූල්‍ය වත්කම්වල සාධාරණ වටිනාකම කෙරෙහි බලපෑ හැකි ය. භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජන ප්‍රකාශිත අගයෙන් දක්වා ඇත.

ශේෂ පත්‍රයේ දිනට මූල්‍ය වත්කම්වල ධාරණ අගය (භාණ්ඩාගාර බිල්පත්)
රු. 3,959,239,350/- (2022
රු. 3,474,976,963/-)

(ආ) නිර්වචිත ප්‍රතිලාභ බැඳියාවන් පිළිබඳ තක්සේරු කිරීම
ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 19 (LKAS) අනුව සූත්‍ර ක්‍රමය භාවිත කරමින් නිර්වචිත ප්‍රතිලාභ විශ්‍රාම සැලසුම් පිළිබඳ පරිවැය ගණනය කරනු ලබයි.

ශේෂ පත්‍රයේ දිනට නිර්වචිත ප්‍රතිලාභ බැඳියාවන්හි ධාරණ අගය රු. 31,578,115 (2022 රු. 21,196,052/-).

(ඇ) සාධාරණ වටිනාකම
සාධාරණ වටිනාකම යනු දැනුමැති, බලකිරීමකින් තොරව කැමැත්තෙන් කටයුතු කරන පාර්ශවයන් අතර අතේ දුරින් සිදු කරන ගනුදෙනුවක දී විකඟ වන ප්‍රතිෂ්ඨාවයි. මූල්‍ය උපකරණයක් පළමු ව හඳුනා ගත් විට, එහි සාධාරණ වටිනාකම යනු සාමාන්‍යයෙන් ගෙවූ හෝ ලැබුණු ප්‍රතිෂ්ඨාවයි. මූලික හඳුනා ගැනීමෙන් අනතුරු ව ලංසු මිල යනු සක්‍රීය වෙළෙඳපොළක ඇති මූල්‍ය වත්කමක සාධාරණ වටිනාකම වන අතර, විකුණුම් සඳහා ඉදිරිපත් කරන මිල යනු සක්‍රීය වෙළෙඳපොළක ඇති මූල්‍ය වගකීමක සාධාරණ වටිනාකම වේ. මුදල් සමාන දෑ වැනි මූල්‍ය උපකරණ සහ කෙටි කාලීන ආයෝජන සඳහා, මෙම උපකරණවල ධාරණ අගය සාධාරණ වටිනාකමට ආසන්න වේ.

(ඈ) ආදායම් බද්ද
අධිකාරිය ආදායම් බදුවලට යටත් වන අතර, ආදායම් බදු සඳහා වන සමස්ත විධිවිධාන තීරණය කිරීමෙහි ලා සැලකිය යුතු විනිශ්චයක් අවශ්‍ය වේ.

වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

3. මූල්‍ය වත්කම්

අධිකාරිය එහි මූල්‍ය වත්කම් පහත පරිදි වර්ගීකරණය කොට දක්වයි: එනම් ණය සහ ලැබිය යුතු දෑ සහ, කල් පිරෙන තෙක් තබා ඇති සහ විකුණුම් සඳහා යොදා ගත හැකි දෑ වශයෙනි. මූලික හඳුනාගැනීමේ දී කළමනාකරණය විසින් මෙම වර්ගීකරණය තීරණය කරනු ලබන අතර ම, එම වර්ගීකරණය ආයෝජන සිදු කරන අරමුණ මත රඳා පවතී.

3.1 වර්ගීකරණය

(අ) ණය සහ ලැබිය යුතු දෑ
ණය සහ ලැබිය යුතු දෑ ණය සහ ලැබිය යුතු දෑ යනු ක්‍රියාකාරී වෙළෙඳපොළක දක්වා නොමැති ස්ථාවර හෝ තීරණය කළ හැකි ගෙවීම්වලින් යුතු ඇති විය නොහැකි මූල්‍ය වත්කම් ය. සාමාන්‍ය ගනුදෙනු ලදුපත් ද මෙම කාණ්ඩයට ඇතුළත් කෙරෙන අතර ම, හානිකරණය සඳහා සමාලෝචනයට ලක් කෙරේ.

(ආ) කල් පිරෙන තෙක් තබා ඇති මූල්‍ය වත්කම්
කල් පිරෙන තෙක් තබා ඇති මූල්‍ය වත්කම් යනු ස්ථාවර හෝ තීරණය කළ හැකි ගෙවීම්වලින් සහ කල් පිරෙන තෙක් තබා ගැනීමට අධිකාරියෙහි කළමනාකරණය අරමුණු කරන ස්ථාවර කල් පිරීම්වලින් යුතු ඇති විය නොහැකි මූල්‍ය වත්කම් වේ. පහත සඳහන් දෑ ඊට අයත් නොවේ.

- මූලික හඳුනා ගැනීම් මත අධිකාරිය ලාභ හෝ අලාභ මඟින් සාධාරණ වටිනාකම ලෙස නම් කරයි, හෝ
- විකුණුම් සඳහා යොදා ගත හැකි යනුවෙන් අධිකාරිය නම් කරයි, සහ
- ණය සහ ලැබිය යුතු දෑ යන්නෙහි අර්ථය සපුරාලන
- කල් පිරෙන තෙක් තබා ඇති ආයෝජනවල පොලී අගයන් ආදායම් ප්‍රකාශයෙහි දක්වා ඇති අතර, එය 'ආයෝජන ආදායම්' ලෙස සඳහන් කොට ඇත.

(ඇ) විකුණුම් සඳහා යොදා ගත හැකි මූල්‍ය වත්කම්
විකුණුම් සඳහා යොදා ගත හැකි මූල්‍ය වත්කම් ද්‍රවශීලතාව හෝ පොලී අනුපාත වෙනස්කම් සහ විනිමය අනුපාත හෝ ස්කන්ධ මිල අවශ්‍යතා මත විකිණිය හැකි අවිනිශ්චිත කාලසීමාවක් දක්වා රඳවා තබා ගත හැකි මූල්‍ය වත්කම් හෝ, ණය, ලැබිය යුතු දෑ, හෝ රඳවා තබා ගත හැකි ආයෝජන ලෙස හෝ වර්ග කළ නොහැකි වත්කම් හෝ, ලාභ හෝ අලාභ හරහා ලැබෙන ධාරණ වටිනාකමින් යුතු මූල්‍ය වත්කම් හෝ විකුණුම් සඳහා පවත්නා ආයෝජන වශයෙන් සැලකේ.

3.2 හඳුනා ගැනීම සහ ගණනය කිරීම

මූල්‍ය වත්කම් මූලික ව සාධාරණ වටිනාකමකින් හඳුනාගෙන අතර, සියලු ම මූල්‍ය වත්කම් ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමකින් යුක්ත නොවන අවස්ථාවක, එය ළඟා කරගැනීම සඳහා ගනුදෙනු පිරිවැය සෘජු ව ආරෝපණය වේ. එසේ ම ලාභ හෝ අලාභ හරහාසාධාරණ වටිනාකමකින් යුක්ත වන මූල්‍ය වත්කම්, මූලිකව සාධාරණ වටිනාකමින් හඳුනාගැනෙන අතර, ගනුදෙනු පිරිවැය ආදායම් ප්‍රකාශයේ පියවනු ලැබේ. මූල්‍ය වත්කම් වෙතට මුදල් ප්‍රවාහ ලබා ගැනීමේ අයිතිය කල් ඉකුත් වූ විට හෝ ඒවා මාරු කර ඇති විට ඒවා හඳුනා ගැනීමෙන් බැහැර කරනු ලබන අතර, අධිකාරිය විසින් හිමිකාරිත්වයේ සියලු අවදානම් සහ වාසි සැලකිය යුතු ලෙස පවරා ඇත. විකුණුම් සඳහා යොදා ගත හැකි මූල්‍ය වත්කම් පසු ව සාධාරණ වටිනාකමින් යුක්ත වේ. ඵලදායී පොලී ක්‍රමය භාවිතා කරමින් ණය සහ ලැබිය යුතු මුදල් සහ කල්පිරීමට නියමිත මූල්‍ය වත්කම් ක්‍රමක්ෂගත පිරිවැයක් යටතේ හඳුනාගනු ලැබේ.කල්පිරීමට නියමිත ලෙස වර්ගීකරණය කරනු ලබන මූල්‍ය සහ මූල්‍ය නොවන සුරැකුම්වල සාධාරණ වටිනාකමෙහි වෙනස්කම්, වෙනත් විස්තීර්ණ ආදායම් මඟින් හඳුනා ගැනේ.

විකිණිය හැකිහෝ හානිකරණ ලෙස සුරැකුම් වර්ගීකරණය කරන විට, වෙනත් විස්තීර්ණ ආදායම්වල හඳුනා ගනු ලබන සමඟුචිත සාධාරණ අගයේ වෙනස්කම්, මූල්‍ය වත්කම් ඇති ආදායම් ප්‍රකාශයේ ඇති ශුද්ධ ලාභ/අලාභ ලෙස ආදායම් ප්‍රකාශයට ඇතුළත් කොට ඇත.

සාඵල්‍ය පොලී ක්‍රම භාවිත කරමින් ගණනය කරනු ලබන විකිණිය හැකි සුරැකුම්පත් මත වන පොලිය මූල්‍ය ප්‍රකාශනයෙන් හඳුනා ගැනේ.

3.2.1 සාධාරණ වටිනාකම පිළිබඳ හඳුනාගැනීම

ණය සහ අත්තිකාරම්වල සාධාරණ වටිනාකම මෙන් ම බැංකු වෙත වගකීම් සහ ගනුදෙනුකරුවන් ගිවිස ගෙන විකඟ වූ මූල්‍ය ප්‍රවාහ, බැර තත්ත්වය, ද්‍රවශීලිතාව සහ වියදම වර්තමාන අගය ආකෘතිය යොදා ගෙන හඳුනා ගැනේ.

ධාරණ අගයෙන්, වෙළෙඳ ලැබිය යුතු දෑ සහ ගෙවිය යුතු දෑ සඳහා හානිකරණ ප්‍රතිපාදන අඩු කළ පසු ඒවායේ සාධාරණ අගයට ආසන්න අගයක් ලැබෙන බව උපකල්පනය කෙරේ.

3.2.2 හඳුනා ගැනීමෙන් බැහැර කිරීම

මූල්‍ය වත්කමක (හෝ මූල්‍ය වත්කමක කොටසක් හෝ සමූහයෙන් කොටසක සමාන මූල්‍ය වත්කමක් යොදා ගත හැකි විටක) හඳුනා ගැනීමෙන් බැහැර කෙරෙනුයේ:

- වත්කම් වෙතින් මුදල් ප්‍රවාහ ලබා ගැනීමට ඇති අයිතිය අවසන් වී ඇත.

මූල්‍ය ප්‍රකාශන

මූල්‍ය ප්‍රකාශනයන් සඳහා සටහන්

✈ වත්කම්වලින් මූල්‍ය ප්‍රවාහ යොදා ගැනීමේ අයිතිය අධිකාරිය විසින් පවරා ඇති හෝ 'ගනුදෙනු' සැලැස්මක් සඳහා එකඟ වීම යටතේ තෙවන පාර්ශ්වයක් වෙත ද්‍රව්‍යාත්මක ප්‍රමාදයකින් තොර ව සම්පූර්ණයෙන් ලැබිය යුතු මූල්‍ය ප්‍රවාහ ගෙවීමේ වගකීම උපකල්පනය කර ඇති අවස්ථාවල ය.

(අ) අධිකාරිය වත්කම්වල සියලු අවදානම් සහ සියලු වාසි සැලකිය යුතු වශයෙන් පවරා ඇති නැතහොත්,

(ආ) අධිකාරිය වත්කම්වල සියලු අවදානම් සහ සියලු වාසි සැලකිය යුතු වශයෙන් පවරා හෝ රඳවා ගෙන නොමැත. නමුත් වත්කම් පාලනය පවරා ඇත.

අධිකාරිය එහි වත්කමකින් මූල්‍ය ප්‍රවාහ ලැබීමේ අයිතිය පවරා ඇති අවස්ථාවක හෝ සම්මත කරගැනීමකට එළඹ ඇති අවස්ථාවක මෙන්ම, වත්කමේ සියලු අවදානම් සහ සියලු වාසි සැලකිය යුතු වශයෙන් පවරා හෝ රඳවා ගෙන නොමැති අවස්ථාවක හෝ එහි පාලනය පවරා නොමැති අවස්ථාවක, අධිකාරියේ අඛණ්ඩ මැදිහත්වීමේ ප්‍රමාණය අනුව වත්කම් යන්න හඳුනා ගැනේ. මෙහි දී, අධිකාරිය විසින් හවුල් වගකීමක් ද හඳුනා ගනු ලැබේ. පවරන ලද වත්කම් සහ හවුල් වගකීම් අධිකාරිය සතු අයිතීන් සහ බැඳීම් පිළිබිඹු වන ලෙස ගණනය කෙරේ. පවරන ලද වත්කම මත ඇපකරයක ස්වරූපය ගනු ලබන අඛණ්ඩ මැදිහත්භාවය වත්කමේ මුල් ධාරණ අගයට හා අධිකාරියට ආපසු ගෙවීමට අවශ්‍ය විය හැකි උපරිම අගයට පහළින් ගණනය කරනු ලැබේ.

4. දේපළ, පිරියත සහ උපකරණ

4.1 පිරිවැය/නැවත තක්සේරු කිරීම

දේපළ පිරියත සහ උපකරණ අයිතම සමුච්චිත ක්ෂය වීම හා සමුච්චිත හානි අලාභ පිරිවැයෙන් අඩු කර ගණනය කරනු ලැබේ. වත්කම් අත්පත් කරගැනීමට සෘජු ව ම සම්බන්ධ වියදම පිරිවැයට ඇතුළත් වේ. ද්‍රව්‍ය පිරිවැය, සෘජු ශ්‍රමය සහ අපේක්ෂිත පරිදි වත්කම් භාවිතය සඳහා සෘජු ව භාවිත කළ හැකි වෙනත් පිරිවැය ස්වයං අර්ථකාරී වත්කම් පිරිවැයට ඇතුළත් වේ.

දේපළ පිරියත සහ උපකරණ යන අයිතමයක් නැවත ප්‍රතිස්ථාපනය කිරීමට වැය වන පිරිවැය අනාගතයේ දී අධිකාරියට නැවත අත් කර දීමට සම්භාවිතාවක් තිබේ නම් සහ එම පිරිවැය විශ්වාසදායක වන්නේ නම්, එය අයිතමයෙහි ධාරණ අගය වශයෙන් හඳුනා ගැනේ. දේපළ පිරියත සහ උපකරණ භාවිත කරමින් සිදු කරන දෛනික සේවා සඳහා වැය වන පිරිවැය ලාභය හා අලාභය තුළ හඳුනා ගැනේ.

දේපළ පිරියත සහ උපකරණ අයිතම වටිනාකම නැවත කත්සේරු කර ඇති අවස්ථාවක, එකී වත්කම්හි සමස්තය ද නැවත කත්සේරු කරනු ලැබේ. අධිකාරිය විසින් 2014 වර්ෂයේ සිට බලපැවැත්වෙන පරිදි සෑම වර්ෂ 3-5කට වරක් වත්කම් තක්සේරු කිරීමේ ප්‍රතිපත්තිය වෙනස් කරනු ලැබ ඇත.

වත්කමක් නැවත තක්සේරු කරන විට, ආදයම් ප්‍රකාශයේ පෙර හඳුනාගෙන ඇති එම වත්කම්වල නැවත තක්සේරු කිරීමේ හිඟයේ ප්‍රමාණය හැර, ධාරණ අගයේ ඕනෑම වැඩි වීමක් නැවත තක්සේරු කිරීමේ සංචිතය වෙත සෘජු ව ම බැර කෙරේ. එය මූල්‍ය ප්‍රකාශයේ සඳහන් වේ. එම වත්කමේ පෙර අතික්තයක් පියවන ඕනෑ ම නැවත තක්සේරු කිරීමේ හිඟතාවක් නැවත තක්සේරු කිරීමේ සංචිතයෙහි අතිරික්තයට සෘජු ව ම හිලව් කෙරෙන අතර, ඕනෑ ම අතිරික්තයක් වියදමක් වශයෙන් හඳුනා ගැනේ. විකුණන ලද වත්කම්වලට අදාළ ඕනෑ ම නැවත තක්සේරු සංචිතයක් බැහැර කිරීමෙන් පසු රඳවා ගත් ඉපැයීම් වෙත මාරු කරනු ලැබේ.

4.2 ක්ෂය වීම

ක්ෂය වීම වත්කමක පිරිවැය හෝ පිරිවැය වෙනුවෙන් ඇති වෙනත් අගයක් වන සුන්බුන් වටිනාකම පහළින් ගණනය කරනු ලැබේ. ක්ෂය වීම දේපළ, පිරියත සහ උපකරණ යන සෑම අයිතමයක ම ඇස්තමේන්තුගත ආයු කාලය පුරා සරල රේඛීය ක්ෂය කිරීමේ පදනම මත ලාභය හෝ අලාභය වශයෙන් හඳුනා ගැනේ. අත්පත් කරගන්නා වර්ෂයේ දී, වත්කම භාවිතයට ගත් දිනයේ සිට සමානුපාතික පදනමක් මත ක්ෂය වීම් ගණනය කරනු ලබන අතර, එම වත්කම බැහැර කළ දිනයෙන් පසුව ක්ෂය වීමක් අය නොකෙරේ. කල්බදු වත්කම් කල්බදු කාල සීමාවෙහි සහ ඒවායේ ආයු කාලයෙහි කෙටි බව මත ක්ෂය වී යයි. ඉඩම් ක්ෂය වීමට ලක් නොවේ.

පවත්නා වත්කම්වල ඇස්තමේන්තුගත ආයු කාලය පහත පරිදි වේ:

ගොඩනැඟිලි	–	වසර 15-40
බහාලුම් අංග	–	වසර 5-10
මෝටර් රථ	–	වසර 8-15
පිරියත, යන්ත්‍රෝපකරණ සහ උපකරණ	–	වසර 4-10
ලී භාණ්ඩ සහ සවිකිරීම්	–	වසර 4-10
වෙනත් ස්ථිර වත්කම්	–	වසර 4-10

ක්ෂය වීමට අදාළ නියමය දේපළ, පිරියත සහ උපකරණ පිරිවැය/තක්සේරුව (වත්කම සඳහාවූ පිරිවැයෙහි/තක්සේරුවහි අවශේෂ අගයෙන් 10%ට වඩා අඩු) පිළිබඳ සරල පදනමකින් ගණනය කරනු ලැබේ. ඉඩම් හැර සියලු දේපළ පිරියත සහ උපකරණ ඒවායේ ආයු කාලය මත වාර්ෂික ව පහත ප්‍රතිශතවලින් ක්ෂය වීමට ලක් වේ.

ගොඩනැඟිලි	–	6 2/3%
බහාලුම් අංග	–	10%
මෝටර් රථ	–	12.5 %
පිරියත, යන්ත්‍රෝපකරණ සහ උපකරණ	–	25 %
ලී භාණ්ඩ සහ සවිකිරීම්	–	25 %
වෙනත් ස්ථිර වත්කම්	–	25%

වත්කම භාවිත කිරීම ආරම්භ කළ දිනයේ සිට සමානුපාතික පදනමක් මත ක්ෂය වීම ලාභ අලාභ ගිණුමට අය කර ඇති අතර, පිරිවැයෙන්/නැවත තක්සේරු කරන ලද අගය ප්‍රමාණයෙන් 10%ක් තනි වත්කම්වල ක්ෂය කළ හැකි අගය තීරණය කිරීමේ දී සුන් බුන් වටිනාකම වශයෙන් වශයෙන් පවතී.

ක්ෂය වීමේ ක්‍රමය, ආයු කාලය සහ අවශේෂ අගය කළමනාකරණය විසින් සෑම වාර්තාකරණ දිනයක දී ම සමාලෝචනය කෙරෙන අතර, පවත්නා තොරතුරුවල ගුණාත්මක භාවය සහ වත්කම්වල අපේක්ෂිත ආර්ථික කාර්යක්ෂමතාව මත පදනම් ව අවශ්‍ය පරිදි LKAS 16 මඟින් ගැලපීම් සිදු කරනු ලැබේ.තාක්ෂණික අවභාවිතයට අදාළ මෙම තක්සේරු කිරීම්වල අවිනිශ්චිතතා ඒ ඒ ඒමෘදුකාංග සහ තොරතුරු තාක්ෂණ උපකරණවල උපයෝගීතාව වෙනස් කිරීමට හේතු විය හැකි ය.

4.3 හඳුනා ගැනීමෙන් බැහැර කිරීම

දේපළ, පිරියත සහ උපකරණ බැහැර කිරීම මත හෝ එය භාවිත කිරීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකරන අවස්ථාවල දී හඳුනා ගැනීමෙන් බැහැර කෙරේ. දේපළ, පිරියත සහ උපකරණ අයිතමයක් හඳුනා ගැනීමෙන් බැහැර වීම මඟින් ඇති වන ලාභය හෝ අලාභය තීරණය වන්නේ විකුණුම් ක්‍රියාවලිය සහ වත්කම් ධාරණ අගය අතර ඇති වන වෙනස අනුව වන අතර, එය ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගෙන ඇත.

4.4 ස්පෘශ්‍ය වත්කම් හානිකරණය

සෑම වාර්තාකරණ කාල පරිච්ඡේදයක් අවසානයේ දී ම, ස්පෘශ්‍ය වත්කම්වල හානිකරණ අලාභයක් සිදු වී ඇති බවට යම් ඇඟවීමක් තිබේ ද යන්න තීරණය කිරීමට අධිකාරිය විසින් එම වත්කම්වල ධාරණ අගය සමාලෝචනය කරනු ලැබේ. එලෙස පවතී නම්, වත්කම්වල පියවා ගත හැකි අගය හානිකරණ අලාභ (ඇත්නම්) ප්‍රමාණය තීරණය කිරීම සඳහා ඇස්තමේන්තු කෙරේ. තනි වත්කමක පියවා ගත හැකි අගය ඇස්තමේන්තු කිරීමට නොහැකි අවස්ථාවක, වත්කම අයත් වන මුදල් උත්පාදන ඒකකය සඳහා පියවා ගත හැකි අගය තීරණය වේ. වෙන් කිරීම පිළිබඳ සාධාරණ සහ ස්ථාවර පදනම මඟින් වත්කම් ද කුඩා තනි උත්පාදන ඒකකවලට බෙදා වෙන් කෙරෙන බව හඳුනාගත හැකිය.

පියවා ගත හැකි අගය යනු විකිණීමට ඇති හෝ භාවිතයේ පවතින සාධාරණ වටිනාකමට වඩා ඉහළ වූ අගයකි. භාවිතයේ පවතින වත්කම් තක්සේරු කිරීමේ දී, ඇස්තමේන්තු කරන ලද අනාගත මුදල් ප්‍රවාහ මුදල්වල කාලීන අගයෙහි වර්තමාන වෙළෙඳපොළ තක්සේරු පිළිබිඹු කෙරෙන සහ පෙර බදු වට්ටම් අනුපාතයෙන් වර්තමාන අගයට වට්ටම් කරනු ලැබෙන අතර, අනාගත මුදල් ප්‍රවාහයන් ඇස්තමේන්තු කරන වත්කමට විශේෂිත වූ අවදානම් ගලපා නැත.

වත්කමක (හෝ මුදල් උත්පාදන ඒකකය) පියවිය හැකි අගය යනු ධාරණ අගයට වඩා අඩු විය යුතු යැයි ඇස්තමේන්තු කර ඇතැයි උපකල්පනය කළහොත්, එහි දී වත්කමක ධාරණ අගය පියවිය යුතු අගය දක්වා අඩු කර ඇත. අදාළ වත්කම නැවත තක්සේරු කළ මුදලකට ගෙන යන්නේ නම් මිස හානිකරණ අලාභයක් මූල්‍ය ප්‍රකාශයෙහි හඳුනාගත හැකිය.

4.5 නොනිමි ප්‍රාග්ධන ක්‍රියාකාරකම්

නොනිමි ප්‍රාග්ධන ක්‍රියාකාරකම් පිළිබඳ ව සමුච්චිත හානිකරණ අලාභවල පිරිවැයෙහි දක්වා ඇත. මේවා ගොඩනැගිලි, ජාල උපකරණ පද්ධති සංවර්ධනය සහ ප්‍රාග්ධනීකරණය අපේක්ෂා කෙරෙන වෙනත් ස්ථිර වත්කම් ගොඩනැඟමේ දී සෘජු ව ම වැය වන ප්‍රාග්ධන වියදම් වේ.

මෙම වියදම් සම්පූර්ණ කිරීමේ සහතිකය ලැබීමෙන් අනතුරු ව හෝ වත්කම් ලබා ගත හැකි වන විට CAASL වත්කම් ලේඛනයට ඇතුළත් කෙරේ.

4.6 අස්පෘශ්‍ය වත්කම්

ඉහළ ආයු කාලයක් සහිත වත්කම් වන අස්පෘශ්‍ය වත්කම් ගණනය කරනු ලබන්නේ අවම පිරිවැය සමුච්චිත ක්‍රමක්ෂ සහ සම්චිත හානිකරණ අලාභවලිනි. ක්‍රමක්ෂ නියමයන් ගණනය කරනයේ තාක්ෂණික මෘදුකාංග සහ මෙහෙයුම් පද්ධති සඳහා වන පිරිවැය (වත්කම් වටිනාකමෙහි අවශේෂ වටිනාකමින් 10%කට අඩු) පිළිබඳ සරල පදනමකිනි ය.

ඉහළ ආයු කාලයක් සහිත එවැනි අගයන් ඉවත් කර දැමීම සඳහා සියලු මෘදුකාංග වාර්ෂික ව 50%ක වාර්ෂික අනුපාතයකින් ක්‍රමක්ෂ කරනු ලැබේ.

අස්පෘශ්‍ය වත්කම්වල ආයුකාලය සමාලෝචනය කිරීමට අවශ්‍ය වූ විටෙක කලින් කලට සමාලෝචන කටයුතු සිදු කරනු ලැබේ. තාක්ෂණික මෘදුකාංගවල ආයු කාලය පහත පරිදි වේ.

තාක්ෂණික මෘදුකාංග	වසර 2-4

4.7 වත්කම් භාවිත කිරීමේ අයිතිය සහ කල්බදු වගකීම්

4.7.1 වත්කම් භාවිත කිරීමේ හිමිකම

වත්කම ආරම්භ වන දිනයේ දී ම අධිකාරිය විසින් වත්කම් භාවිත කිරීමේ හිමිකම හඳුනා ගනු ලබයි (එනම් වත්කම භාවිත කිරීමට හැකි දිනය). වත්කම් භාවිත කිරීමේ හිමිකම පිරිවැය, යම් සමුච්චිත ක්ෂයවීම් සහ හානිකරණ අලාභවලින් ගණනය කරනු ලැබෙන අතර, ඕනෑ ම කල්බදු වගකීම් ගණනනය කිරීමක් සඳහා ගැලපේ. හඳුනාගෙන ඇති කල්බදු වගකීම් ප්‍රමාණය, දරන ලද මූලික පිරිවැය සහ ආරම්භක දිනට හෝ ඊට පෙර සිදු කරන ලද කල්බදු ගෙවීම් වත්කම් භාවිත කිරීමේ හිමිකම සඳහා වැය වන පිරිවැයට ඇතුළත් වේ. වත්කම් භාවිත කිරීමේ හිමිකම කල් බදු කාල සීමාව සහ ඇස්තමේනුතු කරන ලද වත්කම්වල ආයු කාලය අනුව සරල පදනමක් මත ක්ෂය වේ. එය පහත පරිදි වේ:

වත්කම්	ඇස්තමේන්තු කරන ලද ආයුකාලය
ඉඩම්	වසර 30ට වැඩි

4.7.2 කල්බදු වගකීම්

කල්බදු ආරම්භ වන දිනයට, කල්බදු කාල සීමාව අනුව කල්බදු ගෙවීම්වල වර්තමාන වටිනාකමින් කල්බදු වගකීම් ගණනය කරනු ලබන බව අධිකාරිය විසින් හඳුනා ගනු ලබයි.

මූල්‍ය ප්‍රකාශන
මූල්‍ය ප්‍රකාශනයන් සඳහා සටහන්

5. තොග

තොග ගණනය කරනු ලබන්නේ පිරිවැයෙනි. පිරිවැය තීරණය කරනුයේ පෙර පිවිසි සහ පෙර නිකුත් කළ (FIFO) යන පදනම අනුව ය. තොග විටිනාකම අත්පත් කරගැනීමට වැය වන බරපැනවලින් ද, පරිවර්තන පිරිවැයවලින් සහ පවත්නා තත්ත්වයට රැගෙන ඒමට වැය වන අනෙකුත් වියදම්වලින් ද සමන්විත වේ.

6. වෙනත් වත්කම්

වෙනත් ණය ගැතියන් සහ ලබන්නන්, අත්තිකාරම් තැන්පතු, පෙර ගෙවුම්, සහ ලැබිය යුතු බදු මුදල් ආදිය වෙනත් වත්කම්වලට අයත් වේ.

(අ) අත්තිකාරම් තැන්පතු පෙර ගෙවුම් බරපැන
එක් මූල්‍ය වර්ෂයකට වඩා ප්‍රතිලාභයක් හෝ සම්බන්ධතාවක් ඇතැයි සැලකෙන වියදමක් අත්තිකාරම්, තැන්පතු, සහ පෙර ගෙවුම් වියදම් ලෙස වර්ග කෙරේ. එම වියදම කාල සමානුපාතික පදනම මත අදාළ කාල සීමාව තුළ කපා හරිනු ලැබේ.

(ආ) වෙනත් ණයගැතියන්
වෙනත් ණයගැතියන් හානිකරණ අලාභ පිරිවැය රහිත පිරිසක් බව හඳුනා ගැනේ.

(ඇ) ලැබිය යුතු බදු
ලැබිය යුතු බදු පිරිවැයක් වශයෙන් හඳුනා ගැනේ.

(ඈ) පෙරගෙවුම් කාර්ය මණ්ඩල පිරිවැය
අධිකාරියෙහි සේවකයන්හට සහන මිලට ලබා දෙන කාර්ය මණ්ඩල ණයවලින් පෙරගෙවුම් කාර්ය මණ්ඩල පිරිවැය ඉතිරි වන ශේෂය මීට අයත් වේ.

(ඉ) ලැබිය යුතු එකතු කළ අගය මත බදු
දේශීය ආදායම්බදු දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතුවකතු කළ අගය මත බදු ආපසු ගෙවීම් මෙමඟින් දැක්වේ.

7. මුදල් සහ මුදල් හා සමාන දෑ

මුදල් සහ මුදල් හා සමාන දෑ අතැති මුදල්වලින් සහ දන්නා මුදල් අගයට පහසුවෙන් පරිවර්තනය කළ හැකි සහ අගය වටිනාකමට සැලකිය යුතු අවදානමක් ඇති නොකරන කෙටිකාලීන ඉහළ ද්‍රවශීල ආයෝජනවලින් සමන්විත වේ. මේවා කෙටි කාලීන මුදල් බැඳීම් සඳහා හේතු වේ.

මුදල් ප්‍රවාහ ප්‍රකාශවල, මුදල් සහ මුදල් හා සමාන දෑ අතැති මුදල්වලින් සහ බැංකු තැන්පතුවලින් සමන්විත වෙයි. කෙටි කාලීන කල් පිරෙන ආයෝජන ද මුදල් සමාන දෑවලට අයත් වේ. ජංගම වගකීම්වල ණය තුළ ඇති බැංකු අයිරා ඒකාබද්ධ ශේෂ පත්‍රය මඟින් දැක්වේ.

8. ප්‍රතිපාදන

පසුගිය සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් වර්තමානයේ අධිකාරිය සතු ව වගකීමක් (නෛතික හෝ සම්මුතික) ඇති බව ප්‍රතිපාදන යනුවෙන් හඳුනා ගැනේ. එනම් එම වගකීම් පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ඇතුළත් සම්පත් පිටතට ගලා යාමක් අවශ්‍ය විය හැකි වගකීම් ප්‍රමාණය පිළිබඳ විශ්වාසදායක ඇස්තමේන්තුවක් ය. මුදල්වල කාල වටිනාකමෙහි බලපෑම ද්‍රව්‍යය යැයි උපකල්පනය කළහොත්, එහි දී, මුදල්වල කාල වටිනාකමෙහි වර්තමාන වෙළෙඳපොළ තක්සේරු කිරීම සහ සුදුසු අවස්ථාවල දී වගකීමට විශේෂිත වූ අවදානම් පිළිබිඹු කෙරෙන පූර්ව බදු අනුපාතයකින් අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහ වට්ටම් කිරීමෙන් ප්‍රතිපාදන තීරණය කරනු ලැබේ.

2002 අංක 34 දරණ සිවිල් ගුවන්සේවා අධිකාරිය පනතේ 7 (ඌ) වගන්තිය යටතේ, ගුවන්යානා අනතුරු සහ සිදුවීම් පිළිබඳ විමර්ශන දියත් කිරීමට සහ ගවේෂණය කිරීමට සහ ගලවාගැනීමේ මෙහෙයුම් දියත් කිරීමට ප්‍රතිපාදන සලසා දීමට අධිකාරිය වෙත බලතල, කාර්ය සහ කර්තව්‍ය පැවරී ඇත. මෙය 2010 අංක 14 දරන සිවිල් ගුවන්සේවා පනතේ VI පරිච්ඡේදයෙන් හා 53, 54 සහ 55 වගන්තිවල විධිවිධාන මඟින් තවදුරටත් විස්තර කරේ.

ශ්‍රී ලංකාව පුළුල් සාමුද්‍රික ගුවන් අවකාශයක් සහිත වීම හා දිනෙන් දින ඉහළ යන ගුවන්යානා සංචලන සහිත භූමියක් හා අවකාශයක් සහිත වීම හා රට තුළට සහ රටින් පිටතට සිදු වන ගුවන් ගමන් සහිත දිවයිනක් වන බැවින් ගුවන්යානා අනතුරු සොයා බැලීමට සහ විමර්ශන සිදු කිරීමට මෙන් ම මුදා ගැනීමේ මෙහෙයුම්වලට අදාළ කටයුතු පවත්වාගෙන යාම සඳහා ප්‍රමාණවත් අරමුදල් සැපයීමට කටයුතු කිරීම CAASL වගකීමකි.

ඒ අනුව, එම කටයුතු සඳහා යෙදවීමට මිලියන 50ක මුදලක් සංචිත අරමුදල් වශයෙන් වෙන් කළ යුතු බවට 2018 මැයි මස 30 වනදින පවත්වන ලද CAASL හි 145 වැනි මණ්ඩල රැස්වීමේ දී සාකච්ඡා පත්‍රයක් (DP/May/2018/03 (a)) යොමු කරන ලදි.

9. සේවක ප්‍රතිලාභ

9.1 නිර්වචිත දායකත්ව සැලසුම්

නිර්වචිත දායකත්ව සැලැස්ම යනු පශ්චාත් රැකියා ප්‍රතිලාභ සැලැස්මකි. ඒ යටතේ දායක මුදල් වෙන ම අරමුදලක් බවට පත් කෙරෙන අතර, ඊට අමතර මුදල් ගෙවීමට ආයතනය සතු ව නෛතික හෝ සාධනීය වගකීමක් නොමැත. නිර්වචිත දායකත්ව සැලැස්මට අදාළ වන වගකීම් සේවකයන් සේවා සපයන කාල සීමාව තුළ දී ලාභ හෝ අලාභවල වියදමක් වශයෙන් හඳුනා ගැනේ.

✈ සේවක අර්ථසාධක අරමුදල
අධිකාරියෙහි සෑම සේවකයකුට ම සේවක අර්ථසාධක අරමුදල හිමි ය. සේවකයන්ගේ මූලික වැටුපෙන් හා දීමනාවලින් 15%ක් එම අරමුදලට බැර වේ.

✈ සේවක භාරකාර අරමුදල
සේවකයන්ගේ වැටුපෙන් 3%ක් සේවක භාරකාර අරමුදලට බැර වේ.

9.2 නිර්වචිත ප්‍රතිලාභ සැලසුම්

නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් යනු නිර්වචිත දායකත්ව සැලසුම් හැර අනෙකුත් පශ්චාත් රැකියා සැලසුම් ය. 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත යටතේ පාරිතෝෂික ගෙවීම අධිකාරිය සතු වගකීමකි. මෙම පනත යටතේ දක්වා ඇති වගකීම් සඳහා වන දීමනා තීරණය කෙරෙනුයේ සේවයේ නියතු වසර ගණනින් සම්පූර්ණ මාසයේ වැටුප පදනම් කරගෙන ය. එසේ ම ගණනය කිරීම් LKAS 19 හි සූත්‍ර ක්‍රමය පදනම් කරගෙන සිදු කෙරේ. සෑම වර්ෂයක් අවසානයේ පාරිතෝෂික දීමනා වටිනාකම සඳහා වෙන ම ආයෝජනයක් පවත්වාගෙන යනු ලැබේ.

9.3 කාර්ය මණ්ඩල සුබසාධනය සහ සමාජ සුරැකුම් අරමුදල

රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගොස් සිවිල් ගුවන්සේවා අධිකාරියට බැඳුණු රාජ්‍ය නිලධාරීන් වෙනුවෙන් 2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ පනතේ 20(5) වගන්තිය ප්‍රකාරව කාර්ය මණ්ඩල සුබසාධන සහ සමාජ ආරක්ෂණ අරමුදල නිර්මාණය කර ඇත. එක් එක් විශ්‍රාමික නිලධාරියාගේ නමට ඇති මුදල සමුච්චිත පොළිය සමග විශ්‍රාම යාමේදී ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය විසින් ඔවුන්ට ලබා දෙනු ලැබේ.

10. මූල්‍ය වගකීම්

10.2 මූලික හඳුනාගැනීම් සහ ගණනය කිරීම්

LKAS 39 විෂය පථයෙහි ඇති මූල්‍ය වගකීම් ලාභ අලාභ හෝ ණය සහ ණය ගැනීම් හරහා සාධාරණ වටිනාකමකින් යුතු මූල්‍ය වගකීම් ලෙස වර්ග කෙරේ. අධිකාරිය විසින් මූලික හඳුනාගැනීමේ දී එහි මූල්‍ය වගකීම් වර්ගීකරණය තීරණය කරනු ලබයි.

සියලු ම මූල්‍ය වගකීම් පළමු ව සාධාරණ වටිනාකමකින් හඳුනා ගැනෙන අතර, ණය සහ ණය ගැනීම් ක්‍රමක්ෂගත පිරිවැයක් යටතේ සිදු කෙරේ. සෘජු ව ආරෝපණය කළ හැකි පිරිවැය මීට ඇතුළත් වේ. වෙළෙඳ සහ ගෙවිය යුතු දෑ ආදිය අධිකාරියේ මූල්‍ය වගකීම්වලට ඇතුළත් වේ.

11. වෙනත් වගකීම්

උපචිත වියදම් ඇතුළු වෙනත් ණය හිමියන් මෙම වෙනත් වගකීම්වලට අයත් වේ. එහි සාධාරණ වටිනාකම ලෙස සලකනු ලබන ඓතිහාසික අගය මත මේවා සඳහන් කරනු ලැබේ.

12. ආදායම හඳුනාගැනීම

12.1 2002 අංක 34 දරන සිවිල් ගුවන්සේවා අධිකාරිය පනතේ 12 වගන්තිය ප්‍රකාර ව, අධිකාරිය සතු ව අරමුදලක් තිබිය යුතු අතර 12(2) වගන්තිය යටතේ අධිකාරිය විසින් ලැබෙන සියලු මුදල් එම අරමුදලට ලබා දිය යුතු ය. 12 (2) වගන්තිය යටතේ ලැබෙන මුදල් SLFRS 15 ට අනුකූල ව ඉදිරිපත් කිරීම සඳහා මූල්‍ය ප්‍රකාශවල ඇති ආදායම යටතේ වර්ග කෙරේ.

12.2 ආදායම් මාර්ග

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය පහත මූලාශ්‍ර මඟින් ආදායම් උපයනු ලැබේ.

- මෙහෙයුම් ආදායම
  - චතෙර විකිණුම් අධිභාරය
  - අපගමන බද්දෙන් ලැබෙන සේවා ගාස්තු
  - නියාමන සේවා (බලපත්‍ර/සහතික නිකුත් කිරීම/අලුත් කිරීම/අනුමැති ලබා දීම සහ විභාග සංවිධානය කිරීම)

- මෙහෙයුම් නොවන ආදායම්
  - වෙනත් ආදායම්
  - පොළී ආදායම (කාර්යමණ්ඩල ණය සහ මූල්‍ය උපකරණ වලින්)

චතෙර විකිණුම් අධිභාරය වෙතින් ලැබෙන ආදායම/අපගමන බද්දෙන් ලැබෙන සේවා ගාස්තුවලින් ලැබෙන ආදායම/නියාමන සේවාවෙන් ලැබෙන ආදායම අදාළ සේවා සපයන කාල සීමාව තුළ ඇති සාධාරණ වටිනාකමින් හඳුනා ගනු ලැබේ. මෙම සියලු ආදායම් උපචිත පදනමක් අනුව හඳුනාගනු ලැබේ.

12.3 පොළී ආදායම

ලාභය හෝ අලාභය හරහා සාධාරණ වටිනාකමින් ගණනය කරනු ලබන ආදායම් ඇතුළු ව සියලු ම පොළී සහිත මූල්‍ය උපකරණ සඳහා ඵලදායී පොළී අනුපාත ක්‍රමය භාවිත කරමින් ආදායම් ප්‍රකාශයෙහි ඇති ''ආයෝජන ආදායමෙහි' දැක්වේ. ලැබිය යුතු දෑ හානිකරණයට පත් වූ විට, අධිකාරිය විසින් අනාගත මුදල් ප්‍රවාහ උපකරණයේ මුල් පොළී අනුපාතයෙන් වට්ටම් කළ පසු ධාරණ අගය එහි පියවිය හැකි අගය දක්වා අඩු කරන අතර එම වට්ටම පොළී ආදායම ලෙස අඛණ්ඩ ව ලිහිල් කෙරේ.

12.4 වෙනත් ආදායම්

වෙනත් ආදායම් උපචිත පදනමක් අනුව හඳුනාගනු ලැබේ.

13. වියදම් හඳුනාගැනීම

සියලු වියදම් උපචිත පදනමක් අනුව හඳුනා ගනු ලැබේ. සාමාන්‍ය ව්‍යාපාර කටයුතු වලදී සහ දේපළ පිරියත සහ උපකරණ නඩත්තු කිරීමේ දී සිදු කරන ලද වියදම් වර්ෂයෙහි ලාභය ගණනය කිරීමේදී ආදායමෙන් අය කරනු ලැබේ.

වත්කමෙන් ලැබෙන අනාගත ප්‍රතිලාභවල අපේක්ෂිත ආයු කාලය හෝ අපේක්ෂිත පරිභෝජන රටාවේ වෙනස්කම් ක්ෂය වීම් කාලසීමාව වෙනස් කිරීම හරහා වත්කම්වල ගණනය කෙරේ. ඒවා හිණුම්කරණ ඇස්තමේන්තුවක වෙනස්කමක් ලෙස සලකනු ලැබේ.

14. ණය පිරිවැය

ණය පිරිවැය යනු ණය අරමුදල් හා සම්බන්ධ අධිකාරිය විසින් දරනු ලබන පොළී සහ වෙනත් පිරිවැය වේ. ණය ගැනීමේ පිරිවැය එය දරන ලද කාල සීමාව තුළ වියදමක් ලෙස හඳුනාගනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශන

මූල්‍ය ප්‍රකාශනයන් සඳහා සටහන්

15. ජංගම සහ විලම්බිත ආදායම් බද්ද

15.1 කාල සීමාවක් සඳහා වන බදු වියදම ජංගම සහ විලම්බිත ආදායම් බද්දෙන් සමන්විත වේ. වෙනත් විස්තීරණ ආදායම් හෝ සෘජුවම හිමිකම් අයිතමවලට අදාළ වන ප්‍රමාණය හැර, ආදායම් ප්‍රකාශය තුළ බදු හඳුනාගෙන ඇත. ඒ අනුව, බද්ද පිළිවෙළින් විස්තීර්ණ ආදායමෙහි හෝ සෘජු ව ස්කන්ධයෙහි ද හඳුනා ගත හැකි වේ.

වර්තමාන සහ පෙර වර්ෂවලට අදාළ ව බදු අධිකාරිවලින් අය කරගැනීමට හෝ බදු අධිකාරි වෙත ගෙවීමට අපේක්ෂා කෙරෙන අගයන්වලින් ජංගම බදු වත්කම් සහ වගකීම් සමන්විත වේ. අගයන් ගණනය කිරීම සඳහා භාවිත කෙරෙන බදු අනුපාත සහ නීති මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශයේ දිනය හෝ ඊට පසු දිනයකදී පනවන ලද ඒවා වේ. ඒ අනුව, බදු අය කිරීමට අදාළ වන විධිවිධාන 2017 අංක 10 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන සහ එහි සංශෝධන මඟින් බදු අරමුණු සඳහා සකස් කරන ලද වර්ෂය සඳහා වන ලාභය මත පදනම් ව සකස් කරනු ලැබ ඇත.

වත්කම් සහ බැරකම්වල බදු පදනම් වූ සහ මූල්‍ය ප්‍රකාශයේ ඇති ධාරණ අගය අතර පැන නඟින තාවකාලික වෙනස්කම් මත විලම්බිත ආදායම් බදු යන්න හඳුනා ගැනේ. කෙසේ වුවද, විලම්බිත ආදායම් බද්ද ගනුදෙනුව සිදු වන අවස්ථාවේ දී ගිණුම්කරණයට හෝ බදු අය කළ හැකි ලාභයට බලපාන ව්‍යාපාරික සංයුතියක් හැර වෙනත් ගනුදෙනුවක දී වත්කමක හෝ වගකීමක මූලික හඳුනා ගැනීමක් මඟින් පැන නඟින්නේ නම්, එය ගිණුම්කරණයට හෝ බදු අය කළ හැකි ලාභයට බල නොපායි. විලම්බිත ආදායම් බද්ද වාර්තාකරණ කාල සීමාව අවසන් වන විට පනවන ලද හෝ සැලකිය යුතු ලෙස පනවන ලද බදු අනුපාත (සහ නීති) භාවිත කරමින් තීරණය කරනු ලැබේ. අදාළ විලම්බිත ආදායම් බදු වත්කම ලබා ගැනීමෙන් පසු ව, හෝ විලම්බිත ආදායම් බදු වගකීම පියවා ගත් පසු ව මෙය අදාළ කරගැනීමට අපේක්ෂා කෙරේ.

තාවකාලික වෙනස්කම් භාවිත කළ හැකි අනාගත බදු අය කළ හැකි ලාභය ලබා ගැනීමට හැකි නම් ඒවා විලම්බිත බදු වත්කම් වශයෙන් හඳුනා ගැනේ.

අධිකාරිය විසින් තාවකාලික වෙනස්කම්හි ප්‍රත්‍යාවර්තනවල කාල නිශ්චය පාලනය කරන අවස්ථාවන් හැර අනුබද්ධිත සහ සම්බන්ධිතයන්හි ආයෝජනවල හටගන්නා තාවකාලික වෙනස්කම් මත විලම්බිත ආදායම් බදු සපයනු ලබන අතර, ඉදිරි පුරෝකථනවල තාවකාලික වෙනස්කම් ප්‍රතිවර්තනය නොකරන බව පැහැදිලි ය.

ජංගම බදු වත්කම්වලට ප්‍රවර්තන බදු වගකීම් හිලව් කිරීම බලාත්මක කිරීමට නීත්‍යානුකූල අයිතියක් ඇතිවිට සහ ශුද්ධ පදනම මත පියවීමට අදහසක් ඇති විට, බදු අය කළ හැකි ආයතනය හෝ විවිධ බදු අය කළ හැකි ආයතන මත එම බදු අය කළ හැකි අධිකාරිය මඟින් අයකරන ආදායම් බදුවලට විලම්බිත ආදායම් බදු වත්කම් සහ වගකීම් අදාළ වන විට විලම්බිත ආදායම් බදු වත්කම් සහ වගකීම් හිලව් කරනු ලැබේ.

භාවිත කළ හැකි මෙම අලාභ අනාගතයේ දී භාවිත කළ හැකි ලාභ බවට පත් වූ විටදී භාවිත නොකිරීමෙන් සිදු වූ අලාභ හෝ භාවිත නොකිරීමෙන් ඇති වූ බදු බැර ඉදිරියට රැගෙන යන බදු බලපෑම් වත්කමක් වශයෙන් පිළිගනු ලැබේ.

15.2 කල් දමන ලද බදු වත්කම් සහ වගකීම්

	2023 රු.	2022 රු.
ආරම්භක ශේෂය	**47,874,164**	21,668,927
ප්‍රතිපාදන වෙතින් පාරිතෝෂිකය සඳහා	**1,328,079**	3,124,000
වේගවත් බදු ක්ෂය වීමෙන්	**35,386,090**	23,081,237
ශුද්ධ කල් දමන ලද බදු වගකීම්	**84,588,333**	47,874,164

15.3 බදු වියදම් සහ ව්‍යවස්ථාපිත බදු අනුපාතයෙන් ගුණ කරන ලද ගිණුම්කරණ ලාභ සැසඳීම පහත පරිදි වේ.

16. විදේශ මුදල් ඒකක පරිවර්තනය/හුවමාරුව

	2023 රු.	2022 රු.
ආදායම් බද්දට පෙර ගිණුම්කරණ ලාභය	**4,557,199,326**	3,387,758,674
අවම: වෙනත් ආදායම් මාර්ග සහ නිදහස් ආදායම	**(1,403,893,444)**	(677,754,961)
	3,153,305,881	2,710,003,713
අඩු කළ නොහැකි වියදම්	**162,779,370**	165,819,885
ව්‍යාපාරවලින් ලැබෙන ව්‍යවස්ථාපිත ආදායම	**3,316,085,251**	2,875,823,598
අවම: සුදුසුකම් ගෙවීම	**(4,000,000,000)**	(1,000,000,000)
බදු අය කළ හැකි ආදායම - ව්‍යාපාර ආදායම	**(683,914,749)**	1,875,823,598
බදු අය කළ හැකි ආදායම - ව්‍යාපාර ආදායම	**1,257,936,616**	541,714,111
මුළු බදු අය කළ හැකි ආදායම	**574,021,867**	2,417,537,709
ආදායම් බදු වියදම		
බදු අය කළ හැකි ආදායම සහ ව්‍යාපාර නොවන ආදායම 24% සහ 30%	**172,206,560**	618,309,763
වර්ෂය සඳහා වන ආදායම් බදු වියදම්	**172,206,560**	618,309,763

ක්‍රියාකාරී මුදල් හැර අනෙකුත් මුදල් ඒකකවල සියලු ම ගනුදෙනු ශ්‍රී ලංකා රුපියල්වලින් සටහන් වන්නේ ගනුදෙනු කරන විට පැවති විනිමය අනුපාත භාවිත කරමිනි. සෑම මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයක ඇති දිනයක ම විදේශ මුදල් ඒකකවලින් ඇති මූල්‍ය වත්කම් සහ වගකීම් වාර්තාකරනු ලබන දිනයේ පවතින විනිමය අනුපාතයට සමාන ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කරනු ලැබේ. විදේශ මුදල් ඒකකවලින් ඇති මූල්‍ය නොවන වත්කම් සහ වගකීම් ගනුදෙනු කරන දිනයේ පවතින විනිමය අනුපාතිකය භාවිත කර ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කෙරේ. මුදල් අයිතම පියවීමේ දී සහ මුදල් අයිතම නැවත පරිවර්තනය කිරීමේ දී ඇති වන විනිමය වෙනස්කම් වීම වෙනස්කම ඇති වන වර්ෂයේ ආදායම් ප්‍රකාශයෙන් හඳුනා ගත හැකි ය.

විදේශ මුදල් ගනුදෙනුවලට අදාළ විදේශ විනිමය ලාභ සහ අලාභ 'මූල්‍ය ආදායම හෝ පිරිවැය' යටතේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ දක්වා ඇත.

මූල්‍ය ප්‍රකාශන

මූල්‍ය ප්‍රකාශනයන් සඳහා සටහන්

17. ශේෂ පත්‍ර දිනයට පසු සිදුවීම්

අධ්‍යක්ෂවරුන් විසින් සිදුවීම් සමීපව නිරීක්ෂණය කරන අතර, අවශ්‍ය වූ විට, ශේෂ පත්‍ර දිනට පසු සිදුවූ වැදගත් සිදුවීම් සම්බන්ධයෙන් සුදුසු පරිදි වත්මන් මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් සිදු කරනු ලැබේ.

18. අවිනිශ්චිත බැරකම්

අතීත සිදුවීමක් හේතුවෙන් අනාගත වගකීමක් හෝ අතීත සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් ඇති විය හැකි වර්තමාන වගකීමක් තිබේ නම්, එහි දී අවිනිශ්චිත බැරකම් යන්න අනාවරණය කෙරේ. කෙසේ වෙතත්, මෙහි දී මුදල් ගෙවීමක් හෝ අගය සාධාරණ වශයෙන් ඇස්තමේන්තු කිරීමක් සිදු කළ නොහැක.

19. මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ ප්‍රකාශය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියට (LKAS 07) - "මුදල් ප්‍රවාහ ප්‍රකාශය" අනුව මුදල් ප්‍රවාහ සකස් කිරීමේ "වක්‍ර ක්‍රමවේදය" භාවිත කරමින් සකස් කොට ඇත. මුදල් සහ මුදල් හා සමාන දෑ දන්නා මුදල් ප්‍රමාණයට පහසුවෙන් පරිවර්තනය කළ හැකි සහ වටිනාකම වෙනස් වීමේ සැලකිය යුතු අවදානමක් නොමැති කෙටි කාලීන, ඉහළ ද්‍රවශීල ආයෝජනවලින් සමන්විත වේ. අතැති මුදල්, බැංකු ශේෂ,ඒක්ෂණ සහ කෙටිකාලීන තැන්පතු වල ඇති මුදල් මෙම මුදල් සහ මුදල් හා සමාන දෑවලට අයත් වේ.

වක්‍ර ක්‍රමවේදය හරහා මුදල් නොවන ගනුදෙනුවල බලපෑම්, අතීත හෝ අනාගත මුදල් ලැබීම්වල සහ ගෙවීම්වල යම් විලම්බිත කිරීම් හා උපචිත කිරීම් මඟින් මෙන් ම, ආයෝජන හෝ මූල්‍යකරණ මුදල් ප්‍රවාහ සම්බන්ධ ආදායම් හෝ වියදම් අයිතම මඟින් වෙනස් කරන ලද ලාභ හෝ අලාභ පෙන්වා දෙනු ලැබේ.

20. රජයේ ප්‍රදාන

රජයේ ප්‍රදාන යන්න ලැබීමක් පවතින බවට හෝ අධිකාරිය වෙත පවරන ලද බවට සෑහෙන තරම් සහතිකයක් ඇති විට සාධාරණ වටිනාකමින් හඳුනාගනු ලැබුණි.

රජයේ ප්‍රදානයේ වටිනාකම, අධිකාරිය පිහිටුවීමේදී සිවිල් ගුවන්සේවා දෙපාර්තමේන්තුවෙන් පැවරූ වත්කම් සහ පහත සඳහන් වත්කම් වලින් සමුච්චිත ක්‍රමක්ෂය අඩු කිරීමෙන් පිළිබිඹු කරයි.

20.1 රජයේ ප්‍රදාන ක්‍රමක්ෂය

රජයේ ප්‍රදාන ක්‍රමක්ෂය සඳහා වන ප්‍රතිපාදන දේපළ, පිරියත සහ උපකරණවල පිරිවැය/තක්සේරුව (වත්කමෙහි පිරිවැය/තක්සේරුවේ සුනුබුන් අගයෙන් 10%ට වඩා අඩු) පිළිබඳ සරල පදනමකින් ගණනය කෙරේ. රජයේ ප්‍රදානයට අදාළ ව ගිණුම්ගත කර ඇති ඉඩම හැර අනෙකුත් සියලු ම දේපළ, පිරියත සහ උපකරණ ප්‍රයෝජනවත් ජීවිත කාලය තුළ පහත සඳහන් ප්‍රතිශත මත වාර්ෂිකව ක්‍රමක්ෂය කර ඇත.

ගොඩනැගිලි	– 6 2/3%
බහාලුම් අංග	– 10%
මෝටර් රථ	– 12.5 %
පිරියත, යන්ත්‍රෝපකරණ සහ උපකරණ	– 25 %
ලී භාණ්ඩ සහ සවි කිරීම්	– 25 %
වෙනත් ස්ථිර වත්කම්	– 25%

21. ප්‍රධාන කළමනාකරණ සේවක පිරිස් සහ සම්බන්ධිත පාර්ශ්ව සමඟ ගනුදෙනු

21.1 ප්‍රධාන කළමනාකරණ සේවක පිරිස් සමඟ ගනුදෙනු

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (LKAS24) හා අදාළ පාර්ශ්ව පිළිබඳ හෙළිදරව් කිරීම්වලට අනුකූල ව, අධිකාරියෙහි ක්‍රියාකාරකම් සැලසුම් කිරීමට, මෙහෙයවීමට සහ පාලනය කිරීමට ප්‍රධාන කළමනාකරණ සේවක පිරිස් සතුව බලය පවතී. එබැවින් අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රධාන කළමනාකරණ සේවක පිරිස් වශයෙන් වර්ගකොට දක්වා ඇත.

ප්‍රධාන කළමනාකරණ පිරිස් වෙත ගෙවන ලද හානිපූරණ පහත පරිදි වේ.

	2023 රු.	2022 රු.
කෙටි කාලීන සේවක ප්‍රතිලාභ	3,943,458	3,987,858
පශ්චාත් -සේවා ප්‍රතිලාභ	-	-
වෙනත් දිගු කාලීන ප්‍රතිලාභ	-	-
අවසන් කිරීම් ප්‍රතිලාභ	-	-

ආයතනයේ නම	සම්බන්ධතාව	ගනුදෙනුවේ ස්වභාවය	2023 (රු.)	2022 (රු.)
සීමාසහිත ශ්‍රී ලංකන් එයාර් ලයින්ස්	රජය සතු	චිතෙර විකුණුම් අධිභාරය	1,260,242,886	1,155,774,055
ලංකා විදුලිබල මණ්ඩලය	රජය සතු	විදුලි ගාස්තු	33,668,354	16,315,556
සීමා සහිත ගුවන්තොටුපල හා ගුවන්සේවා (පෞද්ගලික) සමාගම	රජය සතු	විදුලි ගාස්තු	1,952,062	1,614,816
ජාතික ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලය	රජය සතු	ජල ගාස්තු	116,528	138,270
සීමා සහිත ගුවන්තොටුපල හා ගුවන්සේවා (පෞද්ගලික) සමාගම	රජය සතු	ජල ගාස්තු	2,188,008	935,182
මහා භාණ්ඩාගාරය	රජය සතු	අපගමන බදු ගෙවීම්	38,828,543,756	22,248,864,840
සීමා සහිත ගුවන්තොටුපල හා ගුවන්සේවා (පෞද්ගලික) සමාගම	රජය සතු	අපගමන බදු ගෙවීම්	8,970,987,501	4,770,744,713
ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය	රජය සතු	අපගමන බදු ගෙවීම්	4,485,493,750	2,385,327,870
සේවක නියුක්ති භාරකාර අරමුදල් මණ්ඩලය	රජය සතු	සේවක නියුක්ති භාරකාර අරමුදල	8,551,128	9,297,357
සේවක අර්ථසාධක අරමුදල	රජය සතු	සේවක අර්ථසාධක අරමුදල	42,755,626	46,486,769
දේශීය ආදායම් දෙපාර්තමේන්තුව	රජය සතු	ආදායම් බදු	765,282,046	309,550,100
දේශීය ආදායම් දෙපාර්තමේන්තුව	රජය සතු	මුද්දර බදු	2,153,482	1,551,975
ශ්‍රී ලංකා ටෙලිකොම්	රජය සතු	විදුලි සන්දේශ ගාස්තු	8,713,349	7,016,072
ශ්‍රී ලංකා ගුවන් හමුදාව	රජය සතු	ඉන්ධන ගාස්තු	915,404	262,998
සීමා සහිත ගුවන්තොටුපල හා ගුවන්සේවා (පෞද්ගලික) සමාගම	රජය සතු	ඉන්ධන ගාස්තු	25,689,829	10,032,241
ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව	රජය සතු	රක්ෂණ ගාස්තු	301,478	1,193,830
ලංකා බැංකුව	රජය සතු	ආයෝජන	3,614,946,156	2,070,348,167
මහජන බැංකුව	රජය සතු	ආයෝජන	2,236,500,000	73,000,000
සීමාසහිත ශ්‍රී ලංකන් කේටරින් (පෞද්ගලික) සමාගම	රජය සතු	රැස්වීම් සහ පුහුණු කිරීම් සඳහා ආහාර සැපයුම් සේවා	2,407,991	1,707,459
මාර්ග සංවර්ධන අධිකාරිය	රජය සතු	අධිවේගී මාර්ගයේ අය කිරීම්	2,456,557	1,629,096
ලැබිය යුතු දෑ				
සීමා සහිත ශ්‍රී ලංකන් එයාර් ලයින්ස්	රජය සතු	චිතෙර විකුණුම් අධිභාරය	46,300,641	53,590,915
ගෙවිය යුතු දෑ				
මහා භාණ්ඩාගාරය	රජය සතු	අපගමන බදු ගෙවීම්	4,020,600,433	2,932,292,550
සීමා සහිත ගුවන්තොටුපල හා ගුවන්සේවා (පෞද්ගලික) සමාගම	රජය සතු	අපගමන බදු ගෙවීම්	705,844,005	787,638,087
ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය	රජය සතු	අපගමන බදු ගෙවීම්	139,822,680	393,819,043

මූල්‍ය ප්‍රකාශන
මූල්‍ය ප්‍රකාශනයන් සඳහා සටහන්

21.2 අදාළ පාර්ශව සමඟ ගනුදෙනු

ව්‍යවස්ථාපිත මණ්ඩලයක් වශයෙන් සිවිල් ගුවන්සේවා අධිකාරිය, සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවල දී රජය යටතේ පාලනය කරනු ලබන ආයතන සමඟ පහත දැක්වෙන ගනුදෙනු කටයුතු සිදු කර ඇත.

ප්‍රමාණය හේතු කොටගෙන සහ රජය යටතේ පාලනය කරනු ලබන/අදාළ සියලු ආයතන සමඟ සිදු කෙරෙන සියලු ගනුදෙනු අත් කරගැනීම සහ අනාවරණය කිරීම ප්‍රායෝගික නොවන හෙයින්, LKAS 24 , එනම් 'අදාළ පාර්ශව ගනුදෙනු' වලට අනුකූල ව වෙන් වෙන් වශයෙන් වැදගත් වන ගනුදෙනු සඳහා සීමා සහිත අනාවරණය කිරීම් සිදු කොට ඇත.

ශ්‍රී ලංකා රජය යටතේ පාලනය කරනු ලබන සියලු ආයතන වෙතින් ලැබිය යුතු/ආයතනවලට ලැබිය යුතු ශේෂ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි වෙළෙඳ ලැබිය යුතු දෑ, වෙළෙඳ සහ වෙනත් ලැබිය යුතු දෑ යටතේ දක්වා ඇත.

22. මූල්‍ය අවදානම කළමනාකරණය

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය යනු ව්‍යවස්ථාපිත මණ්ඩලයකි. මෙහි මූලික කාර්යභාරය වන්නේ සිවිල් ගුවන්සේවා කරමාන්තය වෙත නියාමන සේවා සැපයීම යි. අධිකාරිය විසින් කොටස් ණයකර සහ ණය ආදී මූල්‍ය උපකරණ සමඟ මූල්‍යකරණය වී නොමැත. අධිකාරිය මූල්‍ය උපකරණ භාවිත කිරීමෙන් පහත අවදානම්වලින් බොහෝ දුරට වැළකී ඇත.

- ණය අවදානම
- ද්‍රවශීලතා අවදානම

22.1 ණය අවදානම

ණය අවදානම යනු පාරිභෝගිකයෙකු තම ගිවිසුම්ගත බැඳීම් ඉටු කිරීමට අසමත් වුව හොත් අධිකාරියට සිදු වන මූල්‍ය අලාභය යි. එය මූලික වශයෙන් අභ්‍යන්තර සහ බාහිර පාර්ශ්ව වෙතින් ලැබිය යුතු දෑ හේතු කොටගෙන ඇති වේ.

ආයෝජන:

අධිකාරිය විසින් ණය අවදානම අවම කිරීම සඳහා, රජයේ භාණ්ඩාගාර බිල්පත් සහ කෙටි කාලීන තැම්පතු පමණක් එහි (CAA) නිල බැංකුකරු වන ලංකා බැංකුවෙහි ආයෝජනය කරනු ලබයි.

සේවක ණය

සේවකයාගේ මාසික වැටුපෙන් ණය ශේෂය අය කර ගැනීම හෝ සේවකයා පැහැර හැරිය හොත් එවැනි වටිනාකමක් ඇපකරුගෙන් අය කිරීම සහතික කරමින් අධිකාරිය විසින් ණය අවදානම අවම කගනු ලබයි.

22.2 ද්‍රවශීලතා අවදානම

ද්‍රවශීලතා අවදානම යනු අධිකාරියට නියමිත මූල්‍ය වගකීම් නියමිත පරිදි ගෙවීමට නොහැකි වීමේ අවදානම යි. දැරිය නොහැකි අලාභ හෝ අධිකාරියේ කීර්තියට හානි නොවන ආකාරයෙන්, ගෙවිය යුතු දෑ සාමාන්‍ය සහ අනපේක්ෂිත තත්වයේ පසුවන විට එහි වගකීම් සපුරාලීමට ප්‍රමාණවත් මුදලක් පවතින බව හැකි තරම් සහතික කරලීම ද්‍රවශීලිතා කළමනාකරණය මඟින් අපේක්ෂා කෙරේ.

රුපියල් මිලියන 5 ට අමතරව කෙටි, මධ්‍ය සහ දිගු කාලීන මූල්‍ය උපකරණ මඟින් අධිකාරිය විසින් පවත්වා ගෙන යනු ලබන ආයෝජන අතිරික්ත මුදල් මඟින් ද්‍රවශීලිතාව පවත්වා ගෙන යන බවට සහතික කරනු ලබයි. මූල්‍ය ප්‍රවාහ පුරෝකථනය මූල්‍ය සහ ආදායම් කළමනාකරණ අංශය මඟින් සිදු කරනු ලබයි. මෙහෙයුම් අවශ්‍යතා සපුරාලීමට ප්‍රමාණවත් මුදල් ඇති බවට සහතික කිරීමට මූල්‍ය සහ ආදායම් කළමනාකරණය අංශය විසින් අධිකාරියේ ද්‍රවශීලතා අවශතාවල ක්‍රමවත් පුරෝකථ අධීක්ෂණ කටයුතු සිදු කරනු ලබයි.

23. ආදායම

	2023 රු.	2022 රු.
මෙහෙයුම් ආදායම	**4,267,567,018**	3,685,224,914
මෙහෙයුම් නොවන ආදායම	**1,239,457,119**	549,162,285
වෙනත් මෙහෙයුම් නොවන ආදායම	**23,615,667**	33,915,474
මුළු ආදායම	**5,530,639,804**	4,268,302,673
මෙහෙයුම් ආදායම		
ඒතෙර මෙහෙයුම් අධිභාරය	**3,771,642,993**	3,376,434,208
අපගමන බදු සේවා ගාස්තු	**364,495,616**	227,543,076
නියාමන සේවාවලින් ලැබෙන ආදායම	**131,428,409**	81,247,630
	4,267,567,018	3,685,224,914
මෙහෙයුම් නොවන ආදායම		
කුලී ආදායම	**432,050**	-
සංචාරක බංගලාව වෙන් කරවා ගැනීම	**130,500**	214,360
වත්කම් බැහැර කිරීම මත ලැබෙන ලාභය	**106,226**	-
ටෙන්ඩර් අයදුම්කිරීමේ ගාස්තු	**27,000**	31,500
ශතක ගුවන්සේවා ග්‍රන්ථය අලෙවිය	**-**	2,160
විවිධ ආදායම්	**1,774,198**	6,933,154
පරිපාලන ගාස්තු/ශිෂ්‍ය වීසා නිර්දේශ	**152,000**	267,000
පරිපාලන දඩ	**1,341,677**	-
කාර්ය මණ්ඩල ණය වලින් ලැබෙන පොළිය	**22,156,182**	5,316,369
භාණ්ඩාගාර බිල්පත් මත ආයෝජනයෙන් ලද පොළිය	**797,605,933**	221,025,270
රක්ෂණ තැන්පතුවල ආයෝජනය කිරීමෙන් ලද පොළිය	**335,462,280**	257,889,819
අනෙකුත් ආයෝජනවලින් ලද පොළිය	**80,269,073**	57,482,654
	1,239,457,119	549,162,285
අනෙකුත් මෙහෙයුම් ආදායම්		
කාර්ය මණ්ඩල ණය වෙතින් ලද පොළි ආදායම (IFRS ගැළපුම්)	**19,906,515**	30,206,157
රජයේ ප්‍රදාන ක්‍රමක්ෂය කිරීම	**3,709,152**	3,709,152
විදේශ මුදල් ගනුදෙනු මත විනිමය ලාභය	**-**	165
	23,615,667	33,915,474
මුළු මෙහෙයුම් නොවන ආදායම	**1,263,072,786**	583,077,759
මුළු ආදායම	**5,530,639,804**	4,268,302,673

මුදල් වෙළෙඳපොළ තුළ සෑම දිනක් අවසානයේ දී ම බැංකුවේ මුදල් ශේෂය වික් දිනක් ඇතුළත ආයෝජනය කිරීම සඳහා CAASL විසින් ලංකා බැංකුවේ කටුනායක ශාඛාවේ සහ මහජන බැංකුවේ සීදුව ශාඛාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව අරමුදල් කළමනාකරණ ගිණුම් විවෘත කර ඇත. කෙටි කාලීන ආයෝජන හරහා උපයන පොළී ආදායම වෙනත් ආයෝජනවලින් ලැබෙන පොළිය යටතේ පෙන්වා ඇත.

මූල්‍ය ප්‍රකාශන

මූල්‍ය ප්‍රකාශනයන් සඳහා සටහන්

24. කාර්ය මණ්ඩල වියදම්

	2023 රු.	2022 රු.
වැටුප් සහ වේතන	114,622,376	124,696,647
වෙනත් දීමනා	174,403,863	180,128,106
සේවක අර්ථසාධක අරමුදල	42,755,626	46,507,826
සේවක භාරකාර අරමුදල	8,551,128	9,301,568
ප්‍රයෝජනයට නොගත් නිවාඩු සඳහා මුදල් ගෙවීම	6,960,151	7,501,654
ප්‍රසාද දීමනා	9,060,561	9,690,863
අතිකාල සහ නිවාඩු ගෙවීම්	9,713,849	7,197,885
සුභසාධන වියදම්	38,885,080	30,483,367
පාරිතෝෂික	4,426,929	12,250,981
සේවකයන් සඳහා මරණාධාර ලබා දීම	3,652,560	-
ණය ප්‍රතිලාභ සඳහා වන කාර්ය මණ්ඩල පිරිවැය - (IFRS ගැළපුම්)	19,906,515	30,206,157
මුළු කාර්ය මණ්ඩල වියදම්	432,938,638	457,965,055

25. රැස්වීම්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු සඳහා වියදම්

	2023 රු.	2022 රු.
රැස්වීම්, සම්මන්ත්‍රණ, වැඩමුළු සඳහා වියදම් - දේශීය	1,642,653	274,870
රැස්වීම්, සම්මන්ත්‍රණ, වැඩමුළු සඳහා වියදම් - විදේශීය	6,421,030	1,992,788
COSCAP කමිටු රැස්වීම් වියදම්	-	5,240,150
රැස්වීම්, සම්මන්ත්‍රණ, වැඩමුළු සඳහා මුළු වියදම්	8,063,683	7,507,808

26. පුහුණු වියදම්

	2023 රු.	2022 රු.
පුහුණු වියදම් - දේශීය	4,116,875	1,316,568
පුහුණු වියදම් - විදේශීය	5,542,223	157,722
මුළු පුහුණු වියදම්	9,659,098	1,474,290

27. පරිපාලන සහ වෙනත් වියදම්

	2023 රු.	2022 රු.
පරීක්ෂණ	2,695,915	1,348,751
සේවා ස්ථානයෙන් පිටත රැස්වීම්	62,229	55,595
සේවා ස්ථානය තුළ රැස්වීම්	1,923,185	488,386
ප්‍රවාහන වියදම් - දේශීය	2,456,557	1,629,096
උපදේශන සහ නෛතික ගාස්තු	349,903	249,344
බාහිර තාක්ෂණික සහය	44,990,350	25,216,200
සම්මුඛ පරීක්ෂණ/කාර්ය මණ්ඩල ඇගයීම්	371,897	33,545
මණ්ඩල ගෙවීම්	1,570,000	760,500
දේපළ, පිරියත සහ උපකරණ නඩත්තු කිරීම	3,926,456	2,763,805
ලිපි ද්‍රව්‍ය සහ පරිභෝජන වියදම්	23,882,546	14,662,702
අභ්‍යන්තර ගුවන්තොටුපොල සංවර්ධනය	992,000	209,118
වෙනත් සැපයුම්	1,354,916	1,280,921
විදුලි සංදේශ	12,342,350	11,790,472
තැපැල් ගාස්තු	626,994	412,868
ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානය වෙත ගෙවන ලද සාමාජික මුදල්	63,622,713	72,653,816
ප්‍රකාශනය සහ ප්‍රචාරණය සඳහා දායක මුදල්	6,876,986	2,033,391
විභාග ගාස්තු	2,673,639	1,655,285
මුද්‍රණ වියදම්	9,025,685	5,846,738
විදේශ මුදල් ගනුදෙනු මත විනිමය අලාභ	911,208	-
බැංකු ගාස්තු	500	-
කල්බදු වගකීම් සඳහා වන මූල්‍ය පිරිවැය	6,682	4,296
විගණන ගාස්තු	1,079,400	881,200
වත්කම් බැහැර කිරීම මත අලාභය	862,778	3,550
පරිවර්තන සහ ටයිප් කිරීම සඳහා වියදම්	95,524	84,398
සුබසාධන උපයෝගිතා - ක්‍රීඩා	540,453	64,445
විවිධ වියදම්	19,225	22,675
ඉන්ධන සහ ලිහිසි තෙල්	26,953,740	11,004,059
රථවාහන නඩත්තු කිරීම	17,971,645	11,611,738
බදු කුලී සහ කුලී ගාස්තු	16,977,099	15,851,355
පොදු - සුබසාධන	17,317,284	10,442,710
කාර්යාල ගොඩනැගිල්ල සහ නිල නිවාස සඳහා වියදම්		
විදුලිය	35,621,216	17,716,285
ජලය	3,092,733	1,650,734
ආරක්ෂාව	11,883,755	9,997,320
සනීපාරක්ෂාව	13,494,800	10,993,835
වෙනත් නඩත්තු කිරීම්	27,009,417	14,284,852
කළමනාකරණ සේවා	2,520,000	3,026,755
භූමි අලංකරණය සහ නඩත්තු කිරීම	3,221,448	-
ගුවන්සේවා සංවර්ධනය	1,666,401	1,203,617
තොරතුරු තාක්ෂණ නඩත්තු කිරීම්	4,430,822	8,952,010
මුළු පරිපාලන සහ වෙනත් වියදම්	365,420,451	260,886,367

මූල්‍ය ප්‍රකාශන

මූල්‍ය ප්‍රකාශනයන් සඳහා සටහන්

28. ආදායම් බදු වියදම්

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා ආදායම් බදු වියදම්වල සැලකිය යුතු සංරචක පහත පරිදි වේ.

	2023 රු.	2022 රු.
ජංගම ආදායම් බදු	-	-
ජංගම බදු ගාස්තු		
ආදායම් බදු වියදම්	172,206,560	618,309,763
විලම්භිත බදු		
විලම්භිත බදු සම්බන්ධයෙන් අයකිරීම/(ආපසු හැරවීම) (සටහන 39)	36,714,169	26,205,237
මුළු බදු වියදම්	208,920,729	644,515,000

අධිකාරියේ බදු අය කිරීමට පෙර බද්ද පහත සඳහන් පරිදි අධිකාරියේ 30%ක් වන මූලික බදු අනුපාතය භාවිතයෙන් පැන නඟින සෛද්ධාන්තික අගයට වඩා වෙනස් වේ.

	2023 රු.	2022 රු.
බද්දට පෙර ලාභය	4,557,199,326	3,387,758,674
30% ක සළුල අනුපාතයකින් ගණනය කරන ලද බද්ද	1,367,159,798	863,878,462
බදු සඳහා අඩු කළ නොහැකි වියදම් මත බද්ද	426,214,796	182,258,816
බදු සඳහා අඩු කළ හැකි වියදම්/ආදායම මත බලපෑම	(1,621,168,033)	(427,827,515)
විලම්භිත ආදායම් බදු වත්කමක් හඳුනා නොගත් බදු අලාභ	36,714,169	26,205,237
මුළු බදු වියදම්	208,920,729	644,515,000

29. දේපළ, පිරියත සහ උපකරණ

i. මහා භාණ්ඩාගාරයෙන්/රජයෙන් පවරන ලද දේපළ, පිරියත සහ උපකරණ වත්කම් ලදුපතේ දිනයට සාධාරණ වටිනාකමින් දක්වා ඇත. (තක්සේරු කිරීම 2003 දී සිදු කරන ලදී.) IFRS පරිවර්තන කාර්යන් සඳහා ඉහත සඳහන් කරන ලද වත්කම්වල නැවත තක්සේරු කිරීමේ වටිනාකම 2011 ජනවාරි 1 දිනට සැලකෙන පිරිවැය ලෙස සලකනු ලැබේ.

ii. අධිකාරිය විසින් 2023.12.30 දිනට අමාත්‍යාංශයේ විගණන හා කළමනාකරණ කමිටුවේ නිර්දේශ අනුව අභ්‍යන්තර ව පත් කරන ලද කමිටුවක් හරහා ඉඩම් සහ ගොඩනැගිලි හැර අනෙක් සියලු වත්කම් තක්සේරු කර ඇත. ඉඩම් සහ ගොඩනැගිලි තක්සේරු කිරීම් රජයේ තක්සේරු වෙතින් ලැබීමට නියමිත අතර, එම වටිනාකම් 2024 මූල්‍ය ප්‍රකාශයට ඉදිරිපත් කරනු ලැබේ.

අධිකාරිය සතු වත්කම්වල වෙළෙඳපොළ වටිනාකම හෙළිදරව් කිරීම සඳහා මෙම තක්සේරුව සිදු කරන ලදී. සාධාරණ වටිනාකම යනු සමාන දේපළ සඳහා ගනුදෙනු මිල පිළිබඳ වෙළෙඳපොළ පදනම් සාක්ෂි වේ.

තක්සේරු කිරීම් වෙළෙඳපොළ මිල මත පදනම් වන අතර, දේපළෙහි ස්වභාවය, ස්ථානය හෝ තත්ත්වයෙහි ඕනෑ ම වෙනස්කමක් වෙනුවෙන් වෙනස් කොට ඇත. සාධාරණ අගය මැනීමට ප්‍රමාණවත් දත්ත පවතින අවස්ථාවල දී, අදාළ අගය නිරීක්ෂණය කළ හැකි යෙදවුම් උපරිම ලෙස භාවිත කිරීම සහ නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් භාවිතය අවම කිරීම සඳහා මෙම තක්සේරු ක්‍රම සුදුසු වේ. සාධාරණ වටිනාකමේ වෙනස්වීම් වෙනත් විස්තීර්ණ ආදායම් සහ හිමිකම් ප්‍රකාශය තුළ සඳහන් කර ඇත.

iii. වර්ෂය තුළ වර්ගීකරණ වෙනස්කම් හඳුනාගෙන ඇති අතර, LKAS 1 අනුව අංක 30 සහ 31 සටහන්වල දැක්වෙන පරිදි නැවත වර්ගීකරණය සිදු කර ඇත. ඉහත සඳහන් නැවත වර්ගීකරණය ලාභයට බල නොපායි.

iv. අමාත්‍ය මණ්ඩලය විසින් 2019 ජනවාරි 29 වන දින ගනු ලැබූ තීරණයට අනුව පෙබරවාරි 05 සහ අප්‍රේල් 02 යන දිනයන්හිදී ගනු ලැබූ පසුකාලීන තීරණ මගින් සංශෝධනය කරන ලද අතර, පලාලි ගුවන් තොටුපල රුපියල් වලින් සමන්විත දේශීය අරමුදල් යොදා ගනිමින් කලාපීය වාණිජ ගුවන් ගමන් ක්‍රියාත්මක කිරීම සඳහා සංවර්ධනය කිරීමට අනුමැතිය ලබා දී ඇත. CAASL විසින් රුපියල් මිලියන 900 ක් සහ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අරමුදල (SLTDA) විසින් රුපියල් මිලියන 1,050 ක දායකත්වයක් ලබා දී ඇත.

v. 2002 අංක 34 දරන සිවිල් ගුවන්සේවා අධිකාරිය පනතේ 9 වැනි වගන්තිය සම්බන්ධයෙන් ගරු ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යවරයා විසින් මඩකලපුව පිහිටි සිවිල් ගුවන්සේවා අධිකාරිය වෙත පැවරීම සහ පවරා ගැනීම සඳහා වන 1973/78 දරන 2016 ජූලි 1 වන දිනැති ගැසට් නිවේදනය ප්‍රකාශයට පත් කර ඇත. ඒ අනුව, ඉඩම සහ ගොඩනැගිලි 2017 සහ 2018 වසරවල දී CSSAL වත්කම් ලේඛනයට ඇතුළත් කරන ලදි. මෙම දේපළ ගුවන්තොටුපොල සහ ශ්‍රී ලංකා ගු.ගු.සේ.ස මෙහෙයුම් කටයුතු සඳහා බදු දී ඇත.

vi. මඩකලපුව සංචාරක බංගලාවේ සහ යාපනය ජාත්‍යන්තර ගුවන්තොටුපොලෙහි ප්‍රාග්ධන වියදම්වලට අදාළ ආදාන බද්ද දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව විසින් තහනම් කර ඇත. පෙර වසරේ ක්ෂයවීම් සමුච්චිත ලාභයට අය කර ඇති අතර හිමිකම් ප්‍රකාශයේ අනුමත නොකළ ආදාන බද්ද ලෙස පෙන්වා ඇත. වත්කම්වල ආරම්භක ශේෂයන් සහ සමුච්චිත ක්ෂයවීම් පහත පරිදි සකස් කර ඇත.

	ප්‍රාග්ධනීකරණය කළ	අනුමත නොකළ ආදාන බද්ද	පෙර වර්ෂයේ ක්ෂය වීම
යාපනය ජාත්‍යන්තර ගුවන්තොටුපොල	ගොඩනැගිලි	88,769,981	
මඩකලපුව සංචාරක බංගලාව	ගොඩනැගිලි	10,177,693	2,054,826
	පිරියත, යන්ත්‍රෝපකරණ සහ උපකරණ	151,488	119,343

සමුච්චිත ක්ෂය වීම	අවසන් ශේෂය 31/12/2022	වෙනස් කළ අගය	ආරම්භක ශේෂය 1/1/2023
ගොඩනැගිලි	383,786,098	2,054,826	385,840,924
පිරියත, යන්ත්‍රෝපකරණ සහ උපකරණ	64,563,539	119,343	64,682,882

vii. 2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරි පනතේ 9 වැනි වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව, ප්‍රවාහන සහ සිවිල් ගුවන්සේවා අමාත්‍යතුමා විසින් දෙවන උපලේඛනයේ නිශ්චිත ව දක්වා ඇති සහ ඉහත දක්වන ලද පනතේ තුන්වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ගුවන් නාවික පහසුකම් සහ ඉඩම,, උපලේඛනයේ විශේෂ කොට දක්වා වහා බලාත්මක වන පරිදි සිවිල් ගුවන්සේවා අධිකාරියේ පහත ගුවන් තොටුපොලවල් පැවරීමට සහ බලාත්මක කිරීමට 2017.12.21 දිනැති අංක 2050/38 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් නියෝගයක් පනවනු ලැබ ඇත.

ගගන යාත්‍රාංගණ (දෙවන කාර්ය සටහනෙහි දක්වා ඇති)

- කටුනායක ගුවන්තොටුපොල
- රත්මලාන ගුවන්තොටුපොල

ගගන නාවික පහසුකම් සහ ඊට අදාළ භූමිය (තෙවන කාර්ය සටහනෙහි දක්වා ඇති)

- රත්මලාන කඳවල පාරේ පිහිටි සිවිල් ගුවන්සේවා පුහුණු මධ්‍යස්ථානය, ගොඩනැගිලි ව්‍යුහ සහ ඊට අයත් ඉඩම්.
- රත්මලාන, අත්තිඩියේ පිහිටි ගගන නාවික සන්නිවේදන සම්ප්‍රේෂණ මධ්‍යස්ථානය, එහි ගොඩනැගිලි ව්‍යුහ සහ ඊට අයත් ඉඩම්.
- ගම්පහ මඩම්පැල්ලේ පිහිටි බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොලෙහි ගුවන් විදුලි සංචාලන ආධාරක, එහි ගොඩනැගිලි ව්‍යුහ සහ ඊට අයත් ඉඩම්.
- බණ්ඩාරණායක ගුවන් තොටුපලෙහි ගුවන් ධාවන පථය සඳහා දායක වන ගම්පහ - පමුණුගම සහ කපුගොඩ පිහිටි ගුවන් විදුලි සංචාලක ආධාරක, එහි ගොඩනැගිලි සහ ව්‍යුහයන් සහ ඊට අයත් ඉඩම්.

මූල්‍ය ප්‍රකාශන

මූල්‍ය ප්‍රකාශනයන් සඳහා සටහන්

- පිදුරුතලාගල කන්දේ පිහිටා ඇති රේඩාර් මධ්‍යස්ථානය, එහි ගොඩනැගිලි සහ ව්‍යුහ සහ ඊට අයත් ඉඩම්.
- ගුවන් සමාගමේ කාර්ය මණ්ඩලය සඳහා නිවාඩු නිකේතනය ඉදි කර ඇති නුවරඑළිය දිස්ත්‍රික්කයේ පිදුරුතලාගල ඉඩම සහ එහි පවතින හෝ ඊට අදාළ ව්‍යුහයන්.
- අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නුවර ගම්පළාත නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 249 දෙවන අදියරේ, ග්‍රාමසේවක කොට්ඨාසයේ අනුරාධපුර නව නගරයේ පිහිටි අංක 976 දරන කොටසෙහි හෙක්ටෙයාර 0.125ක බිම් කොටස.

වත්කම් වර්ගය	01/01/2023 දිනට ශේෂය	එකතුකිරීම්/ පැවරුම්	නැවත තක්සේරු කිරීම	බැහැර කිරීම්	31/12/2023 දිනට ශේෂය	31/12/2022 දිනට ශේෂය
පිරිවැය						
ඉඩම්	575,826,244	8,116,895	-	-	583,943,139	575,826,244
ගොඩනැගිලි	1,858,139,292	573,706,555	-	-	2,431,845,847	1,858,139,292
බහාලුම් කොටස්	4,315,018	-	-	-	4,315,018	4,315,018
රථ වාහන	155,322,995	-	14,413,320	-	169,736,315	155,322,995
පිරියත සහ යන්ත්‍රෝපකරණ	104,834,293	12,579,081	(30,897,564)	(7,988,659)	78,527,152	104,834,293
ලී භාණ්ඩ සහ සවිකිරීම්	52,933,789	2,170,572	(18,544,672)	(1,138,649)	35,421,039	52,933,789
වෙනත් ස්ථිර වත්කම්	536,144	-		(319,936)	216,208	536,144
	2,751,907,775	596,573,103	(35,028,916)	(9,447,244)	3,304,004,718	2,751,907,775

වත්කම් වර්ගය	01/01/2023 දිනට ශේෂය	වර්ෂය සඳහා අයකිරීම්	නැවත තක්සේරු කිරීම	බැහැර කිරීම්	31/12/2023 දිනට ශේෂය	31/12/2022 දිනට ශේෂය
ක්ෂය වීම						
ගොඩනැගිලි	385,840,924	118,091,412	-	-	503,932,336	383,786,098
බහාලුම් කොටස්	408,567	388,352	-	-	796,919	408,567
රථ වාහන	33,762,870	14,587,676	(36,078,368)	-	12,272,178	33,762,870
පිරියත සහ යන්ත්‍රෝපකරණ	64,682,882	11,813,628	(66,067,435)	(7,156,257)	3,272,817	64,563,539
ලී භාණ්ඩ සහ සවිකිරීම්	35,586,641	4,816,385	(37,213,906)	(1,024,784)	2,164,335	35,586,641
වෙනත් ස්ථිර වත්කම්	484,260	1,393	-	(295,240)	190,413	484,260
	520,766,143	149,698,845	(139,359,710)	(8,476,281)	522,628,998	518,591,974
ලිඛිත වටිනාකම					2,781,375,720	2,233,315,802

30. අස්පෘශ්‍ය වත්කම්

වත්කම් වර්ගය	01/01/2023 දිනට ශේෂය	එකතුකිරීම්/ පැවරුම්	නැවත තක්සේරු කිරීම	බැහැර කිරීම්	31/12/2023 දිනට ශේෂය	31/12/2022 දිනට ශේෂය
පිරිවැය						
තොරතුරු තාක්ෂණ මෘදුකාංග	35,845,518	8,125,000	(29,740,901)	-	14,229,616	35,845,518

වත්කම් වර්ගය	01/01/2023 දිනට ශේෂය	වර්ෂය සඳහා අය කිරීම	නැවත තක්සේරු කිරීම	බැහැර කිරීම්	31/12/2023 දිනට ශේෂය	31/12/2022 දිනට ශේෂය
ක්ෂය වීම						
තොරතුරු තාක්ෂණ මෘදුකාංග	23,916,192	7,638,729	(30,828,816)	-	726,105	23,916,192
ලිඛිත වටිනාකම					13,503,511	11,929,326

31. වත්කම භාවිත කිරීමේ අයිතිය - වීරවිල

2008 ජනවාරි මස දී වසර තිහක කල්බදු ගිවිසුමක් යටතේ වීරවිල පිහිටි සංචාරක බංගලාව රජය විසින් අධිකාරිය වෙත ලැබුණි. 2019.12.31 දින තෙක් කල්බදු ගෙවීම් ලාභ සහ අලාභ ගිණුම අධිකාරිය අය කර ඇත. ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් LKAS 17 අනුභවා යමින් SLFRS 16 කල්බදු සඳහා නිකුත් කරනු ලැබ ඇත. එබැවින් SLFRS 16 හි C7-C 13 පේදය අනුව යමින් කරමින් ආරම්භක අයදුම්පතෙහි දිනයට හඳුනා ගන්නා ලද ප්‍රමිතිය මූලික ව යොදා ගැනීමේ සමුච්චිත බලාත්මක කිරීමත් සමඟ අතීතානුයෝගීව 2020 ජනවාරි 1 දින සිට මෙම ප්‍රමිතිය සිවිල් ගුවන්සේවා අධිකාරිය විසින් යොදා ගෙන ඇත.

වත්කම් භාවිතයේ අයිතිය හඳුනාගත් අදාළ ධාරණ වටිනාකම පහතින් දැක්වේ.

	2023 රු.	2022 රු.
2022 ජනවාරි 1 වන දිනට	**315,505**	336,539
එකතු කිරීම		-
වියදම ක්ෂය වීම	**(21,034)**	(21,034)
2022 දෙසැම්බර් 31 දිනට	**294,471**	315,505

මූල්‍ය ප්‍රකාශන

මූල්‍ය ප්‍රකාශනයන් සඳහා සටහන්

32. නොනිමි ප්‍රාග්ධන ක්‍රියාකාරකම්

i. ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය (CAASL) ජාතික අයවැයෙන් යෝජනා කරන ලද පුත්තලම සහ බණ්ඩාරවෙල අභ්‍යන්තර ගුවන්තොටුපොල සංවර්ධනය කිරීමට සමීක්ෂණ සැලසුම් කිරීම සඳහා මුදල් වැය කර ඇත. මෙම අභ්‍යන්තර ගුවන්තොටුපොලවල් සංවර්ධනය කිරීම අවසන් කර නොමැති බැවින්, එම වියදම් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහිත පරිපාලන සහ අනෙක් වියදම් යටතේ අභ්‍යන්තර ගුවන්තොටුපොල සංවර්ධන වියදම් වශයෙන් පෙන්වා ඇත.

ii. යාපනය ගුවන්තොටුපොල ඉදිකිරීමට වැය වන රු.44,509,332/-ක් වන වියදම් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහ පලාලි ගුවන්තොටුපාල යටතේ ලැබුණු රු. 170,621,991/-ක අත්තිකාම් මුදලත් සමඟ ප්‍රාග්ධනීකරණය විය.

iii. ගුවන්තොටුපොල ඉඩම් අත්පත් කරගැනීම යටතේ ගුවන්තොටුපොල ඉඩම් සමීක්ෂණ සැලසුම් සඳහා යොදවන ලද මුදල පෙන්නුම් කෙරේ.

iv. ප්‍රධාන කාර්යාලවල රැස්වීම් කාමරවල ඇති ශබ්ද ආරක්ෂණය (රු.5 078,125/-), අපගමන කළමණාකරණ මෘදුකාංග (4,730,000/-) සහ ස්වයංක්‍රීය පුද්ගලික බලපත්‍ර පද්ධතිය (1,125,000/-) සඳහා කරන ලද කොටස් ගෙවීම් තොරතුරු තාක්ෂණ සංවර්ධනය යටතේ සඳහන් කර ඇත.

	2023 රු.	2022 රු.
අභ්‍යන්තර ගුවන්තොටුපොල - බණ්ඩාරවෙල	-	677,000
අභ්‍යන්තර ගුවන්තොටුපොල - පුත්තලම	-	315,000
යාපනය ජාත්‍යන්තර ගුවන්තොටුපොල - පලාලි	-	446,509,332
ගුවන්තොටුපොල ඉඩම් අත්පත් කර ගැනීම	457,610	323,210
ඉදිකිරීම් - ප්‍රධාන කාර්යාලය	5,954,050	-
ඉදිකිරීම් - පරීක්ෂක නිල නිවාස	-	2,163,312
තොරතුරු තාක්ෂණ සංවර්ධන	5,855,000	10,933,125
	12,266,660	460,920,979

33. වෙළෙඳ ලැබිය යුතු දෑ

	2023 රු.	2022 රු.
OSS සහ ලැබිය යුතු අපගමන සේවා වියදම් ආදායම	352,585,282	291,010,409
වෙනත් ණයගැතියන්	3,198,055	2,905,039
	355,783,337	293,915,448

34. කාර්යමණ්ඩල ණය

	2023 රු.	2022 රු.
කාර්යමණ්ඩල ණය	123,266,279	134,590,825
විලම්බිත කාර්ය මණ්ඩල පිරිවැය (ණය)	(62,504,044)	(78,609,923)
	60,762,235	55,980,902

35. මූල්‍ය වත්කම්

	2023 රු.	2022 රු.
භාණ්ඩාගාර බිලපත්	**3,938,043,298**	3,408,791,366
භාණ්ඩාගාර බිලපත් - පාරිතෝෂික අරමුදල්	**21,196,052**	66,185,597
අඩු කළ : විලම්භිත පොළී ආදායම	**(221,581,007)**	(122,122,458)
	3,737,658,343	3,352,854,505

විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් සඳහා පවත්වාගෙන යනු ලබන වෙන ම ආයෝජනයක් මූල්‍ය වත්කම්වල අන්තර්ගත වේ.

36. අත්තිකාරම්, පෙර ගෙවීම් සහ වෙනත් ලැබිය යුතු දෑ

	2023 රු.	2022 රු.
අත්තිකාරම්	**176,789,416**	175,649,471
පෙර ගෙවීම්	**19,418,757**	12,509,901
ලැබිය යුතු වකතු කළ අගය මත බදු	**136,799,321**	255,416,974
ලැබිය යුතු පොළී ආදායම්	**54,399,217**	23,236,120
පෙර ගෙවීම් කරන ලද කාර්ය මණ්ඩල පිරිවැය	**62,504,044**	78,609,923
	449,910,755	545,422,389

ලැබිය යුතු වකතු කළ අගය මත බද්දෙන් 50%ක් දේශීය ආදායම් බදු දෙපාර්තමේනතුව විසින් විගණනය කොට ඇති අතර, පවතින ආදායම් විගණනය කිරීම සඳහා අබණ්ඩ පසු විපරම් ක්‍රියාමාර්ග ගනු ලැබේ.

ඒකාබද්ධ අරමුදලට රු. 4,000,000,000 දායක මුදලක් ලැබෙන බැවින් ලැබිය යුතු ආදායම් බදු මුදලක් ඇත.

37. මුදල් හා මුදල් සමාන දෑ

	2023 රු.	2022 රු.
බැංකුවේ මුදල්		
ජංගම ගිණුම: 000 202 6666 - BOC	**118,716,340**	63,290,060
ජංගම ගිණුම: 000 202 6678- BOC	**130,291,453**	978,156,779
ජංගම ගිණුම: 0088591866 -BOC (ලංකා QR)	**841,237**	147,950
USD ගිණුම: 89897817- BOC	**5,061,829**	98,137
ජංගම ගිණුම: 324 100 190 023 731 - මහජන බැංකුව	**590,591,556**	214,916,769
කෙටි තැන්පතු	**2,604,500,000**	1,335,000,000
සුළු මුදල් අත්තිකාරම්	**1,518,000**	737,000
මුදල් ප්‍රවාහ ප්‍රකාශය සඳහා මුළු මුදල් සහ මුදල් සමාන දෑ	**3,451,520,415**	2,592,346,695

මූල්‍ය ප්‍රකාශන

මූල්‍ය ප්‍රකාශනයන් සඳහා සටහන්

විදේශීය ගනුදෙනුකරුවන්ගෙන් මුදල් එකතු කිරීමට සහ පරීක්ෂණ සඳහා විදේශගත වන පරීක්ෂකරුන්හට මුදල් නිකුත් කිරීමට අධිකාරිය විසින් ලංකා බැංකුවේ USD ගිණුමක් ආරම්භ කර ඇත. විදේශ මුදල් ගනුදෙනුවලට අදාළ විදේශ විනිමය ලාභ සහ අලාභ 'මූල්‍ය ආදායම හෝ පිරිවැය' යටතේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ ඉදිරිපත් කර ඇත. ලංකා QR ක්‍රමය හරහා මුදල් එකතු කිරීම සඳහා අධිකාරිය විසින් වෙන ම ජංගම ගිණුමක් විවෘත කරනු ලැබ ඇත.

38. රජයේ ප්‍රදාන ලැබීම්

i. 2002 අංක 34 දරන සිවිල් ගුවන්සේවා අධිකාරිය පනතේ 9 වන වගන්තිය ප්‍රකාර ව මඩකලපුව ගුවන්තොටුපොල සතු ගොඩනැගිලි සහ ඉඩම්වල වටිනාකම CAASL වෙත පවරා ඇත.

ii. 65- 3651 සහ 65- 3653 යන රථ වාහන දෙකෙහි වටිනාකම ICAO ව්‍යාපෘතියෙන් ලැබුණි.

iii. බාහිර සම්පත් දෙපාර්තමේන්තුව හරහා පරිත්‍යාගයක් ලෙස ශ්‍රී ලංකාව සහ ආර්ථික සහ සමාජ සංවර්ධන වැඩසටහන වෙනුවෙන් ජපන් ප්‍රදානයකින් ලද මද්‍යසාර පරීක්ෂණය සඳහා ප්‍රශ්වාස විශ්ලේෂක Breath Analyzer පරීක්ෂණ 3ක වටිනාකම.

2022.01.01 දිනට රජයේ ප්‍රදාන	558,598,755
එකතු කල: 2022 වර්ෂය තුළ ලැබුණු ප්‍රදාන	-
අවම: 2022 වර්ෂය සඳහා ක්‍රමක්ෂ කිරීම	(3,709,152)
2022.12.31 දිනට රජයේ ප්‍රදාන	554,889,603
එකතු කල: 2023 වර්ෂය තුළ ලැබුණු ප්‍රදාන	
අවම: ප්‍රදාන ලෙස ලැබුණු වත්කම් බැහැර කිරීම	(18,113)
අවම: 2023 වර්ෂය සඳහා ක්‍රමක්ෂ කිරීම	(3,709,152)
2023.12.31. දිනට රජයේ ප්‍රදාන	551,162,338

	2023 රු.	2022 රු.
ඉඩම්	522,374,500	522,374,500
ගොඩනැගිලි	26,498,005	28,799,702
පිරියත, යන්ත්‍රෝපකරණ සහ උපකරණ	205,331	205,331
ලී භාණ්ඩ සහ සවිකිරීම්	5,793,653	7,201,109
වෙනත් ස්ථිර වත්කම්	-	18,113
මුළු	554,871,490	558,598,755
වර්ෂය සඳහා ක්‍රමක්ෂ	(3,709,152)	(3,709,152)
වර්ෂය අවසානයේ දී ශේෂය	551,162,338	554,889,603

39. රඳවා ගත් ඉපැයුම්

	2023 රු.	2022 රු.
වසර ආරම්භක දිනට	5,826,217,782	4,029,697,346
වත්මන් වර්ෂයේ ලාභය	4,348,278,597	2,743,243,673
වෙනත් විස්තීර්ණ ආදායම්/(වියදම්)	(14,345,234)	53,276,761
පෙර වර්ෂයේ ගැලපුම් : අනුමත කළ නොහැකි යෙදවුම් බදු	(22,305,396)	-
ඒකාබද්ධ අරමුදල වෙත පැවරීම	(4,000,000,000)	(1,000,000,000)
වසර අවසාන දිනට	6,137,845,749	5,826,217,782

40. නැවත තක්සේරු කිරීමේ අතිරික්තය

	2023 රු.	2022 රු.
රථ වාහන	149,478,190	98,986,502
පිරියත, යන්ත්‍රෝපකරණ සහ උපකරණ	42,821,221	7,651,349
තොරතුරු තාක්ෂණ මෘදුකාංග	1,087,915	-
ලී භාණ්ඩ සහ සවිකිරීම්	25,843,908	7,174,674
	219,231,233	113,812,525

41. විලම්බිත බදු වගකීම්

	මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය		විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය	
	2023 රු.	2022 රු.	2023 රු.	2022 රු.
විලම්බිත බදු වගකීම් මත				
නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම	21,302,565	19,974,485	1,328,079	3,124,000
වැඩි වූ බදු ක්ෂය වීම	78,881,946	43,495,855	35,386,090	23,081,237
	100,184,511	63,470,341	36,714,169	26,205,237
විලම්බිත බදු වත්කම් මත:				
වැඩි වූ බදු ක්ෂය වීම	15,596,177	15,596,177	-	-
නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම				
	15,596,177	15,596,177	-	-
වෙනත් විස්තීර්ණ ආදායම්				
විලම්බිත ආදායම් බදු වියදම් (සටහන 28)			36,714,169	26,205,237

මූල්‍ය ප්‍රකාශන

මූල්‍ය ප්‍රකාශනයන් සඳහා සටහන්

ජංගම බදු වගකීම්වලට එරෙහිව ජංගම බදු හිලව් කිරීමට නීත්‍යනුකූල ව බලාත්මක කළ හැකි අයිතියක් ඇති විට සහ විලම්බිත ආදායම් බදු එම මූල්‍ය අධිකාරියට අදාළ වන විට විලම්බිත ආදායම් බදු වත්කම් සහ වගකීම් හිලව් කරනු ලැබේ. ශුද්ධ විලම්බිත බදු මුදල පහත පරිදි වේ.

	2023 රු.	2022 රු.
විලම්භිත බදු වත්කම	**15,596,177**	15,596,177
විලම්භිත බදු වගකීම්	**(100,184,510)**	(63,470,341)
ශුද්ධ විලම්භිත බදු වත්කම සහ වගකීම	**(84,588,333)**	(47,874,164)

42. කල්බදු වගකීම්

	2023 රු.	2022 රු.
ජනවාරි 31 දිනට	**307,013**	329,502
එකතු කිරීම්	**-**	-
පොලී උපචයන	**6,682**	4,296
ගෙවීම්	**(32,141)**	(26,784)
දෙසැම්බර් 31 දියට	**281,554**	307,014

43. ප්‍රතිපාදන සහ වෙනත් වගකීම්

	2023 රු.	2022 රු.
කාර්ය මණ්ඩල අරමුදල්	**158,564**	142,337
බැංකු ඇපකාර තැන්පතු (අපගමන බදු)	**219,740,948**	23,408,553
හදිසි අනතුරු විමර්ශන අරමුදල	**48,322,696**	48,944,519
	268,222,208	72,495,409

44. විශ්‍රාම ප්‍රතිලාභ වගකීම

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි හඳුනා ගැනෙන වගකීම් විචලනය පහත පරිදි වේ.

	2023 රු.	2022 රු.
වසර ආරම්භක දිනට	**21,196,052**	66,185,597
ජංගම සේවා පිරිවැය		1,661,286
පොලී පිරිවැය	**4,426,929**	10,589,695
වර්ෂය තුළ සිදු කරන ලද ගෙවීම්	**(8,390,100)**	(3,963,765)
භාවිත කරන ලද උපකල්පනවල වෙනස්වීම් නිසා ඇතිවන ලාභ/අලාභ	**14,345,234**	(53,276,761)
වසර අවසානය දිනට	**31,578,115**	21,196,052

වසර අවසානයේ දී නිර්වචිත ප්‍රතිලාභ බැඳීම් සඳහා වන වගකීම් ගණනය කිරීම සඳහා ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය භාවිත කරමින් සේවක ප්‍රතිලාභවල පිරිවැය නිර්ණය කිරීමේ දී භාවිත කරන මූලික උපකල්පන පහත පරිදි විය:

	2023	2022
වට්ටම් අනුපාතය	12%	16%
ඉදිරි වැටුප් වැඩි කිරීමේ අනුපාතය	1%	1%
ජීවන වියදම් දීමනා වර්ධක අනුපාතය	0%	0%
කාර්ය මණ්ඩල පිරිවැටුම් අනුපාතය	0%	0%
විශ්‍රාමික වයස	අවු 60	අවු 60

නිශ්චිත ප්‍රතිලාභ වගකීම සඳහා වන වගකීම් මඟින් බාහිර ව අරමුදල් සපයනු නොලැබේ; සෑම වර්ෂයක් අවසානයේ දී ම විශ්‍රාම ප්‍රතිලාභ වගකීමේ වටිනාකම සඳහා වෙන ම ආයෝජනයක් පවත්වාගෙන යනු ලැබේ.

45. වෙළෙඳ ගෙවිය යුතු දෑ

i. 2019 ඔක්තෝම්බර් 11 වන දින තීරණය ප්‍රකාර ව, අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රාදේශීය වාණිජ ගුවන් ගමන් මෙහෙයුම් සඳහා යාපනය ජාත්‍යන්තර ගුවන්තොටුපොල (පලාලි) සංවර්ධනයට භාවිත කිරීමට රුපියල් 1,050/- දක්වා මුදලක් සිවිල් ගුවන්සේවා අධිකාරිය (CAASL) විසින් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය (SLTDA) වෙත එවන ලද අපගමන බදු සම්ප්‍රේෂණ රඳවා ගැනීම අනුමත කරනු ලැබ ඇත. රඳවා තබාගෙන ඇති රු. 1, 050,000,000 මුදල යාපනය ජාත්‍යන්තර ගුවන්තොටුපොල සංවර්ධනය (SLTDA)- තැම්පතු යටතේ දක්වා ඇත.

	2023 රු.	2022 රු.
තැන්පතු තක්සේරුකරණ ගාස්තු සහ මෙහෙයුම්	18,533,532	9,217,631
CAASL සහ සංචාරක සංවර්ධන අධිකාරිය සහ රාජ්‍ය භාණ්ඩාගාරය වෙත ගෙවිය යුතු	2,585,713,770	1,313,115,658
තැන්පතු - යාපනය ජාත්‍යන්තර ගුවන්තොටුපල සංවර්ධනය - SLTDA	1,050,000,000	1,050,000,000
වෙනත් ණය හිමියන්	2,361,140	53,466
	3,656,608,443	2,372,386,755

මූල්‍ය ප්‍රකාශන

මූල්‍ය ප්‍රකාශනයන් සඳහා සටහන්

46. වෙනත් ගෙවිය යුතු දෑ

	2023 රු.	2022 රු.
උපචිත වියදම්		
- කාර්ය මණ්ඩල වියදම්		
සේවක අර්ථසාධක අරමුදල	5,684,076	8,578,034
ප්‍රයෝජනයට නොගත් නිවාඩු සඳහා මුදල් ගෙවීම	6,960,151	7,506,608
ප්‍රසාද දීමනා	52,050	-
සේවක භාරකාර අරමුදල	682,089	1,029,364
සුබසාධන ගෙවීම්	117,500	92,220
උපයන විට ගෙවීම	879,699	103,460
වැටුප් සහ වේතන	1,888,271	269,398
- පුහුණු	45,000	-
- පරිපාලන සහ වෙනත් වියදම්		
ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානය වෙත දායකත්වය	-	32,342,133
මුද්‍රණ	6,537,204	4,200,000
විදුලිය	3,439,637	2,017,706
සුබසාධන - පොදු	1,486,238	1,460,000
ගොඩනැගිලි නඩත්තුව - වෙනත්	2,366,637	1,162,825
සනීපාරක්ෂක	1,140,697	1,114,872
බාහිර තාක්ෂණික සහය	3,319,700	1,222,000
බදු කපා හැරීම කල් දැමීමෙන්	683,146	-
විදුලි සංදේශ	1,041,338	1,021,410
ආරක්ෂාව	1,015,665	1,004,590
විගණන ගාස්තු	1,035,000	990,600
බදු තුලී සහ කුලී ගාස්තු	1,480,960	-
වෙනත් වියදම්	1,909,597	1,586,735
	41,764,655	65,701,955

47. ආදායම් බදු වගකීම්

	2023 රු.	2022 රු.
වර්ෂය ආරම්භයේ දී ශේෂය	482,052,569	173,292,906
වර්ෂය සඳහා වන දීමනාව	172,206,560	618,309,763
එකතු කළ අගය මත බදු ආපසු ගෙවීම ආරම්භ කිරීම	(8,250,934)	-
වර්ෂය තුළ ගෙවීම්	(765,282,046)	(309,550,100)
වර්ෂය අවසානයේ දී ශේෂය	(119,273,851)	482,052,569

48. අවිනිශ්චිත වගකීම්

ශ්‍රී ලංකා ගුවන්සේවා අධිකාරියට එරෙහි ව මීගමුව මහාධිකරණයේත් කොළඹ මහාධිකරණයේ සහ අභියාචනාධිකරණයේත් නඩු කිහිපයක් ම ගොනු වී ඇති බැවින්, එම නඩු සඳහා සැලකිය යුතු මූල්‍ය වගකීම් ප්‍රමාණයක් ඉපැයීමට සිදු වේ.

49. ශේෂ පත්‍රයේ දිනට පසු සිදුවීම්

පහත සඳහන් කරුණු හැරුණුකොට මූල්‍ය ප්‍රකාශයේ වෙනස්කම් සිදු කිරීමට අවශ්‍ය හෝ අනාවරණය කිරීමට අවශ්‍ය කිසිදු වැදගත් සිදුවීමක් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙන් පසු ව සිදු වී නොමැත.

2008 මැයි 22 වැනි දිනැති අංක 1550/7 ගැසට් නිවේදනයෙහි පළ කරන ලද, 1992 අංක 55 දරන ගුවන් සංතරණ (විශේෂ විධිවිධාන) පනතේ 13 (2) වන වගන්තිය යටතේ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයා විසින් සකසන ලද රෙගුලාසි ප්‍රකාර ව, ශ්‍රී ලංකාවෙන් ආරම්භ වන ගුවන් ගමන් සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත නිකුත් කනු ලබන සෑම මඟී ගුවන් ප්‍රවේශපත්‍රයකට ම ඇමරිකානු ඩොලර් 60ක එතෙර වික්‍රිණුම් අධිභාරයක් (OSS) අය කෙරේ. සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිශ්චිත ව දක්වා ඇති පරිදි ඉහත කී එතෙර වික්‍රිණුම් අධිභාරය එකතු කිරීමට සහ ඒවා ඒකාබද්ධ අරමුදල වෙත බැර කිරීමට මෙම රෙගුලාසිය මඟින් ශ්‍රී ලංකා ගුවන්සේවා අධිකාරිය (CAASL) වෙත බලය පැවරී ඇත. ඒ අනුව, 2002 අංක 34 දරන සිවිල් ගුවන්සේවා අධිකාරිය පනතේ (CAA පනත) 12 වන වගන්තියෙන් අවසර ලබා දී ඇති පරිදි, 2008 වර්ෂයේ සිට, ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය විසින් එකී මුදල් රැස් කොට අධිකාරිය සතු අරමුදලට ආදායමක් වශයෙන් එක්කොට ඇත. එකී පනත මඟින් නියමකොට ඇති නියාමන විෂය පථයට අදාළ ප්‍රමාණවත් ආදායමක් සහ ප්‍රාග්ධන වියදම් අය කරගැනීමෙන් අනතුරු ව, CAASL විසින් සෑම වර්ෂයක ම පුරුද්දක් වශයෙන් එම අධිභාරය ඒකාබද්ධ අරමුදල වෙත ප්‍රේෂණය කරනු ලැබ ඇත. 2008 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා රුපියල් 9,668,000,000.00ක මුළු මුදලක් ඒකාබද්ධ අරමුදල වෙත ප්‍රේෂණය කරනු ලැබ ඇත.

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ වාර්ෂික විගණනයට අදාළ ව, විගණකාධිපතිවරයා මේ සම්බන්ධයෙන් සැලකිල්ලක් දැක් වූ අතර, සිය අදහස දක්වමින් OSS අධිකාරිය සතු අරමුදලට ඇතුළත් කර නොගෙන සෘජු ව ම ඒකාබද්ධ අරමුදල වෙත බැර කළ යුතු බව ප්‍රකාශ කළේ ය.

සිවිල් ගුවන්සේවා අධිකාරිය භාර රේඛීය අමාත්‍යවරයා වන වරාය නාවික සහ ගුවන්සේවා අමාත්‍යවරයා මෙම තීරණය සම්බන්ධයෙන් මැදිහත් වූ අතර, එම තීරණය පිළිබඳ නැවත සලකා බලා, OSS ආදායම CAASS මූල්‍ය ප්‍රකාශයේ මුළු වාර්ෂික ආදායමෙන් 80% නියෝජනය කරන බැවින් සිවිල් ගුවන්සේවාවේ නියාමන විෂය පථය යටතේ එන ක්‍රියාකාරකම් වන පුනරාවර්තන වියදම් සහ ප්‍රාග්ධන වියදම් ආවරණය කිරීමට ප්‍රමාණවත් එකතුවක් ලැබෙන තෙක් රැඳී සිටීමට CAASL වෙත අවසර ලබා දෙන මෙන් ඔහු විසින් අමාත්‍ය මණ්ඩලය වෙතින් ඉල්ලීමක් සිදු කරන ලදි.

අමාත්‍ය මණ්ඩලය විසින් 2023. 02. 19 දින පැවති රැස්වීමේ දී සිවිල් ගුවන්සේවා අධිකාරියේ (CAA) මාසික වියදම් සඳහා මාසික OSS ආදායමෙන් රුපියල් මිලියන 90ක් රඳවා තබා ගැනීම සඳහා අනුමැතිය ලබා දෙන ලදි.

මූල්‍ය ප්‍රකාශන
විගණකාධිපතිගේ වාර්තාව 2023

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. AAV/B/CAASL/FA/2023/06 ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 22 August 2024

සභාපති
ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව, 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ මූල්‍ය ප්‍රකාශය සහ අනෙකුත් නෛතික සහ නියාමන අවශ්‍යතා පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

2023 දෙසැම්බර් 31 වන දිනට වන මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, විස්තීර්ණ ආදායම පිළිබඳ ප්‍රකාශය, ස්කන්ධ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය සහ එම දිනෙන් අවසන් වන වසර සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ වාස්තවික ගිණුම්කරණ ප්‍රතිපත්ති තොරතුරු ඇතුළු මූල්‍ය ප්‍රකාශ සටහන්වලින් සමන්විත ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ ("අධිකාරිය") 2023 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන විගණනය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මූල්‍ය පනතේ විධිවිධාන සමඟ ඒකාබද්ධව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) විධිවිධාන අනුගමනය කරමින් මාගේ මඟපෙන්වීම යටතේ සිදු කරන ලදි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) වගන්තියේ විධිවිධාන අනුව සිදු කරන ලද මාගේ වාර්තාව යථා කාලයේ දී පාර්ලිමේන්තුවේ සභාගත කෙරෙනු ඇත.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ලෙස දක්වා ඇති කරුණුවල බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2023 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් වලට අනුකූලව සත්‍ය සහ සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මාගේ මතයයි.

2. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) 2023 දෙසැම්බර් 31 වන දිනට රු. 4,193,585 ක ධාරක අගයක් සහිත ගොඩනැඟිලි තුනක සුන්බුන් අගය හා ඵලදායි ජීවිත කාලය පිළිබඳව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 හි 51 වන අනුඡේදයට අනුව සමාලෝචනය කිරීමක් සහ ගිණුම්ගත කිරීමක් සිදු කර නොතිබුණි.

(ආ) 2023 දෙසැම්බර් 31 දක්වා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු රු. 136,799,321 ක චකිතූ කළ අගය මත බදු වලින් රු. 127,895,303 ක ප්‍රමාණයක් වර්ෂය තුළ දී ආපසු නොගෙවන චකිතූ කළ අගය මත බදු වශයෙන් ගළපා ඇත. කෙසේ වෙතත්, ලැබිය යුතු අවශේෂ චකිතූ කළ අගය මත බදු ආපසු අය කරගැනීම

පිළිබඳව පැහැදිලි විශ්වාසයක් නොතිබුණ ද සමාලෝචනය සිදු කෙරෙන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශවල අලාභ හෝ අනාවරණ සඳහා ප්‍රතිපාදන සලසා නොමැත.

(ඇ) 2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායකත්ව පනතේ 2 (ඇ) වගන්තිය ප්‍රකාරව පෙර වර්ෂය සහ සමාලෝචනය සිදු කෙරෙන වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශය මඟින් 2022 ඔක්තෝබර් 1 වන දින සිට බලපැවැත්වෙන ආදායම් බදු ප්‍රනිශ්චායක සඳහා හඳුනාගෙන ඇති රු. 10,679,705 ක සමාජ ආරක්ෂණ දායකත්ව බද්දට එරෙහිව ප්‍රතිපාදන සලසා නොමැත.

(ඈ) අධිකාරිය විසින් 2002 අංක 14 දරන චකිතූ කළ අගය මත බදු පනතේ පළමු වන උපලේඛනයේ (ඒ) වගන්තිය ප්‍රකාරව 2016 වර්ෂයේ දෙවන කාර්තුවේ සිට 2023 දෙසැම්බර් 31 වන දින දක්වා අපගමනය මත අය කරනු ලබන සේවා ගාස්තු ආදායම සඳහා රු. 112,885,849 ක සහ සමාලෝචනය සිදු කරන වර්ෂයට අදාළව රු. 364,495,666 ක සේවා ගාස්තු ආදායම මත රු. 54,674,342 ක මුදලක් චකිතූ කළ අගය මත බදු ලෙස ගෙවිය යුතු ය. කෙසේ වෙතත්, රු. 167,560,191ක ගෙවිය යුතු මුළු චකිතූ කළ අගය මත බදු මුදල ගිණුම්ගත කර නොමැත.

(ඉ) අපගමනය මත අය කරනු ලබන සේවා ගාස්තු සඳහා අධිකාරියේ ආදායම හඳුනා ගැනීමේ ප්‍රතිපත්තිය උපචිත පදනම මත සිදු කළ ද, 2023 දෙසැම්බර් 31 වන දිනට ගුවන් සමාගම් හයකින් (6) ලැබිය යුතු රු. 11,070,728,696 ක අපගමන ආදායම ගිණුමගත කර නොමැත. එබැවින් මහා භාණ්ඩාගාරයට, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට හා ගුවන්තොටුපොල සහ ගුවන්සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගමට ගෙවිය යුතු මුදල පිළිවෙළින් රු. 8,303,046,522, රු. 899,496,707 සහ රු. 1,798,993,414 ලෙස අඩුවෙන් තක්සේරු කර ඇත. එසේම අධිකාරියේ අපගමනය මත අය කරනු ලබන සේවා ගාස්තු ද රු. 69,192,054 ක් අඩුවෙන් තක්සේරු කර ඇත.

(ඊ) රු. 1,772,902 ක් වටිනා උපකරණ වත්කම් අත්පත් කරගැනීම ආරම්භයේ සිටම අධිකාරියේ කටයුතු සඳහා යොදා නොගෙන අධිකාරියේ ගබඩාවේ සහ සෞඛ්‍ය අංශය තුළ රඳවා තබා ගෙන ඇත. කෙසේ වුව ද, අධිකාරිය විසින් එම වත්කම් සම්පූර්ණයෙන්ම ක්ෂය කර 2022 වර්ෂයේ දී අගය ප්‍රතිගණනය කොට ගිණුම්ගත කිරීම සිදු කර ඇත. එසේ ම රු. 8,582,775 ක වටිනාකමකින් යුතු වාහන දෙකක් භාවිතයට නොගෙන අධිකාරී පරිශ්‍රය තුළ නවතා ඇත.

(උ) 2023 දෙසැම්බර් 31 වන දිනට රු. 178,943,596 ක සමස්ත වටිනාකමකින් යුතු ණය ගැතියන් හය දෙනෙකුට (6) ශේෂය තහවුරු කිරීමේ ලිපි යවා ඇත. කෙසේ වෙතත්, රු. 173,193,596 ක සමස්ත වටිනාකමකින් යුතු ණය ගැතියන් තිදෙනෙකු ශේෂ තහවුරු කර නොතිබුණු අතර, තහවුරු කරන ලද ශේෂයෙහි සහ ලෙජරයේ ශේෂයෙහි රු. 473,184 ක වෙනසක් තිබුණි.

මූල්‍ය ප්‍රකාශන
විගණකාධිපතිගේ වාර්තාව 2023

(ඌ) රු. 232,644,548 ක සමස්ත වටිනාකමකින් යුතු ණයහිමියන් ගෙන්, රු. 124,902,383 ක සමස්ත වටිනාකමකින් යුතු ණයහිමියන් දොළොස්දෙනෙකුගේ ශේෂ තහවුරු කිරීම් නොලැබීම හේතුවෙන් තහවුරු කරගැනීමට නොහැකි විය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට (SLAUs) අනුව මම මාගේ විගණනය සිදු කර ඇත. එම ප්‍රමිති යටතේ මා වෙත පැවරී ඇති වගකීම්, මගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශ විගණනය සඳහා විගණකගේ වගකීම් යටතේ තවදුරටත් විස්තර කර ඇති අතර මා ලබාගත් විගණන සාක්ෂි මගේ තත්ත්වාගණනය කළ මතයට පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ සුදුසු යැයි මම විශ්වාස කරමි.

1.3 අධිකාරියේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් වෙනත් තොරතුරු

අධිකාරියේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත්, මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් මූල්‍ය ප්‍රකාශ සහ ඒ සම්බන්ධ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරුවලින් වෙනත් තොරතුරු සමන්විත වේ. වෙනත් තොරතුරු සම්බන්ධයෙන් කළමනාකාරීත්වය වගකියනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශ පිළිබඳ මාගේ මතය මඟින් වෙනත් තොරතුරු ආවරණය නොකෙරෙන අතර මා විසින් ඒ සම්බන්ධයෙන් කිසිදු ආකාරයක සහතිකයක් හෝ නිගමනයක් සපයනු නොලැබේ.

මූල්‍ය ප්‍රකාශ විගණනය සම්බන්ධයෙන් මාගේ වගකීම වනුයේ, වෙනත් තොරතුරු කියවා බැලීම වන අතර, එහි දී වෙනත් තොරතුරු හා මූල්‍ය ප්‍රකාශ අතර ප්‍රමාණාත්මක නොගැළපීමක් පවතී ද යන්න හෝ විගණනයේ දී මා ලද දැනුම හෝ වෙනත් ආකාරයකින් කිසියම් ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් සිදු වී ඇති ද යන්න සොයා බැලීම යි.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබා ගත් වෙනත් තොරතුරු මත මා විසින් ඉටු කරන ලද කාර්යය මත පදනම් වන්නේ නම්, මෙම වෙනත් තොරතුරුවල ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් ඇතැයි මම නිගමනය කරන්නේ නම් මවිසින් එය වාර්තා කළ යුතු වේ. මේ සම්බන්ධයෙන් වාර්තා කිරීමට මාහට කිසිදු කරුණක් නොමැත.

1.4 මූල්‍ය ප්‍රකාශ සඳහා කළමනාකරණය සහ පාලනය සිදු කරන පාර්ශ්ව සතු වගකීම්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය සහ සාධාරණ දැක්මක් සපයන මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකාරීත්වයෙහි වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ දී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකාරීත්වයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විට දී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ

නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම සහ අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකාරිත්වයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම පාලනය සතු වගකීමකි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) වගන්තිය ප්‍රකාර ව, අධිකාරියේ වාර්ෂික සහ අවර්තක මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමට හැකි වන පරිදි අධිකාරිය විසින් සිය ආදායම්, වියදම්, වත්කම්, සහ වගකීම් පිළිබඳ නිසි ගිණුම් සහ වාර්තා පවත්වා ගෙන යා යුතු ය.

1.5 මූල්‍ය ප්‍රකාශ විගණනය කිරීම සඳහා විගණකාධිපතිවරයා සතු වගකීම්

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශ, වංචා සහ වැරදි නිසා ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ සහතික කිරීමක් ලබා ගැනීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාවක් නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික කිරීමක් යනු ඉහළ මට්ටමේ සහතික කිරීමක් වන නමුත්, එමගින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයක් සිදු කිරීමේ දී සෑමවිට ම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශ ඇති විට ඒවා අනාවරණය කෙරෙන බවට සහතික කිරීමක් ලබා නොදේ. වංචා සහ වැරදි හේතුවෙන් සාවද්‍ය ප්‍රකාශ ඇති විය හැකි අතර, මේවායේ බලපෑම් තනි හෝ සාමූහික ලෙස මූල්‍ය ප්‍රකාශ පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් කල හැකි බවට අපේක්ෂා කෙරේ නම් ප්‍රමාණාත්මක ලෙස සලකනු ලබයි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව විගණනයක කොටසක් වශයෙන් මා විසින් වෘත්තීය විනිශ්චය ක්‍රියාත්මක කරන ලද අතරම විගණනය පුරා වෘත්තීය විචක්ෂණභාවය පවත්වා ගන්නා ලදි. එසේම මා විසින්:

- වංචා හෝ දෝෂයක් හේතුවෙන් මූල්‍ය ප්‍රකාශවල ඇති වන ප්‍රමාණාත්මක වැරදි අර්ථකථනයක අවදානම හඳුනාගෙන ඒවා තක්සේරු කිරීම, එම අවදානම්වලට ප්‍රතිචාර දක්වන විගණන ක්‍රියා පටිපාටි සැලසුම් කිරීම සහ ඉටු කිරීම සහ මාගේ මතයට පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම සිදු කරන ලදී. කුමන්ත්‍රණ, ව්‍යාජ ලිපි ලේඛන, හිතාමතා පැහැර හැරීම්, සාවද්‍ය අර්ථ නිරූපණ හෝ අභ්‍යන්තර පාලනය අභිබවා යාම වැනි දෑ වංචාවට සම්බන්ධ විය හැකි බැවින් වංචාව නිසා ඇති වන සාවද්‍ය ප්‍රකාශ හදුනා ගැනීම වැරදීමක් නිසා ඇති වන සාවද්‍ය ප්‍රකාශයක් හදුනා ගැනීමට වඩා අසීරු වේ.
- අවස්ථාවෝචිත පරිදි සුදුසු විගණන ක්‍රියා පටිපාටි සැලසුම් කිරීම සඳහා විගණනයට අදාළ අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබා ගනු ලැබුව ද, එසේ සිදු කරන්නේ සමාගමේ අභ්‍යන්තර පාලනයෙහි ඵලදායීතාවය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අරමුණින් නොවේ.

මූල්‍ය ප්‍රකාශන
විගණකාධිපතිගේ වාර්තාව 2023

- භාවිත කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල යෝග්‍යතාව සහ කළමනාකාරිත්වය විසින් කරන ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සහ ඊට සම්බන්ධ අනාවරණය කිරීම්වල සාධාරණත්වය පිළිබඳ ඇගයීම සිදු කෙරේ.
- කළමනාකාරිත්වය ගිණුම්කරණයේ අඛණ්ඩ පැවැත්මේ පදනම යොදා ගැනීමේ යෝග්‍යතාව පිළිබඳව නිගමනය කරනු ලබන අතර, ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව, සමාගමට අඛණ්ඩ පැවැත්මක් ඇති වීමේ හැකියාව පිළිබඳ සැලකිය යුතු සැකයක් ඇති කරන සිදුවීම් හෝ කොන්දේසිවලට අදාළව ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවක් පවතින්නේ ද යන්න තීරණය කරමි. ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවක් පවතින බවට මා නිගමනය කරන්නේ නම්, මූල්‍ය ප්‍රකාශවල අදාළ අනාවරණයන් පිළිබඳව මවිසින් මගේ විගණන වාර්තාවේ අවධානය යොමු කිරීම අවශ්‍ය වන අතර, නැතහොත් එවැනි අනාවරණය කිරීම් ප්‍රමාණවත් නොවේ නම්, මගේ මතය වෙනස් කිරීම සිදු කළ යුතුය. මගේ නිගමනය පදනම් වී ඇත්තේ මගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගත් විගණන සාක්ෂි මත ය. කෙසේ වෙතත්, අනාගත සිදුවීම් හෝ තත්ත්වයන් අධිකාරියේ අඛණ්ඩව පැවැත්ම නැවැත්වීමට හේතු විය හැක.
- අනාවරණය කිරීම් ඇතුළුව මූල්‍ය ප්‍රකාශවල සමස්ත ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය සහ මූල්‍ය ප්‍රකාශ මඟින් එහි ඇතුළත් ගනුදෙනු සහ සිදුවීම් පිළිබඳ සාධාරණ ඉදිරිපත් කිරීමක් සිදු කර ඇති ද යන්න තක්සේරු කිරීම සිදු කරනු ලැබේ.

මගේ විගණනයේ දී මා හඳුනා ගන්නා, අනෙකුත් කාරණා, අභ්‍යන්තර පාලනයේ සැලකිය යුතු අඩුලුහුඬුකම් ද ඇතුළුව විගණනයේ සැලකිය යුතු සොයා ගැනීම් සම්බන්ධයෙන් පාලනය භාරව සිටින අය සමඟ මම සන්නිවේදනය කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතා සඳහා නිශ්චිත විධිවිධාන ඇතුළත් ය.
මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා වන පදනමේ විස්තර කර ඇති කරුණුවල බලපෑම හැරුණු කොට, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගෙන ඇති අතර, මගේ පරීක්ෂණයට අනුව, අධිකාරිය විසින් 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ අවශ්‍යතා අනුව නිසි පරිදි ගිණුම් වාර්තා පවත්වා ගෙන ඇත.

2.1.2 මූල්‍ය ප්‍රකාශ, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ අවශ්‍යතා අනුව පෙර වර්ෂයට අනුකූලව ඉදිරිපත් කර ඇත.

2.1.3 ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශයේ, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ අවශ්‍යතාවන්ට අනුව පෙර වර්ෂයේ මගේ වාර්තාවේ මා විසින් තත්ත්වාගණනය කළ මතය සඳහා වන පදනමේ විස්තර කරන ලද සියලු නිර්දේශ අන්තර්ගත වේ.

2.2 අනුගමනය කරන ලද ක්‍රියා පටිපාටි මත පදනම්ව සහ ලබාගත් සාක්ෂි ප්‍රමාණවත් කරුණුවලට පමණක් සීමා වූ අතර, පහත කිසිවක් මගේ අවධානයට යොමු වී නැත.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතෙහි 12 (ඈ) වගන්තියේ අවශ්‍යතාව ප්‍රකාරව, අධිකාරියේ සාමාන්‍ය පාලන කටයුතුවලින් බැහැරව, අධිකාරිය විසින් ඇති කරගත් ඕනෑම කොන්ත්‍රාත්තුවක් සඳහා එහි පාලන මණ්ඩලයේ ඕනෑම සාමාජිකයෙකුට සෘජු හෝ වක්‍ර උනන්දුවක් ඇති බව ප්‍රකාශ කිරීම.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතෙහි 12 (ඊ) වගන්තියේ අවශ්‍යතාව ප්‍රකාරව, අධිකාරියේ පාලන මණ්ඩලය විසින් නිකුත් කරන ලද කවර ආකාරයකින් හෝ අදාළ විය හැකි ලිඛිත නීතියකට, සාමාන්‍ය සහ විශේෂ විධානයන්ට අධිකාරිය අනුකූල වී නොමැති බව ප්‍රකාශ කිරීම, පහත සඳහන් දෑ හැර;

	නීතිය/මඟපෙන්වීම සඳහා යොමුව	**අනුකූල නොවීම**
(අ)	2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරි පනත	
	(i) 7 (ඇ) වගන්තිය	ශ්‍රී ලංකාවේ ගුවන්සේවා සංවර්ධන සැලසුම අධිකාරිය විසින් සකස් කළ යුතු වුව ද, එය මෙම වාර්තා කරන දිනය වනවිටත් සකස් කර සහ හෝ අනුමත කරගෙන නොතිබුණි.
	(ii) 7 (උ) වගන්තිය	අධිකාරිය විසින් 2010 අංක 14 දරන සිවිල් ගුවන්සේවා පනතේ 56 වන වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ කාර්ය මණ්ඩලයෙන් සමන්විත ගුවන්යානා විමර්ශන මණ්ඩලයක් (මණ්ඩලය) පත් කිරීමෙන් ශ්‍රී ලංකා දේශ සීමාව තුළ සිදු වන ගුවන්යානා හදිසි අනතුරු පිළිබඳ විමර්ශන ආරම්භ කළ යුතු ය. කෙසේ වෙතත්, එවැනි මණ්ඩලයක් පත් කිරීමකින් තොරව, අධිකාරිය විසින් 2006, 2009 සහ 2010 වර්ෂවල දී පිළිවෙළින් රු. මිලියන 20ක්, රු. මිලියන 10ක් සහ රු. මිලියන 20ක් හදිසි අනතුරු අරමුදලට වියකතු කොට ඇත. මේ සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය විසින් ගන්නා ලද 2016 ජූලි 26 දිනැති අංක cp/16/375/709/063 දරන තීරණය මඟින් ශ්‍රී ලංකා ගුවන්යානා හදිසි අනතුරු විමර්ශන කාර්යාංශයක් පිහිටු වීමට තීරණය කර ඇති අතරම, කාර්යාංශයට කාර්ය මණ්ඩලයක් ද සහිත ව සභාපතිවරයකු පත් කිරීමටත්, ඒ සමඟම රේඛීය අමාත්‍යාංශ අය වැයෙන් හෝ අධිකාරියෙන් රුපියල් මිලියන 50ක ප්‍රතිපාදන වෙන් කිරීමටත්, 2010 අංක 14 දරන සිවිල් ගුවන්සේවා පනත සංශෝධනය කිරීමටත් විසින් අනුමැතිය ලබා දී ඇත. කෙසේ වෙතත්, කැබිනට් තීරණයේ උපදෙස් පිළිපැදීමට අධිකාරිය කිසිදු පියවරක් ගෙන නොමැත.

මූල්‍ය ප්‍රකාශන
විගණකාධිපතිගේ වාර්තාව 2023

	නීතිය/මඟපෙන්වීම සඳහා යොමුව	අනුකූල නොවීම
	(iii) 9 වන වගන්තිය	2016 වර්ෂයේ ගැසට් නිවේදයේ දෙවන උපලේඛනයේ සඳහන් ගගන යාත්‍රාංගණ 14 සහ තුන වන උපලේඛනයේ සඳහන් ගුවන්ගමන් පහසුකම් 8 සහ ඊට සම්බන්ධ ඉඩමේ වත්කම් පිළිබඳ නියෝග යක් නිකුත් කිරීමට අධිකාරිය විසින් කටයුතු කර නොතිබුණි. එසේ වුව ද, පනත සකස් කර වසර 21ක් ගත වී තිබුණ ද පනතේ සඳහන් කර ඇති ගුවන්තොටුපොල 10 ගැසට් කිරීම සඳහා ක්‍රියාමාර්ග යක් ගෙන නොතිබුණි.
	(iv) 9 වන වගන්තිය සහ 2017 දෙසැම්බර් 21 වන දිනැති අංක 2050/38 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය (අති විශේෂ)	2019 අප්‍රේල් 02 දිනැති අංක CP/19/2008/105/009-1 මඟින් අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී ලබා දෙන ලද අනුමැතිය සහ ගැසට් පත්‍රය ප්‍රකාරව යාපනය ගුවන්තොටුපොල සිවිල් ගුවන්සේවා අධිකාරිය වෙත පැවරුවද එය ජාත්‍යන්තර ගුවන්තොටුපොලත් විශයෙන් මෙහෙයුම් ආරම්භ කරන ලද්දේ 2019 ඔක්තෝබර් 17 වන දින ය. අධිකාරිය විසින් යාපනය ගුවන්තොටුපොළේ අක්කර 2962.18ක් වන ඉඩමේ මායිම් හඳුනා ගැනීමේ ක්‍රමවේදය සම්පූර්ණ කර නොතිබුණු අතරම, එය මෙම වාර්තාවේ දිනය වන තෙක්ම ගැසට් නිවේදනයක් මඟින් නිකුත් කර නොතිබුණි.
ආ)	1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල (සේ.අ.අ.) පනතේ 47 වන වගන්තිය, 1980 අංක 16 දරන සේවක භාරකාර අරමුදල (සේ.භා.අ) පනතේ 44 වන වගන්තිය හා 2013 සැප්තැම්බර් 11 දිනැති අංක 02/2013 දරන රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛය	සේ.අ.අ. සහ සේ.භා.අ. පනත්වල අර්ථ දක්වා ඇති ඉපැයීම්වලට අමතර ව, සේ.අ.අ. සහ සේ.භා.අ. සඳහා දක්වන දායකත්වය ගණනය කිරීමේ දී අධිකාරිය විසින් විවිධ ආකාරයේ වූ දීමනා වර්ග 7ක් ඊට ඇතුළත් කර ඇත. මෙම සදොස් ගණනය කිරීම හේතුවෙන් නියැදි විගණන කාල පරිච්ඡේදය වන 2023 -2022 වර්ෂවල දී රු. 125,145,338 මුදලක් සේවක අර්ථසාධක අරමුදලටත් රු. 15,017,440 මුදලක් සේවක භාරකාර අරමුදලටත් වැඩිපුර බැර කර ඇත.

	නීතිය/මඟපෙන්වීම සඳහා යොමුව	**අනුකූල නොවීම**
ඇ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2023 ජනවාරි 11 දිනැති අංක 2314/16 දරන ගැසට් පත්‍රයේ (අති විශේෂ) 4 (1) වගන්තිය	අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරන ලද පරිදි චිකතු කළ යුතු අපගමන ආදායම සඳහා සුරැකුම්පත් ලෙස බැංකු ඇපකරයක් හෝ රු 3,776,266,598ක මුදලක් ගුවන් සමාගම් 7ක් විසින් සපයා නොතිබුණි.
ඈ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2008 මැයි 22 දිනැති අංක 1550/7 දරන (අති විශේෂ) ගැසට් පත්‍රයේ 07 සහ 08 රෙගුලාසි සහ 2023 නොවැම්බර් 28 දිනැති අංක 23/1937/628/094 දරන අමාත්‍ය මණ්ඩල තීරණය	ගැසට් පත්‍රයෙන් නියම කර ඇති පරිදි චිකතු කළ එතෙර විකිණුම් අධිභාරය (OSS) ඒකාබද්ධ අරමුදලට බැර විය යුතු ය. කෙසේ වෙතත්, අධිකාරිය විසින් එතෙර විකිණුම් අධිභාරය ඒකාබද්ධ අරමුදලට බැර නොකර ගැසට් නිවේදනය ආරම්භයේ සිට ම අධිකාරියේ ආදායම වශයෙන් පිළිගෙන ඇත. තව දුරටත්, 2023 නොවැම්බර් 28 දිනැති අංක 23/1937/628/094 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අදාළ අධිභාරය ඒකාබද්ධ අරමුදලට බැර කරන ලෙස අමාත්‍ය මණ්ඩලය විසින් ද අධිකාරිය වෙත නියම කරන ලදි. ඒ අනුව රඳවාගත් ඉපැයීම් ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කරන ලෙස භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව අධිකාරියට උපදෙස් දී තිබුණි. කෙසේ වුව ද, මෙම වාර්තාව නිකුත් කරන දිනය වන විටත් රඳවා ගත් ඉපැයීම් අධිකාරිය විසින් ප්‍රේෂණය කරනු ලැබ නොතිබුණි.
ඉ)	2003 ජුනි 02 දිනැති අංක PED /12 දරන රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛයේ 6.6 වගන්තිය 2021 නොවැම්බර් 16 දිනැති 01/2021 චක්‍රලේඛයේ 6.5.1 වගන්තියෙන් සංශෝධිත පරිදි රාජ්‍ය සතු ව්‍යවසායන් සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශ නිකුත් කරන ලදි.	සමාලෝචනය සිදු කෙරෙන වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශ මූල්‍ය වර්ෂය අවසන් වී දින 60ක් ඇතුළත විගණකාධිපතිවරයා වෙත යැවිය යුතු වුවද කෙසේ වෙතත්, මූල්‍ය ප්‍රකාශය විගණනය වෙත යවා ඇත්තේ 2024 ජුනි 24 දින, එනම් දින 116ක ප්‍රමාදයක් සහිතවය.

මූල්‍ය ප්‍රකාශන
විගණකාධිපතිගේ වාර්තාව 2023

	නීතිය/මඟපෙන්වීම සඳහා යොමුව	අනුකූල නොවීම
ඊ)	2023 දෙසැම්බර් 05 දිනැති අංක CP23/2271/604/221 දරන අමාත්‍ය මණ්ඩල තීරණය සහ 2023 දෙසැම්බර් 11 දිනැති අංක PED 04/2023 දරන රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛය	2022 වර්ෂයේ දී අධිකාරිය විසින් ශුද්ධ ලාභයක් උපයා ඇති බව අමාත්‍ය මණ්ඩල සංදේශයේ සඳහන් කර තිබුණ ද අධිකාරිය විසින් එම ශුද්ධ ලාභය ගණනය කර ඇත්තේ ඒකාබද්ධ අරමුදලට බැර විය යුතු එතෙර විකිණුම් අධිභාරයද අධිකාරියේ (OSS) ආදායම යටතට ගනිමිනි. ඒ අනුව 2022 පාදක වර්ෂයේ සිට රු. 9,060,561ක ප්‍රසාද දීමනාවක් ගෙවීමට නොහැකි අතර, රු. 633,190,535ක අලාභයක් ලබා ඇත.
උ)	අංක 04/2023 දරන PED චක්‍රලේඛය	අංක 04/2023 දරන PED චක්‍රලේඛය ප්‍රකාරව, පැමිණීම, කාර්ය සාධනය හෝ වෙනත් ඕනෑම ආකාරයක දිරිගැනවීමක් සඳහා කිසිදු දිරි දීමනාවක් නොගෙවන ආයතන සඳහා ඉහත ප්‍රසාද දීමනාව ගෙවීමට අධිකාරියට හැකි වුව ද, අධිකාරිය විසින් එම ප්‍රසාද දීමනාවට අමතර ව රු. 63,165,455ක මුදලක් දීමනා වශයෙන් ගෙවා ඇත.
ඌ)	2021 නොවැම්බර් 17 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛය	
	(i) 2.3 වගන්තිය	අධිකාරියේ කාර්ය පටිපාටික අත්පොත් අවම වශයෙන් වසර 5කට වරක් හෝ සමාලෝචනය කර යාවත්කාලීන කළ යුතු වුව ද, අධිකාරියේ අත්පොත් 44ක් මෙම වාර්තාව නිකුත් කරන දිනය වන විටත් යාවත්කාලීන කර නොමැත.
	(ii) 3.2 වගන්තිය	චක්‍රලේඛයේ විධිවිධානවලට පටහැනිව, විශේෂ දීමනා, කළමණාකරණ දීමනා සහ අතුරු දීමනා ලෙස රු. 73,103,022ක මුදලක් කළමනාකරණ සේවා දෙපාර්තමේනතුවේ අනුමැතිය රහිතව අධිකාරියේ නිලධාරීන් වෙත ගෙවා ඇත.

	නීතිය/මඟපෙන්වීම සඳහා යොමුව	අනුකූල නොවීම
එ)	2022 අගෝස්තු 08 දිනැති අංක 04/2022 දරන රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛයේ 2.8 මඟපෙන්වීම	අධිකාරිය උත්සව කටයුතුවලට අදාළව කිසිදු වියදමක් නොදැරිය යුතු වුව ද, සමාලොචනය සිදු කරන වර්ෂය තුළ දී අධිකාරිය විසින් රු. 1,152,344ක මුදලක් උත්සව කටයුතු සඳහා වැය කර ඇත.
ඒ)	මූල්‍ය රෙගුලාසි 101, 103 සහ 104	වීරවිල සංචාරක බංගලාවෙහි කොටසකට 2022 මැයි 18 වන දින ඇති වූ ගින්නකින් හානි සිදු වී ඇති අතර, සංචාරක බංගලාව කළමනාකරණය සහ නඩත්තු කිරීමේ සේවා සපයන්නා අධිකාරියේ උපදෙස් පරිදි කටයුතු කර නොතිබූ අතර ඒ පිළිබඳ මූල්‍ය රෙගුලාසිවලට අනුව අධිකාරිය පියවර ගෙන නොතිබුණි.
ඔ)	2015 අප්‍රේල් 09 දිනැති අංක DMS/1748 දරන මූදල් අමාත්‍යාංශයේ ලේකම්ගේ ලිපිය	තාක්ෂණික දීමනාව වලංගු බලපත්‍රයක් හෝ සහතිකයක් ඇති නිලධාරීන්ට පමණක් ගෙවිය යුතු වුව ද, අධිකාරිය විසින් රු. 32,033,682ක තාක්ෂණික දීමනාවක් වලංගු බලපත්‍ර හෝ සහතික ඇති බවට තහවුරු නොකළ නිළධාරීන් 27 දෙනෙකුට ලබා දී ඇත.
ඕ)	කාර්ය මණ්ඩල අත්පොත සහ පරිපාලන රීති (i) 5.2.6 සහ 5.2.8 වගන්තිය	අධිකාරියේ සෑම තනතුරක් සඳහාම මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගත යුතු මෙන්ම, අධිකාරියේ ඉල්ලීම පරිදි තාවකාලික තනතුරක් ඇති කිරීමට මහා භාණ්ඩාගාරයට හැකි වුව ද, අධිකාරිය විසින් සමාලෝචනය සිදු කරන වර්ෂය තුළ දී නිලධාරීන් 13 දෙනෙකු පත් කර මහා භාණ්ඩාගාරයේ අනුමැතිය නොමැතිව රු. 44,990,350ක දීමනාවක් ගෙවා ඇත.

මූල්‍ය ප්‍රකාශන
විගණකාධිපතිගේ වාර්තාව 2023

නීතිය/මඟපෙන්වීම සඳහා යොමුව	**අනුකූල නොවීම**
(ii) 14.5.1 සහ 14.8.2 (IV) වගන්තිය	දේපල සහ වාහන ණය සඳහා පොළී අනුපාතය සියයට 7ක් විය යුතු වුව ද, අධිකාරිය විසින් අත්පොත ආරම්භයේ දී අය කර ඇතිතේ සියයට 4.2ක් පමණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, 2022 සහ 2023 වර්ෂවල දී පිළිවෙළින් රු. 2,108,585ක සහ රු. 1,792,073ක ණය පොළී ආදායමක් අධිකාරියට අහිමි වී ඇති බව නියැදි විගණනයෙන් හෙළි විය.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතෙහි අංක 12 (ඇ) වගන්තියේ අවශ්‍යතාව ප්‍රකාරව, අධිකාරිය එහි බලතල, කාර්යයන් සහ රාජකාරි ඉටු කර නොමැති බව ප්‍රකාශ කිරීමත පහත සඳහන් දෑ හැර;

අධිකාරියේ මාණ්ඩලික අත්පොත සහ පරිපාලන රීතිවල 14 වගන්තිය ප්‍රකාරව අධිකාරියේ ආයතනික පාලනයේ රීති කාර්ය මණ්ඩල රීති, පරිපාලන රීති සහ මූල්‍ය රීති යන ප්‍රධාන කොටස් තුනෙන් සමන්විත වේ. අත්පොතට අනුව ආයතනික රීති සහ මූල්‍ය රීති වෙන වෙනම නිකුත් කළ යුතු වුව ද, මූල්‍ය රීති 44ක් මෙම වාර්තාව නිකුත් කරන දිනය දක්වාම නිකුත් කර නොමැත.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතෙහි 12 (ඈ) වගන්තියේ අවශ්‍යතාව ප්‍රකාරව, අදාළ නීතිවලට අනුකූලව සහ කාල රාමු තුළ දී සමාගමේ සම්පත් ආර්ථිකව, කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස ලබාගෙන භාවිත කර නොමැති බව ප්‍රකාශ කිරීමත පහත සඳහන් දෑ හැර;
ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය (අධිකාරිය) විසින් අයවැයෙන් වෙන් කළ රු. මිලියන 7.5 ඉක්මවමින්, වීරවිල සංචාරක බංගලාව ප්‍රතිසංස්කරණය සඳහා රු. 24,217,285ක් වියදම් කරනු ලැබ ඇත. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට පටහැනිව මෙම ව්‍යාපෘතිය තනි ලංසුකරුවකුට ප්‍රදානය කර ඇත. එසේම, දෙපාර්ශ්වය විසින් විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් අත්සන් කර නොමැත.

කොන්ත්‍රාත්තුව 2022 මැයි 18 වන දින ප්‍රදානය කළ නමුත්, අතරමැද මාස 10ක කාලය තුළ අමුද්‍රව්‍ය මිල සැලකිය යුතු ලෙස ඉහළ ගිය ද, කොන්ත්‍රාත්කරු විසින් මුල් ලංසු මිලටම එහි කටයුතු ආරම්භ කර ඇත්තේ 2023 මාර්තු 13 දින ය. කොනත්‍රාත්කරු විසින් සිදු කළ රු. 2,193,750ක අතිරේක කාර්ය සඳහා විධිමත් අතිරේක අරමුදල් ඉල්ලීමක් නොමැති ව සම්පූර්ණ කරන ලද අතර, මෙම කාර්යය තාක්ෂණික ඇගයීම් කමිටුව (TEC) හෝ ප්‍රසම්පාදන කමිටුව (PC) මඟින් අනුමත කර නොමැත. තව ද, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 8.12.2 මඟින් අවශ්‍ය පරිදි සම්පූර්ණ කිරීමේ සහතිකයක් ද ලබා දී නොමැත. 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනතේ 11 (1) වගන්තියට අනුව කොන්ත්‍රාත් ලියාපදිංචි සහතිකය ලබා ගෙන නොමැති අතර, කාර්යය අවසන් කිරීමට පෙර කොනත්‍රාත්කරුගේ කාර්ය සාධන සහතිකය කල් ඉකුත් වී තිබුණි. ඊට අමතරව, සනීපාරක්ෂක උපකරණ සැපයීම සහ සවි කිරීම සඳහා රු. 1,792,000ක ගෙවීමක් එහි නිශ්චිත අවශ්‍යතා සපුරාලීමකින් තොරව සිදු කර ඇත.

2.3 වෙනත් කරුණු

ඇ) 2023 ජනවාරි 12 වන දින සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරන ලද අංක EL/01/2023 දරන මඟපෙන්වීමේ 9 වන ඡේදයට අනුව, අපගමන බද්ද එකතු කිරීම සම්බන්ධයෙන් නියමිත කාල සීමාව තුළ ගෙවීම් ප්‍රේෂණය කිරීමට අපොහොසත් වන ගුවන් සමාගම් ඉහත සඳහන් කළ මඟපෙන්වීමේ 6 වන ඡේදයේ දක්වා ඇති පරිදි සෑම ප්‍රමාද දිනයක් සඳහාම ගෙවිය යුතු මුළු මුදලට අමතරව පොලිය ගෙවීම ද අවශ්‍ය වේ. 2023 දෙසැම්බර් 31 වන දිනට, අධිකාරිය විසින් හිඟ අපගමන බදු සඳහා ගුවන් සමාගම් 6ක රු. 1,408,373,439ක ප්‍රමාද පොලියක් ගණනය කර ඇත. කෙසේ වෙතත්, අධිකාරියට තවමත් මෙම වාර්තාවේ දිනය දක්වාම මෙම පොලී අය කිරීම් නොහැකි වී ඇත.

ආ) අධිකාරිය විසින් තාවකාලික මඟී පර්යන්තයක්, ගිනි නිවීමේ ගොඩනැගිල්ලක් සහ පර්යන්ත මාර්ගයක් ඉදි කිරීමට රු. 215,710,963ක මුළු අත්තිකාරම් මුදලක් ගු.ගු.සේ.ස. වෙත ලබා දී ඇත. එහෙත්, යාපනය ජාත්‍යන්තර ගුවන්තොටුපොල ඉදි කිරීම 2020 අගෝස්තු 11 වන දින අවසන් වුව ද, මෙම අත්තිකාරම පියවීම 2023 අගෝස්තු 31 දක්වා සිදු කර නොමැත.

මූල්‍ය ප්‍රකාශන
විගණකාධිපතිගේ වාර්තාව 2023

ඇ) පියාසැරි දිනයේ පවතින විනිමය අනුපාතික මත අපගමන බද්ද ගණනය කරන ගුවන් සමාගම් හතරක අපගමන බදු ඒකතුව රු. 1,504,761,392 කි. මෙය සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කළ EL/01/2023 මඟපෙනවීමේ නිශ්චිත අනුපාතිකයට පටහැනි වේ.

ඈ) 2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරි පනතේ තුන් වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ගුවන් යානා පහසුකම් සහ ඉඩම විධිමත් බදු ගිවිසුමකින් සහ කුලී ගාස්තුවකින් තොරව සීමා සහිත ගුවන්තොටුපොල සහ ගුවන්සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගම විසින් භාවිත කර ඇත.

ඉ) අභ්‍යන්තර ගුවන් ප්‍රවාහන වැඩිදියුණු කිරීමේ ප්‍රයත්නයේ කොටසක් වශයෙන්, රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව (PPP) විධිවිධාන හරහා දිගන, බදුල්ල සහ පුත්තලම යන ප්‍රදේශවල නව අභ්‍යන්තර ගුවන්තොටුපොල තුනක් ස්ථාපිත නිරීමට 2016 අයවැය යොජනා මඟින් සැලසුම් කර ඇත. අධිකාරියට රු. 2,013,605ක් බදුල්ල ගුවන්තොටුපොළේ සමීක්ෂණ සැලසුම් සහ පාරිසරික බලපෑම තක්සේරු කිරීමට (EIA) 2022 දෙසැම්බර් 31 වන දින වන විට යෙදවීමට සිදු විය. කෙසේ වෙතත්, මෙම ගුවන්තොටුපොල තුනේ ඉදි කිරීමේ කටයුතු වර්තමානය වන විට නවතා ඇත.

ඊ) වීරවිල සංචාරක බංගලාවේ කළමනාකරණ හා නඩත්තු කොන්ත්‍රාත්තුව 2016 වසරේ සිට එකම සමාගමක් සමඟ අලුත් කර ඇති අතර අධිකාරිය විසින් රු. 5,960,000ක මුදලක් වලංගු ගිවිසුමක් නොමැතිව ගෙවා ඇත. ඊට අමතරව, රු. 1,155,000ක මුදලක් ප්‍රතිසංස්කරණ කාලය තුළ දී සේවා සැපයුම්කරු වෙත ගෙවා ඇත.



ඩබ්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති.

විගණකාධිපතිගේ වාර්තාවට පිළිතුරු ලිපිය 2023

විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය
බත්තරමුල්ල

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව 2023 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ මූල්‍ය ප්‍රකාශ සහ අනෙකුත් නෛතික සහ නියාමන අවශ්‍යතා පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව.

AAV/B/CAASL/FA/2023/06 දරන 2024 අගෝස්තු 22 දිනැති ඔබේ වාර්තාව හා බැඳේ.

උක්ත වාර්තාවට අදාළ පිළිතුරු පහත පරිදි වේ.

1.2 සුදුසුකම් ලත් මතය සඳහා පදනම

(අ) 2023 අගෝස්තු මස සිට PPE හි ඉඩම් සහ ගොඩනැඟිලි නැවත තක්සේරු කරන ලෙස CAASL විසින් තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා සිටි අතර, මායිම් සහ හිමිකාරිත්වයේ ගැටලු හේතුවෙන් වාර්තා නොනිමි තත්වයේ පවතී.

(ආ) දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් ලැබිය යුතු වැට් බදු ශේෂයෙන් 50%ක් නිෂ්කාෂණය කර ඇති අතර, ශේෂය නිෂ්කාෂණය කිරීමට පසු විපරම් කටයුතු අඛණ්ඩව සිදු කරනු ලබයි. 2024 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශවල ප්‍රතිපාදන සලසනු ඇත.

(ඇ) 2022.10.18 දිනැති ලිපියෙන් සිවිල් ගුවන්සේවා අධිකාරිය මඟින් ඉල්ලා ඇති පරිදි දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් වකතු කරන ලද ආදායම මත සමාජ ආරක්ෂණ දායක බද්ද (SSCL) පිළිබඳ වගකීම පැහැදිලි කර ඇත. රජය විසින් පනවන ලද ව්‍යවස්ථාපිත ගාස්තු සමාජ ආරක්ෂණ දායක බද්දේ වගකීමක් නොවන බව හේතු දක්වන පැහැදිලි කිරීම අනුව, අපගමන බද්දේ සේවා ගාස්තුව, සමාජ ආරක්ෂණ දායක බද්දේ වගකීමක් නොවේ. ඉන් අනතුරුව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව 2023.03.20 දින තවත් ලිපියක් නිකුත් කරමින්, අපගමන බද්දේ සේවා ගාස්තුව, සමාජ ආරක්ෂණ දායක බද්දේ වගකීමක් බව පෙන්වා දුන්නේය. එම ලිපිය මත පදනම්ව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් 2022 ඔක්තෝම්බර් 01 වන දින තක්සේරු නිකුත් කරන ලදී. CAASL තක්සේරු වලට එරෙහිව අභියාචනා ඉදිරිපත් කළ අතර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව අවසන් තීරණය දැනුම් දී නොමැත. තවද, අපගමන බද්ද යනු වැට් බද්ද සහ සමාජ ආරක්ෂණ දායක බද්ද සඳහා වගකිව නොහැකි රජයේ බද්දක් බව මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව මගින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට තහවුරු කර ඇත.

(ඈ) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ විශාල බදු ගෙවීමේ ඒකකය මඟින් ලිපියක් නිකුත් කරමින් වැට් බද්ද සඳහා තක්සේරුවක් නිකුත් කර, අපගමන බද්දේ සේවා ගාස්තුව මත වැට් බද්ද අය කළේය. CAASL රජය වෙනුවෙන් සේවාවක් සපයන බව, අපගමන බද්දේ සේවා ගාස්තුව ව්‍යතිරේක ආදායමක් ලෙස ප්‍රකාශ කිරීම සහ වැට් ප්‍රතිලාභවල සමානුපාතිකව ආදාන බද්ද තහනම් කර ඇත යන සියලු හේතු සපයමින්, තක්සේරුවලට එරෙහිව CAASL විසින් අභියාචනා කර ඇත.

(ඉ) භාණ්ඩාගාරය වෙනුවෙන් අපගමන බදු එකතු කිරීම සහ බෙදා හැරීම සිදු කරමින් CAASL මඟින් ගුවන් සමාගම් සහ භාණ්ඩාගාරය අතර අතරමැදි කාර්යභාරයක් ඉටු කරයි. එබැවින් භාණ්ඩාගාර ජංගම ගිණුම යටතේ ගෙවිය යුතු මුදල් දැක්වේ.

(ඊ) පහත ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කොට ඇත.

අයිතම	වටිනාකම (රු)	ගන්නා ලද ක්‍රියාමාර්ග
DVD ධාවක	28,089.00	මහජන ප්‍රදර්ශනය සඳහා භාවිත කිරීම
15 LCD මොනිටර්	39,136.00	මහජන ප්‍රදර්ශනය සඳහා භාවිත කිරීම

අයිතම	වටිනාකම (රු)	ගන්නා ලද ක්‍රියාමාර්ග
ඇල්කොහොල් පරීක්ෂා කිරීම සඳහා Breath Analyzer	1,705,677.00	මෙය ජපන් ආධාරයකි. මෙකී කාර්යය නිමා කිරීමට ක්‍රියාමාර්ග ගනු ඇත.
KI-8168 Rexton ජීප් රථය	7,650,000.00	මෙකී කාර්යය නිමා කිරීමට ක්‍රියාමාර්ග ගනු ඇත.
YM - 4182 ත්‍රිරෝද රථය	1,000,000.00	මෙකී කාර්යය නිමා කිරීමට ක්‍රියාමාර්ග ගනු ඇත.
එකතුව	10,422,902.00	

(උ) සහ (ඌ) විගණන අධිකාරී වෙත පිටපතක් සමඟ ශේෂ තහවුරු කිරීම් ලබා දෙන මෙන් සියලුම ණය ගැතියන් සහ ණයහිමියන් දැනුවත් කරමින් CAASL විසින් ලිපි යවා ඇත.

මූල්‍ය ප්‍රකාශන
විගණකාධිපතිගේ වාර්තාවට පිළිතුරු ලිපිය 2023

2. අනෙකුත් නෛතික සහ නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.2.2

අදාළ නීතිය/විධානය	විස්තරය
(අ) 2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ පනත	
7 (ඇ) වගන්තිය	සිවිල් ගුවන්සේවා අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2024 පෙබරවාරි 26 වැනි දින පැවති එහි 197 වන මණ්ඩල රැස්වීමේදී ශ්‍රී ලංකාව සඳහා දස අවුරුදු පරිපූර්ණ සැලසුම් රාමුවක් ස්ථාපිත කිරීම සහ ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් කැබිනට් අනුමැතිය ලබා ගැනීමට ජාතික සිවිල් ගුවන්සේවා ප්‍රධාන සැලැස්ම (NCAMP) ඉදිරිපත් කිරීම සඳහා අනුමැතිය ලබා දී ඇත. මේ අතරතුර, සීමාසහිත ගුවන්තොටුපල සහ ගුවන්සේවා (ශ්‍රී ලංකා) විසින් CAMP වෙත යෝජිත සංශෝධනයක් ඉදිරිපත් කර ඇත. CAASL විසින් මේ වන විට සංශෝධනයේ සමාලෝචන සහ විමර්ශන කටයුතු සිදු කරන අතර, යෝජිත වෙනස්කම් සම්පාදනය කිරීමෙන් පසුව, CAMP විසින් ජාතික සැලසුම් කමිටුව වෙත ඉදිරිපත් කරන ලබයි. ඉන්පසුව අනුමැතිය සඳහා කැබිනට් මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ඇත.
7 (උ) වගන්තිය	ස්වාධීන ගුවන්යානා අනතුරු විමර්ශන කාර්යාංශයක් (AAIB) පිහිටුවීමේ කැබිනට් තීරණය, ශ්‍රී ලංකාවේ පැවති ICAO විශ්ව ආරක්ෂණ අධීක්ෂණ විගණනය මගින් දක්වන ලද සොයාගැනීම් වලට ප්‍රතිචාර වශයෙන් රජය විසින් යෝජනා කරන ලද ප්‍රතිශෝධන ක්‍රියාමාර්ගයකි. 2016 වසරේ සිට නීති කෙටුම්පත් සම්පාදකවරයා සමඟ සාකච්ඡා කර එකී නීති සම්පාදනය කිරීමට අවශ්‍ය සියලු පියවර මෙම අධිකාරිය විසින් ගෙන ඇත. එය ක්‍රියා පටිපාටි කිහිපයකින් යුතු දිගු ක්‍රියාවලියක් වූ අතර, මේ වනවිට අවසන් අදියරේ පවතී. AAIB පනත් කෙටුම්පතට අනුව, අමාත්‍ය මණ්ඩල සංදේශයේ දක්වා ඇති සංවිධාන ව්‍යුහය සම්මත කර ගැනීමට ප්‍රතිපාදන පවතී. එමෙන්ම, සිවිල් ගුවන්සේවා විෂය භාර අමාත්‍යවරයාගේ ඡන්දයෙන් වාර්ෂිකව රුපියල් මිලියන පනහක අරමුදලකට ප්‍රතිපාදන පවතී. AAIB පනත් කෙටුම්පතේ 2010 අංක 14 දරන CA පනතේ අදාළ වගන්ති අවලංගු කිරීමට ප්‍රතිපාදන පවතී.
9 වන වගන්තිය	සිවිල් ගුවන්සේවා විෂය භාර අමාත්‍යවරයා විසින් මෙම ගැසට් පත්‍රය සකස් කළ යුතුය. දෙවන සහ තුන්වන උපලේඛනවල සඳහන් කර ඇති ගුවන් තොටුපලවල් 4ක් සහ ගුවන්සේවා පහසුකම් අනුයුක්ත ඉඩම් 6ක් පමණක් ගැසට් කර ඇත. අනෙකුත් ගුවන්තොටුපල හමුදා කටයුතු සඳහා භාවිත වේ. දැනට සිවිල් කටයුතු සඳහා ක්‍රියාත්මක වන දෑ පමණක් ගැසට් කර ඇත.
iv) 9 වන වගන්තිය	1950 වර්ෂයේදී සිවිල් ගුවන්සේවා දෙපාර්තමේන්තුව විසින් ගුවන් යාත්‍රාංගණයක් පිහිටුවීම සඳහා හෙක්ටයාර් 141.6296 (ආසන්න වශයෙන් අක්කර 349) භූමි ප්‍රමාණයක් අත්පත් කර ගන්නා ලදී. ඉන් අනතුරුව 1986 වර්ෂයේදී ගුවන් යාත්‍රාංගණය පුළුල් කිරීම සඳහා හෙක්ටයාර් 261.7365ක් (ආසන්න වශයෙන් අක්කර 646ක්) ශ්‍රී ලංකා ගුවන් හමුදාවට පවරා ගන්නා ලදී. කෙසේ වෙතත්, මෙම ඉඩම් සඳහා අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය තවමත් අසම්පූර්ණ තත්වයේ පවතී. විගණන වාර්තාවේ සඳහන් අක්කර 2,962.18 ක භූමි ප්‍රමාණය සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාව අත්පත් කරගත් ඉඩම් ඇතුළත් වේ. මීට අමතරව ඉඩම්වල මායිම් සඳහන් නොකර පලාලි ගුවන්තොටුපොල පිළිබඳ 2019.09.26 දිනැති අංක 2142-74 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය ප්‍රකාශයට පත් කර ඇත. එබැවින්, මෙම අධිකාරිය විසින් සිවිල් ගුවන්සේවා දෙපාර්තමේන්තුවට පවරා ගත් ඉඩම්, සහ මායිම් නැවත ගැසට් කිරීමට කෙටුම්පතක් සකස් කර ඇති අතර, එම ලේඛනය නෛතික සමාලෝචනය සඳහා යොමු කොට ඇත. විගණන වාර්තාවේ සඳහන් පරිදි, සිවිල් ගුවන්සේවා දෙපාර්තමේන්තුවට පවරාගෙන ඇති ඉඩම් අක්කර 349 ලියාපදිංචි කිරීමට මෙම අධිකාරිය පියවර ගෙන ඇත. මුළු අක්කර 2,962.18 න් ඉතිරි කොටස මෙම අධිකාරියට අයත් නොවේ.

අදාළ නීතිය/විධානය	විස්තරය
(ආ) 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදලේ පනතේ 47 වැනි වගන්තිය සහ 1980 අංක 16 දරන සේවක භාර අරමුදල් පනතේ 44 වැනි වගන්තිය සහ 2013 සැප්තැම්බර් 11 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය	ආරම්භයේ පටන් අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද මාණ්ඩලික සහ පරිපාලන නීති (SLCAP 5000) සංග්‍රහයේ 4.7 වගන්තියට අනුව මුළු සේවක වේතනයෙන් EPF සහ ETF වෙත CAASL දායක වේ. විගණන විමසුම, 2024 මැයි 02 වැනි දින පැවති 199 වැනි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට සමාලෝචනය සඳහා ඉදිරිපත් කර ඇත. මණ්ඩලය විසින් පහත සඳහන් තීරණය ගන්නා ලදී. විගණකාධිපතිවරයාගේ නිගමනයට මණ්ඩලය 100%ක් එකඟ විය. එමෙන්ම, විගණකාධිපති විසින් 2024/04/02 දිනැති ලිපිය මඟින් නිශ්චිතව දක්වා ඇති පරිදි, විගණකාධිපතිවරයා විසින් නියම කර ඇති දිමනා හැර, 2024 අප්‍රේල් මාසයේ සිට ඉක්බිතිව ඉදිරියට ක්‍රියාත්මක වන ලෙස, 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදලේ පනතට සහ 1980 අංක 16 දරන සේවක භාර අරමුදල් පනතට පටහැනි දිමනා ගණනය කිරීම මඟින් EPF සහ ETF වෙත දායකත්වය රඳවා ගැනීමට තීරණය කරන ලදී. ඉහත කරුණ (1) ක්‍රියාත්මක කරමින් වෘත්තීය දිමනා, විශේෂ දිමනා, කළමනාකරණ දිමනාව සහ අතුරු දිමනාව "ඉපැයීම්" යටතේ ඇතුළත් වන්නේද යන්න පිළිබඳව මතය විමසීමට කම්කරු කොමසාරිස් වෙත සන්නිවේදනය කිරීම. විගණකාධිපති විසින් නිර්දේශිත පරිදි ව්‍යවස්ථාපිත බැඳීම්වලට අනුකූල වීම සහතික කිරීම සඳහා 2013/සැප්තැම්බර් 11 දිනැති අංක 02/2013 දරන PED චක්‍රලේඛයට අනුව EPF සහ ETF අඩුකිරීම් සහ ප්‍රේෂණ පිළිබඳ විස්තර සෑම මසකම මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම. CAASL විසින් මණ්ඩලයේ තීරණය ක්‍රියාත්මක කෙරුණි.
(ඇ) 2023 ජනවාරි 11 දිනැති අංක 2314/16 දරන ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ (අති විශේෂ) ගැසට් පත්‍රය	අපගමන බද්ද සඳහා ආරක්ෂක තැන්පතුවක් ලෙස ගුවන් සමාගම් විසින් බැංකු ඇපකර ලබා දී ඇත. සඳහන් කළ ගුවන් සමාගම් ලැයිස්තුව සඳහා කාලසටහන් අනුමැතිය ලබා ගැනීමෙන් පසු සක්‍රීයව ක්‍රියාත්මක නොවෙන ඇපකරය සඳහා මුදල් තැන්පතු කළ, සහ ලබා දී ඇති බැංකු ඇපකරය කල් ඉකුත් වීමට මාසයකට වඩා වැඩි කාලයක් පැවතීම යන කරුණු ඇතුළත් විය.
(ඈ) 2008 මැයි 22 දිනැති අංක 1550/7 දරන (විශේෂ) ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ 07 වන සහ 08 වන රෙගුලාසි සහ 2023 නොවැම්බර් 28 දිනැති අංක 24/1937/628/094 දරන කැබිනට් තීරණය	2008 අංක 1 දරන ගුවන් ප්‍රවාහන (මඟී) තීරුබදු රෙගුලාසිවල 8 වැනි වගන්තියේ "සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිශ්චිතව දක්වා ඇති ආකාරයට එම අධිභාරය ඒකාබද්ධ අරමුදලට බැර කරන්න" යනුවෙන් සඳහන් වේ. 2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ පනත මඟින් CAASL ස්ථාපිත කළ අතර, මින් ඉදිරියට එහි අරමුදලේ (12 වැනි වගන්තිය) 'ප්‍රධාන පනත්' යනුවෙන් හැඳින්වේ. සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල් (DGCA) විසින් මෙම පනතේ 12 (2) (ඇ) වගන්තිය ප්‍රකාරව එයාර්ලයින්ස් ආයතනයෙන් විදේශ විකුණුම් අධිභාරය (OSS) ලෙස එකතු කරන ලද මුදල් අධිකාරියේ අරමුදලට බැර කර ඇත. 2010 අංක 14 දරන සිවිල් ගුවන්සේවා පනතේ 126 (2) (ආ) වගන්තියට අනුව විධිවිධාන අවලංගු කර තිබියදීත්, 1992 අංක 55 දරන ගුවන් සංතරණ (විශේෂ විධිවිධාන) පනතට අනුව ඉහත සඳහන් කළ නියාමනය ගැසට් කර ඇත. 2002 අංක 34 දරන CAASL පනතේ 12 (2) (ඇ) වගන්තියේ විධිවිධාන මඟින් එහි අයදුම් කිරීම සහ බලාත්මක කිරීම සීමා කළ යුතුය. එබැවින්, අධිකාරියේ අරමුදල හැර භාණ්ඩාගාරයට එකතු කිරීම සහ සෘජුවම ප්‍රේෂණය කිරීම සඳහා කිසිදු එකතු කිරීමේ ගිණුමක් පවත්වාගෙන යාමට DGCA හට බලතල නොමැත. ඉහත අධිභාරය තීරුබදු හෝ බද්දක් නොවන බැවින් එය කිසිදු මුදල් පනතක් යටතේ ගැසට් කර නොතිබුණි. මෙම නෛතික ප්‍රතිපාදනය පසුගිය දශක දෙකක කාලය තුළ අනුප්‍රාප්තික DGCA විසින් භාවිත කර ඇත.

මූල්‍ය ප්‍රකාශන

විගණකාධිපතිගේ වාර්තාවට පිළිතුරු ලිපිය 2023

අදාළ නීතිය/විධානය	විස්තරය

2002 අංක 34 දරන CAASL පනතේ විධිවිධාන වලින් බැහැර වීමට DGCA හට අභිමත බලයක් නොමැති බැවින් එකී ප්‍රධාන පනතට අනුව එහි විධිවිධාන වලට අනුකූල වීමට ඔහු බැඳී සිටී. 2002 අංක 34 දරන CAASL පනතේ (12 වැනි වගන්තිය) විධිවිධාන වලින් අපගමනය වීම, DGCA විසින් සිදු කළ උල්ලංඝනය කිරීමක් ලෙස සලකනු ලබන අතර, පනවන ලද නීතියේ අදාළ විධිවිධාන වලට අනුව නීති විරෝධී වේ. ඒ අනුව 2008 වර්ෂයේ සිට 2022 දක්වා කාලය තුළ අධිකාරියට ලැබුණු රුපියල් 16,981,667,778/- OSS එකතුව අද දක්වා ආදායම් ප්‍රකාශනවල නියෝජනය කර ඇති අතර, එය අධිකාරියට ආදායමක් ලෙස සලකනු ලැබේ. අධිකාරියට ලැබී ඇති OSS ආදායමේ සාරාංශය පහත පරිදි වේ.

CAASL ආරම්භයේ සිට, එහි අධ්‍යක්ෂමණ්ඩල සාමාජිකයින්ගේ නිසි අනුමැතිය ඇතිව, 1971 අංක 38 දරන මූල්‍ය පනතේ 10(5) වගන්තියේ නියමයන්ට අනුව වාර්ෂික දායක මුදල් සමඟ රුපියල් 6,468,000,000/-(හයබිලියන හාරසිය හැටඅට මිලියනයක්) රජයේ භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කර ඇත්තේ "රාජ්‍ය සංස්ථා වල ශුද්ධ අතිරික්ත ආදායම විසර්ජනය" මේ වන තෙක් අපගමනය නොකිරීමෙනි. 2002 දෙසැම්බර් 27 වැනි දින CAASL හි ආරම්භය සිට රජයේ යහපාලන මූලධර්ම වලට අනුකූලව විධිමත් මූල්‍ය හා පරිපාලන කළමනාකරණ පිළිවෙත් තුළින් රජයේ භාණ්ඩාගාරයට කිසිදු අපහසුතාවයක් නොවන අන්දමින් අධිකාරිය ක්‍රියාත්මක විය. CAASL විසින් 2002 සිට 2008 දක්වා PTA ආදායම එකතු කර ඉහත සඳහන් කළ පරිදි සිවිල් ගුවන්සේවා අධිකාරියේ අරමුදලට බැර කර ඇත.

	රු.
2008 - 2022 ලැබී ඇති OSS	16,981,667,778.00
අඩු කිරීම්:	
ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණ	6,468,000,000.00
CAASL ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම	895,000,000.00
ගුවන්තොටුපල සංවර්ධනය - යාපනය ජාත්‍යන්තර ගුවන්තොටුපල	900,000,000.00
ගුවන්තොටුපල සංවර්ධනය - රත්මලාන ජාත්‍යන්තර ගුවන්තොටුපල	759,800,000.00
ගුවන්තොටුපල සංවර්ධනය - මඩකලපුව ජාත්‍යන්තර ගුවන්තොටුපල	42,199,000.00
BIA ආරක්ෂක සංවර්ධන - නිල සුනඛයින් මිලදී ගැනීම	22,111,000.00
උප කාර්යාලය ඉදිකිරීම - මත්තල	45,044,000.00
CAASL පරීක්ෂක නිල නිවාස ඉදිකිරීම - වීරවිල	46,382,000.00
CAASL පරීක්ෂක නිල නිවාස ඉදිකිරීම - මඩකලපුව	67,750,000.00
CAASL පරීක්ෂක නිල නිවාස ඉදිකිරීම - රත්මලාන	13,422,000.00
CAASL පරීක්ෂක නිල නිවාස ඉදිකිරීම - කටුනායක	4,896,000.00
වෙනත් ප්‍රාග්ධන වියදම්	378,690,000.00
ශ්‍රී ලංකාව තුළ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ පැවැත්වීම	57,700,000.00
පුනරාවර්තන වියදම් 2008 - 2022	5,906,146,000.00
ආදායම් බදු	4,039,180,000.00
මුළු වියදම	19,646,320,000.00
CAASL හි අනෙකුත් ආදායම් මාර්ග වලින් ආවරණය වන වියදම්	(2,664,652,222.00)

අදාළ නීතිය/විධානය	විස්තරය
(ඊ) 2023 දෙසැම්බර් 5 දිනැති CP/23/2271/604/221 කැබිනට් තීරණය සහ 2023.12.11 දිනැති PED චක්‍රලේඛනය	පළමු කැබිනට් තීරණය 20/11/2023 දින සිදු කළ අතර, එමඟින් CAASL වෙතින් සියලුම OSS ආදායම මාරු කරන ලෙස ඉල්ලා සිටියේය. කෙසේ වෙතත්, CAASL මූල්‍යමය වශයෙන් දීර්ඝ කාලීන පැවැත්ම පවත්වාගෙන යාමේ අවශ්‍යතාව පිළිබඳව සංශෝධිත කැබිනට් පත්‍රිකාවක් සහ නිසි සාධාරණීකරණයක් සහිතව ගරු සිවිල් ගුවන්සේවා අමාත්‍යතුමා මෙම තීරණයට අභියාචනයක් ඉදිරිපත් කළේය. නීත්‍යානුකූල ප්‍රමුඛතාවයක් ඇති 2024/02/19 දින 2 වැනි කැබිනට් තීරණය, ගරු අමාත්‍යවරයාගේ අභියාචනා කළ කැබිනට් පත්‍රිකා යොමුව - සටහන/ 197/පෙබරවාරි/2024/04 හි 2023 නොවැම්බර් 20 වැනි දින අංක 23/1937/628/094 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අදාළ අන්තර්ගතය සහ ඉදිරිපත් කිරීම් සැලකිල්ලට ගන්නා අතර CAASL හට එහි වියදම් සඳහා මසකට රුපියල් මිලියන 90 ක OSS ඉපැයීම් රඳවා ගත හැකි බව අමාත්‍ය මණ්ඩලය වැඩිදුරටත් තීරණය කළේය. නීත්‍යානුකූල දෘෂ්ටි කෝණයකින් බලන කල, 2024/02/19 දිනැති 2 වන කැබිනට් තීරණය මගින් පළමු කැබිනට් තීරණය අවලංගු කර ඇති බව මණ්ඩලයේ අදහසයි. ඒ අනුව, 2023/11/20 දිනැති J S1 කැබිනට් තීරණයෙන් බලපැවැත්වෙන පරිදි 2024/02/19 දිනැති කැබිනට් තීරණය අනුව නිසි OSS මුදල් ප්‍රේෂණය කිරීමට මණ්ඩලය තීරණය කර ඇත. තවද, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් 2024 අප්‍රේල් 22 දිනැති TO/REV /01/ 14/ 14-11 යන ලිපි යොමුවෙන්, 2024/02/19 දිනැති කැබිනට් තීරණය මත මාසිකව රුපියල් 90 ක් රඳවා තබා ගැනීමෙන් පසු OSS ආදායම වෙන ලෙස CAASL වෙත උපදෙස් දී ඇති බැවින්, සම්පූර්ණ OSS බද්ද ප්‍රේෂණය කිරීම සිදු නොවේ. එබැවින් CAASL එකී ලිපියට සම්පූර්ණයෙන් අනුකූල වේ. එබැවින් මෙම තීරණයත් සමඟ 2020,2021 සහ 2022 වර්ෂවල ලාභය නොවෙනස්ව පවතින අතර, 2023 ලාභය වන රු. 4,600,480,452/-කින් 360,288,651 ක් පමණක් අඩු කෙරෙන අතර, එය 2023.11.20 දින සිට භාණ්ඩාගාරයට යවන ලද අදාළ මුදල වේ. OSS ආදායම CAASL ආදායමේ කොටසක් ලෙස සලකනු ලබන අතර, 2002 සිට ඒ සඳහා ආදායම් බදු ගෙවා ඇත.
(උ) අංක 04/2023 දරන PED චක්‍රලේඛනය	CAASL මගින් කාර්ය සාධනය හෝ පැමිණීම අනුව කළමනාකරණ දීමනාවක් හෝ අතුරු දීමනාවක් ගෙවනු නොලබයි.
(ඌ) අංක 01/2021 දරන සහ 2021 නොවැම්බර් 17 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය	
2.3 වන වගන්තිය	මාණ්ඩලික සහ පරිපාලන නීති සංග්‍රහයේ (SLCAP 5000) පළමු සමාලෝචනය අවසන් කර ඇති අතර, 2 වන සමාලෝචනය සකස් කරමින් පවතී. ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානයේ (ICAO) අවශ්‍යතා අනුව අනෙකුත් සංග්‍රහයන් සංශෝධනය කෙරේ.
3.2 වන වගන්තිය	කළමනාකරණ දීමනාව ජ්‍යෙෂ්ඨ සිවිල් ගුවන්සේවා පරීක්ෂකවරුන් 19 දෙනෙකුගෙන් සහ කාර්ය මණ්ඩලයේ කළමනාකරුවන් 15 දෙනෙකුගෙන් සමන්විත කළමනාකරු කාණ්ඩයේ (මහා භාණ්ඩාගාරය විසින් අනුමත කරන ලද MM 1-1 වැටුප් පරිමාණය) නිලධාරීන්ට කළමනාකරණ දීමනාව ගෙවනු ලැබේ. 2018.03.29 දින පැවති 143 වැනි රැස්වීමේදී කළමනාකරුවන් සඳහා රුපියල් 20,000/- ප්‍රවාහන දීමනාවක් වෙනුවට රුපියල් 50,000/- ක මාසික දීමනාවක් අධිකාරිය විසින් අනුමත කර ඇත.

මූල්‍ය ප්‍රකාශන
විගණකාධිපතිගේ වාර්තාවට පිළිතුරු ලිපිය 2023

අදාළ නීතිය/විධානය	විස්තරය
	2023.02.01 දින පැවති 185 වන රැස්වීමේදී පහත සඳහන් හේතූන් මත කළමනාකරුවන්ගේ දීමනාව අඛණ්ඩව ගෙවීමට අධිකාරිය විසින් තීරණය කර ඇත. 2018 වර්ෂය සිට මෙම දීමනාව ගෙවා ඇති බැවින් තීරණය ආපසු හැරවීමට මෙම අධිකාරියට නොහැක. ✈ අනුප්‍රාප්තික සැලැස්ම සහ පරිවර්තනය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට ජ්‍යේෂ්ඨ කළමනාකාරීත්ව තනතුරු සඳහා මධ්‍යම මට්ටමේ කළමණාකරුවන් පුහුණු කිරීම; මෙම කාණ්ඩයේ සේවකයින් CAASL හි අධ්‍යක්ෂවරයාට ආසන්න පහළ මට්ටමේ කටයුතු කරන අතර, වාර්ෂික වැඩ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා විශ්ලේෂණය, සැලසුම් කිරීම, පුරෝකථනය කිරීම පිළිබඳ විවිධ රාජකාරිවලට සහභාගී විය යුතු අතර, වැඩ කරන වේලාවන් සාමාන්‍ය කාර්යාල වේලාවට සීමා නොවේ. ඔවුන්ට සතියේ දිනවල දිගු වේලාවක් සේවය කිරීමට සිදුවන්නේ නම් සහ සති අන්තයේ රාජකාරි සඳහා කැඳවනු ලැබුවහොත්, සාමාන්‍ය තත්වයන් යටතේ ප්‍රවාහන පහසුකම් සැපයීම CAASL විසින් කළ යුතුය. මෙම දීමනාව ගෙවීමත් සමඟ, CAASL විසින් ප්‍රවාහනය සැපයීම අවශ්‍ය නොවන අතර එය CAASL වෙත පිරිවැය ඉතිරි කිරීමක් ද වේ. ✈ අධිකාරියේ සේවය සඳහා දක්ෂ නිලධාරීන් රඳවා තබා ගැනීම. රැකියාවේ සුවිශේෂී ස්වභාවය හේතුවෙන්, ආයතනයේ නියාමන අධිකාරීන්ගේ සේවකයින් රඳවා තබා ගැනීමේ අවශ්‍යතාවය සඳහා වෙළඳපොළ වටිනාකම සමඟ වේතනයක් ලබා දීම අනිවාර්ය අවශ්‍යතාවයක් ලෙස ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානය (ICAO) ප්‍රකාශ කර ඇත. ආරක්ෂක අධීක්ෂණ කාර්යයන් ඉටු කරන සුදුසුකම් ලත් පුද්ගලයින් බඳවා ගැනීම සහ රඳවා තබා ගැනීම සහතික කිරීම සඳහා රාජ්‍යයන් විසින් වැටුප් සහ සේවා කොන්දේසි වැනි අවශ්‍ය පියවර ගත යුතු බව ආරක්ෂක අධීක්ෂණ සංග්‍රහයේ (doc 9734) දක්වයි. ✈ ගමනාගමන ගැටලු නොමැතිව, පවරා ඇති රාජකාරි සහ කාර්යයන් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ඉටු කිරීමට හැකි වන පරිදි කළමනාකරු කාණ්ඩයේ සේවකයින්ට සිය රාජකාරී ස්වාධීනව නියාමනය කිරීමට උපකාර කරයි. ✈ මෙම නිලධාරීන් තමන්ගේම ප්‍රවාහන ක්‍රමවේදයක් යොදා ගනිමින් සේවය වාර්තා කරන බැවින්, ප්‍රවාහන පහසුකම් සැපයීමේ ප්‍රායෝගික ගැටලු සහ මූල්‍ය පිරිවැය දැරීම ආදී ගැටලු වලට මුහුණ දීමට අධිකාරියට සිදු නොවේ. ✈ ගෙවීම් අත්හිටුවීම කළමනාකරු කාණ්ඩයේ නිලධාරීන්ගේ ආයතනික තත්ත්වයට සහ ජීවන තත්ත්වයට දැඩි ලෙස බලපානු ඇත. තවද, කාණ්ඩයේ නිලධාරීන් පූර්ණ ලෙස පුහුණු කර ඇති අතර, ඔවුන් CAASL හි සේවයෙන් ඉවත් වුවහොත්, එය සංවිධානයේ කාර්යයන්ට විශාල පාඩුවක් වන අතර, ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානය විසින් පවත්වනු ලබන විගණනයේ දී සැලකිය යුතු සොයාගැනීම්වලට හේතු විය හැකිය. ✈ මෙම දීමනාව ලබා දීමේ ආරම්භක අදියරේදී කළමනාකරණ කාණ්ඩයේ සියලුම නිලධාරීන්ට තමන්ගේම ප්‍රවාහන ක්‍රමයක් භාවිත කිරීමට උනන්දු කරන ලද අතර, ඔවුන් අධිකාරියෙන් වාහන ණය යෝජනා ක්‍රමය යටතේ ණය ලබාගෙන වාහන මිලදී ගත් අතර, අදාළ දීමනාව ගෙවීම නතර කළහොත් ඔවුන් ණය වාරික ගෙවීමේදී ගැටලුවකට මුහුණ දීමට සිදු වනු ඇත. ✈ ජ්‍යේෂ්ඨ සිවිල් ගුවන්සේවා පරීක්ෂකවරුන්ට තමන්ගේම ප්‍රවාහන ක්‍රම ඇති බැවින් ගුවන්සේවා කර්මාන්තයේ නිරීක්ෂණ කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමට මෙම කළමනාකරුවන්ගේ දීමනාව අතිශයින් උපකාරී වේ. **අතුරු දීමනාව** 2022.04.08 දින පැවති 180 වැනි රැස්වීමේදී CAASL හි සියලුම සේවකයන්ට රුපියල් 25,000/-ක අතුරු දීමනාව ගෙවීමට අධිකාරිය විසින් අනුමැතිය ලබා දී ඇත. 2016 වසරේ සිට ඔවුන්ගේ වැටුප්වල සැලකිය යුතු වර්ධනයක් සිදුවී නොමැති බැවින් සියලුම කාර්ය මණ්ඩල සඳහා මෙම දීමනාව ලබාදී ඇත. තවද, පසුගිය වසර තුළ ජීවන වියදම විශාල ලෙස වැඩි වී ඇත. එකල දැඩි රෙගුලාසි හේතුවෙන් දක්ෂ කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීමට සිවිල් ගුවන්සේවා දෙපාර්තමේන්තුවට නොහැකි වූ බවත්, DCA වෙත වැඩි ස්වයං පාලනයක් ලබා දීම සඳහා 2002 දී සිවිල් ගුවන්සේවා අධිකාරිය පිහිටුවන බවත් පෙන්වා දෙන ලදී.

අදාළ නීතිය/විධානය	විස්තරය
	තවද, පසුගිය කාලය තුළ CAASL ආයතනයට කිසිදු අලාභයක් සිදු නොවූ බවත්, 2022 වසරේදී රුපියල් මිලියන 1000ක මුදලක් ඒකාබද්ධ අරමුදලට දායක කර ඇති බවත්, දැනට පවතින ආර්ථික දුෂ්කරතා යටතේ සේවකයන්ට ලබාදී ඇති වරප්‍රසාදයක් ඉවත් කර ගන්නේ නම් එහි ප්‍රතිඵලයක් ලෙස ඇතිවන ඕනෑම සේවක නොසන්සුන්තාවක් රටේ අත්‍යවශ්‍ය ගුවන්සේවා කර්මාන්තය අඩපණ කළ හැකි අතර එය දැනටමත් පීඩාවට පත්ව ඇති රටේ ආර්ථිකයට ඉතා දැඩි අහිතකර බලපෑමක් ඇති කරන බවත් මණ්ඩලය විසින් නිරීක්ෂණය ලදී. ඉහත කරුණු සලකා බැලීමෙන් අනතුරුව, 2023.02.01 දින පැවති 185 වන රැස්වීමේදී අතුරු දීමනාව පවත්වාගෙන යාමට මණ්ඩලය එකඟ විය. කෙසේවෙතත් මෙම තීරණය තාවකාලික පියවරක් ලෙස ගෙන ඇති බැවින්, (2022.04.08 දින පැවති 180 වැනි රැස්වීමේදී) එය අනාගත වැටුප් සංශෝධන/වැඩිවීම්වලට අන්තර්ග්‍රහණය කළ යුතු බව මණ්ඩලය තීරණය කළේය. ඒ අනුව එක් එක් සේවකයාගේ අතුරු දීමනාවෙන් රුපියල් 10,000/- බැගින් අඩු කිරීමට සහ OMS චක්‍රලේඛ අංක 01/2024 මගින් ඉහළ ගිය ජීවන වියදම් සඳහා දීමනාව වැඩි කිරීමට 2024.01.19 දින පැවති 196 වැනි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී තීරණය කර ඇත. **විශේෂ දීමනාව** 2022.01.18 දිනැති අංක 01/2022 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන සහ 2022.01.28 දින පැවති 177 වැනි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම මගින් ගනු ලැබූ තීරණය අනුව රුපියල් 5000/- ක විශේෂ දීමනාව ගෙවනු ලැබේ. **තාක්ෂණික දීමනාව** 2015.04.09 දින මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද "ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා පිළිබඳ සම්මුතිය යටතේ රජයට පැවරී ඇති ජාත්‍යන්තර වගකීම් ඵලදායී ලෙස ඉටු කිරීම සඳහා සිවිල් ගුවන්සේවා අධිකාරියේ ආරක්ෂක අධීක්ෂණ ශක්‍යතා ශක්තිමත් කිරීමේ අත්‍යවශ්‍යතාව" යටතේ DMS/1748 අංක ලිපියේ සඳහන් විධිවිධාන අනුව විශේෂ තාක්ෂණික දීමනාව ගෙවනු ලැබේ. අයදුම්කරුවෙකු තාක්ෂණික දීමනාව සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කළ විට, මෙම ඉල්ලීම විශේෂ කමිටුවක් (විශේෂ තාක්ෂණික දීමනා පිළිබඳ තක්සේරු මණ්ඩලය) සහ ගෙවීමට පෙර කාර්ය මණ්ඩල කමිටුවේ නිර්දේශය මත ඇගයීමට ලක් කෙරේ.
(i) 04/2022 දරන PED චක්‍රලේඛය	2023 වසර තුළ උත්සව කටයුතු සඳහා වන පිරිවැය අවම කිරීමට CAASL පියවර ගෙන ඇත. 2022 සහ 2021 වසරවලට සාපේක්ෂව සැලකිය යුතු අඩුවීමක් එහි දක්නට ඇත. එය 2022 වසරට සාපේක්ෂව 84% ක අඩුවීමකි. කෙසේ වෙතත්, CAASL හි කාර්ය මණ්ඩල සාමාජිකයින් දිරිමත් කිරීමට ජනවාරි 1 වැනි දින උත්සවය, සිංහල සහ දෙමළ අලුත් අවුරුදු උත්සවය වැනි ප්‍රධාන ප්‍රධාන සැමරුම් සඳහා වියදම් කිරීමට සිදු විය.
(j) FR 101, 103 සහ 104	තත්ත්ව සහ අභ්‍යන්තර විගණන අංශය විසින් මෙම කරුණ සිය වාර්තාවේ යොමු අංක. QIA/2023/HRPM/06 – වීරවිල සංචාරක බංගලාව, භාරකරුගේ විවේකාගාරය හි දක්වා තිබුණි. රුපියල් 252,000/- ක දුම්මඳු සැපයුම්කරුගේ බැඳුම්කරය ක්‍රියාත්මක කර වහාම අලුත්වැඩියා කිරීමට CAASL හි 83 වැනි විගණන සහ කළමනාකරණ කමිටුව විසින් නිර්දේශ කරන ලදී. ඒ අනුව මේ වනවිට අලුත්වැඩියා කටයුතු සිදුවෙමින් පවතී.
(ඔ) 2015.04.09 දිනැති අංක DMS/1748 මුදල් ලිපියේ රේඛීය අමාත්‍යාංශයේ ලේකම්	2015.04.09 දින මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද "ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා පිළිබඳ සම්මුතිය යටතේ රජයට පැවරී ඇති ජාත්‍යන්තර වගකීම් ඵලදායී ලෙස ඉටු කිරීම සඳහා සිවිල් ගුවන්සේවා අධිකාරියේ ආරක්ෂිත අධීක්ෂණ ශක්‍යතා ශක්තිමත් කිරීමේ අත්‍යවශ්‍යතාව" යටතේ අංක DMS/1748 ලිපියේ සඳහන් විධිවිධාන අනුව සහ විශේෂ තාක්ෂණික දීමනාව ගෙවීම සඳහා තක්සේරු මණ්ඩලයේ නිර්දේශය මත සහ මාණ්ඩලික කමිටුවේ අනුමැතිය මත විශේෂ තාක්ෂණික දීමනාව ගෙවනු ලබයි.

මූල්‍ය ප්‍රකාශන
විගණකාධිපතිගේ වාර්තාවට පිළිතුරු ලිපිය 2023


අදාළ නීතිය/විධානය	විස්තරය
(ඕ) මාණ්ඩලික සහ පරිපාලන රීති සංග්‍රහය	මාණ්ඩලික සහ පරිපාලන රීති සංග්‍රහය (SLCAP 5000) හි 5.2.10 ඡේදයට අනුව, වැඩ ව්‍යාපෘති - සේවා අවශ්‍යතාවයේ දී, අනුමත කාර්ය මණ්ඩලයෙන් පිටත විශේෂ පැවරුම් සඳහා පුද්ගලයින් බඳවා ගැනීමට CAASL හට බලය ඇත. 2017/07/27 දින පැවති 136 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී, ව්‍යාපෘති පදනම මත කර්මාන්තය සඳහා නම් කරන ලද පරීක්ෂකවරුන් පත් කිරීමට තීරණයක් ගන්නා ලදී.
(i) මාණ්ඩලික සහ පරිපාලන රීති සංග්‍රහයයේ 5.2.6 වන වගන්තිය	වැඩ ව්‍යාපෘති සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය අවශ්‍ය නොවේ. CAASL පනතේ 11 වන කොටසේ 7(v) වගන්තියට අනුව, කොන්ත්‍රාත්තුවේ දක්වා ඇති පරිදි සුදුසුකම් ලත් පුද්ගලයින් සම්බන්ධ කර ගැනීමට සහ කර්මාන්ත ප්‍රමිතීන්ට අනුකූලව ඔවුන්ගේ වේතන සැපයීමට අධිකාරියට බලය ඇත. මාණ්ඩලික සහ පරිපාලන නීති (SLCAP 5000) සංග්‍රහයේ 5.2.10 ඡේදය - වැඩ ව්‍යාපෘති - සේවා අවශ්‍යතා පවතින අවස්ථාවලදී, අනුමත සේවක සංඛ්‍යාවෙන් පිටත විශේෂ පැවරුම් සඳහා පුද්ගලයින් බඳවා ගැනීමට CAASL හට බලය ඇත. 2017 ජූලි 27 වන දින පැවති 136 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී, විශේෂ තාක්ෂණික විශේෂඥතාවක් අවශ්‍ය වන රාජකාරි ඉටු කිරීම සඳහා ව්‍යාපෘති පදනම මත ක්ෂේත්‍රයේ නම් කරන ලද පරීක්ෂකවරුන් පත් කිරීමට තීරණය කරන ලදී.
(ii) 14.5.1 සහ 14.8.2(iv) වගන්තිය	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2023 ඔක්තෝම්බර් 11 දින පැවති එහි 193 වන රැස්වීමේදී වාහන සහ දේපළ ණය සඳහා පොලී අනුපාතිකය 7% දක්වා වැඩි කිරීම අනුමත කරන ලදී.
2.2.3 2018 ජාතික විගණන පනත	
(අ) මූල්‍ය සංග්‍රහය සහ ආයතනික සංග්‍රහය	**මූල්‍ය නීති** LCAP 5000 හි 4.1 වගන්තිය: මාණ්ඩලික සහ පරිපාලන රීති සංග්‍රහය, අනුව මූල්‍ය ක්‍රියා පටිපාටි සහ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ/ක්‍රියා පටිපාටි ඇතුළත් වෙනම මූල්‍ය සංග්‍රහයක් CAASL සතුවීම අවශ්‍ය වේ. මෙම අවශ්‍යතාවයට අනුකූලව, CAASL විසින් වෙන් වූ මූල්‍ය සංග්‍රහයක් සකස් කරන ලද අතර, එය 2017 සහ 2018 රැස්වීම් කිහිපයකදී විගණන සහ කළමනාකරණ කමිටුව (AMC) විසින් සමාලෝචනය කරන ලදී. AMC විසින් 2018 මැයි 25 වන දින 61 වන AMC රැස්වීමේදී මණ්ඩල අනුමැතිය සඳහා සංග්‍රහය ඉදිරිපත් කරන ලෙස නිර්දේශ කරන ලදී. කෙසේ වෙතත්, මෙම අනුමැතිය තවමත් අවසන් කර නොමැත. CAASL විසින් සකස් කරන ලද මූල්‍ය සංග්‍රහයෙන් ව්‍යවස්ථාපිත මණ්ඩලවලට බැඳී ඇති මූල්‍ය පනත, රජයේ මූල්‍ය රෙගුලාසි (FR) සහ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රතිවර්තනය කරයි. මූල්‍ය පනත, FR සහ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ මඟින් CAASL හි සංග්‍රහයට සාපේක්ෂව වඩා පුළුල් වූ පූර්ණ සහ සවිස්තරාත්මක ක්‍රියා පටිපාටි සපයයි. ඉහත කරුණු අනුව CAASL විසින් පහත තීරණ වලට එළඹෙන ලදී. CAASL සඳහා වෙනම මූල්‍ය සංග්‍රහයක් නිර්මාණය කිරීම වෙනුවට මුදල් පනත, රජයේ මූල්‍ය රෙගුලාසි සහ රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අඛණ්ඩව පිළිපැදීම. ඉදිරි සමාලෝචන ක්‍රියාවලියේදී SLCAP 5000 හි 4.1 වගන්තිය: මාණ්ඩලික සහ පරිපාලන රීති සංග්‍රහයෙන් වෙනම මූල්‍ය සංග්‍රහයක් සඳහා වන අවශ්‍යතාවය ඉවත් කිරීමට යෝජනා කිරීම.
2.2.4 ප්‍රසම්පාදන	ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය (CAASL) විසින් වීරවිල පිහිටි දැනට පවතින සංචාරක බංගලාව ප්‍රතිසංස්කරණය කිරීමේ කාලෝචිත මෙන්ම වැදගත් තීරණය ගෙන ඇත. කාලයත් සමඟ දේපළ සැලකිය යුතු ලෙස පිරිහීම හේතුවෙන් නඩත්තු කිරීම අත්‍යවශ්‍ය බැවින් මෙම තීරණය ගෙන ඇත. බංගලාවේ කෙතරම් අඛලන් වීද යත් කාර්ය මණ්ඩල සාමාජිකයින් සහ ගනුදෙනුකරුවන් එහි පැමිණීමට හෝ රැඳී සිටීමට අකමැති දැක්වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස අධිකාරියේ විභව ආදායම අහිමි විය. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 7.12.2 අනුව, ජාතික තරඟකාරී ලංසු (NCB) යටතේ මිල ගණන් කැඳවන අවස්ථාවේ, එක් ලංසුවක් පමණක් ලැබුණද, ප්‍රසම්පාදන ක්‍රියාවලිය යම් යම් කොන්දේසි යටතේ ඉදිරියට යා හැකිය. තරඟකාරිත්වය සීමිත වන අවස්ථා වලදී පවා ප්‍රසම්පාදනය සාධාරණ සහ කාර්යක්ෂම බව මෙම මාර්ගෝපදේශයෙන් සහතික කරයි. ආර්ථික අර්බුදයට පෙර පැවති තත්ත්වය මත පදනම්ව DPC අනුපාත අනුමත කරන ලදී. එබැවින් මිල දෙතුන් ගුණයකින් වැඩි වී ඇති බව පෙන්නුම් කරන හෙයින් මිල පහළට සංශෝධනය කිරීමට ලංසුකරු සමඟ සාකච්ඡා කිරීම ප්‍රායෝගික නොවීය.

අදාළ නීතිය/විධානය	විස්තරය
	මීට අමතරව, ඉදිකිරීම් ක්ෂේත්‍රයේ බිඳවැටීමට හේතු වූ ආර්ථික අර්බුදයෙන් ඇති වූ ඉහළ මිල අස්ථාවරත්වය සහ උච්චාවචනයන් නිසාවෙන් තමන් මුහුණ දෙන අභියෝග පිළිබඳව 2023 මාර්තු 13 දිනැති ලිපියෙන් ලංසුකරු විසින් ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය (CAASL) වෙත දන්වා ඇත. පවතින ආර්ථික අර්බුදය සහ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ බිඳවැටීම සැලකිල්ලට ගනිමින්, CAASL ප්‍රසම්පාදන කාර්යාලය දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (DPC) මගපෙන්වීම ලබා ගත්තේය. රටේ වත්මන් වෙළඳපළ තත්ත්වයන් අනුව සහ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලට අනුකූලව, එම ලංසුකරුට සඳහාම නැවත කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට DPC තීරණාත්මක තීරණයක් ගත්තේය. වෙළඳපළ වෙනස්වීම්, පෙර ප්‍රසම්පාදන පිළිවෙත්, ලංසුකරුගේ කාර්යසාධනය, සහ වඩාත්ම වැදගත් ලෙස, CAASL වෙත ඉතා වාසිදායකවූ එම මිල ගණන්වලට අනුකූල වීමට ලංසුකරුගේ විකඟතාවය වැනි විවිධ සාධක සලකා බලා, තත්ත්වය පිළිබඳ පුළුල් තක්සේරුවකින් පසුව මෙම තීරණයට එළැඹ ඇත. ලංසුකරු C7 මට්ටම යටතේ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) ලියාපදිංචි වී ඇත. CIDA යනු ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් කර්මාන්තය පාලනය කරන සහ නියාමනය කරන බලයලත් ආයතනය වන අතර, සියලුම ලියාපදිංචි ආයතන තත්ත්ව, විශ්වසනීයත්වය සහ වෘත්තීයභාවය පිළිබඳ දැඩි ප්‍රමිතීන් සපුරාලන බව සහතික කරයි. C7 ලියාපදිංචිය මගින් මෙම දැඩි ප්‍රමිතීන්ට ලංසුකරු අනුගත වීම පිළිබිඹු කරමින් ඉහළ මට්ටමේ නිපුණතාවයක් සහ විශ්වසනීයත්වයක් සහතික කරයි. නානකාමර 12ක බිත්ති ටයිල් වැඩ නිම කිරීම සඳහා මුල් ව්‍යාපෘතියට වෙනසක් ඇති කරමින් දීර්ඝ කිරීම ලබා දී ඇත. මෙම කාර්යය මුලින් පවරන ලද කාර්යයන් වලින් අනෙන්‍යන්‍ය වශයෙන් වෙනස් වන අතර, එමනිසා මුල් ව්‍යාපෘතියට අදාළ කාල සීමාව වෙනස් කිරීමේ කාර්යයට අදාළ නොවේ.
වෙනත් කරුණු	
(අ) අපගමන බදුවල ප්‍රමාද වූ ගෙවීම්	CAASL විසින් මුදල් පනතේ 4 වැනි වගන්තියේ (3) උපවගන්තිය සහ අපගමන බදු රෙගුලාසි මගින් ප්‍රමාද වූ පොලිය අයකර ගැනීමට අඛණ්ඩ පියවර ගෙන ඇත. මේ සම්බන්ධයෙන් රේඛීය අමාත්‍යාංශය සහ මහා භාණ්ඩාගාරය දැනුවත් කරන ලදී. හිඟ අපගමන බද්ද පියවීම සඳහා අදාළ ගුවන් සමාගම් වෙත අවසන් දැනුවත් කිරීම් ලබා දී ඇති අතර මෙම ගැටලුව සම්බන්ධයෙන් ගරු නීතිපති වෙත ලිපියක් යොමු කොට ඇත.
(ආ) බේරුම් නොකළ අත්තිකාරම්	2023 ඔක්තෝබර් 30 වැනි දින පැවති එහි 194 වැනි රැස්වීමේ දී අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සමඟ මෙය ප්‍රාග්ධනීකරණය කරන ලදී. CAASL විසින් ව්‍යාපෘති ප්‍රසම්පාදන ඇගයීම් කමිටුව (PPEC) සහ ව්‍යාපෘති ප්‍රසම්පාදන අනුමත කමිටුවේ (PPAC) ඇගයීම සහ අනුමැතිය හරහා යාපනය ජාත්‍යන්තර ගුවන් තොටුපල සංවර්ධනයට වෙන් කරන ලද අරමුදල් නිකුත් කරයි. 2020 ජූලි 13 වන දින අමාත්‍යාංශය (සංචාරක හා ගුවන්සේවා අමාත්‍යාංශය) විසින් කමිටු අවසන් වරට පත් කරන ලදී. කමිටුවල සාමාජිකයන් නොමැති බැවින් අත්තිකාරම් පියවීම් අවසන් කිරීමට කමිටු පත් කරන ලෙසට රේඛීය අමාත්‍යාංශය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත. CAASL විසින් විස්තර ඉදිරිපත් කළ පසු බේරුම් නොකළ අත්තිකාරම් ප්‍රාග්ධනීකරණය කරනු ලැබේ. මේ සම්බන්ධයෙන් නිරන්තර සාකච්ඡා පැවැත්වේ.
(ඇ) අපගමන බද්ද ගණනය කිරීමට අදාළ විනිමය අනුපාතිකය	අතපසුවීමක් හේතුවෙන් සිදු වූ සිද්ධීන් කිහිපයක් හැර අපගමන බද්ද ගණනය කිරීම සඳහා ගුවන් ගමන් දිනයට අදාළ විනිමය අනුපාතිකය ගුවන් සමාගම් විසින් යොදා නොගත්තද පසුව ඒ සියල්ල නිවැරදි කරන ලදී. CAASL 015 - (23-1) ඉදිරිපත් කළ නොහැකි වූ ගුවන් සමාගම් විසින් ටිකට් නිකුත් කළ දිනය මත පදනම්ව පරිවර්තන විස්තර ලබා දී ඇත. ගුවන් සමාගම් විසින් ටිකට් නිකුත් කළ දිනය මත පදනම්ව පරිවර්තන අනුපාතයේ විස්තර ලබා දී ඇත.

මූල්‍ය ප්‍රකාශන
විගණකාධිපතිගේ වාර්තාවට පිළිතුරු ලිපිය 2023

අදාළ නීතිය/විධානය	විස්තරය
(අ) ගුවන්සේවා පහසුකම් සහ භූමිය	අන්‍යෝන්‍ය අවබෝධය මත පදනම්ව සීමාසහිත ගුවන්තොටුපල සහ ගුවන් සමාගම (ශ්‍රී ලංකාව) විසින් මෙම සම්පත් මේ වනවිට භාවිත කරනු ලබයි. නෛතික තත්ත්වය අනුව දීර්ඝ කාලීන බදු ක්‍රමය සහ ගාස්තු අය කිරීම සම්බන්ධයෙන් ගරු නීතිපතිතුමාගේ උපදෙස් මත ඉදිරි ක්‍රියාමාර්ග ගනු ලැබේ. CAASL විසින් මඩකලපුව ගුවන් තොටුපල ක්‍රියාත්මක කිරීමට අදාළ බදු ගිවිසුමක් සකස් කර එය සමාලෝචනයට CAASL වෙත ලබා දී ඇත. මඩකලපුව ගුවන් තොටුපල බදු ගිවිසුම අවසන් කිරීමෙන් පසු සෙසු ගුවන් තොටුපල සහ ගුවන්සේවා පහසුකම් සඳහා ක්‍රියා පටිපාටිය අනුගමනය කරනු ඇත.
(ඉ) දේශීය ගුවන් තොටුපලවල් - දිගන, බදුල්ල සහ පුත්තලම	බදුල්ල ගුවන් තොටුපල සම්බන්ධයෙන් ශක්‍යතා අධ්‍යයනය, මධ්‍යම පරිසර අධිකාරියේ පරිපාලක ගාස්තු, පරිසර බලපෑම තක්සේරුකරණය වෙත EIA සඳහා ඉල්ලුම් කිරීමේ පුවත්පත් දැන්වීම සහ සමීක්ෂණ ගාස්තු සඳහා ගෙවීම් පියවා ඇත. පුත්තලම ගුවන් තොටුපල සංවර්ධනය සඳහා සමීක්ෂණ සහ මධ්‍යම පරිසර අධිකාරියේ පාලන ගාස්තු අය කළ නමුත් කැබිනට් තීරණය අනුව ව්‍යාපෘතිය නතර විය. දිගන ගුවන් තොටුපලක් සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් ශක්‍යතා අධ්‍යයනයක් සිදුකිරීමේ කම්ටුව ආරම්භ කිරීම පමණක් සිදු විය.
(ඊ) වීරවිල කළමනාකරණ ගාස්තු	2017 මාර්තු මස 15 වන දින දුම්බදු කේටරර්ස් සමඟ අත්සන් කරන ලද ගිවිසුම 2018 මාර්තු 16 සිට 2019 මාර්තු 15 දක්වා තවත් වසරකට දීර්ඝ කිරීමට කළමනාකරණ තීරණයක් ගන්නා ලදී. අත්සන් කරන ලද ගිවිසුමේ 2 වැනි වගන්තියේ දක්වා ඇති කොන්දේසි මත පදනම්ව මෙම තීරණය ගෙන ඇති අතර සේවා සතුටුදායක ලෙස අවසන් වූ පසු ගිවිසුම් කාලය තවත් වසරක් සඳහා දීර්ඝ කළ හැකිය. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුව, 2019 මාර්තු 15 සිට 2021 මාර්තු 14 දක්වා කාලය සඳහා බංගලාව කළමනාකරණය සඳහා සුදුසු සැපයුම්කරුවෙකු තෝරා ගැනීමට ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කරන ලදී. පුවත්පත් දැන්වීම් 2019 පෙබරවාරි 12 වන දින ප්‍රකාශයට පත් කරන ලද අතර ලංසු විවෘත කිරීම 2019 මාර්තු 1 වන දින සිදු කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (සිවිල් ගුවන්සේවා) විසින් ඉදිරිපත් කළ ලිපියට අනුව, ප්‍රසම්පාදන ක්‍රියාවලිය නැවත දැනුම් දෙන තුරු අත්හිටුවා ඇත. පසුව, වරාය, නාවික හා ගුවන්සේවා අමාත්‍යාංශයේ උපදෙස් මත පහත පරිදි පවතින කළමනාකරණ සමාගමට දීර්ඝ කිරීම් ලබා දෙන ලදී. 1. 1 වැනි දීර්ඝ කිරීම - 2019 මාර්තු 14 සිට 2019 මාර්තු 28 දක්වා (සති 2) 2. 2 වැනි දීර්ඝ කිරීම - 2019 මාර්තු 28 සිට 2019 අප්‍රේල් 14 දක්වා (සති 2) 3. 3 වැනි දීර්ඝ කිරීම - 2019 අප්‍රේල් 15 සිට 2019 අප්‍රේල් 30 දක්වා (සති 2) 4. 4 වැනි දීර්ඝ කිරීම - 2019 අප්‍රේල් 30 සිට 2019 මැයි 31 දක්වා (මාස 1) ඒ අනුව බංගලාවේ නිසි කළමනාකාරිත්වයක් නොමැතිවීම හේතුවෙන් නඩත්තු කටයුතු අඩාල වී ඇති බැවින් විසඳුමක් ලබාදෙන ලෙස ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය (CAASL) විසින් අමාත්‍යාංශයෙන් ඉල්ලා සිටියේය. සංචාරක බංගලාව නඩත්තු කිරීමේ වැදගත්කම සැලකිල්ලට ගනිමින්, CAASL හි ප්‍රධාන කාර්යාලයේ දැනට පවතින සනීපාරක්ෂක කටයුතු පිළිබඳ කොන්ත්‍රාත්තුවේ දීර්ඝ කිරීමක් ලෙස, CAASL ප්‍රධාන කාර්යාලයට වීම සේවා ලබාදුන් සමාගම්වල සේවය වීම අනුපාතයටම ලබා ගනිමින් පිරිසිදු කිරීමේ සහ ආරක්ෂක කටයුතු දිගටම පවත්වා ගැනීමට කළමනාකරණය තීරණය කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස, 2021 ජනවාරි 11 වන දින දක්වා කළමනාකරණ සේවා කටයුතු සිදු නොකළ අතර, ඒ හේතුවෙන්, CAASL ප්‍රධාන කාර්යාලයේ සනීපාරක්ෂක කටයුතු පිළිබඳ කොන්ත්‍රාත්තුවට අනුව පිරිසිදු කිරීම් සහ ආරක්ෂක කටයුතු සඳහා ගෙවීම පමණක් සිදු කරන ලදී.

අදාළ නීතිය/විධානය	විස්තරය
	වීරවිල සංචාරක බංගලාව පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා 2020 දෙසැම්බර් 28 වැනි දින පැවැති සාකච්ඡාවකදී වීරවිල සංචාරක බංගලාවේ කළමනාකරණ කටයුතු පෙර කළමනාකාරීත්වය දැරූ කොන්ත්‍රාත්කරු වූ දුම්දූ කේටරර්ස් වෙත මාස තුනක කාලයකට පවරා දෙමින් ප්‍රසම්පාදනය මෙම මාස තුන තුළ අවසන් කරන ලෙස DGCA විසින් උපදෙස් දෙන ලදී. පෙර ගිවිසුමේ නියමයන් සහ කොන්දේසි මෙම කාල සීමාව සඳහා අදාළ විය. මෙම තීරණයට අනුකූල වෙමින්, 2021 ජනවාරි 11 සිට 2021 අප්‍රේල් 10 දක්වා දුම්දූ කේටරර්ස් වෙත කළමනාකාරීත්වය පැවරීමට සිවිල් ගුවන්සේවා අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අත්සන සහිත ලිපියක් නිකුත් කරන ලදී. පසුව 2021 මාර්තු 10 වැනි දින DPC වෙතින් ඉහත තීරණය සඳහා ආවරණ අනුමැතිය ලබා ගන්නා ලදී. ඉන් අනතුරුව, රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් අනතුරුව, 2021 අප්‍රේල් 12 වැනි දින සිට වසර දෙකක කාලයක් සඳහා වීරවිල සංචාරක බංගලාවේ කළමනාකරණ සේවා සැපයීමේ කොන්ත්‍රාත්තුව දුම්දූ කේටරර්ස් වෙත රු. 210,000.00 ක මාසික මිලකට තෘප්තිමත් සේවා මත තවත් වසරක් දක්වා දීර්ඝ කිරීමට විධිවිධාන ලබාදී ඇත. එමෙන්ම, වසර දෙකක සේවා කාලයෙන් පසුව, ගිවිසුම් කාලය සතුටුදායක ලෙස සේවා සම්පූර්ණ කිරීම හේතුවෙන් තවත් වසරක් දීර්ඝ කළ හැකි අත්සන් කරන ලද ගිවිසුමේ 2 වැනි වගන්තියේ විධිවිධාන මත පදනම්ව, 2023 අප්‍රේල් 13 සිට 2023 ඔක්තෝබර් 12 දක්වා තවත් මාස හයකට කොන්ත්‍රාත්තුව දීර්ඝ කරන ලදී. එමෙන්ම, එකී කොන්දේසි මත පදනම්ව, නව කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවසන් වන තෙක් ගිවිසුම 2023 ඔක්තෝබර් 13 සිට 2024 පෙබරවාරි 12 දක්වා මාස හතරක් සඳහා තවදුරටත් දීර්ඝ කරන ලදී. එම කාල සීමාව තුළ කළමනාකරණ කොන්ත්‍රාත්කරු විසින් ප්‍රතිසංස්කරණ කාලයේදී ආරක්ෂක සේවා සැපයීම, උද්‍යාන ප්‍රදේශය පිරිසිදු කිරීම හා අතුගා දැමීම, ජලාපවහන පද්ධතිය පිරිසිදු කිරීම, පැලවලට වතුර දැමීම, තිර රෙදි සහ සෝෆා කවර ඉවත් කිරීම හා යෙදීම, භාණ්ඩ තොග තබා ගැනීම, හදිසි අවශ්‍යතා සඳහා ප්‍රධාන කාර්යාලයට වාර්තා කිරීම වැනි ක්‍රියාකාරකම් සිදු කර ඇත. ප්‍රතිසංස්කරණ කටයුතු සිදුවෙමින් පැවතියද, වෙන්කිරීම් අත්හිටුවා තිබුණද, ඉහත විස්තර කර ඇති පරිදි අනෙකුත් සේවා සිදු කරන ලදී. එබැවින්, ගිවිසුමේ සඳහන් රැකියා සිදු කිරීම සඳහා කළමනාකරණ කොන්ත්‍රාත් සමාගමේ ගාස්තුව ගෙවන ලදී. DPC තීරණයෙන් පසුව, අබාන්ස් පාරිසරික සේවා වෙත කොන්ත්‍රාත්තුව ලබා දුන් අතර 2024 පෙබරවාරි 13 සිට 2025 පෙබරවාරි 12 දක්වා වසරක ගිවිසුමක් අත්සන් කරන ලදී.



ජී.එස් විතානගේ
සභාපති

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය

ඇමුණුම්
නියාමන විෂය පථය

නියාමන ක්ෂේත්‍ර	2023	2022	වෙනස් වීම (%)
ගුවන්තොටුපොල			
අභ්‍යන්තර ගොඩබිම් ගුවන්තොටුපොල	10	10	-
අභ්‍යන්තර ජල යාත්‍රාංගණය	11	11	-
ජාත්‍යන්තර ගුවන්තොටුපොල	4	4	-
ගුවන් සමාගම්			
අභ්‍යන්තර ගුවන්සේවායෙහි නිරත වන දේශීය ගුවන් සමාගම්	5	5	-
ජාත්‍යන්තර ගුවන්සේවයෙහි නිරත වන දේශීය ගුවන් සමාගම්	2	2	-
ජාත්‍යන්තර විදේශීය ගුවන් සමාගම්	37	31	19%
පුහුණු සංවිධාන			
පියාසර පාසල්	7	8	-13%
ශ්‍රේණිගත කිරීමේ පුහුණු සංවිධානය	1	2	-50%
ඉංජිනේරු/නඩත්තු කිරීමේ පාසල්	5	4	25%
සිවිල් ගුවන්සේවා පුහුණු මධ්‍යස්ථානය	1	1	-
ගුවන් සංචාලනය			
ගුවන් සංතරණ සේවා සැපයුම්කරුවන්	1	1	-
ගුවන්යානා ලියාපදිංචිය සහ ගුවන් යෝග්‍යතාව			
විශාල ප්‍රමාණයේ ගුවන්යානා (ගුවන්ගත කිරීමේ උපරිම බර කිලෝ ග්‍රෑම් 5700 සහ ඊට වැඩි)	29	30	-3%
කුඩා ප්‍රමාණයේ ගුවන්යානා (ගුවන්ගත කිරීමේ අවම බර කිලෝ ග්‍රෑම් 5700 ට අඩු)			
සැහැල්ලු ප්‍රවාහන ගුවන්යානා	40	41	-2%
අධි සැහැල්ලු ගුවන්යානා	1	1	-
හෙලිකොප්ටර්	7	7	-
උෂ්ණ වායු බැලූන	4	4	-
කෘත්‍රිම පුහුණු උපක්‍රමික/පියාසර පුහුණු උපක්‍රමික			
දේශීය පූර්ණ පියාසර අනුකාරක – A 320/A 330/ ඒකාබද්ධ පනේල පුහුණුකරු	3	3	-
ගුවන් ගමන් පාලන අනුකාරක (ATC)	1	1	-

නියාමන ක්ෂේත්‍ර	2023	2022	වෙනස් වීම (%)
පුද්ගල බලපත්‍ර			
ශිෂ්‍ය නියමු බලපත්‍රලාභීන්	253	145	74%
පෞද්ගලික නියමු බලපත්‍රලාභීන්	100	124	-19%
වාණිජ නියමු බලපත්‍රලාභීන්	300	174	72%
ගුවන් ප්‍රවාහන නියමු බලපත්‍රලාභීන්	768	293	162%
ගුවන් ගමන් පාලන බලපත්‍රලාභීන්	68	45	51%
ගුවන්යානා නඩත්තු ඉංජිනේරු බලපත්‍රලාභීන්	275	60	358%
ගුවන්යානා පිටත්කර හැරීමේ බලපත්‍රලාභීන්/ගුවන් මෙහෙයුම් නිලධාරී බලපත්‍රලාභීන්	4	0	-
ගුවන්යානා සේවා ස්ථාන ක්‍රියාකාරක බලපත්‍රලාභීන්	0	1	-100%
ගුවන් මැදිරි කාර්ය මණ්ඩල සාමාජික සහතිකලාභීන්	501	253	98%
පියාසර උපදේශකවරුන්	22	7	214%
පියාසර උපදේශකවරුන් (සීමිත)	11	0	-
භූමි උපදේශක අනුමැති	28	25	12%
*තත්ත්වගත/කාණ්ඩගත කිරීමේ පරීක්ෂකවරුන්	1		-
*ශ්‍රේණිගත කිරීමේ උපදේශකවුන්	9	*නව දර්ශක	-
*කෘත්‍රිම පියාසර උපදේශකවරුන්	4		-
ගුවන් පරීක්ෂකවරුන්	6	6	-
*තත්ත්වගත/කාණ්ඩගත කිරීමේ පරීක්ෂකවරුන්	1		-
*ශ්‍රේණිගත කිරීමේ පරීක්ෂකවරුන්	23	*නව දර්ශක	-
*කෘත්‍රිම පියාසර පරීක්ෂකවරුන්	3		-
නම් කරන ලද සෝදිසි නියමුවන්	20	20	-
සිවිල් ගුවන්සේවා වෛද්‍ය පරීක්ෂකවරුන්/වෛද්‍ය තක්සේරුකරුවන්	6	6	-
සහතික කළ ගුවන්සේවා ආරක්ෂක පිරික්සුම්කරුවන්	1056	747	41%
සහතික කළ ගුවන්සේවා ආරක්ෂක උපදේශකවරුන්	20	19	5%
සහතික කළ ගුවන්සේවා ආරක්ෂක කළමනාකරුවන්	23	19	21%
ගුවන් ප්‍රවාහන සේවා සැපයුම්කරුවන්			
ගෝලීය බෙදාහැරීමේ සේවා සැපයුම්කරුවන්	3	3	-
ගුවන් ප්‍රවාහන සේවා සැපයුම්කරු බලපත්‍රලාභීන්	528	442	19%
ගුවන් ප්‍රවාහන සේවා සැපයුම්කරු බලපත්‍රය - අ කාණ්ඩය	510	420	21%
ගුවන් ප්‍රවාහන සේවා සැපයුම්කරු බලපත්‍රය - ආ කාණ්ඩය	18	22	-18%
සාමාන්‍ය අලෙවි නියෝජිතයන	26	23	13%

ඇමුණුම්

CAASL හි තාක්ෂණික කාර්යසාධනය පිළිබඳ සාරාංශය

රෙගුලාසි/දැනුම් දීම්/නීති ගණන	2023	2022
ගුවන්යානා මෙහෙයුම්	12	4
ගුවන්යානා ලියාපදිංචි කිරීම සහ ගුවන් යෝග්‍යතාව	1	-
ගගන යාත්‍රාංගණ	3	5
ගුවන් සංතරණ සේවා	2	5
ගුවන්සේවා සුරක්ෂිතතාව	11	6
ගුවන් වෛද්‍ය සේවා	2	3

සංවිධාන/පුද්ගලයින් පිළිබඳ මූලික සහතිකය	2023	2022
ගුවන් සමාගම් (විදේශීය)	7	4
නඩත්තු සංවිධාන	2	1
ගුවන් නියමුවන්	492	201
ගුවන් ගමනාගමන පාලක	7	20
ගුවන්යානා නඩත්තු බලපත්‍ර දරන්නන්	38	30
ගුවන් මෙහෙයුම් නිලධාරීන් (ගුවන් ගමන් සංදේශකරුවන්)	4	-
පියාසර උපදේශකවරුන්	15	7
පියාසර උපදේශකවරුන් (සීමිත)	9	-
තත්ත්වගත/කාණ්ඩගත කිරීමේ උපදේශකවරුන්	1	*නව දර්ශක
ශ්‍රේණිගත කිරීමේ උපදේශකවරුන්	-	
ශ්‍රේණිගත කිරීමේ උපදේශකවරු	9	
කෘත්‍රිම පියාසර උපදේශකවරුන්	4	
බිම් උපදේශකවරුන්	27	25
ගුවන් මැදිරි කාර්ය මණ්ඩල සාමාජිකයන්	137	7

සහතික ලත් සංවිධාන/පිරිස් අධීක්ෂණය	2023	2022
බෑවුම් මඟ පරීක්ෂණ - මෙහෙයුම්	13	10
සිමියුලේටර පරීක්ෂණ	3	3
මාර්ග පරීක්ෂණ	10	6
අන්තරායකර භාණ්ඩ පරීක්ෂණ	13	15
ප්‍රධාන මූලික පරීක්ෂණ/උපදේශක නිරීක්ෂණ	6	6
නම් කරන ලද පරීක්ෂක නියමුවන් (DCP අධීක්ෂණය)	0	5
බෑවුම් මඟ පරීක්ෂණ - ගුවන් යෝග්‍යතාව	15	15
ගුවන්යානා නඩත්තු සංවිධානයේ පරීක්ෂණ	22	22
අනුමත නඩත්තු පුහුණු සංවිධානයේ පරීක්ෂණ	4	11
අඛණ්ඩ ගුවන් යෝග්‍යතා කළමනාකරණ සංවිධානයේ (CAMO) පරීක්ෂණ	9	10
පියාසර පුහුණු පාසල් පරීක්ෂණ	16	13
ගගන යාත්‍රාංගණ පරීක්ෂණ	60	31
ATM පරීක්ෂණ	42	36
AIM පරීක්ෂණ	6	12
SMS පරීක්ෂණ	15	15
CNS පරීක්ෂණ	25	26
MET පරීක්ෂණ	3	-
සිතියම් සහ ප්‍රස්තාර පරීක්ෂණ	3	3
PANS-OPS පරීක්ෂණ	3	-
ANS අහඹු පරීක්ෂණ	0	2
SKED නොවන පියාසර පරීක්ෂණ	5	5
ගුවන්සේවා ආරක්ෂක අධීක්ෂණ ක්‍රියාකාරකම් පැවැත්වීම (පරීක්ෂණ, විගණන, විමර්ශන, පිරික්සුම්)	97	75
නම් කරන ලද රෝහල් - පරීක්ෂණ	5	-

අවසන් කරන ලද විගණන	2023	2022
ගුවන්සේවා සුරක්ෂිතතාව	1	3

ඇමුණුම්
ප්‍රධාන කාර්යසාධන දර්ශක - 2023

මෙහෙයවීම සහ කළමනාකරණය	2023	2022
අධිකාරියේ රැස්වීම්	11	9
විගණන කමිටු රැස්වීම්	5	4
කාර්ය මණ්ඩල කමිටු රැස්වීම්	3	2
කර්මාන්ත උපදේශක රැස්වීම්	13	39

නෛතික කටයුතු සහ බලාත්මක කිරීම (LA&E)	2023	2022
සම්පාදනය කරන ලද ප්‍රාථමික නීති/සමාලෝචනය කරන ලද පනත් කෙටුම්පත්	6	-
නිකුත් කරන ලද/සමාලෝචනය කරන ලද/සංශෝධනය කරන ලද අනුබද්ධ නීති	41	22
ගිවිසුම්/අවබෝධතා ගිවිසුම	24	30
නීතිපති දෙපාර්තමේන්තුවෙහි/නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවෙහි සහභාගී වූ උපදේශන සංඛ්‍යාව	14	18
නෛතික කරුණු සම්බන්ධයෙන් CAASL/DGCA වෙත නීති උපදෙස් ලබා දීම	86	110
උසාවියේ/නඩුවල පෙනී සිටීම	27	31
සකස් කරන ලද නෛතික ලියකියවිලි	10	9
සමාලෝචනය කරන ලද CAASL ලේඛන ගණන	5	9

ගුවන්සේවාවේ සුරක්ෂිතතාව (AVSEC)	2023	2022
සමාලෝචන/සංශෝධන - NCASP සහ අනුබද්ධිත ලේඛන	10	13
තක්සේරු/සමාලෝචන - දේශීය ගුවන් සමාගම/ගුවන්තොටුපොල මෙහෙයුම් ගුවන්සේවා සුරක්ෂිතතා වැඩසටහන	6	5
තක්සේරු/සමාලෝචන - විදේශීය ගුවන් සමාගම මෙහෙයුම් ගුවන්සේවා සුරක්ෂිතතා වැඩසටහන	14	9
තක්සේරු/සමාලෝචන - ගුවන්සේවා සුරක්ෂිතතා පුහුණු වැඩසටහන/අධ්‍යයන පරාසය	4	2
ගුවන්සේවා සුරක්ෂිතතාව අධීක්ෂණ ක්‍රියාකාරකම් පැවැත්වීම (පරීක්ෂණ, විගණන, විමර්ශන, පිරික්සුම්)	97	75
ගුවන්සේවා සුරක්ෂිතතා කළමනාකරුවන් සහතික තිරීම සහ නැවත සහතික කිරීම	23	19
ගුවන්සේවා සුක්ෂිතතා උපදේශකවරුන් සහතික කිරීම සහ නැවත සහතික කිරීම	20	19
ගුවන්සේවා සුක්ෂිතතා පිරික්සුම්කරුවන් සහතික කිරීම සහ නැවත සහතික කිරීම	1,056	747
ගුවන් යානයක් තුළ/භාණ්ඩ රඳවනයක් මත ආයුධ රැගෙන යාම සඳහා අනුමැතිය ලබා දීම	87	36
ගුවන්තොටුපොල ප්‍රවේශ බලපත්‍ර නිකුත් කිරීම සඳහා නිර්දේශ ලබා දීම	572	297
ගුවන්සේවා සුරක්ෂිතතා පුහුණුව/දේශන/ඉදිරිපත් කිරීම් පැවැත්වීම	2	1

පරිසරය, පර්යේෂණ සහ ව්‍යාපෘති (ER&P)	2023	2022
ජාත්‍යන්තර ගුවන් සමාගම් සංඛ්‍යාන වාර්තා	357	322
අභ්‍යන්තර ගුවන් සමාගම් සංඛ්‍යාන වාර්තා	51	47
යවන ලද ICAO වාර්තා කිරීමේ පෝරම	69	52
CAASL හි ක්‍රියාකාරකම් කාර්ය සාධන සංඛ්‍යාන වාර්තා	240	239
CAASL හි රාජ්‍ය ආයතන/පොදු ජනතාව/අනෙකුත් අංශ සඳහා වන සංඛ්‍යා ලේඛන විධිවිධාන	38	22
නිකුත් කරන ලද ලංසු/RFP (යෝජනා ඉල්ලුම් කිරීම)	19	18
ප්‍රදානය කරන ලද ගිවිසුම්	130	66
සකස් කරන ලද CAASL හි මණ්ඩල පත්‍රිකා	3	3
CAASL හි වැඩමුළු/උත්සව/වැඩසටහන්/විශේෂ දිනයන් සඳහා පරිපාලනමය සහය	3	4
රැස්වීම්/පුහුණුවීම්/සම්මන්ත්‍රණ/වැඩමුළු (ගුවන්සේවා) සංවිධානය කිරීම සඳහා පරිපාලනමය සහය	13	1

ගුවන් සංතරණ සේවා (ANS)	2023	2022
පවත්වන ලද ATM පරීක්ෂණ	42	36
පවත්වන ලද ATM පරීක්ෂණ	6	12
පවත්වන ලද SMS පරීක්ෂණ	15	15
පවත්වන ලද CNS පරීක්ෂණ	25	26
පවත්වන ලද MET පරීක්ෂණ	3	-
පවත්වන ලද සිතියම් සහ ප්‍රස්තාර පරීක්ෂණ	3	3
පවත්වන ලද PANS-OPS පරීක්ෂණ	3	-
අහඹු ANS පරීක්ෂණ	-	2
SKED නොවන පියාසැරි පරීක්ෂණ	5	5
NOTAM නිකුත් කිරීම සඳහා අනුමැති	326	416
නිකුත් කරන ලද AIP අතිරේකය	13	7
AIP සංශෝධනය	4	2
නිකුත් කරන ලද AIC ගණන	6	4
අනුමත කරන ලද ගුවන් කාර්යන් ගණන	73	53
නිකුත් කරන ලද ගොඩබෑමේ නිෂ්කාශන	591	383
නිකුත් කරන ලද ගුවන් පියාසැරි නිෂ්කාශන	1,667	991
කාලසටහන්ගත නොකළ පියාසැරි අනුමැති සංඛ්‍යාව	2,258	1,374
යවන ලද AFTN	1,983	813
ලැබුණු AFTN	4,249	4,250
ගොඩබෑමේ සහ වාහන නැවැත්වීමේ ගාස්තුවලින් නිදහස් කිරීම් ගණන	9	6
රාජ්‍ය තාන්ත්‍රික පියාසැරිය (ගොඩබෑම) සඳහා විරෝධතා නොමැති සටහන් ගණන	103	73
රාජ්‍ය තාන්ත්‍රික පියාසැරිය (ඉහළින් පියාසර කිරීම) සඳහා විරෝධතා නොමැති සටහන් සංඛ්‍යාව	176	93
කොළඹ පියාසර තොරතුරු කලාපයට (FIR) ඉහළින් පියාසර කරන ගුවන්යානා සංඛ්‍යාව	35,929	24,177

ඇමුණුම්
ප්‍රධාන කාර්යසාධන දර්ශක - 2023

ගගන යාත්‍රාංගණ	2023	2022
අනුමත කරන ලද කුලුනු ගණන	266	209
උස් ගොඩනැගිලි ඉදිකිරීම සඳහා අනුමැති	85	122
ගොඩබිම් ගුවන්තොටුපොල සහතිකය අලුත් කිරීම්	2	4
සිදු කරන ලද ගගන යාත්‍රාංගණ අධීක්ෂණය	60	31

ගුවන්සේවා පුහුණුව සහ පුද්ගල බලපත්‍ර	2023	2022
ශිෂ්‍ය නියමු බලපත්‍ර (SPL) (නිකුත් කිරීම + අලුත් කිරීම්)	253	145
පෞද්ගලික නියමු බලපත්‍ර (PPL) (නිකුත් කිරීම+ අලුත් කිරීම්)	100	124
වාණිජ නියමු බලපත්‍ර (CPL) (නිකුත් කිරීම+ අලුත් කිරීම්)	300	174
ගුවන් ප්‍රවාහන නියමු බලපත්‍ර (ATPL) (නිකුත් කිරීම+ අලුත් කිරීම්)	768	293
ගුවන් ගමන් පාලක බලපත්‍ර (ATC) (නිකුත් කිරීම + අලුත් කිරීම්)	68	45
ගුවන්යානා නඩත්තු බලපත්‍ර (නිකුත් කිරීම+ අලුත් කිරීම්)	275	60
ගුවන්යානා නඩත්තු බලපත්‍ර - ශ්‍රේණිගත කිරීම් (නිකුත් කිරීම්)	59	107
ගුවන්යානා නඩත්තු බලපත්‍ර - කාණ්ඩ (නිකුත් කිරීම්)	8	12
ගුවන්යානා කාර්ය මණ්ඩල සහතිකය (නිකුත් කිරීම + අලුත් කිරීම්)	501	253
පියාසර මෙහෙයුම් නිලධාරි බලපත්‍රය (නිකුත් කිරීම +අලුත් කිරීම්)	4	-
PPL, CPL සහ ATPL නිකුත් කිරීම් සඳහා ගුවන්යානා ශ්‍රේණිගත කිරීම	96	66
උපදේශක ශ්‍රේණිගත කිරීම - (නිකුත් කිරීම + අලුත් කිරීම)	47	7
පියාසර පාසල් බලපත්‍ර (නිකුත් කිරීම + අලුත් කිරීම)	7	9
භූමි උපදේශක අනුමැති (නිකුත් කිරීම + අලුත් කිරීම්)	28	25
ගුවන් ගමන් පාලක ශ්‍රේණිගත කිරීම (නිකුත් කිරීම්+ අලුත් කිරීම්)	118	106
NIB නිෂ්කාශන නිකුත් කිරීම	231	56
PPL විභාගය (ප්‍රශ්න පත්‍ර සංඛ්‍යාව)	573	493
AML විභාගය (විභාග ගණන)	5	2
AML විභාගය (ප්‍රශ්න පත්‍ර සංඛ්‍යාව)	2,650	1,440
ATPL (A) විභාග	109	101
ATPL (A) :භාර දෙන ලද ප්‍රශ්න පත්‍ර සංඛ්‍යාව)	1,653	1,375
ATPL (H) විභාග	3	9
ATPL (H) විභාගය (ප්‍රශ්න පත්‍ර සංඛ්‍යාව)	17	27
ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතා පරීක්ෂාව (ELPC)	127	140
පියාසැරි උපදේශක (සීමිත) විභාගය (සිද්ධාන්ත සහ සම්මුඛ පරීක්ෂණ)	9	4

ගුවන්යානා මෙහෙයුම්	2023	2022
විශේෂ මෙහෙයුම්	1	-
විදේශ ගුවන් ක්‍රියාකරු සහතිකය -පළමු නිකුත් කිරීම	7	4
විදේශ ගුවන් ක්‍රියාකරු සහතිකය - අලුත් කිරීම	34	42
අන්තරායකර භාණ්ඩ ප්‍රවාහන බලපත්‍ර - පළමු නිකුත් කිරීම	2	5
අන්තරායකර භාණ්ඩ ප්‍රවාහන බලපත්‍ර - අලුත් කිරීම	11	17
DCP/TRE පළමු නිකුත් කිරීම	-	1
DCP/TRE අලුත් කිරීම	-	7
ජාත්‍යන්තර ගුවන් ක්‍රියාකරු සහතිකය - අලුත් කිරීම	1	3
සිමියුලේටර අලුත් කිරීම	2	3
PPC අවසරය	57	62
සිදු කරන ලද අධීක්ෂණ කටයුතු	67	45
ලියාපදිංචි ඩ්‍රෝන යානා - දේශීය හිමිකරුවන්	1,388	1,091
ලියාපදිංචි ඩ්‍රෝන යානා - විදේශීය හිමිකරුවන්	2,388	1,526

ගුවන්යානා ලියාපදිංචිය සහ ගුවන් යෝග්‍යතාව (AR&AW)	2023	2022
සිදු කරන ලද අධීක්ෂණ කටයුතු (බෑවුම් මඟ, විගණනය)	96	98
ගුවන්යානාවල ගුවන් යෝග්‍යතා සහතිකය -පළමු නිකුත් කිරීම	2	1
ගුවන්යානාවල ගුවන් යෝග්‍යතා සහතිකය - අලුත් කිරීම	40	45
ගුවන්යානා ලියාපදිංචි කිරීමේ සහතිකය - පළමු නිකුත් කිරීම	4	1
ගුවන්යානා ලියාපදිංචි කිරීමේ සහතිකය - අලුත් කිරීම	63	55
නඩත්තු සංවිධානය (දේශීය) - පළමු නිකුත් කිරීම	1	-
නඩත්තු සංවිධානය (දේශීය) - අලුත් කිරීම	17	18
නඩත්තු සංවිධානය (විදේශීය) - පළමු නිකුත් කිරීම	1	1
නඩත්තු සංවිධානය (විදේශීය) - අලුත් කිරීම	45	56
නඩත්තු පුහුණු සංවිධානය - පළමු නිකුත් කිරීම	1	-
නඩත්තු පුහුණු සංවිධානය - අලුත් කිරීම	4	1
අඛණ්ඩ ගුවන් යෝග්‍යතා කළමනාකරණ සංවිධානය - පළමු නිකුත් කිරීම	1	6
අඛණ්ඩ ගුවන් යෝග්‍යතා කළමනාකරණ සංවිධානය - අලුත් කිරීම	9	5
ගුවන්සේවා සිදුවීම් පිළිබඳ විමර්ශන	339	298

ඇමුණුම්

ප්‍රධාන කාර්යසාධන දර්ශක - 2023

ගුවන් ප්‍රවාහනය සහ ආර්ථික නියාමනය (ATER)	2023	2022
අභ්‍යන්තර ගුවන් ගමන් කාලසටහන් අනුමත කිරීම්	72	55
ගුවන් ප්‍රවාහන සැපයුම්කරුවන් සඳහා පවත්වන ලද තක්සේරු	123	46
ජාත්‍යන්තර ගුවන් ගමන් කාලසටහන් අනුමත කිරීම්	477	492
විදේශ තාක්ෂණික/තාක්ෂණික නොවන ප්‍රවීණ කාර්ය මණ්ඩලය සඳහා වීසා බලපත්‍ර නිර්දේශ කිරීම්	110	86
ශ්‍රී ලංකාවේ ලියාපදිංචි ගුවන්යානා සඳහා වන වරලත් බලපත්‍රය	4	7
ශ්‍රී ලංකාවේ ලියාපදිංචි ගුවන්යානා සඳහා වන ගුවන්යානා බලපත්‍රය	2	2
වරලත් බලපත්‍ර - ජාත්‍යන්තර මෙහෙයුම්	2	2
වරලත් බලපත්‍ර - අභ්‍යන්තර නිත්‍ය මෙහෙයුම්	2	8
ගුවන් ප්‍රවාහන සැපයුම්කරුගේ බලපත්‍ර	528	442
විදේශ ගුවන් බලපත්‍ර	33	6
සමාලෝචනය කරන ලද පවත්නා ගුවන්සේවා ගිවිසුම්	1	1
හසුරුවන ලද පාරිභෝගික පැමිණිලි	52	48
වර්ෂය අවසානය වන විට ඇති විවෘත අහසක් ගුවන්සේවා ගිවිසුම්	19	19

මානව සම්පත් සහ දේපළ කළමනාකරණය (HR&PM)	2023	2022
කාර්ය මණ්ඩල බඳවා ගැනීම්	10	1
මුළු කාර්ය මණ්ඩලය (ස්ථිර සේවක පදනම මත)	168	172
පහසුකම් සලසන ලද විදේශ පුහුණුවීම්/සම්මන්ත්‍රණ/වැඩමුළු	15	7
පහසුකම් සලසන ලද විදේශ රැස්වීම්/සම්මේලන/සමුළු	18	4
පහසුකම් සලසන ලද විදේශ පරීක්ෂණ	16	8
පහසුකම් සලසන ලද දේශීය පුහුණුවීම්/සම්මන්ත්‍රණ/වැඩමුළු	14	1
පහසුකම් සලසන ලද දේශීය අභ්‍යන්තර පුහුණු වැඩසටහන් (උපදෙස් ඇතුළුව)	09	11
පහසුකම් සලසන ලද මාර්ගගත පුහුණුව/සම්මන්ත්‍රණ/වැඩමුළු	11	18
පහසුකම් සලසන ලද මාර්ගගත රැස්වීම්/සම්මේලන	02	2
සකස් කරන ලද කාර්ය සාධන තක්සේරු කිරීම්	102	98
කාර්ය මණ්ඩල ණය පහසුකම්	80	72

තත්ත්ව සහ අභ්‍යන්තර විගණනය (Q&IA)	2023	2022
සිදු කරන ලද විගණන	104	94
විගනණයෙන් ඉස්මතු කළ සොයා ගැනීම්	133	86

ගුවන්සේවා ආරක්ෂණ අධීක්ෂණය	2023	2022
වාර්තා වූ බරපතල (ගැටුම්) සිදුවීම්	**16**	6
වාර්තා වූ සිදුවීම්	**364**	321
මගීන්ට හෝ ගුවන් කාර්ය මණ්ඩලයට සිදු වූ සුළු තුවාල	**1**	2
සකසන ලද නව මාර්ගෝපදේශ	**-**	2
සංශෝධනය කරන ලද පවතින මාර්ගෝපදේශ	**1**	2
සංශෝධනය කරන ලද පවත්නා IS	**1**	-
බලපත්‍රලාභීන් සම්බන්ධයෙන් වන අනතුරු/සිද්ධි සත්‍යාපනය	**96**	106

ගුවන් වෛද්‍ය සේවා (AMS)	2023	2022
වෛද්‍ය පරීක්ෂණ	**1,657**	1,348

සිවිල් ගුවන්සේවා ප්‍රවර්ධනය සහ මාධ්‍ය	2023	2022
පවත්වන ලද CADEC වැඩසටහන	**5**	5
පාසල් සිසුන් සඳහා පවත්වන ලද වැඩමුළු	**8**	2
විශේෂ ක්‍රියාකාරකම් සහ දැනුම්වත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම	**4**	1
පුවත්පත් ලිපි	**30**	20
රූපවාහිනී වැඩසටහන්	**24**	21

තාක්ෂණික පුස්තකාලය	2023	2022
ප්‍රවේශ කරන ලද සහ බෙදා හරින ලද ICAO ලේඛන	**267**	1,085

ඇමුණුම්
ගුවන් ගමන් පිළිබඳ තොරතුරු

	2023	2022	වර්ධනය (%)
ජාත්‍යන්තර ගුවන් ගමන්			
මඟීන්			
ගුවන්යානා වලට ගොඩ වීම්	**3,837,541**	2,878,370	33%
ගුවන්යානා වලින් ගොඩ බැසීම්	**3,637,041**	2,624,169	39%
ගුවන්යානා අතර මාරු වීම්	**899 229**	881,226	2%
ගුවන් භාණ්ඩ (මෙට්‍රික් ටොන්)			
රටින් පිටතට	**65,071**	63,612	2%
රට තුලට	**93,544**	103,357	-9%
ගුවන්යානා සංචලන			
නියමිත ගුවන් ගමන්	**44,995**	35,917	25%
කුලී ගුවන් රථ ගුවන් ගමන්	**1,309**	1,682	-22%
මෙහෙයුම් සිදු කරන ලද ගුවන් සමාගම් සංඛ්‍යාව			
නියමිත සේවා	**33**	30	10%
කුලී	**35**	25	40%
සියලු ගුවන් භාණ්ඩ	**4**	4	-
අභ්‍යන්තර ගුවන් ගමන්			
රැගෙන යන ලද මඟීන් ගණන	**11,955**	6,519	83%
ගුවන්යානා සංචලන	**4,070**	1,539	164%
මෙහෙයුම් සිදු කරන ලද ගුවන් සමාගම් සංඛ්‍යාව	**5**	5	-
නියමිත ගුවන් ගමන්	**2**	2	-
කුලී ගුවන් රථ ගුවන් ගමන්	**3**	3	-

සටහන්

ඇමුණුම්
සටහන්

optima
Designing Your Year!

Designed & Produced by
Optima Designs (Pvt) Ltd.

A full service design and print company.
www.optimadesigns.lk

CAASL



Civil Aviation Authority
Sri Lanka

Safe and Efficient Skies for All

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය
අංක 152/1, මිනුවන්ගොඩ පාර, කටුනායක
දූරකථන අංක :+94 112 358 800 ෆැක්ස් අංක: +94 112 257 154
විද්‍යුත් තැපෑල: info@caa.lk
වෙබ් පිටුව: www.caa.lk